




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් පුර පසළොස්වක ලත් කිවි දින | කාණ්ඩය 112 | පත්‍රය 62 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 පෙබරවාරි 26 සිකුරාදා




දේශයේ පාලන මාවත
දේශමානය
අද පත්‍රය සමග

## විහාර හා දේවාලගම් පනත
# ඉවත් කිරීමට හීනෙන්වත් හිතන්නේ නෑ



රෝෂන් තුෂාර

සිංහල, බෞද්ධ ජනතාවගේ පාරම්පරික නීති පනත් කෙටුම්පත් වෙනස් කිරීමට හෝ බෞද්ධ විහාර හා දේවාලගම් පනත ඉවත් කිරීමට කිසි ලෙසකින් හෝ ක්‍රියා නොකරන බවට සහතික වූ අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා එසේ වෙනසක් කිරීමට හීනෙන් හෝ සිතා නැති බවද අධිකරණ අමාත්‍යාංශයේ පැවති මාධ්‍ය හමුවේදී අදහස් දක්වමින් ඊයේ (25) පැවසීය.

පිට 06

## විත්තියේ සාක්ෂි නොකැඳවාම
# ඇමැති මහින්දානන්ද නිදොස් කොට නිදහස්



රෝෂන් තුෂාර

ශ්‍රී ලංකා නිදහස් කම්කරු කොංග්‍රස වෘත්තිය සමිතියේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් එම වෘත්තීය සමිතියට අයත් රුපියල් ලක්ෂ 37ක මුදලක් සාපරාධි, සාවද්‍ය ලෙස පරිහරණය කළේ යැයි චෝදනා එල්ල වූ ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා විත්තියේ සාක්ෂි කැඳවීමකින් තොරව නඩුවේ සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට කොළඹ මහාධිකරණය ඊයේ (25) තීන්දු කළේය.

පිට 06

පිට 6

## රන්ජන්ට තනි සිරමැදිරියක්

## දුම්රිය ටිකට් පත්වලට ජපානයෙන් කඩදාසි

පිට 6

## මත් කුඩු කිලෝ 45ක් වෑන් රියකින් අදිද්දී අල්ලයි
### වටිනාකම කෝටි 46යි

රක්ෂණ ශ්‍රියන්ත

රුපියල් කෝටි 46කට ආසන්න වටිනාකමකින් යුත් හෙරොයින් කිලෝ 45 ග්‍රෑම් 376ක් හොරණ ප්‍රදේශයේදී වෑන් රථයකින් ප්‍රවාහනය කරමින් සිටියදී පාණදුර මධ්‍යම දූෂණ මර්දන කොට්ඨාසයේ නිලධාරීන් පිරිසක් විසින් සැකකරුවන් දෙදෙනකු සමඟ ඊයේ (25) අලුයම අත්අඩංගුවට ගෙන තිබේ.

පිට 06

## ව්‍යාපාරිකයන් සහ ආයෝජකයන්ට අය-වැය බදු සහන කඩිනමින්

ජයසිරි මුණසිංහ

ව්‍යාපාරිකයන්ට සහ ආයෝජකයන්ට 2021 අය-වැයෙන් ජනාධිපතිවරයා ඇතුළු රජය පොරොන්දු වූ බදු සහන කඩිනමින් සැලසීම සඳහා සියලු බදු අණපනත් සංශෝධනය කරමින් සිටින බවත් මේ වසරේ අප්‍රේල් මාසයේ සිට එම සහන දීමට බලාපොරොත්තු වන බවත් මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා ඊයේ (25) ප්‍රකාශ කළේය.

පිට 06

## කොවිෂීල්ඩ් එන්නත් තවත් ලක්ෂ 5ක් ශ්‍රී ලංකාවට

මහින්ද අලුත්ගෙදර

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් මුදල් ගෙවා ඉන්දියාවේ සීරම් ආයතනයෙන් ඇණවුම් කර තිබූ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා සෙනෙකා කොවිෂීල්ඩ් කොවිඩ් මර්දන එන්නත් මාත්‍රා ලක්ෂ 5ක් ඊයේ (25) පස්වරුවේ කටුනායක ගුවන්තොටුපොළ වෙත රැගෙන විත් තිබිණි.

මේ එන්නත් තොගය ගුවන් යානය තුළද ශීතකරණ පහසුකම් යටතේ ගබඩා කර රැගෙන පැමිණ තිබූ අතර කටුනායක ගුවන් තොටුපොළේදී මේ එන්නත් තොගය ගොඩ බෑ සැණින් ආනයන ගුවන් භාණ්ඩ ගබඩා සංකීර්ණයේ ශීතකරණ තුළ තැන්පත් කිරීමට පියවර ගෙන තිබේ.

පිට 06

පිට 6

## බැචලේගේ වාර්තාව ප්‍රතික්ෂේප කරනවා



ඇමැති දිනේෂ් මානව හිමිකම් කවුන්සිලයට කියයි

## මානව හිමිකම් වාර්තාව මුළුමනින්ම පක්ෂග්‍රාහියි



## රනිල් මැතිසබයට යා යුතුමයි
### එජාප ජ්‍යෙෂ්ඨයෝ කියති

ශිරෝමි අබයසිංහ

කොමිෂන් සභා වාර්තා සහ පැවති රජයේ කැබිනට් පත්‍රිකා, ගිවිසුම් පිළිබඳ සත්‍යය රටට හෙළි කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වහාම පාර්ලිමේන්තුවට යා යුතු බව පක්ෂයේ ජ්‍යෙෂ්ඨයෝ පිරිසක් ඊයේ (25) අවධාරණය කළහ.

පිට 06

## ගානියා බැරිස්ටර්ට අධි චෝදනා ගොනු කළා
### CIDය උසාවියට කියයි

සිරන්ජනි කුමරි

රජය අපහසුතාවට පත් කරමින් අසත්‍ය තොරතුරු සැපයූ බව කියන සිද්ධියට අදාළව ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සේවිකාවක වන ගානියා බැරිස්ටර් ෆ්‍රැන්සිස් යන අයට එරෙහිව මහාධිකරණය හමුවේ අධි චෝදනා ගොනු කර ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා හමුවේ ඊයේ (25) ප්‍රකාශ කළේය.

පිට 06

## රටේ ප්‍රශ්නවලට ආණ්ඩුව සහ සජිත් වගකිව යුතුයි



ශිරෝමි අබයසිංහ

රටේ උද්ගතව තිබෙන සියලු ප්‍රශ්නවලට රාජපක්ෂ ආණ්ඩුව මෙන්ම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාද වග කිව යුතු බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත තෙවරප්පෙරුම මහතා පවසයි.

මාධ්‍ය වෙත ඊයේ (25) අදහස් දක්වමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

පිට 06

## පාස්කු වාර්තාවට විවාදයක් දෙනවා

ඇමැති දිනේෂ්

## පාස්කු වාර්තාව ශ්‍රීලනිපය ප්‍රතික්ෂේප කරනවා



## සා/පෙළ සිසුන්ගේ හැඳුනුම්පත් නිකුත් කරන විශේෂ දිනය අද

පිට 6

පිට 6

## රැඳවූවන් මතින් මුදන්න විශේෂ වැඩපිළිවෙළක්

පිට 6

## පාස්කු කොමිසමේ සාක්කි ලේඛන සහ සීඩී නීතිපති ඉල්ලයි

## නාකොටික් නිලධාරීන්ට ඇප දෙන්න නීතිපති හරස් වෙයි

## ශ්‍රීලනිප සභාපති යළි මෛත්‍රී






## පාස්කු ප්‍රහාරයේ වගඋත්තරකරු නිදැල්ලේ



## ඩොලර් බිලියන 13ක අපනයන ඉලක්කයක්





# ලොව ප්‍රථම වතාවට: යාපනය සරසවියේ පූර්ණ දෘශ්‍යාබාධිත සිසුහු දෙදෙනෙක් විශේෂ ගෞරව උපාධි ලබති



**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

යාපනය විශ්වවිද්‍යාලයේ මෙවර පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී පළමු වතාවට පූර්ණ දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් දෙදෙනකු විශේෂ ගෞරව උපාධි හිමිකරගෙන තිබේ.

යාපනයේ චුන්නාකම් ප්‍රදේශයේ පිහිටි සභාපතිපිල්ලේ දෘශ්‍යාබාධිත පාසලේ ඉගෙනුම ලබා යාපනය විශ්ව විද්‍යාලයට පැමිණි සබේසන් කාත්සානි දේශපාලන විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධියද එම පාසලෙන්ම පැමිණි විජයකුමාර් විජයනාදන් සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධියද හිමි කර ගැනීමට සමත් වී ඇත. යාපනය විශ්ව විද්‍යාල ඉතිහාසයේ පූර්ණ දෘශ්‍යාබාධිත දෙදෙනෙකු එකම උපාධි ප්‍රදානෝත්වයකදී විශේෂ ගෞරව උපාධි හිමි කරගෙන ඇති පළමු අවස්ථාව බවට මේ අවස්ථාව යාපනය විශ්වවිද්‍යාල ඉතිහාසයට එක්ව තිබේ.

# ලීලාදේවි ආනන්දරාජා කිලිනොච්චි පොලිසියට කැඳවයි

## මානව හිමිකම් කමිටුව නියෝජනයට වසර කීපයක්ම ජිනීවා ගිහින්

### ගිණුමේ ලක්ෂ ගණනක එතෙරින් ආ මුදල්

**උතුරු පළාත් විශේෂ-**
**රසුල දිල්හාර ගමගේ**

යුද සමයේදී අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු සොයා බැලීමේ සංවිධානයේ උතුරු නැගෙනහිර සම්බන්ධිකරණ ලේකම්වරියයැයි කියන කාන්තාවකගෙන් ප්‍රශ්න කිරීමට කිලිනොච්චියේ පොලිස් ත්‍රස්ත මර්දන ඒකකය ඇය 24 දා කිලිනොච්චිය පොලීසියට කැඳවා තිබේ.

ලීලාදේවී ආනන්දරාජා නැමති මේ කාන්තාව ඇගේ පුතකු අතුරුදන් වූ බව කියමින් එම සංගමයට බැඳී වසර ගණනාවක් එහි කටයුතු කරන අතර ඇගේ බැංකු ගිණුම් පරීක්ෂා කිරීමේදී ඇයට විදේශ රටක සිට රුපියල් ලක්ෂ ගණනින් මුදල් ලැබී ඇති බව හෙළි වී තිබේ.



ජිනීවා මානව හිමිකම් කමිටුව නියෝජනය කිරීමට ඇය වසර කීපයක්ම ස්විට්සර්ලන්තයට ගොස් ඇති අතර ඒ සඳහාද සංගමයේ මුදල් මෙන්ම ඇගේ මුදල්ද වියදම් කර තිබේ.

ත්‍රස්ත මර්දන ඒකකය විශ්වාස කරන්නේ ඇගේ අතුරුදන් වූයේ යැයි කියන පුතා හොරෙන් විදේශ රටකට ගොස් දෙමළ ඩයස්පෝරාව සමග සම්බන්ධ වී තම මවට විශාල මුදල් ප්‍රමාණයක් එවන බවයි.

එමෙන්ම යුද සමයේදී අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු සොයා බලන සංගමයේ මුවාවෙන් ඇය ස්විස්ටර්ලන්තය ඇතුළු යුරෝපීය රටවලින් මුදල් ගරන ජාවාරමකට සම්බන්ධ බවටද සැකයක් පහළ වී තිබේ.

මේ පිළිබඳ ප්‍රශ්න කිරීමට ඇය කොළඹ ත්‍රස්ත මර්දන ඒකකය වෙත පැමිණෙන ලෙසට සිතාසියක් ලද අවස්ථාවේදි ඇය දැඩි ලෙස රෝගාතුරව සිටින බව ප්‍රකාශ කොට කට උත්තර දීමට කිලිනොච්චිය පොලීසිය ලබාදෙන ලෙස කළ ඉල්ලීමකට අනුව ඇයව කිලිනොච්චියට කැඳවා ප්‍රශ්න කොට තිබේ.

# අනුරාධපුර අවන්ති දේවි බාලිකා ළමා නිවාස සිද්ධියේ විමර්ශන ආයතන හතරකින්

## කාටවත් පරීක්ෂණ යට ගහන්න බෑ:

### උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්

**අනුරාධපුර අතිරේක**
**අමිල ප්‍රභාත් වනසිංහ**

අනුරාධපුර අවන්ති දේවි බාලිකා ළමා නිවෙසේ අපචාර සිද්ධිය ගැන ආයතන හතරක් විසින් වෙන වෙනම පරීක්ෂණ සිදු කරනවා. මා යටතේ සිදු කරන පරීක්ෂණ කිසිම අයුරකින් යට ගහන්න කටයුතු කරන්නේ නැහැ.ඒ අනුව එම පරීක්ෂණ නිසි ලෙස තවදුරටත් සිදු වන බව උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා සඳහන් කළේය.

උතුරු මැද පළාත් සභාවේදී ඉකුත්දා මාධ්‍ය වෙත අදහස් දක්වමින් මේ බව පවසා සිටි ආණ්ඩුකාරවරයා එහිදී මෙසේද පැවසීය.

මේ පරීක්ෂණ ස්වාධීනව සිදු වෙනවා.මාධ්‍ය මගින් මේවා රටට හෙළි කරපු නිසා තමා මෙය එළිවුණේ.මේ වන විට යම් යම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

කණ්ඩායම් හතරකින් පරීක්ෂණ සිදු කරන නිසා මේක කාටවත් යට ගහන්න බැහැ .ජනාධිපතිගේ උපදෙස් මත රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතා යටතේත්,කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේත් ,අනුරාධපුර නියෝජ්‍ය පොලිස්පති යටතේත් පළාත් අමාත්‍යාංශය යටතේත් මෙහි පරීක්ෂණ දිගටම සිදු කෙරෙනවා.

ඒක නිසා මම වගකීමෙන් කියනවා. මේ පරීක්ෂණ සාධාරණ ලෙස සිදු වන බවට. පළාතේ තිබෙන ළමා නිවාසවල දරුවන්ට තිබෙන අඩුපාඩු කඩිනමින් සකස් කර හොඳ පහසුකම් තිබෙන ස්ථාන බවට ඒවා පත් කරනවායැයිද හෙතෙම වැඩිදුරටත් පැවසීය.

ආණ්ඩුකාර ලේකම් ඒ.කේ. එම්. වික්‍රමසිංහ මහතා-

මේ පරීක්ෂණ නිසි පරිදි සිදු කරනවා.මේ වන විටත් සමහර අය අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. වැඩ තහනම් කරපු අයත් ඉන්නවා .ඒ වගේම කීපදෙනකුට චෝදනා පත්‍ර භාරදී නිදහසට කරුණු විමසා තිබෙනවා. ආයතන සංග්‍රහය අනුව පරීක්ෂණ සිදු කෙරෙන ක්‍රියාපිළිවෙතක් තියෙනවා. ඒ අනුවයි කටයුතු කරන්නේ .වැරදි කරපු අය ඉන්නවානම් ඒ සියලු දෙනාට නීතිය අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. පරීක්ෂණ අවසන්වීමට මාස පහක හයක කාලයක් ගත වනු ඇතැයිද හෙතෙම වැඩිදුරටත් පැවසීය.

උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ වැඩ බලන කොමසාරිස් ගයාන් වන්නිනායක මහතාද මේ අවස්ථාවට සහභාගි විය.





# යාපනයේ ගුවන්තොටුපොළේ සංවර්ධන වැඩ බලන්න ඉන්දීය විශේෂඥ පිරිසක් මාර්තුවේ

**උතුරු පළාත් විශේෂ -**
**රසුල දිල්හාර ගමගේ**

යාපනයේ අන්තර්ජාතික ගුවන් තොටුපොළේ දෙවන අදියරේ සංවර්ධන කටයුතු පිළිබඳ කරුණු සොයා බැලීම ට ඉන්දීය ගුවන් තොටුපොළ අධිකාරියේ විශේෂඥයන් පිරිසක් මාර්තු මස පළමු සතියේදී යාපනයට පැමිණීමට නියමිතය.

ඉන්දීය මාධ්‍ය ප්‍රකාශ කළේ යාපනය අන්තර්ජාතික ගුවන් තොටුපොළේ දෙවන අදියරේ සංවර්ධන කටයුතු සඳහා ඉන්දීය රජය ලබාදීමට නියමිත මුදල්ද නියමිත පරිදි ලබාදෙන බවයි.

දෙවන අදියරේ සංවර්ධන කටයුතුවලදී යාපනය අන්තර්ජාතික ගුවන් තොටුපොළේ ධාවන පථය පුළුල් කිරීම ඇතුළු ප්‍රධාන කාර්යන් 7ක් හඳුනාගෙන ඇති අතර මගීන්ට පහසුකම් වර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කොට තිබේ.

කොරෝනා තර්ජනයෙන් පසුව දිවයිනේ පිහිටි සෙසු ගුවන් තොටුපොළ අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වූවද යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මේ දක්වා ක්‍රියාත්මක වී නැත.

ගිනිකොණ

කපා දමන හින්දා රහසෙම | කැලය
කඩා පනින හමුදාවක් දෙති | සහාය
වහා සොයා බැලුවොත් යොදවා | බලය
වඩු අඩුය වරදට ඇති | අවසරය



අද හැටි

පාස්කුවට ගොස් දෙවිඳුන්හට | පින්දී
සිය ගණනක් අකාලේ ජීවිත | දන් දී
සීමා කළ හැකිද? විපතට දී | වන්දී
පලයක් වේද? මේ කොමිසම වෙත | කන් දී

පෙන්නා ඇති නමුත් මල්පල ගසක | අතු
දැන ගත යුතුව ඇත මේ ගස හැදුණු | තතු
පැළ කර පොහොර දැමූ අය ගැන සෙවිය | යුතු
නිවැරැදි තීන්දුව දෙන තුරු බලමු | මතු!

රටේමුල්ලේ මුදන්නායක

# හිරුණිකා ප්‍රේමචන්ද්‍රට එරෙහි නඩුව ලබන 10දා කැඳවීමට නියෝග

**රෝෂන් තුෂාර**

බලහත්කාරයෙන් තරුණයකු පැහැරගෙන යෑම සම්බන්ධයෙන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනි හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියට එරෙහිව පවරා ඇති නඩුව ලබන 10 වැනිදින කැඳවීමට කොළඹ මහාධිකරණ විනිසුරු සෂි මහේන්ද්‍රන් මහතා ඊයේ(25) දින නියම කළේය. 2015 දෙසැම්බර් 21 හෝ ඊට ආසන්න දිනකදි අමිල ප්‍රියංග නමැති තරුණයා පැහැරගෙන යෑමේ චෝදනාවට ප්‍රේමචන්ද්‍ර මහත්මියට එරෙහිව නීතිපතිවරයා මේ නඩුව පවරා ඇත.

ශ්‍රීකාන්තගේ ප්‍රිදූපත



- පාස්කු කොමිසම හින්ද අපිට බත් කන්න වෙන්නෙත් නෑ වගේ සර් !
- ඈ..... ඒ මොකද බං ?
- අන්න, මෛත්‍රීට අත තිබ්බොත් ඩබ්ලි බලා ගන්නවලු !

# රතුපස්වල පොදු සුසානයේ භූමදාන කළ කාන්තාවගේ මළ සිරුර ගොඩගනී

**මල්වාන සමූහ -**
**මහානාම විතානගේ**

ගෙල වැලලාගෙන සියදිවි නසා ගන්නා ලද බවට නිගමනය කොට වැලිවේරිය, රතුපස්වල පොදු සුසාන භූමියේ භූමදානය කළ බව කියන විසිහය හැවිරිදි විවාහක කාන්තාවගේ මළ සිරුර අධිකරණ නියෝගයක් අනුව පෙරේදා (24) පෙරවරුවේ ගොඩ ගනු ලැබීය.

මෙසේ ගොඩ ගනු ලැබුවේ යක්කල ප්‍රදේශයේ පදිංචිව සිටි ඩී .ඒ .චතුරිකා ප්‍රියදර්ශනී නමැති විසිහය හැවිරිදි විවාහක කාන්තාවගේ මළසිරුරයි. ඇය යක්කල ප්‍රදේශයේම වෙළෙඳසලක සේවය කර ඇතැයි ද කියයි.



මේ මරණය තමන්ට සැක සහිත බවට පවසමින් මියගිය කාන්තාවගේ පියා වන ඩී .ඒ .ධර්මසේන මහතා ( 59 ) හා ඇයගේ සොහොයුරියන් විසින් ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමකට අනුව ගම්පහ අතිරේක මහේස්ත්‍රාත් ආර්.එච්. එම්. මහේන්ද්‍ර රාජා මහතාගේ නියෝගය මත ගම්පහ වැඩ බලන මහේස්ත්‍රාත් මහේෂ් හේරත් මහතා ඉදිරියේ මේ මළ සිරුර ගොඩ ගනු ලැබීය.

මේ මළ සිරුර ගොඩ ගැනීමෙන් පසුව එය ඇයගේ ඥාතීන් විසින් හඳුනාගත් අතර පසුව මළ සිරුර පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට රාගම රෝහලට යවන ලෙස වැඩ බලන මහේස්ත්‍රාත්වරයා පොලිසියට නියෝග කළේය.

වතුපිටිවල රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී රමේෂ් අලගියවන්න මහතා ද යක්කල හා වැලිවේරිය පොලිසිවල නිලධාරීහු ද මේ අවස්ථාවට පැමිණ සිටියහ.




විකිණීමට

ඉන්ධන විකුණුම්හලක්

(සිපෙට්කෝ ඉන්ධන පිරවුම්හල) ගණේවල්පොල, කැකිරාව

විකුණුම්හලේ ගොඩනැගිල්ල, කාර්යාලය, සහ කඩ කාමර දෙකක් (2) ඇතුළුව සම්පූර්ණ බිම් ප්‍රමාණය අක්කර තුනකි (03).

- ඉන්ධන පොම්ප හයක් (06)
- ලීටර් 25,000 හේ ඉන්දන ටැංකි හතරක් (04
- මුළු වටිනාකම - රුපියල් මිලියන 150 ක්.

මිල සාකච්ඡා කර තීරණය කළ හැකිය.

විමසීම් : 0777428761


# පාස්කු දින ප්‍රහාර වාර්තාවේ විමර්ශන කොමිෂන් පිටපතක් නීතිපතිට

**සුභාෂිණී සේනානායක සහ රෝෂන් තුෂාර**

පාස්කු ඉරුදින ප්‍රහාර මාලාව පිළිබඳ සොයාබැලූ ජනාධිපති පරීක්ෂණ කොමිසම් සභා විමර්ශන වාර්තාවේ පිටපතක් ඊයේ (25) නීතිපතිවරයා වෙත යොමු කර තිබේ.

ජනාධිපති ලේකම්වරයා විසින් නීතිපතිවරයා වෙත එම පිටපත යොමු කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී නිශාරා ජයරත්න මෙණෙවිය පැවසුවාය.

ඒ අනුව පාස්කු කොමිෂන් සභාවේ නිර්දේශ අනුව ඉදිරි පියවර නීතිපතිවරයා විසින් ගනු ඇතැයි ද නිශාරා ජයරත්න මෙණෙවිය වැඩිදුරටත් පැවැසුවාය.




දිනමිණ
The Dinamina
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 පෙබරවාරි 26 සිකුරාදා

# අපි නොදන්න මානව හිමිකම්!

ජිනීවා මානව හිමිකම් කවුන්සිලය හා එහි වාර්තා යනු ශ්‍රී ලංකාවේ වාර්ෂික ප්‍රශ්න පත්‍රයේ එක්තරා කොටසකි. යුද්ධය හා ත්‍රස්තවාදය නිමා කිරීමත් සමඟ ප්‍රශ්න පත්‍රයට ඉහත කොටස ඉදිරිපත් වී ඇත. මීට උත්තර සැපයිය හැකි මාර්ග දෙකක් ඇත. පළමු මාර්ගය නම් කවුන්සිලය චෝදනා පිළිගෙන රටත් - ජාතියත් පාවාදීමය. දෙවන මාර්ගය නම් රටේ ස්වාධිපත්‍යය හා නිදහස ආරක්ෂා කර ගනිමින් සටනක යෙදීමය. ආණ්ඩුව තෝරාගෙන ඇත්තේ දෙවන මාර්ගයයි. ඒ ගැන රටේ ජනතාවට සතුටු විය හැකිය. එහෙත් එය පහසු කටයුත්තක් නොවේ. කවුන්සිලයට අයත් රටවල් හතළිස් හතෙන් වැඩි දෙනකුගේ සහයෝගය ලබාගත හැකි නම් එය ජයග්‍රහණයකි. විදේශ කටයුතු අමාත්‍යාංශය ඒ සඳහා මෙහෙයුමක යෙදී සිටී.

මානව හිමිකම් කවුන්සිලය ගැනත් එහි ක්‍රියාකාරිත්වය ගැනත් මතවාද ගණනාවක් සමාජය තුළ පවතී. එයින් මතවාද තුනක් ප්‍රධානය. ඒ අනුව මානව හිමිකම් කවුන්සිලය බටහිර බලවත් රටවල දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරමින් සිටින බවත් දුප්පත් රටවලට බලපෑම් කරන බවත් කෙනෙක් විශ්වාස කරති. මානවහිමිකම් කවුන්සිලය ලෝක සාමයට, යුක්තියට හා ජාතීන් අතර සංහිඳියාවට ක්‍රියා කරන ආයතනයක් බැවින් ඔවුන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතු යැයි තව කෙනෙක් විශ්වාස කරති. කවුන්සිලයට බලයක් නැති බවත්, අවසන් තීරකයා වන්නේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය බවත් එහිදී නිෂේධ බලය හිමි චීනය අප ආරක්ෂා කරන බවත් තවත් කෙනෙක් විශ්වාස කරති. මේ සෑම මතවාදයක් පසුපසම පිළිගත හැකි තර්ක පවතී. එබැවින් සියල්ල සමාලෝචන කොට තීරණ ගැනීමේ වගවීම රජයට ඇත.

මානව හිමිකම් කවුන්සිලය මුලින්ම අපට එරෙහිව ඉදිරිපත් කළ චෝදනාව වූයේ වන්නි මානුෂීය මෙහෙයුමේදී සිවිල් වැසියන් ඝාතනය කර ඇත යන්නය. ඒ අනුව යුද්ධය මෙහෙයැවූ සෙන්පතියන් හා ඊට නායකත්වය දුන් දේශපාලකයන් ජාත්‍යන්තර අධිකරණයක් වෙත ගෙන යා යුතු යැයි කවුන්සිලය යෝජනා කළේය. මේ වන විට ඔවුන්ගේ චෝදනාව වන්නේ ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් වගවීමකින් ක්‍රියා කරන්නට ශ්‍රී ලංකා රජය උත්සුක වී නැත යන්නය. මෙවර මානවහිමිකම් සැසියට 46/L/1 යන චෝදනාව යටතේ මානවහිමිකම් පිළිබඳ වගවීම සම්බන්ධයෙන් යළිත් චෝදනා එල්ල කර ඇත. එංගලන්තය ඇතුළු රටවල් පහක් පැමිණිල්ලක් හැටියට එය ඉදිරිපත් කර තිබේ. අමෙරිකාව ද ඊට සහයෝගය දක්වන බව ප්‍රකාශ කර තිබේ.

ශ්‍රී ලංකා රජයේ හමුදා යුද්ධයක් ක්‍රියාත්මක කළේ ත්‍රස්තවාදී සංවිධානයකට එරෙහිවය. ත්‍රස්තවාදීන්ගේ ඉලක්කය වූයේ ප්‍රචණ්ඩත්වය ඔස්සේ රටේ භූමියෙන් කොටසක් අල්ලා ගැනීමය. ස්වාධීන එක්සේසත් රාජ්‍යයක් කැඩී වෙන් වී යන තෙක් රජයකට නිශ්ශබ්දව සිටිය නොහැකිය. රටේ ජාතික ආරක්ෂාව, සාමය හා එක්සේසත් බව ආරක්ෂා කිරීමට රජයක් බැඳී සිටී. ඊට අවශ්‍ය නීති ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇත. අමෙරිකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තුව හඳුන්වා දී තිබූ ආකාරයට ලෝකයේ මිලේච්ඡතම ත්‍රස්ත සංවිධානය එල්.ටී.ටී.ඊ. සංවිධානයයි. එබඳු සංවිධානයක් පරාජයට පත් කොට රටේ සාමය යළි ස්ථාපිත කිරීම වරදක් වන්නේ කෙසේ ද? එය වරදක් නම් ලෝක බලවතුන් ත්‍රස්තවාදයට එරෙහිව ගෙන යන ව්‍යාපාර සියල්ල ව්‍යාජයක් විය යුතුය.

අමෙරිකාවේ හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් යුක්ති සහගත අවංක නායකයකු ලෙස හැඳින්විය නොහැකි වුව ඔහුගේ ඇතැම් ප්‍රකාශවල ඇත්තේ ඍජු හා නිර්භීත භාවයකි. ඔහු ජිනීවා මානව හිමිකම් කවුන්සිලය හැඳින්වූයේ වැසිකිළි වළක් හැටියටය. මේ තත්ත්වය තවදුරටත් විග්‍රහ කරන ට්‍රම්ප් මානවහිමිකම් කවුන්සිලය කුහක හා ආත්මාර්ථකාමී දේශපාලන සංවිධානයක් ලෙස හඳුන්වයි. දෛවයේ සරදමකට මෙන් බටහිර නායකයන් විසින්ම එය විවේචනයට ලක් කරනු ලැබේ. ට්‍රම්ප් කවුන්සිලය විවේචනයට ලක් කළේ අමෙරිකාවට මානව හිමිකම් චෝදනා එල්ල කළ විටය. අමෙරිකාවට කිසිදු දඬුවමක් දීමට කවුන්සිලය සමත් වූයේ නැත. අමෙරිකාව ඉරාක ආක්‍රමණයේදී දස ලක්ෂයකට අධික සිවිල් වැසියන් ඝාතනයට ලක් කළ බව ප්‍රසිද්ධ කාරණයකි.

වන්නි මානුෂීය මෙහෙයුම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සත්‍ය වාර්තා නිරීක්ෂණය කරන්නට මානව හිමිකම් කවුන්සිලය උත්සුක වී නැත. කවුන්සිලයේ ප්‍රධානියා වන මිෂෙල් බැචලේට ශ්‍රී ලංකාව ගැන හෝ වන්නි මානුෂීය මෙහෙයුම ගැන හෝ ප්‍රමාණවත් අවබෝධයක් නැත. ඇය ක්‍රියා කරන්නේ දෙමළ ඩයස්පෝරාවේ, රාජ්‍ය නොවන සංවිධානවල හා බලවත් රටවල දේශපාලන නායකයන්ගේ බලපෑම්වලට අනුවය. තව අතෙකින් එල්.ටී.ටී.ඊ. සංවිධානය සිදු කළ මනුෂ්‍ය ඝාතන ගැන සොයා බැලීමක් කවුන්සිලය සිදු කර නැත. කොටි සංවිධානය ළමා සොල්දාදුවන් යුද්ධයට යොදාගත් ආකාරය පිළිබඳ නිරීක්ෂණයක් ද කවුන්සිලයට නැත. කවුන්සිලයේ ක්‍රියාකාරිත්වයෙහි ඇති දෙබිඩි ස්වභාවය මෙන්ම වංක භාවය ද ඉහත සිදුවීම්වලින් සනාථ වෙයි.

රජය මානව හිමිකම් අභියෝගය හමුවේ නිවැරැදි ලෙස ක්‍රියා කරගෙන යන බව පෙනෙයි. එහි පළමු පියවර වූයේ කවුන්සිලයේ වාර්තා ප්‍රතික්ෂේප කරමින් ඊට ක්ෂණිකව පිළිතුරු සැපයීමය. දෙවන පියවර වූයේ ශ්‍රී ලංකාව හා මිතුරු රටවල් සමඟ සාකච්ඡා කරමින් අභියෝගය ජය ගැනීමට සාමූහික ක්‍රියාවලියක් ආරම්භ කිරීමය. අද ශ්‍රී ලංකාවට එල්ල වන චෝදනා හෙට තවත් දුප්පත් රටකට එල්ල විය හැකිය. මීට මුහුණ දීම සඳහා නොබැඳි රටවල් සාමූහිකව ක්‍රියා කරන්නේ නම් වඩා වැදගත්ය. කොරෝනා වසංගත තත්ත්වය තුළ අන්තර්ජාතික සංවාද පැවැත්වීමට සිදු වී ඇත්තේ සීමා සහිත සන්නිවේදන පසුබිමකය. එය අපේ මෙහෙයුමට අවාසියකි. කෙසේ වුව මේ චෝදනා හමුවේ බිල්ලකු මවාගත යුතු නැත. එලෙසම චෝදනා සැහැල්ලුවෙන් බැහැර කළ යුතු ද නැත.

වත්මන් ආණ්ඩුව කවුන්සිලය හමුවේ දණින් වැටී ආයාචනය කරන තැනකට නොයෑම වැදගත් සිද්ධියකි. රටේ නිදහස හා ස්වාධිපත්‍යය ගැන සලකන නායකයන් මානව හිමිකම් කවුන්සිලය ළඟ දණින් වැටෙන්නේ නැත.




| | |
|---|---|
| පාඩම් කරපු දේ රඳවාගෙන | සිහියේ |
| යන විට විභාගෙට සඳුදා ලහි | ලහියේ |
| නොපෙනෙන හතුරා ද රඳවා ගත් | සිහියේ |
| දෙපසම කැපෙනවා දරුවනි දැළි | පිහියේ |

# කොවිඩ් නසන ලෝකයට සුබවාදී බලාපොරොත්තු



මහාචාර්ය
අජන්තා හපුආරච්චි



ලෝකයේ සිදුවන ඇතැම් දේ පිළිබඳව විද්‍යාත්මකවත් දාෂ්ටිවාදීවත් මිනිසාට විටෙක පැහැදිලි කරගත නොහැක. විවිධ කාලවලදී සිදුවන මෙවැනි විපත් අවබෝධකොට ගත නොහැකි තැන ඒවා දේවත්වයට භාර කරන්නේ ඒ නිසාය. කෙසේ නමුත් වර්තමාන ලෝකයේ මිනිසාට හෙට දිනක් පිළිබඳව සිතිය නොහැකි තරමට වසංගතය ලෝකයම වෙළාගෙන ඇත. නමුත්, නාසා ආයතනයේ න්‍යෂ්ටික අත්හදා බැලීම් හෝ පර්යේෂණ කිරීම් නැවතී නැත. ඒ අතර Analytics Insight සඟරාවේ පළකර තිබූ නූතන ලෝකය පිළිබඳ කරුණු අප දැනගත යුත්තේ ඒවා හඹා යාමට නොව ලෝකයේ සිදුවන දෑ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම පිණිසය. ඒ එම කරුණු තවත් නොබෝ දිනකින්ම අප ජීවිතවලටද බලපාන බැවිනි. ගෝලීයකරණය පසුපසට විසිවී ගියද නව මුහුණුවරකින් එය ලෝකය යළි එකතු කරන බැවිනි.

## ■ අභියෝග ජය ගැනීම

වත්මන් ලෝකයේ රටවල ප්‍රමුඛස්ථානය යොමුවී ඇත්තේ සෞඛ්‍ය ආර්ථිකය හා අධ්‍යාපනය කෙරෙහිය. වර්තමානයේ ලෝකයේ රටවල් අතර පවතින්නේ වෙළෙඳ යුද්ධයකි. කිසිදු රටක් වෙනත් රටක් යටත් කර ගැනීමට හෝ ඒවාට විරුද්ධව යුද්ධ කිරීමට වෙහෙසෙන්නේ නැත. කොවිඩ් නිසා වැනසුණු රටත් ජනතාවත් නඟා සිටුවීමට, සාමූහිකත්වය මානුෂීය ආධාර පෙරට පැමිණ ඇත. යුනෙස්කෝ ආයතනය දරුවන්ගේ අධ්‍යාපයනය ලැබීමේ අයිතිය මතක් කරන අතර අධ්‍යාපනය ශක්තිමත් කිරීම කෙරෙහි කරුණු 9 කින් පෙන්වා දී ඇත. එහිදී සෑම රජයක්ම මෙන්ම ගුරුවරුද මේ කාර්යය කරට ගත යුතු බවත් රජයන් විසින් හා ලෝක මට්ටමෙන් එකිනෙකාට උපකාර කළ යුතු බවත් පෙන්වා දී ඇත. අන්තර්ජාල පහසුකම් හා සෞඛ්‍ය පහසුකම් සඳහා රජයන් ප්‍රමුඛත්වයක් දිය යුතු අතර පාඨමාලා කාලානුරූපව වෙනස් කිරීමේ අයිතිය රටවලට ලබා ගත යුතු බව පෙන්වා දී තිබේ. මෙහි මුඛ්‍යාර්ථය ලෙස අධ්‍යාපනය නවීකරණය කළ යුත්තේ මානව යහපැවැත්මට මුල්තැන දෙමින් බව මෙසේ සඳහන් කර ඇත. Renewal of education-human and well being priority.

විශේෂයෙන් අපට සතුටු විය හැකි ප්‍රධාන කරුණක් එහි සඳහන් වන ආකාරයට සුබවාදී බලාපෙරොත්තුවකි. එංගලන්තයේ වෛද්‍ය පර්යේෂණ ආයතනයක් විසින් පිළිකාව නිශ්චිතවම සොයා ගැනීම සඳහා සුහුරු ඉදිකටුවක් Smart Needle නමින් සොයාගෙන ඇති අතර පිළිකාවට මෙතෙක් නොඇසූ සහනයක් ලෙස Custom Cancer Vaccines නමින් සාර්ථක එන්නතක් සොයාගත් බව වාර්තා වේ. එසේම ඉබෝලා වයිරසයෙන් පසුව බෝවන රෝග මූලයන් පැහැදිලි කර ගැනීම අසීරු වී ඇති අතර රෝගය පාලනය කර ගැනීමටත් අඩුකර ගැනීමටත් හැකිවී ඇත. වර්තමානයේ ලෝකයම ප්‍රධාන අවධානය යොමුකර ඇත්තේ ජනතාවගේ සෞඛ්‍ය කෙරෙහිය. අප රටටද මෙවැනි සොයා ගැනීම් කවදා හෝ ඵලදායක ඒවාය.

## ■ නිදහස් වෙළෙඳාම

වඩාත් සතුටු විය හැකි කරුණු අතර ලෝක ආර්ථිකයේ බලපෑම සිදුකළ නිදහස් වෙළෙඳාම Free Market End රට රටවලට අදාළ ලෙස අවසානයකට පැමිණ ඇති බව කියැවේ. ඒ වෙනුවට බහු සැපැයුම් ජාලයක් Multi-Tire Supply Chains ගැටගැසී ඇති අතර බහුපාර්ශ්වීය ගිවිසුම් නව මුහුණුවරක් ගෙන ඇති බවට කදිම නිදසුන් වන්නේ මෑතකදී චීනයත් යුරෝපයත් මෙන්ම රුසියාවත් ජපානයත් ඇති කරගත් වෙළෙඳ ගිවිසුම් දෙස බලන විටය. ශ්‍රී ලංකාවේ මෑතකදී සිදු වූ වරායේ නැගෙනහිර ජැටිය පිළිබඳව අපට දුක් වන්නට සිදු වන්නේ මතු දිනෙක එය පාඩු ලබමින් නඩත්තු කළ නොහැකි විටෙකය. එහිදී බහු සැපැයුම් ජාලගතව ඉන්දියාව සමඟ කළ ගනුදෙනුව පිළිබඳව අපට වැටහෙන්නේ පසුවටය. දැනට ශ්‍රී ලංකාවද දේශීය ආර්ථිකය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සතුටට කරුණකි. ඒ අනුව පූර්ණ ආර්ථිකයම දේශීයත්වය මත රඳා පැවැතෙන බවක් නොකියැවේ. මීටම සමගාමීව කාර්යාලවල සිදුවී ඇති හා මතුවට සිදුවන දෑ පිළිබඳ අප රටවලටද කිසියම් ඉඟියක් සපයයි. වර්තමානයේ වැඩපළ විශාල ප්‍රමාණයක් වැසී ගොස් ඇති අතර ඒ සඳහා ගෙදර සිට වැඩ කිරීම Teleworking සේවකයන් අඩුකර ගැනීම අවශ්‍ය සේවකයා පමණක් කැඳවීම-on demand වැනි සිදුවීම් අනුව වැඩපළ workplace යන සංකල්පය සහයෝගිතා මධ්‍යස්ථාන-Collaboration Hub බවට පත්වී ඇති බව පෙන්වා දේ. එහි සේවකයාට දක්ෂතා වර්ධනය කර ගත යුතු වන-up-skills අතර ශඛ්‍යතා යළි වර්තමානයට Re-skills ගළපා ගත යුතු වනු ඇත.

## ■ නව ආකෘති

ගම්බද ප්‍රදේශවල වෙනම ක්‍රමයක ශ්‍රම බළකායක් work force බිහිවනු ඇත. රොබෝ සේවාව බෙහෙවින් යොදා ගන්නා අතර මහා ව්‍යාපාර වන Air lines, Hospitals, Education පමණක් නොව සිල්ලර කර්මාන්තවල පවා නව ආකෘති new modles transformation වලට ගමන් කිරීමක් ඇරඹී ඇත. කොවිඩ් වසංගතය හමුවේ වැසුණු කර්මාන්තශාලා හා නව කර්මාන්තශාලා මීට කදිම නිදසුන් වේ. ශ්‍රී ලංකාවේ මෑතකදී රබර් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම නව කර්මාන්ත පිළිබඳ ඉඟියක් සැපැයේ. මෙහිදී විශ්ෂයෙන්ම රජයත් කර්මාන්තශාලා හිමියනුත් සොයා ගත යුතු කරුණ වන්නේ මේ රටේ තිබුණු ටයර් නිෂ්පාදන කර්මාන්තය වැනසුණේ ඇයිද යන්නය. ඊට හේතුව මෙසේ මහා පරිමාණයෙන් ආරම්භ කරන කර්මාන්තශාලා ද ඒ තත්ත්වයට වැටීමට ඉඩ නොදී මතුවටත් රැක ගැනීම පිණිසත් විදේශ විනිමය පමණක් නොව මෙරට රැකියා අභිමිවූවන්ට මේවා මහා අස්වැසිල්ලක් වන බැවිනි.

අප කැමැති වුවද නොවුවද අංකිත තාක්ෂණය සෑම අංශයක්ම ආවරණය කරනු ඇත. 2011 පටන් සංඛ්‍යාංක විභේදනය Digital Divide ලෙස අප සලකන ඇති නැති පරතරය රාජ්‍ය මැදිහත්වීම් මත වෙනස් කිරීමට සිදුවේ. මේ තත්ත්වය හඳුන්වන්නේ Digital Transformation Journey යනුවෙනි. මෙහි වඩාත් භාවිත වන පරිගණකය නවතාවකින් IBM සමාගම නිපදවා ඇත්තේ සුපිරි පරිගණකය හෙවත් Super Computer/Quantum යනුවෙනි. මෙහි ඇති විශේෂත්වය වනුයේ මෙතෙක් අප ආයතනයකට හෝ මධ්‍යස්ථානයකට දත්ත රඳවනයක් ස්ථාපනය Install කරගැනීම නොමැතිව ඒ පරිගණක ඇසුරේම ඒවා පැවැතීමයි -Cloud service on-premise යනුවෙන් මේ තත්ත්වය හඳුන්වා ඇත ඒ අනුව දැනට විශ්වාසය පිළිබඳ ගැටලුව ලිහා Bitcoins භාවිතය ප්‍රචලිත වනු ඇත.

දැනට පවතින පහසුකම් තවදුරටත් වැඩි කරන smart home technology සංකල්පයට අනුව ගෙවල් ඇතුළේ සිටම බොහෝ දේ කරගත හැකි වනු ඇත. 5G internet පහසුකම් මීළඟ පරපුරට ලැබෙනු ඇත. සංඛ්‍යාංක තාක්ෂණය වඩාත ඵලදායී මානව ජීවිතවලට කෙරෙන ආදේශය ආහාර නිෂ්පාදනය හා ස්වාභාවික ක්‍රම වෙත මිනිසා ගමන් කරවීමයි. දැනටමත් ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආහාර රටා සඳහා යන මානව ගමනක් ආරම්භ කර ඇත.

## ■ මානව පරිණාමය

කෘත්‍රිම ආහාර අභාවයට යනු ඇත. මිනිසා මේ සඳහා දැනටමත් Green pressure යන සංකල්පයක් බිහිකර ඇත. මීළඟ පරපුරේ භාවිත වන මොබයිල් දුරකතනයේවත් කාබන් චිපයක් දැකිය නොහැක. වෙනෙකක් තබා දැනටමත් උඩුගුවනේදීවත් ගුවන්යානාවලින් පරිසරයට හානි නොවීමට නව ක්‍රම භාවිත වන අතර දුම්රියවලදී පවා ඒවා වෙනස්වන ක්‍රම වන දුම් පරීක්ෂණ ක්‍රම Offset flight-related co2 emissions /Offset carbon emission යනුවෙන් බටහිර රටවල දැනටමත් ආරම්භ කර ඇත.

අප මෙතෙක් විශ්වාස කොට ඇත්තේ මානව පරිණාමයේදී මානව පවුල් ගසට අනුව- Human Family Tree නියැන්ඩතාල් මානවයා ජර්මනියෙන් සොයාගත් ෆොසිලවලට අනුව මුලින්ම යමක් ලිවීමට උත්සාහ කළ මානවයා වශයෙනි. ඒත් මෑතකදී ප්‍රංසයේ BRUNIQUEL නම් ගුහාවලින් එවැනි මානවයෙක් ජීවත් වූ බවට සාධක සොයාගෙන ඇත. ඒ නිසා මානව පවුල් ගසේ කිසියම් සෙලවීමක් සිදුව ඇතැයි පුරාවිද්‍යාඥයන් සොයාගෙන ඇත. මේවා අපට වැදගත් වන්නේ පුරාවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේදීය. ඒ ලෙසම ඩී.එන්.ඒ -පර්යේෂණවලටද එහි බලපෑම නිසා මේ සොයා ගැනීම entering the Criptera ලෙස හැඳින්වීමට පටන් ගෙන ඇත. ලෝකයේ සිදුවන කොවිඩ් ව්‍යාප්තියත් සමඟ මේ පර්යේෂණ දත්ත මානව විද්‍යාඥයන්ගේ ගමනේ නව මං විවර කර ඇති බවත් කියැවේ.

මෙතෙක් නූතනය සමඟ පමණක් ජීවත්වූ මිනිසා වේගයෙන් සමාජවාදය කරා යන බවත් මේ වාර්තාවලින් පෙන්වා දේ. ඊට හොඳම නිදසුන වන්නේ ලෝකයේ මහා න්‍යෂ්ටික බලවතෙකු වන ඇමරිකාවම ඒ සඳහා ආරම්භක පියවර ගෙන තිබීමයි. වොෂින්ටනයේ fission plan යනුවෙන් න්‍යෂ්ටික අත්හදා බැලීම් කුඩා ප්‍රමාණයකට පත්කර ඇති අතර මානව යහ පැවැත්ම well-being human යන්නත් මානව චින්තනයේ සිතන ආකාරයේ-new mindsets නවතාවක්ද වෙනසක්ද ඇතිවී තිබේ. මින් පසු ලෝකයේ මිනිසා එකිනෙකාට උපකාර කරන ලෝකයක් මිස අභියෝග කරන යුගයක් යළි නොඑනු ඇත.

## ■ උගත හැකි පාඩම්

එය මානව යහපැවැත්ම උදෙසා බිහිවන සාමුහික සමාජ වගකීමක් ලෙස-Corporet social responsibility and well-being of the people ලෝක සමාජය ගොඩ නැගෙමින් පවතී. මෙහිදී වරක් සමාජ විද්‍යාඥයකු වන AAZINOCIC ගේ ප්‍රකාශයක් මතක් කළ යුතුය. එනම් සමාජවාදය හෝ කොමියුනිස්ට්වාදය නිර්මාණය වන්නේ ද්‍රව්‍යමය සම්පත් හා භාණ්ඩ පරිභෝජනයේ උපරිම මට්ටමකදී නොව මිනිස් ප්‍රජාවේ පැවැත්ම තීරණාත්මක දුෂ්කර අභියෝගයන්ට මුහුණදෙන විටෙක සමාජ ජීවිතය ප්‍රතිනිෂ්පාදනය හා සංරක්ෂණය කරලීමේ මාදිලියක් ලෙසය" යන්න අදට කෙතරම් සමීපදැයි පසක් කරන බැවිනි.

සංවර්ධිත යැයි මෙතෙක් හඳුනාගෙන තිබූ රටවලට කොවිඩ් වසංගතය කුඩා රටවලට වඩා දරුණු ලෙස ඉගැන්වීමක් කර ඇත. චීනය මෙතෙක් පරිසරයට කාබන් මුදාහරින ප්‍රධාන රටක් ලෙස තවදුරටත් නොපැවැතීමට එරට තීරණය කර ඇතතේ ලෝකයට සිදුවූ හානියේ ආරම්භක රට චීනය යන්න අවබෝධකොට ගැනීම නිසා විය හැකිය ස්වාභාවික ආහාර රටාවලටත් නිවාසවලටත් green pressure සංකල්පය යටතේ ගමන් අරඹා ඇත දේශපාලනික වශයෙන් රට රටවල පැවැති ආරාවුල් මතුවට වෙනත් ස්වරූපයක් ගනු ඇත. ලෝකයේ රටවල් මෙයින් මෙසේ විවිධ පාඩම් උගතද අප රටේ දේශපාලන ක්ෂේත්‍රයේ පවතින පරාධීන අදහස් තිබෙනතුරු මේ පිළිබඳව අපට සතුටු විය නොහැක අතළොස්සක් දෙනා පමණක් ලෝකයේ නව තත්ත්වය පිළිබඳ දැන සිටියද බහුතරය තවමත් සිටින්නේ මීට දශක දෙකතුනකට පෙර යුගයේ වීම කනගාටුවට කරුණකි. මීළඟ පරපුර හෝ දේශපාලනයෙන් තොරව රට පිළිබඳ සිතුවහොත් ලෝකය සමඟ නව ලෝකය රැගෙන පෙරගමන් යා හැකිය.



# අපේ අරමුණ දේශීය ආර්ථිකය පණගැන්වීමයි



**වසන්ත යාපා බණ්ඩාර**
නීතීඥ, පාර්ලිමේන්තු මන්ත්‍රී
මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති

ලෝකයම මුහුණ දී තිබෙන බරපතළ අර්බුදයක් සේ සැලකෙන කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ද ආර්ථිකය සහ සමාජය යම්කිසි පසුබෑමකට ලක්ව තිබේ. එවැනි තත්ත්වයක් තුළ අනාගත පරපුරේ යහපත වෙනුවෙන් ක්‍රියාත්මක උපකාරක පන්ති ආරම්භ කිරීම මෙන්ම යහපත් ආර්ථිකයක් ගොඩනැංවීම වෙනුවෙන් රජය ගෙන තිබෙන ක්‍රියාමාර්ග සහ වත්මන් ආණ්ඩුවේ අනාගත සැලසුම් සම්බන්ධයෙන් මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී, නීතීඥ වසන්ත යාපා බණ්ඩාර මහතා සමඟ කළ සංවාදයකි මේ.

● **කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට තුළ පවතින තත්ත්වය සැලකිල්ලට ගැනීමේ දී උපකාරක පන්ති ආරම්භ කිරීම කාලෝචිත ද ?**

උපකාරක පන්ති ආරම්භ කිරීම සම්බන්ධයෙන් අපි බැසිල් රාජපක්ෂ මහතා සමඟ මුලින්ම සාකච්ඡා කළා. එතුමා තමයි අපිව උනන්දු කළේ. බැසිල් රාජපක්ෂ මහතාට මේ රටේ ආර්ථිකයේ පුබුදුවාලිය යුතු අංශ සම්බන්ධයෙන් ප්‍රබල වුවමනාවක් තිබෙනවා. මටත් කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රී ගුණපාල රත්නසේකර මහතාටත් කතා කරලා සාකච්ඡා කළා. කොහොමද උපකාරක පන්ති ක්ෂේත්‍රය යළි පණ ගන්වන්නේ, කියා සාකච්ඡා කළා. එහිදී අපිව අගමැති මහින්ද රාජපක්ෂ මහතාට සම්බන්ධ කළා. පාර්ලිමේන්තුවේ දී අගමැතිතුමා සමඟ කිහිප දෙනෙකු සම්බන්ධ වී මේ ගැන සාකච්ඡා කළා.

හමුදාපතිවරයා සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ මේ සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කළා. උපකාරක පන්ති ක්ෂේත්‍රයට අදාළ සංගමයේ නිලධාරීන් සමඟ ද සාකච්ඡා කළා. පසුව මේ තත්ත්වය තාක්ෂණික කමිටුව වෙත යොමු කළා. ඒ අනුව තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු නිලධාරීන් මේ තත්ත්වය තාක්ෂණික වශයෙන් ආරම්භ කළ යුතු ආකාරය සම්බන්ධයෙන් සාකච්ඡා කළා. කරුණු දෙකක් සම්බන්ධයෙන් එහිදී අවධානය යොමු කළා. ඔන්ලයින් ඔස්සේ පන්ති පවත්වාගෙන යාම පිළිබඳව කතා කළා. ඔන්ලයින් ඩේටාවලට සහනයක් ලබාදෙන්නේ කෙසේ ද, පිළිබඳ අපි අවධානය යොමු කළා. අන්තර්ජාල පහසුකම නොමැති පළාත්වලට මෙය ලබාදෙන්නේ කෙසේ ද කියා බැලුවා. පන්තියක මීටරයක දුරස්ථභාවය පවත්වා ගැනීම ගැන කතා කළා. ජනාධිපතිවරයා යම් ප්‍රශ්නයක් විසඳන්න දරන උත්සාහය අපි දැක්කා.

● **දරුවන් සමූහයක්, ගුරුවරුන් සමූහයක් එක්වරම ගෙනවිත් පන්ති පටන් ගන්න බැහැ. කොවිඩ් එන්නත ලබාදිය යුතු බවට ඔවුන් සඳහන් කරනවා?**

සරලව ගැටලු විසඳන්න බැහැ. කොවිඩ් 19 සංකීර්ණ ප්‍රශ්නයක්. අමෙරිකාවටත් විසඳන්න නොහැකි වූ ප්‍රශ්නයක්. ජනාධිපතිතුමා මේ තත්ත්වය මනාව කළමනාකරණය කරගෙනයි යන්නේ. මෙතන දී තාක්ෂණ අමාත්‍යාංශයේ සාකච්ඡාවෙන් පසුව උපකාරක පන්ති නැවත සක්‍රිය කරන්න අවශ්‍ය මට්ටමට පැමිණ තිබෙනවා. මේ සම්බන්ධයෙන් තවදුරටත් පවතින ගැටලු සාකච්ඡා කරන්න අවධානය යොමුව තිබෙනවා.

● **සෞඛ්‍ය අංශ නිර්දේශ කර තිබෙන මාර්ගෝපදේශ අනුව උපකාරක පන්ති ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කළත් ගුරුවරුන්ගෙන්, සිසුන්ගෙන් ඒ සඳහා අපේක්ෂා කරන සහයෝගයක් ලැබෙයි ද ?**

මේ අවස්ථාව සරල සමාජ ආර්ථික තත්ත්වයක් නොව සංකීර්ණ තත්ත්වයක්. අපිට කොරෝනා සම්බන්ධයෙන් නිශ්චිත සහතිකයක් දෙන්න බැහැ. වයිරසයේ වෙනස් වීම, නව ආසාදන තත්ත්වයන්ට යොමුවීම ආදිය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී මෙකට සියයට 100ක සාර්ථක එන්නතක් දෙන්න බැහැ කියලා තමයි ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන්නේ. ෆයිසර්, ස්පුට්නික් 5 ඇතුළු එන්නත් වර්ග සියයට 100ක් සාර්ථක නැහැ. ලෝකයේ ඇතැම් රටවල මේ එන්නත ලබාදීලා ආසාදිත තත්ත්වයන් නැවත ඇතිව තිබෙනවා. ඒ නිසා නිශ්චිත විසඳුමක් තිබෙනවා කියලා කිසිවෙකු මේ තත්ත්වය තේරුම් ගත යුතු නැහැ. අපේ ගුරුවරුන් මේ තත්ත්වය තේරුම් ගන්නවා ඇති. මේ අභියෝග තත්ත්වයක් නිසා මෙහිදී අපිට අවධානමක් තිබෙනවා නැවත පන්ති වසා දමන්නේ නම් ගැටලුවක් වෙන්න පුළුවන්. දරුවන්ගේ සෞඛ්‍යය තත්ත්වය පිළිබඳ සියලු ගුරුවරුන්, ආයතන හිමියන්ට දැවැන්ත වගකීමක් තිබෙනවා.


සෑම මොහොතකම ඒ සම්බන්ධයෙන් අවධානය යොමු විය යුතුයි. එසේ නොවන්නේ නම් ජාතියට ලොකු පාඩුවක්. මේ ගැන දෙමාපියන් ද දරුවන්ට මේ අවධානම් තත්ත්වය කියා දිය යුතුයි. අගමැති මහින්ද රාජපක්ෂ මහතා දරුවන්ගේ අතින් අල්ලාගෙන පාසල් ගියාට පසුව තමයි දෙමාපියන් චකිතයකින් තොරව දරුවන් පාසල් එවන්න පටන් ගත්තේ. පුද්ගලික උපකාරක පන්ති ක්ෂේත්‍රය පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ආණ්ඩුව පැවසූ පරිදි පන්ති කටයුතු ආරම්භ කළා. දෙමාපියන් සහ දරුවන් මේ අවස්ථාවේ පන්තිවලට යොමු වීමේ දී කල්පනාවෙන් කටයුතු කළ යුතුයි. මේ තත්ත්වය තුළ විවිධ ක්ෂේත්‍රයන් පීඩාවට පත්ව තිබෙනවා. අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසු පුද්ගලික උපකාරක පන්ති සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තිබුණා.

● **ලෝකය පුරාම කොවිඩ් 19 වසංගතය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී තිබෙනවා. වසංගතයට එරෙහිව ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් සෑහීමට පත්විය හැකි ද ?**

කොවිඩ් 19 ගැටලුව තිබෙන රටවල හැම කෙනාම සබුද්ධිකව මේ තත්ත්වය තේරුම් ගතයුතුයි. මම මේ ගැන කතා කරන්නේ උද්දාමයෙන් නොවෙයි. මෙය ඉතාම සංකීර්ණ සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයක්. මේ අවස්ථාවේ බොරදියේ මාළු බාන එක හරිම ලෙහෙසියි. කොවිඩ් එක විසඳුවේ නැහැ නේද ? උත්තරයක් නැහැ නේද? ෆේල් නේද කියා ප්‍රශ්නයක් අහන එක පෘතග්ජන පුද්ගලයෙකුට ලෙහෙසියෙන් කළ හැකි දෙයක්. නමුත් මේ ලෝක තත්ත්වය හමුවේ දිනපු රටක් නැහැ. මේ තත්ත්වය තුළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පුද්ගලික උපකාර පන්ති ක්ෂේත්‍රය යළි පණ ගන්වන්නට සාකච්ඡා වාර කිහිපයක් පැවැත්වූවා. මෙය වෛද්‍ය තාක්ෂණික ගැටලුවක්. වෛද්‍ය තාක්ෂණික ගැටලුවකට ජනාධිපතිතුමාට දේශපාලන තීන්දුවක් දෙන්න බැහැ. එතුමා අදාළ වෛද්‍ය, තාක්ෂණික නිලධාරීන් සමඟ සාකච්ඡා කොට තමයි මේ ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කරන්නේ. එතන දී සාමාන්‍යයෙන් පී.සී.ආර් පරීක්ෂණ සඳහා දවසකට රුපියල් මිලියන 100ක් පමණ වියදම් කරනවා.

පසුගිය මාස නවයක කාලයේ දී පී.සී.ආර් පරීක්ෂණ වෙනුවෙන් රුපියල් බිලියන 100ක් වියදම් කර තිබෙනවා. විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයන් ද මෙරටට ගෙනවිත් නිරෝධායනය කරලා අවශ්‍ය පහසුකම්, වෛද්‍ය ප්‍රතිකාර නොමිලේ ලබා දෙනවා. නොමිලේ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යනවා. මේ කටයුත්තට රජය දැනටත් රුපියල් බිලියන 13ක් වෙන්කර තිබෙනවා. විපක්ෂය මේ වෙලාවෙන් වගකීමෙන් ක්‍රියාකිරීම අවශ්‍යයි. මෙය ආණ්ඩුවට, මහජනතාවට, කිසියම් සංවිධානයකට තනිව විසඳන්න බැරි ජාත්‍යන්තර අර්බුදයක්. ඒ වෙලාවේ දේශපාලන පාට කණ්ණාඩි ඉවත් කරලා අපි සාමූහිකව කටයුතු කළ යුතුයි. නමුත් විපක්ෂය කටයුතු කරන ආකාරය අපි දන්නවා. යුද්ධය පැවැති කාලයේ ඔච්චම් කළ ආකාරය අපිට මතකයි. පාමංකඩ, මැදවච්චිය ගිය හැටි ඕන ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියා පැවසූ ආකාරය අපි දන්නවා. මේවා මතක් කරනවිට ලක්ෂ්මන් කිරිඇල්ල මහතාට දුකක් ඇති වෙන්නේ නැද්ද. රවී කරුණානායක මහතාට දුකක් ඇති වෙන්නේ නැද්ද.

එදා යුද්ධයේ දී වචනයකින් හෝ සහාය දුන්නේ නැහැ කියලා. අපි දැනුත් කියනවා මේක ජාත්‍යන්තර අර්බුදයක්. මේ ජාත්‍යන්තර අර්බුදය හමුවේ අපි කටයුතු කළ යුත්තේ කෙසේද. ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග වෙනුවෙන් විශාල පිරිසක් සහාය දෙන්න කැමැතියි. කොවිඩ් සම්බන්ධයෙන් වන එන්නත් වර්ග 5ක් කෙරෙහි සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානය යොමුව තිබෙනවා.



## කොවිඩ් 19 ප්‍රශ්නය ලෝකයේ කිසිම රටක් සියයට 100ක් විසඳාගෙන නැහැ

## ශ්‍රී ලංකාවේ ආර්ථිකය යනු ලෝක ආර්ථිකයේ කොටසක්

## මේ අවස්ථාවේ බොරදියේ මාළු බාන එක හරිම ලෙහෙසියි

● **කොවිඩ් වසංගතය මෙරටින් තුරන් කිරීමේ වැඩපිළිවෙළේ දී රජය අනුගමනය කර තිබෙන වැඩපිළිවෙළ ප්‍රමාණවත් නැහැ, නිසි අවධානයක් යොමුකර නැතැයි විපක්ෂයෙන් චෝදනා එල්ල වෙනවා නේද?**

කොවිඩ් 19 ප්‍රශ්නය ලෝකයේ කිසිම රටක් සියයට 100ක් විසඳාගෙන නැහැ. මේ සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා. එකක් තමයි ඇමෙරිකාව, ඉන්දියාව වගේ ඕන කෙනෙකුට හැදෙන්න කියා අතහැර දාන්න පුළුවන්. දෙවැනියට අපිට පුළුවන් රටම හුදෙකලා කරන්න. අනිත් එක තමයි නව සාමාන්‍යය. අපි කෙසේ හෝ මේ සම්බන්ධයෙන් පියවර ගතයුතු වෙනවා. නමුත් කැමැති වුණත් අකමැති වුණත් කොවිඩ් 19 එක්ක ඉදිරියට කටයුතු කරන්න වෙනවා. ඇතැමුන් කියනවා මුලින්ම ගුවන් තොටුපළ වැසුවානම් හරිනේ කියලා. මුලින්ම හුදෙකලා කළා නම් හරිනේ කියලා. රටේ අවසන් කොවිඩ් රෝගියා තෙක් අපිට අවදානමක් තිබෙනවා. ලෝකයෙන් මෙය තුරන් වනතුරු ඒ ගැන අවදානමක් තිබෙනවා. මෙය මර්දනයට හා විසඳුම් ලබාදෙන්න හොඳ නායකත්වයක් ලබාදිය යුතුයි.

● **කොවිඩ් වසංගත තත්ත්වය තුළ සෞඛ්‍ය අංශවලින් සහ ආරක්ෂක අංශවලින් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් ද?**

කොවිඩ් 19 මර්දනය වෙනුවෙන් කමිටුවක් තිබෙනවා. එහි ප්‍රධානියා යුද හමුදාපතිවරයායි. යුද හමුදාව නිරෝධායන කාර්යයට අදාළව විශාල සේවාවක් ලබා දෙනවා. සෞඛ්‍ය අංශය ද තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලනවා වෙනුවට මේ වසංගතය පාලනය වෙනුවෙන් තම දායකත්වය ලබා දෙනවා. ඒ වගේම අලුතින් තාක්ෂණික ඒකකයක් ස්ථාපිත කර තිබෙනවා. සෑම අංශයක්ම බල ගන්වන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. මේ වෙනුවෙන් රාජ්‍ය අංශයේ දායකත්වය ලබා දෙනවා.

● **පවතින තත්ත්වය තුළ ආර්ථික වශයෙන් ශ්‍රී ලංකාව පසුබෑමට ලක්ව තිබෙනවා. මේ තත්ත්වය තුළ ඉදිරියට යාම සඳහා පවතින රජයේ වැඩපිළිවෙළ කුමක් ද?**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය යනු ලෝක ආර්ථිකයේ කොටසක්. එවිට ලෝක ආර්ථිකයේ පසුබෑමක් තිබිය දී අපිට ප්‍රවර්ධනයක් ලබා ගන්න පුළුවන් නම් එය යහපත්. නමුත් අපිට විතරක් මේක කරන්න බැහැ. ලෝක ආර්ථිකයේ පසුබැසීමත් එක්කම තමයි අපේ ආර්ථිකය නගාසිටුවන්න වෙන්නේ. ලෝක ආර්ථිකයට ද අපිට ආදර්ශ දෙන්න වෙනවා. දේශීය ආර්ථිකය පණගන්වන්න අවශ්‍ය වෙනවා. ආර්ථිකය නගාසිටුවීමේ දී ජාත්‍යන්තර වශයෙන් විසඳුමක් නොලැබෙන්නේ නම් දේශීය වශයෙන් ආර්ථිකය ශක්තිමත් කරනවා. වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ සියලු කොටස් මිල දර්ශකය ඉතිහාසයේ වැඩිම අගයක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. මේ කොටස් වෙළෙඳපොළ රටේ ආර්ථිකය පිබිදෙනවා ද කියන එක නිර්ණායකයක්. අපිට ජාතික ආර්ථිකයට බාධා කරමින් කෘතීම තත්ත්වයක් මවන්න අවශ්‍ය නැහැ. මේ වනවිට ඉදිකිරීම් ක්ෂේත්‍රය යළි පණගන්වා තිබෙනවා. දේශීය නිෂ්පාදකයන් නිෂ්පාදන ආරම්භ කර තිබෙනවා. ඒ නිසා ක්‍රමානුකූලව ජනතාව අතරට මුදල් ගලාගෙන යන තත්ත්වයක් තිබෙනවා. ආර්ථිකයට මූල්‍ය ප්‍රසාරණයක් කරන්න මේ වනවිට රජය පියවර ගෙන තිබෙනවා. ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය ඉහළ ගොස් තිබෙනවා.


● **කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ගැන බොහෝ දෙනෙක් කතා කළා ?**

අපි ආණ්ඩුවක් ලෙස වරාය විකුණන්න යනවා කියලා රට ගිනි තියන්න හදපු පුද්ගලයන්ට විශේෂ යමක් කියන්න කැමැතියි. ජාතික සම්පත් විකුණන්නේ නැහැයි පොරොන්දුවක් දීලා තමයි අපි බලයට ආවේ. දේශීය සම්පත් සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කරන්නේ ඉතාම වගකීමෙන්. ජනාධිපතිවරයා බලයට පත්වෙලා මේ දක්වා කාලය තුළ එක බිම් අඟලක් හෝ විදේශ රටකට හෝ විදෙස් සමාගමකට විකුණා තිබෙනවා නම් මම පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයෙන් ඉවත් වෙනවා. එතුමා වරාය සම්බන්ධයෙන් පුබුදුවාලීමක් කරන්නයි උත්සාහ කළේ. අපේ රටේ වරායට භූ දේශපාලනික වශයෙන් තිබෙන වැදගත්කම එතුමා හොඳින් දන්නවා. ලංකාවේ වරාය පහසුකම හා වැදගත්කම ඉන්දියාවට නැහැ. ඇතැම් වරායවල්වලට යම් නැව් ප්‍රමාණයක් ගේනවා ඇති. ඒ කිසිඳු වරායකට විශාල නැව් ගේන්න බැහැ. අපේ තරම් ගැඹුරු වරායක් නැහැ. ඒ නිසා ඔවුන්ට වරාය වාසියක් නැහැ. ඒ වරාය වාසිය තිබෙන්නේ කොළඹ වරායටයි.

● **ජනතා අපේක්ෂාවන් ඉටුකරමින් රට සංවර්ධනය කිරීම සඳහා රජයේ ඉදිරි සැලසුම් මොනවා ද ?**

රජයක් ලෙස සෑම ග්‍රාම සේවා වසමකම ඉල්ලුම ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනවා. සමස්ත ආර්ථිකයම දියුණු කරන්න අපේක්ෂා කරනවා. බැසිල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් "ගම සමඟ පිළිසඳරක්" වැඩ සමඟ යළි ගමට වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වෙනවා. ගම්වලින් සංවර්ධන යෝජනා ලබාගෙන ඒවා ක්‍රියාත්මක කරනවා. සමාජ, ආර්ථික පහසුකම් වගේම රැකියා උත්පාදනය, ජීවනෝපාය වැඩසටහන්, දේශීය කර්මාන්ත නගාසිටුවීම, කෘෂිකර්මය නගාසිටුවීම ආදිය සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා.

**මහින්ද අලුත්ගෙදර**
**ඡායාරූප - විමල් කරුණාතිලක**




# අතීතයෙන් වත්මනට

ශ්‍රී ලංකාව අනාදිමත් ප්‍රෞඪ ඉතිහාසයකින් යුත් රටකි. අතීතයේ ඉතා සෞභාග්‍යමත් සහ සශ්‍රීක රටක් ලෙස මෙරට පැවතුණු බවට පුරා විද්‍යා නටබුන් අදටත් සාක්ෂි දරයි. ලෝකය දියුණුවෙන් දියුණුවට පත්වෙද්දී තාක්ෂණික දියුණුව ඔස්සේ බොහෝ රටවල් ළඟා කරගත් තැන්, ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ මෙයට බොහෝ කලකට පෙරම සාක්ෂාත් කරගෙන ඇති බව සීගිරිය වැනි විශිෂ්ට නිර්මාණ ජීවමාන සාක්ෂි බවට පත්වෙමින් ලෝකයට නිරාවරණය කරමින් තිබේ.

දේශීය ආහාර පාන සහ බෙත් හේත් ආදිය හේතුවෙන් ශක්තිමත් සහ නිරෝගී ප්‍රජාවක් ලෙස ජීවත් වන්නට ආදි ශ්‍රී ලාංකිකයන්ට හැකියාව ලැබී තිබෙන බව ඔවුන් සිය කාය ශක්තියෙන් සිදුකර ඇති විශ්මිත නිර්මාණ මොනවට කියාපායි.

ඒ අපේ අතීතය යි. අප වර්තමානය ගොඩනගාගෙන තිබෙන්නේ ඒ අතීතය ඔස්සේය. අතීතයෙන් වර්තමානයට රැගෙන ආ බොහෝ දෑ අතර දේශීය අනන්‍යතාවයට මුල්තැන දෙන විවිධ කර්මාන්ත සහ සංස්කෘතිකාංග ද අප අතර තිබේ. නක්ෂත්‍රය සහ ජෝතිෂ්‍ය ශාස්ත්‍රය ද අතීතයේ සිට පැවත එන එවන් එක අංගයකි. එසේම යම් යම් ඇදහිලි සහ විශ්වාස ද අප පරම්පරා ගණනාවක සිට රැගෙන එමු.

වර්තමානය වන විට රැල්ලක් ලෙස දේශීය දේට අගෞරව කරන ආකාරයක් දක්නට ලැබෙන නමුත් එයට එරෙහිව හඬ නගන්නට නොහැකි වන්නේ ඒ සඳහා සාධාරණ හේතු ද සමාජය තුළින්ම පැණ නැඟී ඇති නිසාය.

ඕනෑම වටිනා කියන යමක පිරිහීම සනිටුහන් වන්නේ එය අතිශයෝක්තියක් බවට පත්කරමින් ප්‍රදර්ශනය කරන්නට සූදානම් වීම නිසාය. තිබෙන දෙයට එහා ගිය යමක් පෙන්වන්නට උත්සාහ දැරීමෙන් සිදු වන්නේ අවසානයේ දී එහි සැබෑ වටිනාකමක් ගැබ්වී තිබුණත් එය අහිමි වීමය. වඩාත් කණගාටුදායක කාරණය වන්නේ එබඳු හේතු මත වටිනා කියන දේට ලැබිය යුතු තැන අහිමි වී ඒවා ප්‍රතික්ෂේප වී යාමය.

මානසික ශක්තිය අන් සියල්ලට වඩා බලවත් බව මනෝ විද්‍යාව පිළිබඳව යම් යම් හැදෑරීම් සහ ඒ පිළිබඳව අවබෝධයක් දක්වන පිරිස් පමණක් නොව සාමාන්‍ය ජනතාව ද යම්තාක් දුරට අවබෝධ කරගෙන සිටී. කෙසේ වුවද යම් අයකු සිය මානසික ශක්තිය දියුණු කර ගැනීම සඳහා සහ ඒ ඇසුරෙන් යම් යම් ක්‍රියාකාරකම් සිදු කරනවා නම් ඒ සියල්ලටම යම්කිසි කැප කිරීමක් සහ දීර්ඝ කාලීන පුහුණුවක් තිබිය යුතුය. නමුත් වර්තමානය වන විට යම් යම් බලවේග සහ අද්භූත බලපෑම් මගින් සිතා ගත නොහැකි කාර්යයන් සිදු කරන්නට හැකි බව පවසමින් ඇතැම් පුද්ගලයෝ ගෙනයන කූට උපක්‍රම නිසා කාලාන්තරයක් මුළුල්ලේ පවත්වාගෙන පැමිණි යම් යම් පෞරාණික සිරිත් විරිත් සහ විශ්වාස ද ඇදහිලි ද පිළිබඳවද බොහෝ දෙනා තුළ අවිශ්වාසයක් පැනනැඟීම පුදුමයට කරුණක් නොවේ.

මිත්‍යාව යනු මිත්‍යාව ම ය. එය කිසි විටෙකත් සත්‍ය දෙසට නැඹුරු කරන්නට හෝ හරවන්නට අපට හැකියාවක් නොවේ. අතීතයේ ලාංකික ජන සමාජය තුළ තිබුණා යැයි කියැවෙන බොහෝ විශිෂ්ට වෛද්‍ය ක්‍රම ද යම් යම් කලා හැකියාවන් ආදී බොහෝ දෑ ද වර්තමානය වන විට සම්පූර්ණයෙන්ම අභාවයට පත් වී තිබේ. එසේ වුවද එවැනි විස්කම්වල විස්තර හොයා සොයා ගන්නා ඇතැම් පුද්ගලයින් ඒවා වර්තමානයේ ද පවතින බව සඳහන් කරමින් සිදුකරන කූට ක්‍රියාවලි නිසා දේශීය ප්‍රෞඪ ඉතිහාසයට තිබූ ගෞරවය ටිකෙන් ටික වැනසෙමින් යන අයුරු දක්නට ලැබේ.

මිත්‍යා විශ්වාස සහ දේශීයත්වය යනු එකක් නොවේ. එබැවින් මිත්‍යා මත සෑම මොහොතකම ඉවතට විසිකර දමන්න අප නිරන්තර සූදානමින් පසු වුවද අපේ දෑ එසේ ඉවතලන්නට අපට කිසිදු හැකියාවක් නොමැත. මිත්‍යාව කෙරෙහි අප දක්වන විරෝධය සමඟ දේශීය දේ අගයන්නට හැකි විය යුතුය. අපේ දෑ පිළිබඳව අත්තනෝමතිකව විරෝධතා එල්ල කිරීම තුළ අපට අපේ දෑ අහිමි ව යන්නට වැඩි කාලයක් ගත වන්නේ නැත. එය සැබැවින්ම කනගාටුදායකය.

මිත්‍යා මත සමාජය පුරා රෝපණය කරන යම් පිරිසක් වෙත් නම් ඔවුන්ට පැවසිය යුත්තේ ඔබ වනසා දමන්නේ සාඩම්බර රටක ගෞරවය බවය. සැබැවින්ම අගය කළ යුතු දෑ ද මිථ්‍යාව මත අතහැර ඒවා ද විනාශ කර දමන්නට දඟලන සියලු දෙනාට පවසන්නට ඇත්තේ ද මසැසින් නොව මනැසින් විමසා බලමින් කටයුතු කරන ලෙසය. ඕනෑම ක්ෂේත්‍රයක අන්තවාදීන් වීම එහි අක්මුල් සිඳ දමන්නට කදිම ආයුධ සකස් කරයි. එබැවින් මිථ්‍යාවෙන් නොගිලී විද්‍යාවේද අන්තයට නොගොස් මධ්‍යස්ථ තැනක නතර වී, එතැන සිට දේශීය වටිනාකම් පිළිබඳව අන්ධ නොවූ දෑසකින් බලන්නට හැකි නම් තවත් සියවස් ගණනාවක් ඉදිරියට අපේකම සුරක්ෂිත ව පවතිනු ඇත.

**දිල්රූ ජයසේකර**

# යහපාලන ආණ්ඩු සමයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇතැමුන්ගේ අතපසු වූ ක්‍රියා නිසා ගෙවීම් තවමත් නෑ

යහපාලන ආණ්ඩු සමයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇතැම් බලධාරීන් වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් එම කාලයේදී කළ යුතු ඇතැම් ගෙවීම් මෙතෙක් සිදුවී නොමැති බවට තොරතුරු අනාවරණය වෙමින් පවතී.

2018 වසරේ සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියට ප්‍රවාහන පහසුකම් සැපයූ ඇල්ෆා ට්‍රාන්ස්පෝට් ආයතනයේ අධිපති නිහාල් චන්ද්‍රසිරි මහතාද මෙයට මුහුණ පා ඇති අතර ඔහු තමන්ට සිදු වූ මේ අසාධාරණය පිළිබඳ මාධ්‍යයට කරුණු පැහැදිලි කළේය.

2018 වසරේදී අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළ කළ පුවත්පත් දැන්වීමකට අනුව තමන් සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ ප්‍රවාහන පහසුකම් සැපයීමට ඉල්ලුම් කළ බවද තමාගේ ටෙන්ඩරය පිළිගෙන අදාළ සේවාව සැපයූ බවද පවසන ඔහු මේ සේවාව සැපයීම වෙනුවෙන් අමාත්‍යාංශය මගින් ගෙවිය යුතු රු. 1164628ක මුදල මෙතෙක් තමන්ට නොලැබුණ බව පවසයි.

මේ පිළිබඳ කරුණු විමසීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටලු පවතින බැවින් ගෙවීම් සිදු කිරීමට නොහැකි බව තමන්ට දැනගන්නට ලැබුණ බවද මේ ගැටලුවට විසඳුම් ලබාදීම සඳහා අමාත්‍යාංශය මගින් පත් කළ කමිටුවෙන්ද අදාළ ගෙවීම් සිදු කිරීමට නිර්දේශ කළ ද මෙතෙක් එම ගෙවීම් සිදු නොවූ බව පවසයි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කළ යුත්තේ අමාත්‍යාංශ නිලධාරීන් වුවද මෙයින් සේවාව සැපයූ තමාට දඬුවම් ලබාදීම අසාධාරණ බව පවසන මේ සැපයුම්කරු අදාළ නිලධාරීන්ගෙන් අය කරගෙන හෝ තමන්ට සාධාරණත්වය ඉටු කරන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටී.

# පරිසර අමාත්‍යාංශයෙන් සංවේදී පාරිසරික ප්‍රදේශ හඳුනා ගැනීමේ වැඩපිළිවෙළක්

**බුද්ධිකා ඉඹුලාන**

වන හානිය වැළැක්වීමේ පියවරක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංවේදී පාරිසරික ප්‍රදේශ හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළක් පරිසර අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත.

එසේ හඳුනා ගන්නා ප්‍රදේශ පිළිබඳ ඒ ඒ ප්‍රදේශ අයත් වන ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුම්වත් කරන අතර වගා කිරීමට ඉඩම් හඳුනාගැනීමේ දී පරිසර අමාත්‍යාංශය විසින් සංවේදී පරිසර ප්‍රදේශ ලෙස නම් කරන ස්ථානවල ඉඩම් වගාවට යොදා ගැනීම මෙමගින් වළක්වා ගත හැකියැයි පරිසර අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා කියයි.

රජය විසින් වගාවට සුදුසු බවට තහවුරු කර ඇති ඉඩම් වගා කටයුතුවලට යොදා ගැනීමට ග්‍රාමීය ගොවි ජනතාවට ඉඩකඩ සලසන ලෙස රජය විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනුම් දී තිබෙන නමුත් එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් පරිසර හානි සිදුවන බවට තොරතුරු ලැබී ඇත. එහෙයින් වන විනාශ වැළැක්වීමට ජනාධිපති මෙන්ම රජය ද මෙවැනි පියවර රැසක් ගනිමින් සිටින බව ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පවසයි.

එමෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වගාවට ඉඩම් ලබාදෙන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉඩම් ඉල්ලා ඇතැයි ඇතැම් තැනැත්තන් විසින් කර ඇති ප්‍රකාශ පිළිනොගන්නා බව අවධාරණය කරන ලේකම්වරයා පවසන්නේ මෙරට වගාවට යොදා ගත හැකි එහෙත් හායනයට ලක් වු එමෙන්ම භාවිතයට නොගත් බොහෝ ඉඩම් ඇති බවයි. වගාවට යොදා නොගත් මෙන්ම වනාන්තර හෝ කැලෑවලට ද අයත් නොවන ඉඩම් රැසක් රට පුරා දක්නට ලැබෙන අතර මහවැලි සංස්ථාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය හා දුම්රිය දෙපාර්තමේන්තුව වැනි ආයතන සතුව වගා නොකළ හායනයට ලක් වු ඉඩම් රැසක් ද ඒ අතර වන බවද ජාසිංහ මහතා කියයි.

# ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති පුටුව ජනාධිපති නීතිඥ සාලිය පීරිස්ට



ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ 26 වන සභාපතිවරයා ලෙස ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා පෙරේදා (24) පැවති නිලවරණයේදි විශිෂ්ට ජයක් ලබමින් තේරී පත්විය. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ 2021-2022 වර්ෂවලට සභාපතිවරයකු තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමෙදි සභාපති ධුර අපේක්ෂකයන් ලෙස ජනාධිපති නීතිඥ සාලිය පීරිස් සහ ජනාධිපති නීතිඥ කුවේර සොයිසා මහත්වරු මැතිවරණයට ඉදිරිපත් වූහ.

කොළඹ දිසා අධිකරණය ඇතුළු දිවයිනේ අධිකරණවල පිහිටු වු ඡන්ද මධ්‍යස්ථාන 82කදී මැතිවරණය පැවති අතර සාලිය පීරිස් මහතා ඡන්ද 5093ක් ලබා ගනිමින් ජයග්‍රහණය කළේය.කුවේරද සොයිසා මහතා ඡන්ද 2707ක් ලබාගෙන තිබුණි.මැතිවරණ තේරීම් බාර නිලධාරි ලෙස සොලිසිටර් ජනරාල් සංජය රාජරත්නම් මහතා කටයුතු කළේය. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ලියාපදිංචි ඡන්ද දායකයන් 17000කට අධික පිරිසක් සිටින බව පැවසෙන අතර කොවිඩ් නීති අනුව මෙවර ඡන්දය පැවැත්විණි.

# කිරිබත්ගොඩ පොලිසියට මල් මිටක්

පොලිස් සේවය මහජන මිත්‍රශීලී සේවාවක් කිරීමට බලධාරීන් විටින් විට උත්සාහ කළද පොලිසිය පිළිබඳ ජනතාවට ඇත්තේ එතරම් ප්‍රසාදයක් නොවේ. එසේ වන්නේ නිල ඇඳුමෙන් ආවරණය වී ඇතැම් පොලිස් නිලධාරීන් විසින් සිදු කරන පහත් ක්‍රියා නිසාය. මාධ්‍යයන්ගෙන්ද එවන් පුවත් අපට නිතර අසන්නට දකින්නට ලැබේ. අව් වැසි නොතකමින් ජීවිත පවා පරිත්‍යාගයෙන් උතුම් සේවාවක නියුතු බහුතර පොලිස් නිලධාරීන්ට මෙයින් සිදුවන්නේ බලවත් අසාධාරණයකි.

පොලිස් නිලධාරීන්ගේ අඩුපාඩුකම් මාධ්‍ය ඔස්සේ ද පළ කරනවා සේම ඔවුන්ගෙන් සිදුවන සේවය ද ඇගැයීම මාධ්‍යයේ යුතුකමකි. මා මේ සටහන තබන්නේ එවන් වූ ඇගැයීමට ලක් කළයුතු පොලිස් නිලධාරීන් පිරිසක් ගැනය. ඒ කිරිබත්ගොඩ පොලිසියේ ස්ථානාධිපති සුබසිංහ,පොලිස් පරීක්ෂක තිස්ස මහීපාල,සැරයන් රත්නායක මහත්වරුන් ඇතුළු පොලිසියේ කාර්ය මණ්ඩලය ගැනය.

කිරිබත්ගොඩ පොලිසියට රාජකාරියක් කර ගැනීමට යන ඕනෑම තරාතිරමක අයකුට කිසිදු රස්තියාදුවකින් තොරව සේවාව ඉටු කරදීමට එම නිලධාරීහු කටයුතු කරති. නිරන්තරයෙන් පොලිසියට යන මා මේ බව අත්දැක ඇති අතර ඉකුත් දිනකදීද මේ සංග්‍රහශීලී සේවාව ලැබීමට මටද අවස්ථාවක් ලැබිණි. මෙය මාගේ පෞද්ගලික අත්දැකීමක් වුවද පොලිසියට යන ඕනෑම අයෙකුට මේ අත්දැකීම ලැබිය හැකිය. විශේෂයෙන්ම මේ දිනවල පවතින සෞඛ්‍ය අවදානම පිළිබඳ විශේෂයෙන්ම සැලකිල්ල යොමු කර සෞඛ්‍යාරක්ෂිතව සියලු සේවාවන් ඉටු කිරීමට ඔවුහු වගබලා ගනිති. එම නිලධාරීන්ගේ ආදර්ශවත් සේවය දිරිගැන්වීමේ අරමුණින් මේ සටහන තැබුවෙමි.

**දළුගම අජන්තා**

# වැල්ලවත්ත මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලේ මහා කුම්භාභිෂේක මංගල්‍යය අප්‍රේල් 4 දා



වැල්ලවත්ත මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මන් කෝවිලේ පුනරාවර්තන ප්‍රතිසංස්කරණ අෂ්ට බන්ධන ස්වර්ණ බන්ධන මහා කුම්භාභිෂේක මංගල්‍යය අප්‍රේල් මස 4 වැනි ඉරිදා අමිර්ථ සිද්ධ යෝගය පිහිටි උදෑසන 6 සිට 7 දක්වා මීන ලග්න සුභ හෝරාවෙන් පැවැත්වේ. වැල්ලවත්ත මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිල නව මුහුණුවරකින් ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව පැවැත්වෙන මේ කුම්භාභිෂේක මහා මංගල්‍යය මාර්තු 29 උදෑසන 6.30ට පැවැත්වෙන ගණ දෙවි පූජාවෙන් ආරම්භ වේ. එදින සවස පහට ශ්‍රී සුදර්ශන හෝමය සහ ලක්ෂ්මි කුබේර හෝමය පැවැත්වේ. අප්‍රේල් 1 උදෑසන 7.30 සිට රාත්‍රි 9.30 දක්වාත්, අප්‍රේල් 2 උදෑසන 7.30 සිට සවස 3.30 දක්වාත් බැතිමතුන්ට දේව ප්‍රතිමාවල තල තෙල් ආලේප කිරීමේ අවස්ථාව උදා වෙයි. අප්‍රේල් 4 උදෑසන 6 සිට 7.30 දක්වා තිබෙන සුභ කාලයේදී කුම්භාභිෂේක මංගල්‍යයේ කොත පැළඳවීමේ උත්සවය පැවැත්වේ. අප්‍රේල් 5 සිට මැයි 19 දක්වා දින 45ක් පුරා උදේ සහ සවස පූජා පැවැත්වේ. මයුරපති ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිල වර්තමානයේදී ඉතා ආකර්ෂණීය ලෙස ප්‍රතිසංස්කරණය කර තිබේ.

මාර්තු 29 සිට ආරම්භ වන කුම්බාභිෂේක මංගල්‍යයට සහ ඉන් පසුව පැවැත්වෙන සියලු පූජා සඳහා සම්බන්ධ වී සිතුම් පැතුම් ඉෂ්ට කර ගන්නා ලෙස සියලු බැතිමතුන්ට කෝවිලේ පාලක සභාව ආරාධනා කරයි. මේ උත්සවවල දවල් දානය සඳහා සහල්, පරිප්පු, තෙල්, එළවළු, අල ආදිය සහ කුම්භාභිෂේක පූජාව සඳහා කිරි, තැඹිලි, මුදවපු කිරි, සීනි, පලතුරු, සක්කර ආදිය පරිත්‍යාග කිරීමට බැතිමතුන්ට හැකිය. වැඩි විස්තර කෝවිලේ පාලක සභාවෙන් ලබා ගත හැකිය.

# යාපනයේ නාවක්කුලියේ නිවෙසකින් පැහැරගෙන ගිය බාලවයස්කාරියන් දෙදෙනා සොයා ගනී

**උතුරු පළාත් විශේෂ- රසුල දිල්හාර ගමගේ**

යාපනයේ නාවක්කුලි ප්‍රදේශයේ නිවෙසකින් පැහැරගෙන ගිය බාලවයස්කාර තරුණියන් දෙදෙනකු චාවාකච්චේරි පොලීසිය විසින් 24දා නිදහස් කරගෙන ඇති අතර සිද්ධියට සම්බන්ධ තරුණයන් දෙදෙනෙකුද අත්අඩංගුවට ගෙන තිබේ.

යාපනයේ කයිට්ස් ප්‍රදේශයේ තරුණයන් දෙදෙනෙකු විසින් මේ බාලවයස්කාර තරුණියන් දෙදෙනා බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් ඇති අතර ඒ සම්බන්ධයෙන් නාවක්කුලි පොලීසියට කළ පැමිණිල්ලකට අනුව පොලීසිය වහාම ක්‍රියාත්මක වී ඔවුන් දෙදෙනා නිදහස් කරගෙන ඇත.

පොලීසිය තරුණියන් දෙදෙනා සොයා ගන්නා විට තරුණයන් දෙදෙනා තරුණියන් දෙදෙනාව නිවෙසක රඳවා ගෙන සිට ඇති අතර පොලිසිය බාලවයස්කාර තරුණියන් දෙදෙනා වෛද්‍ය පරීක්ෂණයකට යාපනය ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ.

පොලීසිය විසින් බේරා ගන්නා ලද එම බාලවයස්කාර තරුණියන් දෙදෙනා වයස අවුරුදු 14 හා 15 යන වයස්වලට අයත් දෙදෙනකු බව පොලීසිය පවසයි.

සිද්ධිය සම්බන්ධයෙන් යාපනයේ නාවක්කුලි හා චාවාකච්චේරි පොලීසි පරීක්ෂණ පවත්වයි.

# කුමාරතුංග මුනිදාස සූරීන්ගේ 77 වන ජන්ම සමරු උලෙළ කල්යයි

**දික්වැල්ල විශේෂ -ජී.සිරිසේන**

මාර්තු 02 වැනි දිනට යෙදෙන මුනිදස් කුමරතුගු සමරු උලෙළ මෙවර නොපැවැත්වේ.

කුමාරතුංග මුනිදාස සූරීන්ගේ 77 වන ජන්ම දිනය නිමිති කරගෙන මාර්තු මස 02 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ සමරු උලෙළ මෙවර නොපැවැත්වෙන බව වැව්රුකන්නල සිංහල සමිතියේ සභාපති, කරතොට පඤ්ඤාසීල හිමියෝ ප්‍රකාශ කළහ.

වැව්රුකන්නල විද්‍යාතුංග මහ පිරිවෙන් පරිශ්‍රයේදී වාර්ෂිකව පැවැත්වූ මේ වාර්ෂික ගුණ සමරුව, රචනා (ගද්‍ය -පද්‍ය), චිත්‍ර, ගායනා ආදී තරග පාසල් හා විවෘත වශයෙන් පවත්වා ඒවායේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානයන්ගෙන් සමන්විත විය.

රටේ පවතින වසංගත රෝගය හමුවේ පාසල් දරුවන් හා සාහිත්‍යලෝලීන් එක්රැස් කිරීමේදී ඇතිවන අවදානම සලකා සමරුව මෙවර නොපැවැත්වීමට තීරණය කළ බව වැව්රුකන්නල සිංහල සමිතිය ප්‍රකාශ කරයි.


ජාතික සම්පත JATHIKA SAMPATHA NLB

නිල ප්‍රතිඵල

දිනුම් වාරය 1099

දිනය 2021.02.24

ජයග්‍රාහී ලග්නය මකර

ජයග්‍රාහී අංක 0 6 9 5 4 3

අග සිට මුලට ත්‍යාග රටාව

| | | | |
|---|---|---|---|
| 01 ත්‍යාගය | 0 6 9 5 4 3 | රු: 1,000,000.00 | ත්‍යාගය - |
| 02 ත්‍යාගය | 6 9 5 4 3 | රු: 100,000.00 | ත්‍යාග 03 |
| 03 ත්‍යාගය | 9 5 4 3 | රු: 10,000.00 | ත්‍යාග 33 |
| 04 ත්‍යාගය | 5 4 3 | රු: 1,000.00 | ත්‍යාග 308 |
| 05 ත්‍යාගය | 4 3 | රු: 100.00 | ත්‍යාග 3133 |
| 06 ත්‍යාගය | 3 | රු: 20.00 | ත්‍යාග 30,999 |

මුල සිට අගට ත්‍යාග රටාව

| | | | |
|---|---|---|---|
| 07 ත්‍යාගය | 0 6 9 5 4 | රු: 10,000.00 | ත්‍යාග 03 |
| 08 ත්‍යාගය | 0 6 9 5 | රු: 1,000.00 | ත්‍යාග 32 |
| 09 ත්‍යාගය | 0 6 9 | රු: 200.00 | ත්‍යාග 331 |
| 10 ත්‍යාගය | 0 6 | රු: 100.00 | ත්‍යාග 3126 |
| 11 ත්‍යාගය | මකර | රු: 20.00 | ත්‍යාග 25810 |
| 12 ත්‍යාගය | ජයග්‍රාහී අංක 6ම ඕනෑම පිළිවෙලට ගැලපීමෙන් | රු: 200.00 | ත්‍යාග 232 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,874,680.00

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස හයක කාලසීමාවකට පමණි. රුපියල් ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ලබන බදාදා සුපිරි ත්‍යාගය රු. 14,923,965.30

ජාතික ලොතරැයි මණ්ඩලය தேசிய லொத்தர் சபை NATIONAL LOTTERIES BOARD

32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.

දුරකථන: 011 4607000, 011 2324324

ෆැක්ස්: 011 4669416

Web : www.nlb.lk



2021-02-24 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 701,741

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 28,734,740.00

රු. 2,000,000.00 ත්‍යාග 01 රු. 1,000,000.00 ත්‍යාග 01 රු. 100,000.00 ත්‍යාග 27

www.nlb.lk NLB NATIONAL LOTTERIES



ගොවි සෙත නිල ප්‍රතිඵල NLB NATIONAL LOTTERIES

දිනුම් වාරය 2703 දිනුම් අදින ලද දිනය 2021 / 02 / 24

ඉංග්‍රීසි අක්ෂරය S ජයග්‍රාහී අංක 08 27 46 59

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | 01 |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 05 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 171 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 407 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 9,847 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 6,528 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 162,593 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 29,570 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 209,122

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,338,080.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 67,414,886.40

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය தேசிய லொத்தர் சபை NATIONAL LOTTERIES BOARD

නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.

දුරකථන : 0114 607 000, 0112 324 324

ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk



ධන නිධානය නිල ප්‍රතිඵල NLB NATIONAL LOTTERIES

දිනය - 2021/02/24

දිනුම් වාරය - 445

ඉංග්‍රීසි අක්ෂරය I ජයග්‍රාහී අංක 12 50 66 77

දහස් වරම 2019

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | 0 |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 03 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 91 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 212 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 5,101 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 3,425 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 86,491 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 16,134 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 3,680,100.00

බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 111,584

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය 84,180,433.20

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය தேசிய லொத்தர் சபை NATIONAL LOTTERIES BOARD

අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.

දුරකථන 011 460 7000 011 232 4324



ට්‍රිපල් ජෝඩුව Mega POWER මෙගා පවර් மெகா பவர்

දිනුම් වාරය 774

නිල ප්‍රතිඵල

දිනය: 2021.02.24

ඉංග්‍රීසි අකුර L සුපිරි අංකය 14 ජයග්‍රාහී අංක 12 31 61 70

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | - |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 03 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 100 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 239 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 5,406 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 3,527 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 89,292 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 16,013 |

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 118,575,650.80

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 20,938,204.80

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 32,869,777.60

දිනා ඇති මුළු මුදල රු. 3,307,280.00

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය

නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01

දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585

ෆැක්ස්: 0112 433 631,

වෙබ් අඩවිය: www.nlb.lk



දිනුම් වාරය - 4408 නිල ප්‍රතිඵල NLB

මහජන සම්පත

දිනය: 2021-02-24

ජයග්‍රාහී අක්ෂරය Z ජයග්‍රාහී අංක 6 2 6 0 0 8

ත්‍යාග රටාව - අග සිට මුලට

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 6 2 6 0 0 8 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 2 6 0 0 8 | රු. 100,000/- | 13 |
| 3 වැනි ත්‍යාගය | 6 0 0 8 | රු. 10,000/- | 127 |
| 4 වැනි ත්‍යාගය | 0 0 8 | රු. 1,000/- | 1231 |
| 5 වැනි ත්‍යාගය | 0 8 | රු. 100/- | 12620 |
| 6 වැනි ත්‍යාගය | 8 | රු. 20/- | 124721 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 6 2 6 0 0 | රු. 10,000/- | 11 |
| 8 වැනි ත්‍යාගය | 6 2 6 0 | රු. 1,000/- | 121 |
| 9 වැනි ත්‍යාගය | 6 2 6 | රු. 100/- | 1251 |
| 10 වැනි ත්‍යාගය | 6 2 | රු. 50/- | 12470 |
| 11 වැනි ත්‍යාගය | Z | රු. 20/- | 49879 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 11,534,600.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිටමාස 06ක කාලසීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 14,561,741.00

NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය

32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01

දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.

www.nlb.lk

## විරුද්ධවාදීන්ගේ හිත් නොරිදා මත ජනගත කිරීමේ විශේෂ හැකියාවක් විජමුට තිබුණා:

# විජමු ප්‍රාර්ථනා කළ දේශීයත්වය පිරි දේශයක් නිර්මාණය කිරීමට කැප වෙමු



## අගමැති පාර්ලිමේන්තුවේදී කියයි

## පාර්ලිමේන්තුව

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

හිටපු කථානායක වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා ප්‍රාර්ථනා කළ දේශීයත්වය ඇතුළත් සෞභාග්‍යවත් දේශයක් නිර්මාණය කිරීම එතුමා වෙනුවෙන් අපට කළ හැකි එක් කාර්යභාරයක් වන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (25) ප්‍රකාශ කළේය.

වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා මන්ත්‍රීවරයකු. ඇමැතිවරයකු. ආණ්ඩුකාරවරයකු. කථානායකවරයෙක් ලෙස මෙරටට කළ සේවය අති විශිෂ්ට බවත් ඉතාම නිහතමානී චරිතයක් ලෙස ඔහුගේ චරිතයෙන් ගත යුතු ආදර්ශ රැසක් අපට තිබෙන බවත් අගමැතිවරයා පැවසීය.

හිටපු කථානායක වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා සම්බන්ධයෙන් ශෝක යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවට සහභාගි වෙමින් අගමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුව ඊයේ (25) රැස්විය. නිවේදන, ලිපි ලේඛන, පෙත්සම් වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව ප්‍රධාන කටයුතු ආරම්භ කෙරිණ.

**අගමැති මහින්ද රාජපක්ෂ මහතා-**

1941 අගෝස්තු 05 වැනිදා උපත ලැබූ වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා යහළබැද්ද පාසලෙන්ද, අනතුරුව බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයෙන් ද පාසල් අධ්‍යාපනය ලැබුවා. පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් සහ ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලැබුවා. නීති විද්‍යාලයෙන් නීතිය හැදෑරූ එතුමා දේශපාලනයට පිවිසියේ අධි නීතිඥවරයකු ලෙසයි. එදා එතුමා දේශපාලනයට පිවිසීමට පෙර සිංහල භාෂාවට, සංස්කෘතියට හා ආගමට ඉතා ගැඹුරෙන් බැඳී සිටියා. එතුමාට ඒ ආභාෂය ලැබුණේ තරුණ කාලයේදීමයි. ඔහු තරුණ කාලයේදී හෙළ-හවුල හා සම්බන්ධ ලිපි ලිව්වා. කුමාරතුංග මුනිදාස මහතාගේ මඟ යමින් හෙළ භාෂාව පෝෂණය කිරීමට කටයුතු කළා. වාද විවාදවල යෙදුණා. ඔහුගේ වාද ජාතික පුවත්පත්වලත් පළ වුණා. එතුමා අතින් ජාතියට විශිෂ්ට කෘති දායාද වුණා. "සීගිරි ගී සිරි" එක් කෘතියක්. එය ජනතාව අතර රසාස්වාදයට පත් වුණා. 1977 හපුතලේ දිස්ත්‍රික්කයෙන් එජාපය නියෝජනය කරමින් තරග වැද පාර්ලිමේන්තුවට පිවිසෙනවා. ඇමැතිධුර වරදාන ලැබෙන විට කෙනෙක් වෙනස් වෙනවා. නමුත් වි.ජ.මු. එහෙම වුණේ නැහැ. වාද විවාදවලට යෙදීමේදී පවා තම භාෂා දැනුම දේශපාලන වේදිකාවට ඔහු ගෙනාවා. විරුද්ධවාදීන්ගේ හිත් නොරිදා මත ජනගත කිරීමේ විශේෂ හැකියාවක් ඔහුට තිබුණා. ඒ නිසා ජනතාව ඉදිරියේ දක්ෂ දේශකයෙක් විදියටත් ඔහු ඇගැයීමට ලක් වුණා. ආණ්ඩුවේ දේශීය වෛද්‍ය ඇමැතිවරයා ලෙසත්, අධ්‍යාපන, සංස්කෘතික හා ප්‍රවෘත්ති ඇමැතිවරයා ලෙසත්, සංස්කෘතික හා ප්‍රවෘත්ති ඇමැතිවරයා ලෙසත්, අධිකරණ,නීති ප්‍රතිසංස්කරණ සහ බුද්ධ ශාසන ඇමැතිවරයා ලෙසත් එතුමා විශාල සේවයක් කළා. සිංහල හින්දු අලුත් අවුරුද්දට හිසතෙල් ගෑමේ චාරිත්‍රයට රාජ්‍ය අනුග්‍රහය දී චාරිත්‍ර ජනගත කළා. පාර්ලිමේන්තුවේ කොළ කැඳ වීදුරුවෙන් පටන් ගෙන ජනතාව අතරට ඔසුපැන් සංකල්පය ගෙනයාමට කටයුතු කළා. දුරකථන ඇමතුමට 'ආයුබෝවන්' කියා ආමන්ත්‍රණය කරන්න පටන් ගත්තේ එතුමාගේ කාලයේදීයි. අපි ඇතැම් අවස්ථාවලදී වි.ජ.මු. මහතාගෙන් ඇතැම් වචනවල අර්ථ විමසන විට ඊට අදාළ අර්ථය පමණක් නොව ඉංග්‍රීසි, පාලි, සංස්කෘත වචන පවා අපට ඔහු කියා දුන්නා. අලුත් පරම්පරාවට දේශීයත්වය සම්බන්ධ දැනුම ලබාදෙනවා පමණක් නොව ඔවුන් ලවා දේශීයත්වය ආරක්ෂා කර ගත යුතු යැයි ද එතුමා කල්පනා කළා. ත්‍රිපිටක ධර්මය සිංහලයට පරිවර්තනය කර නැවත මුද්‍රණය කළ වීර චරිත හඳුන්වාදීමටත්, සුභාෂිතය, අමාවතුර වැනි ග්‍රන්ථ නැවත මුද්‍රණය කරන්නටත් එතුමා කටයුතු කළා. මේ පාර්ලිමේන්තුවේ 16 වැනි කතානායක ධුරය හොබවන්නට ඔහුට හැකි වුණා. එදා විපක්ෂය නියෝජනය කළත් කතානායක ධුරය බාරගත් දා සිට එම ධුරය ආරක්ෂා කරන්න පියවර ගත්තා. ජාතික ඇඳුමේ ඇති වටිනාකම ගැන එතුමා නිතර මා සමඟ කතා කර තිබෙනවා. දේශපාලනඥයන් ජාතික ඇඳුම ඇඳිය යුතු බවත් ඉන් දේශීයත්වය පිළිඹිබු වන බවත් ඔහු නිතර කී කරුණක්. ආණ්ඩු බලය නොතිබූ අවස්ථාවේදී එතුමාගේ පුත් උදිත ලොකු බණ්ඩාර මහතා අප සමඟ එක්ව කටයුතු කළා. අවශ්‍ය සෑම අවස්ථාවකදීම අප පවුල සමඟ සමීපව කටයුතු කළා. මේ පාර්ලිමේන්තුවේ අතීත මතක ආවර්ජනය කරනවා නම් අද දවසත් මදි. ඔහු ගැන ගුණකථනය කරන්න. එතරම් දේවල් තිබෙනවා. ඒ නිසා එතුමා ගැන මම බොහෝ දේ කියන්න යන්නේ නැහැ. එතුමා ප්‍රාර්ථනා කළ දේශීයත්වය ඇතුළත් සෞභාග්‍යමත් දේශයක් නිර්මාණය කිරීම තමයි එතුමා වෙනුවෙන් අපට කරන්න තිබෙන්නේ. මන්ත්‍රීවරයෙක්, ඇමැතිවරයෙක්, ආණ්ඩුකාරවරයෙක්, කතානායකවරයෙක් ලෙස එතුමා මෙරටට කළ සේවය අතිවිශිෂ්ටයි. එතුමාට නිවන් සුව අත්වේවා! එතුමාගේ පවුලේ අයට අපේ ශෝකය පළ කරනවා.

**සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා-**

හිටපු කථානායක වි.ජ.මු ලොකුබණ්ඩාර මහතා උසස් ගුණධර්මවලින් යුතු සියලුදෙනා සමඟම මිත්‍රශීලීව කටයුතු කළ මානවවාදියෙක්. පාර්ලිමේන්තුවේ කථානායකවරයා ලෙස සිය ධුර කාලයේ අපක්ෂපාතීත්වය ආරක්ෂා කරගනිමින් එතුමා කටයුතු කළා. එතුමා මෙරට සිටි අත්දැකීම් බහුල දේශපානඥයෙක්. "සභාව නිශ්ශබ්ද වන්න" යන වදන පාර්ලිමේන්තු සම්ප්‍රදායට එකතු කිරීමට එතුමා කටයුතු කළා. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් පාර්ලිමේන්තු පරිශ්‍රයේ ස්ථාපිත කිරීමටද එතුමා මූලිකව කටයුතු කළා. වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමා දේශපාලනය ඉක්මවා ගිය ස්වාධීන මනුෂ්‍යයෙක් බව සිය හැසිරීමෙන්ම පෙන්වා දුන්නා. සීගිරි ගී සිරි, රසදීපනි, ශාස්ත්‍රීය වාද ලිපි, The Mystic of Sigiriya ආදි කෘති ගණනාවක කතුවරයා වුණේ එතුමායි. "හෙළ බස් ඉසුරු" යන ගෞරව නාමයෙන් ද, විජමු ලොකුබණ්ඩාර මහතා හැඳින්වූවා. ජාතින් අතර සමඟිය ඇති කිරීමටද එතුමා කටයුතු කළා. සම්බුද්ධ ශාසනයටද එතුමා අනුපමේය සේවයක් කළා.

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා-**

හිටපු කථානායක වි.ජ.මු ලොකුබණ්ඩාර මහතා මෙරට සිටි කෘතහස්ත නායකයෙක්. එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජනතා සේවකයෙක්. මේ රටේ සියලු දෙනාගේම ආදරය ලබා ගැනීමට එතුමා සමත් වුණා. එතුමා අතිවිශිෂ්ට සේවයක් රටේ ජනතාව වෙනුවෙන් ඉටු කළා. රණසිංහ ප්‍රේමදාස මහතා ජනාධිපති ධූරයට පත් කිරීමටද එතුමා විශාල මෙහෙයක් ඉටු කළා. සෑම දේශපාලන රැස්වීමක්ම එතුමා ආමන්ත්‍රණය කළා. කථානායක ධූරයේ කටයුතු කිරීමේදී එතුමා ස්වාධීනව කටයුතු කළා. කථානායක ධූරයේ කටයුතු ඉතාම සමබරව, නිර්භයව ක්‍රියාත්මක කළා. එතුමා කිසිවිටක එක් දේශපාලන කණ්ඩායමක අතකොළුවක් බවට පත් වූයේ නැහැ. එතුමා ජනතාවට ඉතා සංවේදීව කටයුතු කළා. කුවෙට් වන්දි අරමුදල නිර්මාණය කිරීමට වි.ජ.මු ලොකුබණ්ඩාර මහතා විශාල සේවයක් කළා. වි.ජ.මු ලොකුබණ්ඩාර මහතා මන්ත්‍රීවරුන්ට පරමාදර්ශී නායකයෙක්. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.



### උසස් ගුණධර්මවලින් පිරි මිත්‍රශීලී නායකයෙක්

ඇමැති දිනේෂ් ගුණවර්ධන



### පාර්ලිමේන්තුවට සභ්‍යත්වය ශිෂ්ට සම්පන්න බව ගෙනාවා

ඇමැති ඩලස් අලහප්පෙරුම



### වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජනතා සේවකයෙක්

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස



### ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ඕනෑම මන්ත්‍රීවරයකුට උදව් කළා

පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල

**විපක්ෂයේ සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා-**

විජමු ලොකු බණ්ඩාර මහතා ගැන අගමැතිවරයාත්, සභානායකවරයාත්, විපක්ෂ නායකවරයාත් කළ කතා හදවතින්ම පිළිගන්නවා. නීති සම්පාදක දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු ආරම්භ කර දේශපාලනයට පිවිස වසර 33 ක් පාර්ලිමේන්තු දේශපාලනය කළා. උඩරට ජීවත්වන සිංහල ජනතාව ගැන විශාල කැක්කුමකින් එතුමා වැඩ කළා. දේශීයත්වය අගය කරමින් කටයුතු කළ එතුමා නිහතමානී ලෙස කටයුතු කළා.

**වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා-**

මෙරට දේශපාලනයේ දශක පහකට ආසන්න කාලයක් තුළ වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා කැපී පෙනෙන භූමිකා ගණනාවක් නිරූපණය කළා. ජාතික දේශපාලනයේ සංස්කෘතික මුහුණුවර ඉස්මතු කර ගැනීම සඳහා ප්‍රායෝගිකව කැපවූ නායකයෙක් විදියට ඔහු පෙන්වා දෙන්න පුළුවන්. ප්‍රගතිශීලී නායකයෙක්. අප කා අතරත් සුන්දර මතක සටහන් තැබූ සුන්දර මිනිසෙක්. ප්‍රඥාවෙන් ජීවිතය අවබෝධ කර ගත් අයෙක්. අපේ මිත්‍ර වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතාට අපගේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකය ප්‍රකාශ කරනවා.

**ප්‍රවාහන ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා-**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, අමාත්‍යවරයකු සහ මේ පාර්ලිමේන්තුවේ කතානායකවරයකු ලෙස මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ බදුල්ල දිස්ත්‍රික්කයේ ආදරය දිනාගත් ආදර්ශමත් නායකයෙක් වි.ජ.මු. එතුමා අව්‍යාජ ගැමියෙක්. රටේ සංස්කෘතිය, සභ්‍යත්වය ඉහළින්ම ඔසවා තැබූ ඔහු නවක මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් දුන්නා. මා නීති ශිෂ්‍යයෙක්ව සිටින විට ජාතික ඇඳුමක් ඇඳගෙන බෑගය ඔසවාගෙන එතුමාගේ රාජකාරි කටයුතුවලට නිතර අලුත්කඩේ උසාවියේ නීති සම්පාදන අංශයට නිතර ආවා ගියා. සිංහල භාෂාවට එතුමා තරම් ආදරය කළ අයෙක් නැති තරම්. නමුත් ඔහු ඉංග්‍රීසි භාෂාවත් ඉතා හොඳින් ප්‍රගුණ කළා. එදා කුමාරතුංග සමඟ හෙළ හවුලේ අයෙකු ලෙස රටට සේවාවක් කළා. ඒවා තරුණ පරපුරට ආදර්ශයක්. බොහෝ අය ජාතිකත්වයේ සිටින ගමන් සිංහල භාෂාව පමණක් ඉගෙන ගන්නවා. දෙමළ, ඉංග්‍රීසි භාෂා ප්‍රතික්ෂේප කරනවා. එවැනි අයට වි.ජ.මු. හොඳ ආදර්ශයක්.

**ගාල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා (ස.ජ.බ.)-**

හපුතලේ ආසනය විශිෂ්ට ලෙස ජයග්‍රහණය කර වි.ජ.මු. මහතා 1977 දි පාර්ලිමේන්තුවට පැමිණියා. ජේ.ආර්. ජයවර්ධන මහතා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එතුමාට බාර දුන්නා. එතැන් පටන් එතුමා විවිධ අමාත්‍යාංශය දැරුවා. විවිධ තනතුරු දරමින් වගකීම් ඉටු කළා. දුරකථන ඇමතුමක් දුන් විට 'ආයුබෝවන්' කියන සංකල්පය ඇති කළේ එතුමා. බුද්ධාගමට ගරු කළ අයෙක් ඔහු. නිතර පොත් කියවූ අයෙක්. පොත් රසිකයෙක් වගේම පොත් රචනා කරන්නත් එතුමා කටයුතු කළා. මේ උදාර චරිතය අහිමි වීමත් සමඟ වි.ජ.මු. කියන කුලකයට අයත් අයෙක් මේ සභාවේ නැවත කවදා දකින්න ලැබෙයිද කියන සැකය අපට තිබෙනවා.

**බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී චාමර සම්පත් දසනායක මහතා (පො.ජ.පෙ.)-**

බදුල්ලෙන් දේශපාලන චරිත බොහොමයක් බිහි වුණා. 70 දශකයේ බණ්ඩලා, අප්පුහාමිලා මේ සභාවේ නියෝජනය කළා. නිදහසෙන් පසුව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න උඩරටින් දේශපාලනඥයන් බොහොමයක් බිහි වුණා. බදුල්ල දිස්ත්‍රික්කයේ තමයි වැඩිම ජාතික පාසල් තිබෙන්නේ. ජාතික පාසල් මෙරට බිහි කළේ වි.ජ.මු. . දියතලාව ආයුර්වේද රෝහලේ නිර්මාතෘ විජමු ලොකු බණ්ඩාර මහතා. දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව බැලූ විට වි.ජ.මු. මහතා රටේ ඉහළම තැනකට පත්වේවි කියන අපේක්ෂාව බදුල්ල ජනතාවගේ හදවත් තුළ තිබුණා. බදුල්ලට ඉමහත් සේවාවක් කළ ආදරණීය නායකයෙක් විදියට ඒ මහතා හඳුන්වන්න පුළුවන්.

**බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා (ස.ජ.බ.)-**

සිරුරින් කුඩා පුද්ගලයෙක් වුවත් කඩවසම් පුද්ගලයෙක් ලෙස විජමු ලොකුබණ්ඩාර මහතා දකින්න පුළුවන්. දැනුමෙන් ඥානයෙන් අද්විතීය ස්ථානයක් එතුමාට තිබුණා. කිසියම් පාර්ශ්වයක් අගතියට පත් වුවහොත් එය නිවැරැදිව විසඳන ආකාරය මම ඉගෙන ගත්තේ විජමු මහතාගෙන්.

**ජල සම්පාදන ඇමැති වාසුදේව නානායක්කාර මහතා-**

වි.ජ.මු. යන අක්ෂර මේ රටේ දේශීය සන්නාමය බවට පත් වුණා. ඔහුගේ සිංහලකම, බෞද්ධාගමිකභාවය අනෙක් අයත් සමඟ ගැටලු ඇති කර ගන්නා තත්ත්වයට පත් කර ගත්තේ නැහැ. සුවිශේෂී චරිතයක් වූ ඔහු සමාජයේ සිටි පුද්ගලයන් අතරින් සාමාන්‍යයෙන් දැකිය නොහැකි සුවිශේෂ ගුණවලින් යුක්ත අයෙක්.

**විදුලිය බල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා-**

ජන සම්මතවාදී ගෞරවනීය නායකයෙක් විදියට වි.ජ.මු. මහතා හඳුන්වන්න පුළුවන්. කුමන ලොකු තනතුරක් දැරුවත් ඔහු ලොකුකම් පෙන්වූයේ නැහැ. තනතුරේ වගකීම් ලොකුවට ගත්තත් නිහතමානීව ඔහු කටයුතු කළා. මේ චරිතයේ දිග පළල ගැන මම දන්නවා. හොඳ සංස්කෘතික ජීවිතයක් ඔහුට තිබුණා. විනයධර, ධර්මධර ශික්ෂාකාමී මිනිසකුගේ ලොකුම ලොකු මුද්‍රාව වි.ජ.මු. මහතා හඳුන්වන්න පුළුවන්. පාර්ලිමේන්තුවට සභ්‍යත්වය, ශිෂ්ට සම්පන්නභාවය ඔහු රැගෙන ආවා. පාර්ලිමේන්තුවේ අසභ්‍යත්වය වෙනුවට ඔහු මෙතැනට රැගෙන ආවේ ඌව වෙල්ලස්සේ අව්‍යාජභාවයයි. නිර්මල පංචශීල ප්‍රතිපත්තිය ඔහු තුළ තිබුණා. බලයට කෑදර වූ දේශපාලනඥයෙක් නොවේ. ඒ වගේම ජීවිතයට ආසාවක් නැති අයෙක්. ඒ මහතාගේ චරිතය අපට පරමාදර්ශයක්.

**පත් කළ මන්ත්‍රී හරින් ප්‍රනාන්දු මහතා (ස.ජ.බ.)-**

වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතාගේ මතකයන් අප සතුව තිබෙනවා. 'ආයුබෝවන්' කියන වචනය එතුමාගේ වදන් තුළ නිරන්තරයෙන් තිබුණා. බොහොම නිහතමානී චරිතයක් ඔහු. මගේ විවාහයට අත්සන් කළේත් විජමු මහතා. නාන ගමන් හයියෙන් ශ්ලෝක කියනවා. විජමු කියන්නේ රටට අර්ථයක් ලබා දුන් නායකයෙක්. යට ඉඳන්ම උඩට වරෙන් කියලා මට දේශපාලනයේදී එතුමා උපදෙස් දුන්නා. ඔහුගේ අඩිපාරේ නොමැකෙන නාමයක් ගෙනයන්න ඔහුගේ දරුවන් තිදෙනාට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. එජාපයේ නියෝජනයක් මෙතැන අද නැහැ. අපිත් එජාපයේ සිටි අය.

**පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා මුලසුනට පැමිණියේය.**

**පොළොන්නරු දිස්ත්‍රික් මන්ත්‍රී මෛත්‍රීපාල සිරිසේන මහතා (පො.ජ.පෙ.)-**

විජමු ලොකුබණ්ඩාර මහතා පරමාදර්ශී චරිතයක්. පරමාදර්ශී චරිතයකට තවත් කෙනෙකුට ඇඟිල්ල දිගු කළ නොහැකියි. මෙරට පාර්ලිමේන්තු ඉතිහාසය 1947 සිට ගත් විට සැබෑ ලෙසම බහුශ්‍රැතයෙක් ලෙස හැඳින්විය හැකි අය අඩුයි. නමුත් වි.ජ.මු. එවැනි අයෙක්. වි.ජ.මු. දැනුවත්කම, උගත්කම, ඥානය බෞද්ධකමත් සමඟ ප්‍රගුණ කළ අයෙක්. ඔහු මුළු මහත් සමාජයටම ආදර්ශයක් වුණා. ඔහු තුළ තිබූ දක්ෂකම්, හැකියාවන්, නිර්මාණශීලිභාවයන් යන සියලු දේ තවත් චරිත සමඟ සැසඳීමට අපහසුයි. මෙතුමා පිරිත්, බණ, ධර්ම සාකච්ඡා තිබෙන තැනකට ගියොත් ඒ සෑම තැනම ඒ ක්ෂේත්‍රය කෙරෙහි මනා දැනුමක් පෙන් වූ අයෙක්. දේශපාලන, ආර්ථික, සමාජ ප්‍රශ්න ගැන හොඳ අවබෝධයක් ඔහුට තිබුණා. ඒවා විසඳීමටත් ඔහු කටයුතු කළා. එතුමාගේ අභාවය ජාතියක් විදියට අපට පාඩුවක්. එතුමාගේ පවුලට පමණක් නොව ඒ පාඩුව රටටම දැනෙනවා. 1977 සිටම මම එතුමා හඳුනනවා.

**පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි-**

කොවිඩ් - 19 වසංගතයට ගොදුරු වීම නිසා වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා රටෙන් සමුගැනීම සම්බන්ධයෙන් අදහස් පළ කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. විජමු මහතා ගැන කතා කරන්න මට විශේෂ අයිතියක් තිබෙන බව මම හිතනවා. මම සහ ඕමල්පේ සෝභිත හිමි දුන් ඡන්දය නිසා එතුමා කතානායකවරයා බවට පත් කරන්න අපට හැකි වුණා.

**රාජ්‍ය ඇමැති කනක හේරත් මහතා-**

උගතෙකු, බුද්ධිමතෙකු ලෙස විජමු ලොකු බණ්ඩාර මහතා හඳුන්වන්න පුළුවන්. අපේ පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස පත්ව ප්‍රදේශයේ ජනතාවට විශාල සේවාවක් කළා. මේ ආදර්ශවත් චරිත ගැන සොයා බලා අපි කටයුතු කළ යුතුයි. 2010 උදිත ලොකු බණ්ඩාර මහතාටත් ශෝකය ප්‍රකාශ කරනවා.

**පත් කළ මන්ත්‍රී මයන්ත දිසානායක මහතා (ස.ජ.බ.)-**

මගේ පියා වන ගාමිණී දිසානායක මහතාගේ කල්‍යාණ මිත්‍රයෙක් වෙනවා ලෙස වි.ජ.මු. ලොකු බණ්ඩාර මහතා. වි.ජ.මු. මහතා මම දැන හඳුනාගන්නේ මම පොඩි කාලයේ සිටයි. අංකල් වි.ජ.මු. කියලා තමයි මම ඔහු ආමන්ත්‍රණය කරන්නේ. ගාමිණී දිසානායක මහතා වෙනුවෙන් පෙනී සිටීමට එතුමා කටයුතු කළා. ගාමිණී දිසානායක පදනම හදන්න මගේ මවත් සමඟ එක්ව පූර්ණ සහාය දෙන්න එතුමා කටයුතු කළා.

**පාර්ලිමේන්තුව ලබන 09 වැනිදා පෙරවරු 10ට යළි රැස්වේ.**

# මානව හිමිකම් මහකොමසාරිස් වාර්තාවේ අන්තර්ගතය සාවද්‍ය කරුණුවලින් පිරිලා

## එජා මානව හිමිකම් කවුන්සිලය හමුවේ ඇමැති දිනේෂ් කියයි

**මහින්ද අලුත්ගෙදර**

මතභේදාත්මක වාර්තාවලින් උකහා ගන්නා ලද ජගත් මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරියගේ වාර්තාවේ අන්තර්ගතය, සාවද්‍ය කරුණුවලින් පිරී තිබෙන බවට ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය හමුවේ ප්‍රකාශ කරයි.

ඒ අනුව ජාත්‍යන්තර වශයෙන් තහනම් කර ඇති ත්‍රස්තවාදී සංවිධානයක් වන එල්ටීටීඊය විසින් සිදුකරන ලද හිංසා, රටේ භෞමික අඛණ්ඩතාව සහ ජනතාවගේ ජීවන අයිතිය ආරක්ෂා කිරීමට රජය විසින් ගෙන ඇති නීත්‍යනුකූල පියවර සමඟ සමාන කොට දක්වන අතර මානව හිමිකම් කවුන්සිලය සහ සියලුම එක්සත් ජාතීන්ගේ සංවිධාන සමඟ අඛණ්ඩ සහයෝගය සහ සම්බන්ධතාව තිබියදීත්, නිරන්තරයෙන් ව්‍යාප්ත වන බාහිරයෙන් පාලනය කරනු ලබන උපදෙස් පිළිබඳව අවධාරණය කිරීම, අභියෝග රැසක් ඇති කළහැකි බවද එවැනි ක්‍රියාදාම එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවලට බලපාන භයානක පූර්වාදර්ශයක් වියහැකි බවද විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පෙන්වාදෙයි.

මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව පිළිබඳ අන්තර්ක්‍රියාකාරී සංවාදය 'ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම' (A/HRC/46/20) සඳහා අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වෙමින් විදේශ කටයුතු ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.





එහිදී වැඩිදුරටත් අදහස් පළකළ දිනේෂ් ගුණවර්ධන මහතා-

පෙරේදා (24) ඉදිරිපත් කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව, පසුගිය වසරේ දී පැවති මේ කවුන්සිලයේ 43 වන සැසියේ දී ශ්‍රී ලංකා රජය සම අනුග්‍රාහකත්වය ඉල්ලා අස්කර ගන්නා බව නිවේදනය කරන ලද 30/1 සහ 40/1 යෝජනාවලින් ඇරැඹෙන්නක්. ඕනෑම ස්වයං-ගෞරවයක් සහිත ස්වෛරී රටක පාලනය පිළිබඳ කරුණු සහ මූලික වශයෙන් දේශීය කරුණු ඇතුළත් කරමින්, අසාධාරණ ලෙස තම විෂය පථය සහ වරම පුළුල් කර ඇති මහ කොමසාරිස්වරියගේ වාර්තාව ශ්‍රී ලංකාව ප්‍රතික්ෂේප කරනවා. මෙය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 2 (7) වගන්තිය වන "වර්තමාන ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් මගින් කිසිදු රාජ්‍යයක දේශීය අධිකරණ බලයේ පවතින කාරණාවලට මැදිහත්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට බලය පවරන්නේ නැත." යන්න සම්පූර්ණයෙන් උල්ලංඝණය කිරීමක් වෙනවා.

නිර්දේශ සහ නිගමන සම්බන්ධයෙන් මතුවී ඇති ගමන් මඟ, ශ්‍රී ලංකාවට එරෙහි ඇතැම් කොටස් විසින් නිර්දය ලෙස ලුහුබඳිනු ලබන පූර්ව නිගමනය, දේශපාලනීකරණය සහ අගතිගාමී න්‍යාය පත්‍රය පිළිබිඹු කරනවා. වැරැදි ලෙස ගොඩනංවන ලද චෝදනා මත මේ නිර්දේශ පදනම් වී තිබෙනවා. මහ කොමසාරිස් වාර්තාවේ අඩංගු නිගමන සහ නිර්දේශ ශ්‍රී ලංකාව තරයේ ප්‍රතික්ෂේප කරනවා. විශේෂයෙන් එක්සත් ජාතීන් හා එහි යාන්ත්‍රණ සමඟ නිරතුරුව හා ඵලදායී ලෙස සම්බන්ධ වී සිටින ශ්‍රී ලංකාව වැනි රටක් සම්බන්ධයෙන් ගත්කල, වත්කම් අත්හිටුවීම, සංචාරක තහනම් පැනවීම, ජාත්‍යන්තර අපරාධ අධිකරණය වෙත යොමු කිරීම සහ එක් එක් රාජ්‍යයන් විසින් විශ්වීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා කෙරෙන ඉල්ලීම්, මහ කොමසාරිස් කාර්යාලය විසින් මේ දක්වා ප්‍රවේශය ලබාදීම ප්‍රතික්ෂේප කොට ඇති සහ ඒවායින් සමහරක් වසර තිහක් තිස්සේ නිකුත් නොකොට රඳවා ගෙන ඇති සාක්ෂි මත පදනම් වන අතර, ජාත්‍යන්තර ප්‍රජාව විසින් සමස්තයක් වශයෙන් සැලකිල්ලට ගතයුතු පැහැදිලි හා සුවිශේෂී අනතුරක් පෙන්වා දෙනවා.

ඇතැම් රටවල් විසින් සිදුකරන එවැනි ඒකපාර්ශ්වික ක්‍රියා පිළිගත නොහැකි අතර, එය ස්වාභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කිරීමක්. පසුගිය මාර්තු මාසයේ සිට ලබාඇති ප්‍රගතියට අමතරව, වාර්තාවේ අඩංගු වැරදි තොරතුරු, වැරදි වැටහීම් සහ අත්තනෝමතික තක්සේරු කිරීම් පිළිබඳ ශ්‍රී ලංකාව ලිඛිත අදහස් දැක්වීම් ලබා දී තිබෙනවා. ඒ පිළිබඳව පෙර නොවූ විරූ ප්‍රචාරක ව්‍යාපාරයක් සමඟින්, මහ කොමසාරිස් කාර්යාලය සිය වාර්තාව ප්‍රකාශයට පත්කිරීම සහ එම වාර්තාව පිළිබඳ අපගේ අදහස් අතිරේකයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම ප්‍රතික්ෂේප කිරීම කණගාටුවට කරුණක්. මෙමඟින් වාර්තාව පිළිබඳ ශ්‍රී ලංකාවේ අදහස් සම්බන්ධයෙන් සමාන දෘශ්‍යතාවක් ලබාගැනීම, ශ්‍රී ලංකාවට සහ සාමාජික රටවලට අහිමි වී තිබෙනවා. මීට පෙර මේ කවුන්සිලය වෙත පැහැදිලි කරන ලද හේතු මත ශ්‍රී ලංකාව විසින් ප්‍රතික්ෂේප කර ඇති වගවීම පිළිබඳ විශේෂඥ කමිටුවේ (PoE) අතිශය විවාදාත්මක වාර්තාව සහ ශ්‍රී ලංකාව පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාව (OISL) තුළින් ප්‍රතිනිෂ්පාදනය කර ඇති මහ කොමසාරිස් වාර්තාවේ අඩංගු චෝදනා ශ්‍රී ලංකාව ප්‍රතික්ෂේප කරනවා. ඉහත මතභේදාත්මක වාර්තාවලින් උකහා ගත් මේ වාර්තාවේ අන්තර්ගතය, අන්තර්ජාතික වශයෙන් තහනම් කර ඇති ත්‍රස්තවාදී සංවිධානයක් වන එල්ටීටීඊය විසින් සිදුකරන ලද හිංසා, රටේ භෞමික අඛණ්ඩතාව සහ අපේ ජනතාවගේ ජීවන අයිතිය ආරක්ෂා කිරීමට රජය විසින් ගෙන ඇති නීත්‍යානුකූල පියවර සමඟ සමාන කොට දක්වන සාවද්‍ය කරුණුවලින් පිරී තිබෙනවා යැයිද කීය.

# ලෝක තෙල් මිල විචලනය වුවත් ස්ථාවර ඉන්ධන මිලක් පවත්වා ගැනීමට ක්‍රියා කරනවා

## බලශක්ති ඇමැති උදය ගම්මන්පිල


**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

ලෝක වෙළෙඳපොළේ ඉන්ධන මිල විචලනය වුවද ස්ථාවර ඉන්ධන මිලක් පවත්වාගෙන යාමට රජය කටයුතු කරන බව බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා පාර්ලිමේන්තුවේදි ප්‍රකාශ කළේය.

වසර එක හමාරකට ආසන්න කාලයක් ඉන්ධන මිල ස්ථායී ලෙස පවත්වා ගැනීමට රජයට හැකියාව ලැබුණු බවත්, ඉදිරියේදීත් ලෝක වෙළෙඳපොළේ ඉන්ධන මිල විචලනය වුවද ස්ථාවර ඉන්ධන මිලක් පවත්වාගෙන යාමට රජය උත්සාහ දරන බවත් බලශක්ති ඇමැතිවරයා පැවසීය.

එහෙත් පසුගිය යහපාලන රජයේ මිල ප්‍රතිපත්තිය වූයේ මිල සූත්‍රයක් හඳුන්වාදෙමින් වෙළෙඳපොළ තෙල් මිල ඉහළ යාමේ බර ජනතාව මත පැටවීම බවද ඇමැතිවරයා පැවසීය.

නිරතුරුව සිදුකරන මිල උච්ඡාවචනය ජනතාවට



දැඩි ලෙස බලපාන බැවින් ඉන්ධන මිල ස්ථාවරව තබා ගැනීමේ ප්‍රතිපත්තියක සිටිමින් රජය සෑමවිටම කටයුතු කරන බවද ඇමැතිවරයා සඳහන් කළේය . ආණ්ඩුවට හැකි පමණ කාලයක් බනිජ තෙල් මිල ස්ථාවරව පවත්වාගෙන යාමට කටයුතු කරන අතර තෙල් සංස්ථාව පාඩු ලැබුවද එම බර ජනතාව මත පැටවීමට ආණ්ඩුව සූදානම් නොමැති බවද ඇමැතිවරයා කීය. 2019 සැප්තැම්බර් 11 වැනිදින අවසාන මිල සංශෝධනය කිරීමෙන් අනතුරුව මේ දක්වා බනිජතෙල් මිලේ කිසිදු වෙනස්වීමක් සිදු නොවූ බවත් දැවැන්ත මිල ඉහළ යාමක් සිදු වී දරා ගත නොහැකි මට්ටමට පැමිණියහොත් පමණක් රජය ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බවත් ඇමැතිවරයා කීය.

එහිදි වැඩිදුරටත් ඇමැති උදය ගම්මන්පිල මහතා මෙසේද කීය.

ගිය ආණ්ඩුවේ නිල ප්‍රතිපත්තිය වූයේ ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ නංවනකොට ඒ බර ජනතාව මත පැටවීමයි. බටහිර මානසිකත්වයේ සිටි ආණ්ඩුවක් ලෙස ලොව අනෙක් රටවල් මේක කරන කොට ඒ අය හිතුවා අපිත් මාසිකව වත් මේක කරන්න නෑ කියා. නිරන්තරයෙන් මිල උච්ඡාවචනය වීම ජනතාවගේ ජීවන තත්ත්වයට බලපානවා.අනෙක් පැත්තෙන් රටේ නිෂ්පාදන පිරිවැයට බලපානවා. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ජීවන තත්ත්වය සහ නිෂ්පාදන පිරිවැය ස්ථාවරව පවත්වාගෙන යාමට ස්ථාවරව මිල ප්‍රතිපත්තියක සිටිය යුතු බවයි.

# මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි ලියූ 'හෙළ වෙදකමේ යටගියාව' කෘතියේ මුල් පිටපත ජනපතිට

බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක, නාරාහේන්පිට අභයාරාමාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමිපාණන් විසින් රචිත "හෙළ වෙදකමේ යටගියාව" කෘතියේ පළමු පිටපත ජනාධිපති කාර්යාලයේ දී ඊයේ (25) පෙරවරුවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත පිළිගැන්වීය.

ශ්‍රී ලංකාවේ ඉපැරණි හෙළ වෙදකම එහි ස්වර්ණමය යුග සහ වටිනාකම් පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් කෘතියේ අන්තර්ගත වන අතර රජරට විශ්ව විද්‍යාලයේ කුලපති, මිරිසවැටිය විහාරාධිකාරී ඊතලවැටුණුවැවේ ඥාණතිලක හිමි සහ ගොඩගේ ප්‍රකාශන අධිපති දේශබන්දු සිරිසුමන ගොඩගේ මහතා ද මේ අවස්ථාවට එක්ව සිටියහ.



EWIS Colombo Limited දේශීය පරිගණක නිමැවුම් අංගනය නිෂ්පාදනය කළ නවතම EWIS Neo pro. Laptop පරිගණකය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ඉදිරිපත් කිරීම ද මෙහිදී සිදු කෙරිණ. මිරිසවැටිය විහාරාධිකාරී ඊතලවැටුණුවැවේ ඥාණතිලක හිමිපාණෝ එය ජනාධිපතිවරයා වෙත පිළිගැන්වූහ.

# රුපියල් 20 නව කාසියක් වෙළෙඳපොළට

## මාර්තු 3 දා සිට මුදල් සංසරණයට එක් වෙයි

**මහින්ද අලුත්ගෙදර**

මුදල් සංසරණයට රුපියල් 20 නව කාසියක් නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගෙන තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවට වසර 70ක් පිරීම නිමිත්තෙන් නිකුත් කළ රුපියල් 20 නව කාසිය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා විසින් ජනාධිපති කාර්යාලයේ දී පෙරේදා (24) පස්වරුවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත පිළිගැන්වීය.

ශ්‍රී ලංකා මහ බැංකුවට වසර 70ක් පිරීම නිමිත්තෙන් "සමරු සංසරණ" කාසියක් ලෙස මෙය නිකුත් කර තිබේ. එම නව කාසිය පැති 07ක් සහිත හැඩයකින් යුතුව නිකල් තවරා, වානේවලින් නිෂ්පාදනය කර තිබෙන අතර කාසි මිලියන 05ක් ලබන මාර්තු 03 වැනිදා සිට මුදල් සංසරණයට එකතු කෙරෙන බවද ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරයි.







# පාකිස්තානයේ සංචාරයකට එන්න

## පාකිස්තාන අගමැතිගෙන් ජනපතිට හා අගමැතිට ආරාධනා

## උණුසුම් පිළිගැනීමට හා ආගන්තුක සත්කාරයට ප්‍රණාමය

### පාකිස්තාන අගමැති ඉම්රාන් ඛාන්

**මහින්ද අලුත්ගෙදර**

"සාමකාමී අසල්වැසියකු" පිළිබඳ දැක්මට අනුකූලව, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට පාකිස්තානයේ සහයෝගය දෙන බව පාකිස්තාන අගමැති ඉම්රාන් ඛාන් මහතා අවධාරණය කරයි.

ආරක්ෂාව, ත්‍රස්තවාදය, සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ ජාවාරම් වැනි කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී මෙන්ම බුද්ධි අංශ තොරතුරු හුවමාරු කර ගැනීමේ දී එකිනෙකාට සහයෝගය දැක්වීම හා සම්බන්ධීකරණය කිරීමට ශක්තිමත් හවුල්කාරිත්වයේ අවශ්‍යතාව ශ්‍රී ලංකාව සහ පාකිස්තානය අවධාරණය කරයි.

පාකිස්තාන අගමැති ඉම්රාන් ඛාන් මහතා පසුගිය 23-24 දිනවල ශ්‍රී ලංකාවේ දී නිරත වූ සංචාරය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කරමින් මේ බව සඳහන් කරයි.

එහි වැඩිදුරටත් මෙසේද සඳහන් වෙයි.

ශ්‍රී ලංකා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරාධනය පරිදි පාකිස්තාන අගමැති ඉම්රාන් ඛාන් මහතා පසුගිය 23-24 දිනවල දී ශ්‍රී ලංකාවේ දෙදින නිල සංචාරයක නිරත විය. ඉම්රාන් ඛාන් මහතා සමඟ ෆෙඩරල් රජයේ අමාත්‍යවරුන් සහ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ඉහළ පෙළේ දූත පිරිසක් සහභාගි වූහ. දෙරටේ නව ආණ්ඩු පිහිටුවීමෙන් පසුව පාකිස්තාන අගමැතිවරයා ශ්‍රී ලංකාවට පැමිණි පළමු සංචාරය මෙය වන අතර, එමගින් දෙරටේ රජයන් සහ ජනතාව අතර පවතින උණුසුම් සුහදතාව පැහැදිලිව පිළිබිඹු කෙරේ. අගමැති ඉම්රාන් ඛාන් මහතා ශ්‍රී ලංකාවේ අගමැතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් උණුසුම් ලෙස පිළිගනු ලැබීය.

මේ සංචාරයේ දී අගමැති ඉම්රාන් ඛාන් මහතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ ශ්‍රී ලංකාවේ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් සමඟ නියෝජිත මට්ටමේ රැස්වීම් පැවැත්වීය. විවිධ සහයෝගීතා ක්ෂේත්‍රයන්හි බහුවිධ ද්විපාර්ශ්වික සම්බන්ධතාව පිළිබඳ දෙපාර්ශ්වයම පුළුල් ලෙස සමාලෝචනය කළහ. අන්‍යෝන්‍ය විශ්වාසය හා ගෞරවය සනිටුහන් කළ උණුසුම් හා සුහද වාතාවරණයකින් මේ සාකච්ඡා පවත්වන ලද අතර විශේෂයෙන් මෑතක දී පැවති විදේශ ලේකම් මට්ටමේ ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන, ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභා සැසිවාරය සහ වාණිජ ලේකම්වරුන්ගේ මට්ටමේ සාකච්ඡාවලදී හඳුනාගත් ක්ෂේත්‍රයන්හි, ඔවුන්ගේ සමීප හා විධිමත් උපදේශන තවදුරටත් ගොඩනගාගැනීමට මේ සංචාරය මගින් දෙපාර්ශ්වයටම කාලෝචිත අවස්ථාවක් සලසා දුන්නේය.

සහයෝගීතාව පුළුල් ආකාරයකින් තවදුරටත් ශක්තිමත් කිරීමට දෙපාර්ශ්වයම පුළුල් එකඟතාවකට එළඹුණු අතර, නිතර රැස්වීම් පැවැත්වීම; ඉහළ මට්ටමේ සහ නියෝජිත මට්ටමේ හුවමාරු ප්‍රවර්ධනය කිරීම; සහ අදාළ ආයතන අතර උපදේශන, සහයෝගීතාව සහ සම්බන්ධීකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා එකඟ වූ අතර "සාමකාමී අසල්වැසියකු" පිළිබඳ දැක්මට අනුකූලව, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා පාකිස්තානයේ සහයෝගය ලබාදෙන බවට අගමැති ඉම්රාන් ඛාන් මහතා අවධාරණය කළේය.

සංස්කෘතික සබඳතා, මානව සම්පත් සංවර්ධනය සහ විවිධ ක්ෂේත්‍රවල ධාරිතා වර්ධනය මෙන්ම අධ්‍යාපන හා තාක්ෂණික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේ දී දෙරට අතර පවතින පුළුල් සම්බන්ධතාවය පිළිබඳව දෙපාර්ශ්වයම සමාලෝචනය කළහ.

පාකිස්තාන-ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන සහයෝගීතා වැඩසටහනේ (PSLHECP) කොටසක් ලෙස පාකිස්තාන පාර්ශ්වය වෛද්‍ය ක්ෂේත්‍රයේ (එම්.බී.බී.එස් සහ බී.ඩී.එස්.) ශිෂ්‍යත්ව 100 ක් ප්‍රදානය කිරීම පිළිබඳව ප්‍රකාශයට පත්කළ අතර මානව සම්පත් සංවර්ධනය හා ධාරිතා වර්ධනයට පාකිස්තානය දක්වන සහයෝගය ශ්‍රී ලංකා පාර්ශ්වය අගය කළේය.

බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථාන කරා ආගමික සංචාරක කර්මාන්තය තුළ විශාල අවස්ථාවක් පවතින බව වටහා ගනිමින් සහ ගාන්ධාර ශිෂ්‍යාචාරය දක්වා දිවෙන ඓතිහාසික හා සංස්කෘතික බැඳීම් පිළිබඳ අවධානය යොමු කරන අතරම, දෙපාර්ශ්වයම සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාව ඉහළ නැංවීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කළ අතර, පුහුණුව සහ ධාරිතා වර්ධනය ඇතුළු ආගන්තුක සත්කාර කර්මාන්තයේ විශේෂඥතාව බෙදාහදා ගැනීමේ ප්‍රතිලාභ ඉස්මතු කළහ. මහනුවර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී ආසියානු ශිෂ්ටාචාර හා සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීමේ පියවර පාකිස්තාන පාර්ශ්වය නිවේදනය කළ අතර අන්තර්පුද්ගල සබඳතා, සංචාරක කටයුතු, වෙළෙඳාම හා සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ගුවන් සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමේ වැදගත්කම දෙපාර්ශ්වයම හඳුනා ගත්හ.

දෙරට අතර ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ ආයෝජන වැඩිදියුණු කිරීමට නව මංපෙත් ගවේෂණය කිරීම පිණිස ඉහළ මට්ටමේ පාකිස්තාන-ශ්‍රී ලංකා වෙළෙඳ හා ආයෝජන සමුළුවක් 24 දා පැවැත්වීය. දෙරටේ ව්‍යාපාරික ප්‍රජාව අතර ඵලදායී හා අර්ථවත් සම්බන්ධතාවක් සඳහා මේ සමුළුව මගින් අවස්ථාවක් සලසා දී ඇති අතර පාකිස්තානය සහ ශ්‍රී ලංකාව දෙපාර්ශ්වයම, අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ප්‍රධාන ක්ෂේත්‍රයන්හි ආර්ථික සබඳතා ශක්තිමත් කිරීමේ වැදගත්කම සහ දෙරට අතර වෙළෙඳ හා ආයෝජන විවිධාංගීකරණය කිරීමේ වැදගත්කම නැවත අවධාරණය කළහ. අමෙරිකානු ඩොලර් බිලියනයක ද්විපාර්ශ්වික වෙළෙඳ ඉලක්කයක් සපුරා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමේ වැදගත්කම පිළිබඳව දෙපාර්ශ්වයම අවධාරණය කළ අතර, පාකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම පුළුල් කිරීම හා ගැඹුරු කිරීමට කටයුතු කිරීමට ද එකඟ වූහ.

මේ සංචාරය අතරතුර දී, පාකිස්තානය සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුම් කීපයකට අත්සන් තබන ලද අතර රටවල් දෙකේ රජයන් අතර සංචාරක සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය සහ පාකිස්තාන ආයෝජන මණ්ඩලය අතර සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ පාකිස්තාන කරච්චි විශ්වවිද්‍යාලයේ රසායනික හා ජීව විද්‍යාවන් පිළිබඳ අන්තර්ජාතික මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකාවේ කාර්මික තාක්ෂණ ආයතනය සහ ඉස්ලාමාබාද්හි කොම්සැට්ස් විශ්ව විද්‍යාලය අතර සහයෝගීතාවය සඳහා අභිප්‍රාය, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය සහ පාකිස්තානයේ ලාහෝර් ආර්ථික විද්‍යා විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකා-පාකිස්තාන පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ප්‍රතිනිර්මාණය කිරීමේ අවශ්‍යතාව, ඉම්රාන් ඛාන් සහ මහින්ද රාජපක්ෂ මහත්වරු ඒකාබද්ධව පිළිගත්හ. දෙපාර්ශ්වය අතර පාර්ලිමේන්තු සහයෝගීතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව දෙපාර්ශ්වයම අවධාරණය කළහ.

ආරක්ෂක ක්ෂේත්‍රයේ පවත්නා ද්විපාර්ශ්වික සහයෝගීතාව පිළිබඳ දෙපාර්ශ්වයම තෘප්තිය පළකළ අතර, කාර්ය මණ්ඩල මට්ටමේ සාකච්ඡා ආරක්ෂක සංවාදය දක්වා ඉහළ නැංවීම තුළින් ආරක්ෂක අංශ සබඳතා පුළුල් කිරීම සඳහා තවදුරටත් අවස්ථාවක් ලබා දී ඇති බව සඳහන් කළහ. අගමැති ඉම්රාන් ඛාන් මහතා ඩොලර් මිලියන 50 ක නව ආරක්ෂක ණය පහසුකමක් ලබාදීම පිළිබඳව ප්‍රකාශයට පත් කළ අතර ආරක්ෂාව, ත්‍රස්තවාදය, සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ ජාවාරම් වැනි කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී මෙන්ම බුද්ධි අංශ තොරතුරු හුවමාරු කර ගැනීමේ දී එකිනෙකාට සහයෝගය දැක්වීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා ශක්තිමත් හවුල්කාරිත්වයේ අවශ්‍යතාව දෙපාර්ශ්වයම අවධාරණය කළහ.

අගමැති ඉම්රාන් ඛාන් මහතා ක්‍රීඩා රාජ්‍යතාන්ත්‍රිකභාවය ශක්තිමත් කිරීමේ එතුමාගේ ප්‍රයත්නය වෙනුවෙන් 2021 පෙබරවාරි 24 වැනි දින ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ප්‍රජාව සමඟ අන්තර් ක්‍රියාකාරී සැසියක් සඳහා සහභාගි විය. මේ අවස්ථාවේ දී, "ඉම්රාන් ඛාන් ඉහළ කාර්යසාධන ක්‍රීඩා මධ්‍යස්ථානය" කොළඹ දී ආරම්භ කරන බව, ශ්‍රී ලංකාවේ ක්‍රීඩා හා යෞවන කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරිපිට දී නිවේදනය කළේය. පුහුණුව හා උපකරණ ලබාදීම ඇතුළුව, ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා ඩොලර් මිලියන 52ක් ලබා දෙන බවට පාකිස්තාන පාර්ශ්වය නිවේදනය කළේය.

කලාපීය හා ගෝලීය පරිසරයේ ප්‍රවණතා පිළිබඳව සාකච්ඡා කරමින් දෙපාර්ශ්වයම කලාපීය සාමය, ආරක්ෂාව සහ ස්ථාවරත්වය සඳහා වූ ඔවුන්ගේ ඒකාබද්ධ කැපවීම යළිත් තහවුරු කළහ. ජාත්‍යන්තර නීත්‍යානුකූලභාවයට අනුකූලව, ඵලදායී සංවාදය හරහා කැපී පෙනෙන ආරවුල් සාමකාමීව විසඳීමේ අවශ්‍යතාවය අගමැති ඉම්රාන් ඛාන් මහතා අවධාරණය කළේය. කලාපීය සම්බන්ධතාවයේ සන්දර්භය තුළ, ඉම්රාන් ඛාන් මහතා, කලාපීය ආර්ථික වර්ධනය සහ සමෘද්ධිය සඳහා චීන තීරය හා මාර්ගය මුලපිරීමෙහි ප්‍රධාන ව්‍යාපෘතියක් වන චීන-පකිස්තාන ආර්ථික කොරිඩෝරය (CPEC) ලබාදෙන ලද අවස්ථා පිළිබඳ ඉස්මතු කළේය.

හැකි ඉක්මනින් පාකිස්තානයේ සංචාරයකට පැමිණෙන ලෙස පාකිස්තානයේ අගමැතිවරයා ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට සහ අගමැතිවරයාට ආරාධනා කළේය. තමාට සහ තම දූත පිරිස වෙත දක්වන ලද උණුසුම් ආගන්තුක සත්කාරය පිළිබඳ අගමැති ඉම්රාන් ඛාන් මහතා අගමැති මහින්ද රාජපක්ෂ මහතාට ස්තූතිය පුද කළේය.

# ශ්‍රී ලංකා සංචාරයේ මතක සටහන් ඇල්බමය ඇමැති කෙහෙලිය පාකිස්තාන අගමැතිට බාරදෙයි

දෙදින නිල සංචාරයකට ශ්‍රී ලංකාවට පැමිණි පාකිස්තාන අගමැති ඉම්රාන් ඛාන් මහතා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යැමට පෙර ඒ මහතාගේ ශ්‍රී ලංකා සංචාරයේ සුවිශේෂී මතක සටහන් සහිත ඡායාරූප ඇතුළත් නිල ඇල්බමය සහ වීඩියෝ පටය කටුනායක, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළේ දී ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා අතින් පිළිගැන්වූ අයුරු. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් නාලක කළුවැව මහතා ද මෙහි සිටී.





දැහැමි ආකල්පවලට අනුගත කරන

# 'අමා දම් සිසිලස'

## ධර්ම දේශනා මාලාව




## ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක "අමා දම් සිසිලස" ධර්ම දේශනා මාලාව

ධාර්මික පිළිවෙතක් අනුගමනය කිරීමෙන් පුද්ගල ආකල්ප යහපත් කර ගත හැක. රටක ජීවත්වන ජනතාව භෞතික වශයෙන් සහ අධ්‍යාත්මික වශයෙන් දියුණු විය යුතු ය. එසේ සිදු නොවුණහොත් ගැටලු රැසකට මුහුණ දීමට සිදු වේ. වර්තමාන සමාජයේ පවතින අධි තරඟකාරීත්වය හේතුවෙන් බොහෝ මිනිසුන් තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට උදෑසන සිට රාත්‍රිය දක්වා වෙහෙසේ. ඇතැම් පුද්ගලයින්ට පොහොය දිනයකදීවත් ධර්ම දේශනාවක් ශ්‍රවණය කිරීමට හෝ විහාරස්ථානයකට ගොස් ආගමික වතාවත්වල නියැලීමට අවස්ථාව නොලැබේ. භෞතික සම්පත් කොපමණ තිබුණ ද මිනිසුන්ට අවශ්‍ය අධ්‍යාත්මික සුවය ලබා ගැනීමට නොහැකි වීමෙන් එම පුද්ගලයින්ගේ ජීවිතයට විශාල බලපෑමක් සිදු වේ. එම කාරණාව මනාව ධාරණය කර ගනිමින් මිනිසුන්ගේ අධ්‍යාත්මික සුවදායීබව නංවමින්, පුද්ගල ආකල්ප යහපත් කිරීමට අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා අමා දම් සිසිලස ධර්ම දේශනා වැඩසටහන හඳුන්වා දී තිබේ. මෙවර නවම් පුර පසළොස්වක පෝය දිනයේදී අමා දම් සිසිලස ධර්ම දේශනා මාලාවේ 207 වැන්න, වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක, වාරියපොළ රජමහා විහාරාධිපති, මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝ සභික, උපාධ්‍යාය, දූරන්ධර, මහාචාර්ය, තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ පවත්වති.

### මෙවර ධර්ම දේශනාව පවත්වනු ලබන්නේ

## වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක, වාරියපොළ රජමහා විහාරාධිපති, මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝ සභික, උපාධ්‍යාය, දූරන්ධර, මහාචාර්ය,

### තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්වාමීන් වහන්සේ විසිනි





## ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ, කොළඹ දිසාවේ, දිසා පාලක, කොළඹ - 15 කැළණි නදී විහාරාධිපති,

### පූජ්‍ය අකුරටිස්සේ අරියසාගර හිමි

**රටක පාලකයා ධර්ම මාර්ගය අනුගමනය කරන විට, එය අනුගමනය කරමින් රටේ ජනතාව ද ධර්ම මාර්ගයට අනුගත වේ. එය වර්තමාන සමාජයේ දක්නට ලැබෙන සුවිශේෂී ප්‍රවණතාවයකි. ආගම දහමට ඇලුම් නොකරන බටහිර රටවල සංස්කෘතියට අනුගත වූ ජනතාවට ජීවිතයේ සැබෑ අරුත පිළිබඳව අවබෝධයක් නැත. නමුත් ලෝකයේ ප්‍රමුඛතම බෞද්ධාගමික රටක් වන ලංකාව තුළ ධර්මයේ අගය වටහා දීමට බොහෝ දෙනෙක් සැදී පැහැදී සිටී. ඒ අතින් ලාංකිකයින් සැබවින්ම වාසනාවන්ත ය.**

### ශ්‍රේෂ්ඨ නායකයෙකුගේ යහපත් ආදර්ශය

බුදුරජාණන් වහන්සේ දේශනා කළ උතුම් බුදු බණ, වර්තමාන සමාජයේ සැම පුද්ගලයකුගේම ජීවිතයට ආලෝකයක් සපයයි. වත්මන් සමාජයේ ප්‍රශ්න නොමැති පුද්ගලයකු සොයා ගැනීමට අපහසු ය. ඒ නිසාවෙන් මිනිසුන්ගේ ජීවිතවලට අධ්‍යාත්මික සුවයක් ලබා දී ඔවුන්ගේ සිත් සතන් දැහැමි ආකල්පවලින් උපයුක්ත කිරීම වටිනා පුණ්‍යකර්මකි. අමා දම් සිසිලස ධර්ම දේශනා වැඩසටහන යනු අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා රටේ නායකයෙකු වශයෙන් සමාජයට කරනු ලබන සුවිශේෂී කටයුත්තකි. බෞද්ධයින්ට පමණක් නොව ඕනෑම ආගමිකයෙකුට මෙම ධර්ම දේශනාවන්ට සහභාගී වී ධර්මය ශ්‍රවණය කිරීමෙන් තමන්ගේ ජීවිත ධාර්මිකව සාර්ථක කර ගැනීමට හැකියාව ලැබේ. දුටුගැමුණු රජතුමා ලංකාවේ සැම ස්ථානයකම පාහේ බෞද්ධ සිද්ධස්ථාන ඉදි කර, ධර්මයට අනුව තමන්ගේ ජීවිතය හැඩ ගස්වා ගෙන විශේෂ පෙරහැර පිංකම් වැනි ආගමික කටයුතු සිදු කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකි. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා යනු වර්තමානයේ බිහි වුනු ශ්‍රේෂ්ඨ නායකයෙකි.

එතුමාට ධර්මය පිළිබඳව මනා විශ්වාසයක් තිබේ. ධර්මයෙන් ආරක්ෂාව ලැබෙනවා යන්නට ඔහු තුළ දැඩි විශ්වාසයක් පවතී. එතුමා පළමු වැනි ජනාධිපතිවරණය අවස්ථාවේ දී, ශ්‍රී මහා බෝධියේ පුද පූජා පවත්වන මොහොතේ දී එතුමා අසළට අසාමාන්‍ය ලෙස බෝ කොළයක් පතිත විය. එම බෝ කොළය පතිත වීම, තමන්ගේ ජයග්‍රහණය ස්ථිරව සටහන් වීමක් බව එතුමාණන්ට අවබෝධ විය. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එම බෝ කොළය රැගෙන පැමිණීම තුළින් ද එතුමා තුළ බුදු දහම කෙරෙහි පවතින විශ්වාසය ගම්‍යමාන වේ. තායිලන්තය, බුරුමය වැනි රටවල රජවරු ධාර්මික කටයුතු හොඳින් අනුගමනය කරයි. නමුත් ශ්‍රී ලංකාවේ මෙන් ධර්ම දේශනා වැඩසටහන් වැඩිවශයෙන් පවත්වන්නේ නැත. එනිසා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ වුණු අමා දම් සිසිලස ධර්ම දේශනා වැඩසටහන මුළු ලෝකයේම සිටින බෞද්ධ නායකයින්ට සහ අන් අයට ආදර්ශයක් සපයනු ලබයි.

### මිනිසුන් යහමඟට යොමු කරන්නෙක්

අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ මඟපෙන්වීම මත, ජාතිය, ආගම, කුලය, තත්ත්වය යනාදිය පිළිබඳ නොතකා සියලු සත්ත්වයෝ සුවපත් වේවා යන ශ්‍රේෂ්ඨ සිතුවිල්ල පෙරදැරි කර ගෙන පවත්වනු ලබන මෙම ධර්ම දේශනා වැඩසටහන සැබවින්ම කාලීන වශයෙන් වැදගත් වේ. පොහොය දිනයට පන්සලට නොයන, ධර්මයට අවනතව කටයුතු නොකරන බොහෝ පිරිස්, අරලියගහ මන්දිරයට පැමිණ බණ ඇසීමට සූදානම් වන්නේ රටේ පාලකයා දැක බලා ගැනීමේ ආශාවෙන් යුක්තව ය. මෙහිදී ජනතාවට රටේ පාලකයා දැක බලා ගැනීමට පමණක් නොව ජීවිතය වෙනස් කරලීමට සමත් ධර්ම කරුණු ශ්‍රවණය කිරීමට ද අවස්ථාව හිමි වීම වඩාත් සුවිශේෂී වේ.

විශේෂයෙන්ම වර්තමානයේ සිටිනා තරුණ තරුණියන් තුළ පවතින අයහපත් ආකල්ප වෙනස් කරලීමට මෙවැනි ධර්ම දේශනා මාලාවන් තුළින් නිවැරදි පන්නරය ලැබේ. තරුණ ප්‍රජාව තුළ පවතින විවිධ වැරදි මතවාදයන්, යහපත් ආකල්පවලට පරිවර්තනය කරලීමට මෙවැනි ධර්ම දේශනා වැඩසටහන් තුළින් තිසි මඟ පාදා දේ.

බුදුරදුන් දවස බිම්බිසාර රජතුමා විසින් ඛේමා බිසවව දෙව්රම් වෙහෙරට රැගෙන ගියේ දෙව්රම් වෙහෙරේ සිරිය, ගීතයෙන් ගායනා කර විඳින්නට සලස්වමිනි. ඒ අසා අවසානයේදී ඛේමා බිසව සෝවාන් ඵලයට පත් විය. ඒ හේතුවෙන් වත්මන් තරුණ ප්‍රජාවගේ සිතුවිලි ද මෙවැනි ධර්ම දේශනා තුළින් යහපත් කර ගැනීමට පුළුවන. ඇතැම් තරුණ පුද්ගලයින් අරලියගහ මන්දිරයේ ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට අවස්ථාව සලසා දෙන මෙන් අපෙන් ආයාචනා කරයි. ඒ වාගේ ම බෞද්ධ නොවන පිරිස් ද අපෙන් මෙම ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටියි. එම නිසා මෙවැනි ධර්ම දේශනා ලංකාවේ සිටින සැම පුද්ගලයකුටම වැදගත් වේ. ධර්ම දේශනා මාලාවන්ට සහභාගී වීමට අපෙන් ආයාචනා කරන ඇතැම් පුද්ගලයින් විහාරස්ථානවලට ගොස් ආගමික වතාවත්වල දැඩි ලෙස නියැළුන්නන් නොවීම ද විශේෂත්වයකි. ලංකාවේ රජයේ ප්‍රධානතම ආයතනවල පොහොය දිනයේ, පෙර පෝය දිනයේ, මෙන් ම වාර්ෂිකව මෙවැනි ධර්ම දේශනා පවත්වනු ලබයි.

කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැම පෙර පොහොය දිනයකම ධර්ම දේශනාවක් පවත්වනු ලබයි. එම ධර්ම දේශනාවන් සඳහා ලංකාවේ ප්‍රකට නායක ස්වාමීන් වහන්සේලා, ධර්ම කථික ස්වාමීන් වහන්සේලා පැමිණේ. ඊට අමතරව විවිධ පිංකම් සිදු කරනු ලබයි. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික දානමය පිංකම් පවත්වා පිරිතක් පවත්වනු ලබයි. රූපවාහිනී සංස්ථාව, ගුවන් විදුලි සංස්ථාව, ලේක්හවුස් ආයතනය වැනි ආයතනවල වාර්ෂිකව පිංකම් කිරීමේ සම්ප්‍රදායක් පවතී. ඒ සැම දෙයකටම මඟ පෙන්වනු ලබන්නේ අමා දම් සිසිලස වැනි ධර්ම දේශනා මාලාවන් ය. මෙවැනි පිරිත් පිංකම් පැවැත්වීමෙන් මුළු රටටම ආශිර්වාදයක් ලැබේ.

### වෛරයෙන්, ක්‍රෝධයෙන් තොර සමාජයක්

ඇතැම් මිනිසුන් ධර්මය ඇසුවද, ධර්මය පිළිපදින්නේ නැත. වැරදි ක්‍රියාවන් කරන පුද්ගලයින්ගෙන් 80%ක් පමණ ධර්මයට අනුගත නොවූ, පන්සලකට, පල්ලියකට හෝ කෝවිලකට ගොස් කුමන හෝ ආගමික පිළිවෙතක් අනුගමනය නොකරන පුද්ගලයින් ය. වර්තමානයේ පාතාලයේ සිටින බොහෝ පුද්ගලයින්ගේ ජීවිතය දෙස අවධානයෙන් බැලීමේදී ඔවුන්, කුඩා කාලයේ සිටම ධර්මයට අනුගතව ජීවත් නොවූ පුද්ගලයින් බව පෙනේ. එපමණක් නොව මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් ද පන්සලකට, පල්ලියකට හෝ කෝවිලකට ගොස් ආගමික කටයුතුවල නිරත නොවූ පුද්ගලයින් ය. එම නිසා යම් පුද්ගලයකුට යහපත් පුද්ගලයකු බවට පත් වෙන්නටත්, අයහපත් කෙනෙකු බවට පත් වෙන්නටත්, එම පුද්ගලයා කුමන ආකාරයේ හෝ ආගම දහමකට නැඹුරු වීම බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ නායකයින් බොහෝ දෙනෙක් පහළ විය. නිදහසින් පසුව ජනාධිපතිවරුන් හත් දෙනෙකු බලයට පත් විය. එම ජනාධිපතිවරුන් හත් දෙනා අතරින් බුදුදහමට දැඩි ලෙස නැඹුරු වී බෞද්ධාගමට මුල් තැන දී, ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ඉහළින්ම පිළිගත්තා ප්‍රධානතම නායකයා වූයේ අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ය.

එක්තරා භික්ෂුවක්, දේශපාලන වේදිකාවක " තමන් මිය යාමෙන් පසුව නයෙක් වී හෝ තමන්ගෙන් පළි ගන්නා බව අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිවරයාට ප්‍රකාශ කර සිටියේ ය. එහෙත් එම භික්ෂුව කෙරෙහි මහින්ද රාජපක්ෂ අගමැතිවරයා තරහක්, නපුරක් නොසිතුවේ ය. එවැනි ප්‍රකාශයක් වෙනත් නායකයෙකු ඉදිරියේ ප්‍රකාශ කළා නම් , එම භික්ෂුවට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වේ. ඒ අතින් අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා උතුම් මිනිසෙකි. ජේ. ආර් ජයවර්ධන ජනාධිපතිවරයා ගැටඹේ රාජෝපනාරාමයට කටු කම්බි ගැසුවේය. එසේ සිදු කළේ ගැටඹේ රාජෝපනාරාමාධිපති, ආචාර්ය ලබුදූවේ සිරි ධම්ම හිමියන් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට එක්තරා අවස්ථාවකදී, වසලයා යැයි ප්‍රකාශ කළ නිසාවෙනි.

එයින් පසුව සිත් තැවුලට පත් ජනාධිපතිවරයා රාජෝපනාරාමයට විවිධාකාරයේ හිරි හැර සිදු කළේ ය. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා කිසිවිටෙක තමන් පිළිබඳව වැරදි මත ප්‍රකාශ කරන පුද්ගලයින්ට ක්‍රෝධ නොකළේය. වෛර නොකළේය. අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා උත්සව අවස්ථාවන්ට සහභාගී වූයේ ද පක්ෂ භේදයකින් තොරව ය. එය එතුමා සතුව පවතින සුවිශේෂී ගුණයකි. අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිවරයාව ජනාධිපතිවරනයෙන් පරාජය කිරීමට මාදුළුවාවේ සෝභිත හිමි දැඩි උත්සාහයක නිරත වුව ද, මාදුළුවාවේ සෝභිත හිමියන් අසනීප වී සිටිය දී පවා අතිගරු මහින්ද රාජපක්ෂ අගමැතිතුමා රෝහලට ගොස් නිරෝගී සුවය ප්‍රාර්ථනා කළේ ය.

ලංකාවේ ඇතැම් නායිකාවන් භික්ෂූන් වහන්සේලාට ප්‍රසිද්ධියේ විවිධ වැරදි මත ප්‍රකාශ කළ ද, මහින්ද රාජපක්ෂ අගමැතිවරයා කිසිදු දිනෙක භික්ෂූන් වහන්සේලාගේ සිත දුකට පත් නොකළේය. මුළු ලෝකයටම ආදර්ශයක් ගෙන දෙන, උතුම් මනුෂ්‍යත්වයෙන් උපයුක්ත අසම්මත භාවයෙන් තොර සම්මතයට ගරු කරන ගුණ ගරුක පාලකයෙක් ලෙස එනිසාම මහින්ද රාජපක්ෂ අගමැතිවරයා හැඳින්විය හැකිය.






වර්ෂ 2021ක් වූ පෙබරවාරි මස 26 වැනිදා සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# මැතිනියගේ ඉඩම් පනතට

# කොල්වින්ගෙන් බැට





මෙරට ස්වදේශිකයන් සතු ඉඩම් පිළිබඳව අතීතයේ විශාල ගැටලු තිබූ බවක් ඉතිහාසයෙන් මතු නොවූව ද මෙරට පාලනය යටත් විජිත පාලනයට නතු වීමෙන් පසු ඉඩම් පවරා ගැනීම්, ඉඩම් පිළිබඳ නීතිරීති, පාරම්පරික කුඹුරු ඉඩකඩම් අහිමි වීම් සහ ඉකුත් සියවස වන විට ජනගහනයේ වර්ධනය නිසාත් ඉඩම් සම්බන්ධයෙන් බරපතළ ගැටලු ඇති කරන තත්ත්වයක් උද්ගතව තිබිණි.

රජ කෙනකු මෙරට පාලනය කළ සමයේදී චිරාගත සිංහල සම්ප්‍රදාය වූයේ වැඩවසම් ක්‍රමයයි. රටේ සෑම බිම් අගලක්ම රජු සතු විය. ඒවා සතරාකාර විය.

රජුට අයත් ඉඩම්, වැඩවසම් ඉඩම්, වැඩවසම් නොවන ඉඩම් සහ විහාර දේවාල සතු ඉඩම් වශයෙනි. රජයේ ඉඩම් යනු රජු විසින් කෙලින්ම භුක්ති විඳි ඉඩම්ය. වැඩවසම් නොවන ඉඩම් වූයේ අස්වැන්නෙන් කොටසක් හෝ නියමිත බද්දක් හෝ ගෙවන කොන්දේසිය මත රජුගේ අයිතියෙන් ඉවත් කොට අනුන්ට පවරා දුන් ඉඩම්ය.

රජයට විශේෂ සේවයක් කරනු උදෙසා පැවරූ ඉඩම් වැඩවසම් ඉඩම්වලට අයත් විය. ඒවා දෙවර්ගයක් විය. රජු වෙනුවෙන් කරන සේවය වෙනුවෙන් පැවරූ ඉඩම් සහ නින්ද පරවේණි ඉඩම්ය. (රජු වෙනුවෙන් කුරුඳු තළන්නේ නම් ඔවුන්ගේ එකී විශේෂ සේවය සඳහා දුන් ඉඩම් නින්ද පරවේණි ඉඩම් විය.)

විහාරවල නඩත්තුව සඳහා දුන් ඉඩම් විහාරගම් විය. සියවස් ගණනාවක්ම මෙරට ඉඩම් පැවතියේ එලෙසය. එය වෙනස් වූයේ රට යටත් විජිතයක් වූ පසුය.

මෙරට මුහුදුබඩ පෙදෙස් අත්පත් කර ගැනීමේදී තමන්ට දරන්නට සිදු වූ වියදම් කපා හැරීම සඳහා මහත් උනන්දුවක් දැක්වූ පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම යටත්විජිත යුගයේදී එක පැන් පහරින් ඉහත චිරාගත සම්ප්‍රදාය අහෝසි කර අයබදු ක්‍රමයක් මෙරට ජනතාව මත පැටවූයේය.

1802 දී ප්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකරුද පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ ප්‍රතිපත්තියම අනුගමනය කළේය. 1812 දී ඉංග්‍රීසින් නිකුත් කළ නිවේදනයක සඳහන් වූයේ අවුරුදු පහකට වැඩි නොවන කාල සීමාවක් තුළ බද්දෙන් නිදහස් වූ අක්කර 4000කට වැඩි නොවන බිම් ප්‍රමාණයක් මෙරටින් යුරෝපීයයන්ට ලබා ගත හැකි බවයි.

ආණ්ඩුකාර තෝමස් මේට්ලන්ඩ් කියා සිටියේ මෙරට ආර්ථිකය නැංවීමට, ඉන්දියානු සහ යුරෝපීයන් හට වැවිලි කර්මාන්තය සඳහා මෙරට ආයෝජනයට අනුබල දිය යුතු බවය. පසු කලෙක මෙරට උඩරට ගොවි ජනතාව අමතක කරලමින් කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණවලින්ද කළේ වැවිලි බෝගවලට උඩගෙඩි දීමයි.

ඉඩම් අක්කර දස දහස් ගණනක් ඉතා සුළු මුදලකට මේ අනුව යුරෝපීයන් විසින් අත්පත් කර ගන්නා ලදී. ශ්‍රී ලංකාව නිදහස ලැබූ පසුවත් ඉඩම් පිළිබඳව අභ්‍යන්තරව පැවතුණේ මෙවැනි ගැටලුකාරී තත්ත්වයකි. මේ තත්ත්වය අවබෝධ කර ගත් සිරිමා ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය ඊට සමඟි පෙරමුණ ආණ්ඩුව යටතේ පිළියම් සෙවීමට ගත් උත්සාහයයි මේ.

වගා කළ හැකිව තිබුණත් එසේ වගා නොකළ ඉඩම් කිසියම් ක්‍රමවේදයක් යටතේ රජයට පවරාගෙන ඒවාට වන්දි දෙන ක්‍රමයක් සමඟි පෙරමුණ ආණ්ඩුව යටතේ අගමැතිනි සිරිමා බණ්ඩාරනායක මැතිනිය ජාතික රාජ්‍ය සභාවට යෝජනා කළාය. එය හැඳින්වූයේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යනුවෙනි.

මැතිනියගේ සංකල්පය වූයේ රට තුළ ගොවිතැන හා වැවිලි කර්මාන්තය දියුණු කර දේශීය ගොවියාත්, ආර්ථිකයත් නගා සිටුවා යළි රට තුළ කෘෂිකාර්මික පුනර්ජීවයක් ගොඩනැඟීමය. ඒ අනුව රට තුළ කර්මාන්ත රාශියක් අරඹා වැඩි දියුණු කිරීමට කටයුතු ඇරඹිණි. ඒ අනුව කෘෂිකර්මාන්තය නංවාලීම සඳහා පුරන් කුඹුරු යළි අස්වැද්දීම අවශ්‍ය විය.

කැලෑ වැදී තිබුණු ඉඩම් යළි සශ්‍රීක කිරීම ඇගේ අභිප්‍රාය විය. ඒ අදහස මුදුන්පත් කර ගැනීම සඳහා අගමැතිනිය ජාතික රාජ්‍ය සභාවට සිය වැඩපිළිවෙළ ඉදිරිපත් කළාය.

1971 දී ඇය ඉදිරිපත් කළ යෝජනාව වූයේ උපරිම සීමාවකට යටත්ව ඉඩම් අත්පත් කර ගැනීමත් නින්දගම් ක්‍රමය අහෝසි කිරීමත්ය.

පෞද්ගලික කෘෂිකාර්මික ඉඩම්වල අයිතිය තබා ගත හැකි සීමාවන් පැනවීමත් එමඟින් අදහස් කෙරිණි. එනමුත් මේ කොන්දේසිය විහාර දේවාලගම් සහ ආගමික ස්ථාන සඳහා බලපෑවේ නැත.

උපරිම සීමාවට වඩා වැඩි ඉඩම් රජය මඟින් අත්පත් කරගෙන ඒවා ඵලදායී කටයුත්තකට යොදා ගෙන ඒ සඳහා වන්දි ගෙවීම මැතිනියගේ යෝජනාව විය.

එලෙස රජයට ගන්නා ඉඩම් කාර්යයන් හතරක් සපුරාලීම පිණිස යෙදවීමට අදහස් කෙරිණි. රටේ සංවර්ධනය සඳහාත්, සූක්ෂ්ම වගාවන් සඳහාත් ආර්ථික ඒකක වශයෙන් රැකියා නොමැති තරුණයන්ට ඉඩම් විකිණීමේ සහ ණය පහසුකම්, වැවිලි ද්‍රව්‍ය, පෝර, අලෙවිය යන සේවා සඳහා සමුපකාර සමිති පිහිටුවීම එක් කාර්යයකි.

ගම් පුළුල් කිරීම සඳහා ඉඩම් සපයාදීම දෙවැනි කාර්යයයි. තරුණයන්ගේ සමුපකාර සමිති මඟින් සමූහ වගාවන් කිරීම තවත් කාර්යයකි. වඩා විශාල ඉඩම් ඒකක රජයේ නියෝජිතයකු මඟින් වතු යායන් ලෙස පාලනය කිරීම සඳහා කටයුතු කිරීම අනෙක් කරුණ විය.

මීට අමතරව නින්දගම් ක්‍රමය අහෝසි කිරීම ද ඇගේ යෝජනාවකි. මේවා ඇතුළත් ඉඩම් ප්‍රතිසංස්කරණ යෝජනා එදා කෘෂිකර්ම හා ඉඩම් ඇමැතිවරයා වූ හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කළේ 1972 අගෝස්තු මාසයේදීය.

එනමුත් ඊට පෙර මේ සම්බන්ධයෙන් අගමැතිනි සිරිමා බණ්ඩාරනායක මැතිනිය 1970 නොවැම්බර් 11 වැනිදා මැතිසබය අමතමින් මෙසේ පැවසුවාය.

“මේ රටේ සංවර්ධනය වෙනුවෙන් පරිත්‍යාග කිරීමට මා සූදානම්. මටත් ඉඩකඩම් තිබෙනවා. ඒක කවුරුත් දන්නා කාරණයක්. සමහරු සිතුවා මගේ මේ අදහස් කවදාවත් ක්‍රියාවට නංවන්නේ නැති බව. ශ්‍රීලනිපයේ සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනකොට අප සතු දේපොළත් අපට නැති වී යන බව අපි පැහැදිලිවම දැන සිටියා.”

මැතිනිය කියූ පරිදිම මේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත නිසා ඇයට අයත් ඉඩම් ද අහිමිව ගියේය. මැතිනියට අයත්ව තිබූ වගා කරන පොල් අක්කර 1350ක් ඇයට අහිමි වූවාය. බණ්ඩාරනායක පරපුරට එම පනතින් අහිමි වූ මුළු ඉඩම් ප්‍රමාණය අක්කර තුන්දහසකි. ඇයට අයත්ව තිබූ මහවලතැන්නේ නින්දගමින් අක්කර දහස් ගණනක් ද ඇයට අහිමි වූවාය.

1972 අගෝස්තුවේදී කෘෂිකර්ම හා ඉඩම් ඇමැති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා ඉදිරිපත් කළ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතට කතානායක ස්ටැන්ලි තිලකරත්න මහතා අත්සන් තැබූ පසු එය අගෝස්තු 26දා සිට බලාත්මක කෙරිණි.

එනමුත් සිරිමා බණ්ඩාරනායක මැතිනිය ප්‍රමුඛ සමඟි පෙරමුණ ආණ්ඩුව බිහි කිරීමට මුල්වූ ලංකා සමසමාජ පක්ෂයේ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා ජාතික රාජ්‍ය සභාවේදී ප්‍රකාශයක් කරමින් ඉඩම් ප්‍රතිසංස්කරණයේදී අගමැතිනිය තමන් සතු පෞද්ගලික ඉඩම්වලින් යම් කොටසක් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් ගැලවී අන්සතු කරන ලදැයි චෝදනාවක් එල්ල කළේය.

සිල්වා මහතා එම චෝදනාව කළේ ඔහු එවකට වැවිලි කර්මාන්ත හා ව්‍යවස්ථා සම්පාදන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී වීම සුවිශේෂ සිදු වීමකි.

කෙසේ වුව ද එක් පුද්ගලයකු සතු ඉඩම් අයිතිය අක්කර 50කට සීමා කරමින් සම්මත කෙරුණු මේ ඉඩම් පනත ක්‍රියාත්මක වී දෙවසරක් ගත වන විට රටේ වගා කළ භූමියෙන් අක්කර පන්ලක්ෂ පනස් දහසක ප්‍රමාණයක් රජයට පවරාගෙන තිබිණි.

එම පනත යටතේ දෙවැනි අදියර ක්‍රියාත්මක වූයේ එතෙක් බ්‍රිතාන්‍යයන් සතුව තිබූ වතු ඉඩම් ද රජයට පවරා ගැනීමෙනි. 1897 වසරේදී ඉංග්‍රීසින් මුඩු බිම් පනත යටතේ නීතිමය රාමුවක සිට මෙරට වැසියන්ගෙන් කොල්ලකෑ ඉඩම් ඇතුළු අයුතු ලෙස අත්පත් කරගත් ඉඩම් යළි පවරා ගැනුණේ 1975 ඔක්තෝබර් 14 වැනිදා සම්මත කරගත් ඉඩම් ප්‍රතිසංස්කරණ සංශෝධන පනතිනි.

එකල උඩරට තේ වතු අක්කර දහස් ගණනක් ලංකා වතු කම්කරු සංගමය හා එහි නායක සෞම්‍යමූර්ති තොන්ඩමන් සතුව පැවතිණි. හෙතෙම එක එල්ලේම වතු ඉඩම් පවරා ගැනීමට එරෙහි විය. ඒ වතු රජයට පවරා ගැනීමෙන් ඒවා විනාශ වී යතැයි ඔහු තුළ තිබූ අනුමානය නිසාය.

නුවරඑළිය, හැටන්, තලවකැලේ ප්‍රදේශවල වතු පවරා ගැනීමට ඇමැති හෙක්ටර් කොබ්බෑකඩුව යා යුත්තේ පෙළපාළියකින් බව ගම්පොළ මන්ත්‍රී දි.මු. ජයරත්න මහතා නිගමනය කර තිබිණි.

ඒ අනුව වත්තෙන් වත්තට යමින් රම්බොඩ වතුයායට ඇමැති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා පෙළපාළියකින් යද්දී තවත් පෙළපාළියක් ඊට විරුද්ධ පැත්තෙන් ගමන් අරඹා තිබිණි එය සංවිධානය කර තිබුණේ වතු ජනසතුවට එරෙහි වූ තොන්ඩමන් මහතාය.

පෙළපාළි දෙකම ආසන්න වෙද්දී කවුරුත් සිතා සිටියේ දෙපාර්ශ්වය අතර ගැටුමක් සිදුවේයැයි කියාය.

> “මේ රටේ සංවර්ධනය වෙනුවෙන් පරිත්‍යාග කිරීමට මා සූදානම්. මටත් ඉඩකඩම් තිබෙනවා. ඒක කවුරුත් දන්නා කාරණයක්. සමහරු සිතුවා මගේ මේ අදහස් කවදාවත් ක්‍රියාවට නංවන්නේ නැති බව. ශ්‍රීලනිපයේ සමාජවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනකොට අප සතු දේපොළත් අපට නැති වී යන බව අපි පැහැදිලිවම දැන සිටියා.”

එනමුත් සිදු වූයේ තොන්ඩමන් මහතා මල්මාලාවක් රැගෙන ගොස් ඇමැති කොබ්බෑකඩුවගේ ගෙල පැළඳවීමය.

එසේ වුව ද අගමැතිනි සිරිමා බණ්ඩාරනායක මැතිනිය සිය පාලන කාලයේදී නොසිතූ විරූ අභියෝග රැසකට මුහුණ දුන්නාය. පසු කලෙක බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමට පවා මේ ඉඩම් පවරා ගැනීම බලපෑවේය.

ඊටත් අමතරව මෙම ඉඩම් පවරා ගැනීමේදී සිදු වී යැයි කියන අයථා සිද්ධීන් හේතුවෙන් රාජ්‍ය නායිකාවට එරෙහිව ජාතික රාජ්‍ය සභාවේදී විශ්වාසභංග යෝජනාවක් ගෙන එනු ලැබීය.

එම යෝජනාව ගෙන ආවේ ඇයට 1970 දී සමඟි පෙරමුණ ආණ්ඩුව බිහි කිරීමට මෙන්ම ඇගේ ආණ්ඩුවේ ඇමැතිවරයකු වශයෙන් 1972 දී නව ජනරජ පනත සකස් කළ පුරෝගාමියාද වූ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතාය. එම විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කළේ 1975 දෙසැම්බරයේ දිනෙකය.

එදින ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා මෙසේ ප්‍රකාශ කළේය.

“කතානායකතුමනි, මෙය පෞද්ගලිකවම අගමැතිනියට විරුද්ධව ඉදිරිපත් කරන විශ්වාසභංග යෝජනාවකි. පෞද්ගලිකව අගමැති පදවිය දරන කෙනකුට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒම අපූරු දෙයක් බව මා නොදන්නවා නොවේ. මගේ අදහසේ හැටියට අපේ රටේ තිබූ ව්‍යවස්ථාදායක මණ්ඩලවල අගමැති තනතුර දරන කෙනකුට විරුද්ධව පෞද්ගලික විශ්වාසභංගයක් ඉදිරිපත් කරන පළමුවැනි අවස්ථාව මෙය විය හැකියි. එසේ වුවත් යෝජනාවේ තරමක් දුරට පැහැදිලි කර ඇති පරිදි පවත්නා අපූරු තත්ත්වයක් නිසා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය බව අපේ තීරණයයි.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විනිශ්චය සහ අවසාන තීරණය දෙනු ලබන්නේ අප විසින්ම පමණක් නොවන බව මෙහිලා කිව යුතුය. මා එසේ කියන්නේ විශේෂයෙන් මේ යෝජනාව සම්බන්ධයෙන් අපේ රටේ ප්‍රචාරක මාධ්‍යයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග සලකා බැලීමෙන් පසුවයි....”

එනමුත් මැතිනියගේ ඉඩම් ජනසතුව මඟින් රටටත්, ජනතාවටත් සිදු වූ මහඟු මෙහෙවර මෙරට දේශපාලන ඉතිහාසයේ නොමැකෙන අයුරින් සටහන් වී තිබෙන බව සඳහන් කළ යුතුවේ.

**බන්ධුල ගුණරත්න**

ඉතිරිය 14 වන පිටුවට

1983 වසරේදී ජනතා විමුක්ති පෙරමුණ තහනම් කිරීමෙන් පසු රෝහණ විජේවීර රහසිගත දේශපාලනයෙහි නිරත විය. එවකට පැවති ආණ්ඩුව සිටියේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා සොයමිනි. තමන් රහසිගත දේශපාලනයේ යෙදීමට හේතු සහ තමන් අත්අඩංගුවට ගැනීමේ රජයේ උත්සාහය ගැන සඳහන් කරමින් ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර අගවිනිසුරුට ලියන ලද ලිපියයි මේ.

# පක්ෂ තහනමට එරෙහිව විජේවීරගෙන් අගවිනිසුරුට ලිපියක්



රෝහණ විජේවීර
සභාපති
ජනතා විමුක්ති පෙරමුණ
1984 අප්‍රේල් මස 12 වන දින කොළඹ දීය
ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ කාර්යාලය
කොළඹ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රවිනිශ්චයකාරතුමා වෙත කරනු ලබන පැමිණිල්ලයි.

ගරු අග්‍රවිනිශ්චයකාරතුමනි,

01. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාමාංශික දේශපාලන පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණේ සභාපති රෝහණ විජේවීර වන මා ප්‍රකෘතික යුක්තිධර්මයේත්, සාධාරණත්වයේත්, නීතියේත්, මානව හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලත්, පරම සත්‍යයේත් නාමයෙන් මෙම පැමිණිල්ල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අධිකරණයේ උත්තරීතර නායකයා වන ගරු අග්‍රවිනිශ්චයකාරතුමා වෙත ඉදිරිපත් කරමි.

02. ජනතා විමුක්ති පෙරමුණේ සභාපති වන මා 1982 ජනාධිපතිවරණයේදී එම පක්ෂයේ අපේක්ෂකයා ලෙස තරග කර ඡන්ද 273,428ක් ලබා ගනිමින් තුන්වන ස්ථානයට පැමිණුනෙමි.

03. 1983 දී පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු මහ මැතිවරණය අවුරුදු හයකින් කල්දැමීම සඳහා රජය විසින් පැවැත්වූ ජනමත විචාරණයේදී ආණ්ඩු පක්ෂයෙන් කෙරුණු අගතිගාමී නීති විරෝධි ක්‍රියාපිළිවෙත් හේතුවෙන් ජනමත විචාරණය හා එහි ප්‍රතිඵල නීති විරෝධි බව ප්‍රකාශයට පත්කරන ලෙස ඉල්ලා අධිකරණය ඉදිරියට පැමිණි එකම ලාංකික පුරවැසියා වෙමි.

04. ජනතා විමුක්ති පෙරමුණ, මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගෙන ඇති ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මහජන ඡන්දයෙන් වැඩිදෙනාගේ කැමැත්තෙන් හා සහභාගිත්වයෙන් ආණ්ඩුවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, සමාජ ආර්ථික හැඩගැස්මත් වෙනස් කිරීමට ප්‍රතිඥා දී ඇති ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී දේශපාලන පක්ෂයකි.

05. ජනතා විමුක්ති පෙරමුණ සිය ප්‍රතිපත්ති ප්‍රකාශය හා වැඩපිළිවෙළ මඟින් පැහැදිලිව හා නිරවුල්ව තමන් රට දෙකඩ කිරීමට එකහෙළාම විරුද්ධ බවත්, එසේම ෆෙඩරල් ක්‍රමයකට එකඟ නැති බවත්, ප්‍රකාශයට පත් කර ඇති දේශපාලන පක්ෂයකි. ජනතා විමුක්ති පෙරමුණ රටේ ජීවත්වන සෑම පුරවැසියකුම සෑම අයුරකින්ම එකහා සමානව සලකන ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මධ්‍යගත කරනු ලැබූ ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටියි.

06. විවිධ දේශපාලන මත දැරීමටත්, දේශපාලන සහ සමාජ සංවිධානයක් පිහිටුවා ගැනීමටත් අයිතිය දැන් රටේ වලංගුව පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අපේ ජනරජයේ සියලුම පුරවැසියන් වෙත ප්‍රදානය කර තිබේ. දේශපාලන මතවාදය උඩ වෙනස්කම් නොකිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිඥා දී තිබේ.

07. එහෙත් 1983 ජූලි මස 30 වැනිදා පටන් ජනතා විමුක්ති පෙරමුණ හදිසි නීතිය යටතේ ජනාධිපතිවරයා විසින් තහනම් කර ඇත. එදා විධායකයේ නායකයින් කිසිම වගකීමකින් තොරව හා ලැජ්ජා රහිතව අප පක්ෂයට අවලාද නැගුවේ අප පක්ෂය 1983 ජූලි සිද්ධියට සම්බන්ධ යැයි කියාය. එහෙත් අප පක්ෂයට එරෙහිව කිසිදු චෝදනාවක් කිසිදු අධිකරණයක මෙතෙක් නගා නැත. 1983 ජූලි සිදුවීම පිටුපස සිටියේ කවුරුන්දැයි හෙළි කිරීමට ජනාධිපතිවරයා විසින් පත්කරනවා යැයි කිවූ කොමිසම පත් කළේ නැත. අපේ පක්ෂය 1983 ජූලි සිද්ධීන්ට කිසිදු ආකාරයකින් සම්බන්ධ නැත. ආණ්ඩුව ගෙතූ බොරුවලට වැඩි ආයුෂ නොවීය. රහස් පොලිසිය විසින් කරන ලද පරීක්ෂණවලින් පසුව අප එම කලබලවලට සම්බන්ධ නැති බව පැහැදිලිවම ඔප්පු වූයෙන් අත්අඩංගුවට ගත් එවකට අප පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් ලයනල් බෝපගේ හා අප පක්ෂයේ දේශපාලන මණ්ඩල සභික සෝමරත්න කලුආරච්චි ඇතුළු අය සම්පූර්ණයෙන් නිදහස් කිරීමට ද ආණ්ඩුවට සිදුවිය. ඒත් තවමත් දුෂ්ට හා අගතිගාමී චේතනාවෙන් පාලකයින්ගේ කැමැත්ත උඩ අප පක්ෂය දිගටම තහනම් කර ඇත. මාත් අප පක්ෂයේ වැඩබලන ප්‍රධාන ලේකම් උපතිස්ස ගමනායකත් අත්අඩංගුවට ගැනීමට ප්‍රසිද්ධියේ නියෝග නිකුත් කර ඇත. ඒ අධිකරණය විසින් නොව විධායකය විසිනුයි. අධිකරණයට අපව අවශ්‍ය නැත. ඒ අප කිසිදු වරදක් කර නැති හෙයිනි.

08. අපගේ පක්ෂය තහනම් කර අපව මර්දනයට ලක්කර අපගේ කටවලට මුකවාඩම් දමා අපේ මුද්‍රණාලවලට සීල් තබා දැන් විධායකය තමන් විසින් ඉතා සියුම් ලෙස හා නීතිවිරෝධී ලෙස ගොඩනගා ඇති සාපරාධී කුමන්ත්‍රණකාරී සංවිධාන ලවා අපට අවලාද නැගීමක්, අපහාස කිරීමක් කරගෙන යනු ලබයි. ඒ ඉතා දරුණු දුෂ්ට චේතනාවකිනි. ජනතා විමුක්ති පෙරමුණත් පෞද්ගලිකව මාත් රට බෙදීමට පක්ෂ බවත්, ඊළාම් ත්‍රස්තවාදයට පක්ෂ බවත්, මා දැනට ඉන්දියාවට පැන ගොස් ඇති බවත්, මා යාපන අර්ධද්වීපයේ සැරිසරන බවත් සන්නද්ධ හමුදාවලට දේශපාලන පංති පවත්වා ඉතා සියුම් ලෙස සැලැස්මක් අනුව කාවද්දා ඇති බව දැනගන්නට ඇත. දැන් එම ප්‍රචාර යාන්ත්‍රණය මුදා හල ආණ්ඩුවේ විධායකයේ ඇතැම් කොටස් විසින් රහසිගතව හා නීතිවිරෝධීව පිහිටුවා ගත් සංවිධාන මඟින් කැලෑ පත්තර ව්‍යාපාරයක් රට පුරාම දියත් කර ඇත. මාත් ජනතා විමුක්ති පෙරමුණත් විනාශ කරලීමට තර්ජනය කරමින් කැලෑ පත්තරයක් දිවයින පුරාම ඇතැම් පොලිස් හා හමුදා නිලධාරීන් පිරිසක් විසින් බෙදා හැර ඇත. මෙයින් ඔවුන් බලාපොරොත්තු වන දේ පැහැදිලිය. ඊළාම් ත්‍රස්තවාදයට එකහෙළාම විරුද්ධ අපට ඊට පක්ෂ යැයි මවා පා එමගින් සෙබළුන්ගේත්, පොදු ජනතාවගේත් වෛරයක් ඇවිස්සීමත් අපේ ජනරජයේ ව්‍යවස්ථාදායකයේත්, විධායකයේත් අද කෙරුම්කාරයින් වී සිටින තෝමස් පේන් ගේ වචනවලින් කියනවා නම් 'ඔටුනු පලන් චෞරයින්' ගේ දේශපාලන විරුද්ධවාදීන් වන අපට ශාරීරිකව විනාශ කිරීමට එම වෛරය යොදා ගැනීමක් බව ඉතා පැහැදිලිය.

09. විධායකය විසින් ප්‍රසිද්ධියේ හදිසි නීතිය යටතේ මාව අත්අඩංගුවට ගැනීමට නියෝග දී ඇත්තේ 'ඔටුනු පලන් අපරාධකාරයන්' විසින් සන්නද්ධ හමුදාවලට අප්‍රසිද්ධියේ රහසිගතව නීතිවිරෝධී නියෝගයක් මාව ඝාතනය කිරීමට දී ඇති බවට දිගින් දිගටම වාර්තා ලැබෙයි. මේ පිළිබඳව පැමිණිලි කරන අතරම යුක්තිගරුක සාධාරණ මිනිසෙකු වීම නිසාත්, ඒ නිසාම අද රටත් ජාතියත් විනාශයට හෙළන ඔටුනු පලන් චෞරයින්ට ඔවුන්ගේ රට විනාශ කිරීමේ දේශද්‍රෝහි හා ජාතිද්‍රෝහි ව්‍යාපෘතියට එරෙහි වීම නිසාත්, රට විනාශයෙන් ගොඩගැනීමට විද්‍යාත්මක වැඩපිළිවෙළක්, ප්‍රතිපත්ති මාලාවක්, සැලැස්මක් ඉදිරිපත් කර ඇති නිසාත්, මා අකාලයේ මිය යා යුතු නම් මේ රටටත්, මේ ජාතියටත් එරෙහිව නිමක් නැති අපරාධවල යෙදී ඇති මේ ඔටුනු පලන් චෞරයින්ට කුමන දඬුවමක් මහජනතාව විසින් දීම සාධාරණ නොවන්නේදැයි ඉතාමත් යුක්තිගරුක හා සාධාරණ මිනිසකු ලෙස මේ ජනරජය තුළ නිවැරැදිව ගරු බුහුමන් ලබන ඔබතුමාගෙන් මා අසනු කැමැත්තෙමි.

10. කෙසේ වෙතත් යම්කිසි විදියකින් ඔටුනු පලන් අපරාධකාරයින් විසින් මගේ ජීවිතය අකාලයේ තුරුණු වියේදීම විනාශ කර දමනු ලැබුවහොත් එහි මුළු වගකීම ජාතිය විපතට පත්කරමින් දූෂණයෙන් අගතැන්පත් වෙමින්, මහජනයාගේ මූලික මිනිස් අයිතීන් උදුරා ගනිමින්, තම ඥාති වර්ගයාගේ චිරස්ථිතිය අරභයා සෑම අපරාධයක්ම කරන විධායකයේ උස් අසුන් අරා වැජඹෙන දේශද්‍රෝහීන් රැලත් ඔවුන්ගේ උරුමක්කාරයිනුත් මත පතිත විය යුතු බව ඔබතුමාට අවධාරණයෙන් පවසමි.

11. එලෙසින්ම අප පක්ෂයේ ක්‍රියාකාරිකයන් බොරු චෝදනා උඩ අත්අඩංගුවට ගැනීමත්, වධහිංසා පැමිණවීමේත් සැලැස්මක් පිළිබඳව ද දැනගන්නට ලැබී තිබේ. මේ සියල්ල සැලසුම් කර ඇත්තේ විධායකයේ ඔටුනු පලන් චෞරයින් අද මහජනයාට දක්වන බිය නිසාය. මැතිවරණය පවත්වන්නට අද ඔවුන් බියය. පුවත්පත්වල ස්වාධීනත්වයට හා ලේඛක නිදහසට අද ඔවුන් බියය. වාමාංශික ව්‍යාපාරයට අද ඔවුන් බියය. ඇත්ත කියනවාට අද ඔවුන් බියය.

12. අපරාධකරුවන්ට දඬුවම් දීම සෑම සමාජයකම පිළිගත් නීතියයි. ඔටුනු පලන් අපරාධකරුවන් මේ නීතිය අබිබවා යන්නේ නැත. අපරාධ වැළැක්වීමටත් අධිකරණයට ඉඩ නොලැබෙන විට, අධිකරණය අකර්මණ්‍ය කර ඇති විට, එයට හානි පමුණුවන විට මහජනතාව එම අයිතිය තමන් වෙත පවරා ගැනීම දුෂ්කර දෙයක් බව මානව ඉතිහාසය පෙන්නුම් කරයි.

13. රජය වැසියාගේ මූලික අයිතීන් උල්ලංඝනය කරන විට එම රජයට එරෙහි වීමට වැසියකු අනුලංඝනීය පාරිශුද්ධ අයිතිය කෙතරම් චමත්කාරජනක ලෙස මානව අයිතිවාසිකම් පිළිබඳ සුප්‍රසිද්ධ ප්‍රංශ ප්‍රකාශනය පිළිගෙන තිබේද?

14. අද රටත්, ජාතියත් දෙකඩ කිරීමක් කරාත්, විදේශීය වහල්භාවයට යළි පත් කිරීමක් කරාත්, නග්න ආඥාදායකත්වයක් කරාත්, ආර්ථික පරිහානියක් කරාත්, සමාජ - සංස්කෘතිමය හා සදාචාරාත්මක ආගාධයක් කරාත් ඇදගෙන යන ඔටුනු පලන් චෞරයින්ගේ මේ දුෂ්ට, කෲර හා සාහසික සැලැස්මෙන් රටත්, ජාතියත් බේරාගන්නා ලෙස අවසාන වශයෙන් ඉල්ලා සිටිය යුත්තේ මහජනතාවගෙන් බව මම දනිමි. ඒත් ඊට ප්‍රථම පූර්ව අවසාන උත්සාහයක් වශයෙන් රටත්, ජාතියත් මේ විපතින් මුදාගන්නට ඉදිරිපත් වන මෙන් අපගේ ගෞරවයටත්, අභිමානයටත් හිමිකම් කියන ඉතා නිහතමානී සහ අවංක එඩිතර පුද්ගලයකු වන ජනරජයේ අධිකරණයේ උත්තරීතර නායක ගරු අග්‍රවිනිශ්චයකාරතුමා මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ද මුළු මහත් අධිකරණයෙන් ද ඉල්ලා සිටිමි.

15. 'වින්ඩීසියා තොන්ත්‍රා ටිරානෝස්' කෘතියේ සඳහන් වන පරිදි නොවූවත්, ජාතිය විපතට පත්කරන මේ අඥාන ඔටුනු පලන් චෞරයින්ගේ සාපරාධී සැලැස්මවලින් ජාතිය බේරාගැනීම සඳහා එඩිතර පියවරක් ගැනීමට ඉදිරිපත් වන ලෙස යුක්ති ධර්මයේත්, සාධාරණත්වයේත්, මිනිස් අයිතිවාසිකම්වලත් නාමයෙන් යුක්තිගරුක හා සාධාරණ දේශප්‍රේමී පුරවැසියකු වශයෙන් මා ඉතා ඕනෑකමින් අධිකරණයෙන් ඉල්ලා සිටිමි.

මීට අවංක,

**රෝහණ විජේවීර**
සභාපති
ජනතා විමුක්ති පෙරමුණ

---

# රජ පුටුවෙන් තනි පුටුවට වැටුණු එජාපය

මහා මැතිවරණය 2020 දී පවත්වා නව ආණ්ඩුවක් බලයට පත්ව එම ආණ්ඩුවේ අයවැය ලේඛනය ද සභා සම්මත වී 2021 වර්ෂය ද උදා වී කොරෝනා වසංගතයේ දෙවැනි රැල්ල ද ව්‍යාප්ත වී මාස ගණනක් ගතව ඇත. එහෙත් එම මැතිවරණයෙන් අන්ත පරාජයට පත් වූ එක්සත් ජාතික පක්ෂයට හිමි ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට මෙතෙක් නියෝජිතයකු පත් කර නැත. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම දේශපාලන පක්ෂය ලෙස ද ප්‍රජාතන්ත්‍රවාදයේ මුරදේවතාවා වශයෙන් ද හඳුන්වනු ලබන්නේ එජාපයයි. 1947 සිට කිහිප වරක් රට පාලනය කළ 1977 දී අපේ රට විවෘත ආර්ථිකය හරහා අසිරිමත් සිංගප්පූරුවක් නිර්මාණය කරන්නේයැයි වහසි බස් දෙඩූ නායකයින් අදත් සිටින එක්සත් ජාතික පක්ෂය මේ තරම් අගාධයකට වැටුණේ ඇයි ද යන්න විමසීම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂ ක්‍රමය අගයන කාගේත් යුතුකමකි, වගකීමකි.

ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට නියෝජිතයකු නම් කර පත් කිරීම දිනෙන් දින කල් ගියේය. 2021 ජනවාරි 13 දා පැවැති එජාප කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී අනිවාර්යයෙන්ම මන්ත්‍රී ධුරයට නියෝජිතයකු පත් කරනු ඇතැයි දේශපාලන ක්ෂේත්‍රය තුළ සිටින බහුතරයක්ම විශ්වාස කළහ. එහෙත් එය සිදු නොවූ අතර පක්ෂයට සභාපතිවරයකු, ලේකම්වරයකු විශේෂයෙන් උප සභාපතිවරුන් හතරදෙනකු පත් කෙරිණි.

එක්සත් ජාතික පක්ෂ ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් සභාපති ධුරයට දකුණේ කෘතහස්ත දේශපාලනඥයකු වූ වජිර අබේවර්ධන පත් කෙරිණි. ප්‍රධාන ලේකම් ධුරයට වයඹ පළාත නියෝජනය කරමින් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු වූ පාලිත රංගේ බණ්ඩාර පත් කෙරිණි. උපසභාපති ධුර හතරකට නියෝජිතයන් හතර දෙනකු ද පත් කෙරිණි. නායක රනිල් වික්‍රමසිංහ, නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන, ජාතික සංවිධායක නවින් දිසානායක සහ භාණ්ඩාගාරික මිස්බා පතාර් මහත්වරුන්ගේ වෙනසක් සිදු නොවීය. නියෝජ්‍ය මහ ලේකම් පරිපාලන ලේකම්, කමිටු සභාපති ධුර කීපයකට ද නියෝජිතයන් පත් විය.


පර්යේෂණ සහ ප්‍රතිපත්ති සැලසුම් සංවර්ධන අංශයේ ලේකම්වරයා ලෙස ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා පත් කර ගැනීම විශේෂිත වේ. 1977-90 කාලයේ කරුණාසේන කොඩිතුවක්කු මහතා ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර කිහිපයකම නියුක්ත වූ බව සිහිපත් කරමු.

ජනවාරි 13 දා සිරිකොත පක්ෂ මූලස්ථානයේ සිදු වූ මතභේදවලින් අනතුරුව ජනවාරි 14 දා රනිල් වික්‍රමසිංහ මහතාගේ නිවසේ පැවැත් වූ සාකච්ඡාවකින් පසු හිටපු ප්‍රධාන ලේකම් අකිල විරාජ් කාරියවසම් මහතා පක්ෂයේ උපනායකත්වයට පත් කළ බව මාධ්‍ය මඟින් වාර්තා විය. උපනායකත්වය පෙරදී දරා සිටියේ රවි කරුණානායක මහතාය.

ජාතික සංවිධායක ධුරයට පත්ව සිටි නවින් දිසානායකගේ නොපැමිණීමත්, රවි කරුණානායකගේ සහ අර්ජුන රණතුංගගේ මතභේදත් ඔස්සේ අභ්‍යන්තරයේ ගැටලු නිම නොවන ආකාරයකි. බහු වාර්ගික බහු ආගමික පක්ෂයක් වන එ.ජා.පක්ෂය සුළු ජාතීන් නියෝජනය සඳහා අවධානය යොමු කිරීමක් ද දක්නට ලැබේ. කෙසේ වූවත් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට නියෝජිතයකු නම් කිරීම මෙතෙක් සිදු නොවීය.

මේ සිද්ධීන් ගැන විමර්ශනයක යෙදෙන කළ පෙනී යන්නේ ලංකාවේ ප්‍රධානතම පක්ෂය වන එ.ජා.ප.ය ජූලි-අගෝස්තු කාලසීමාව සුබපලදායක නොවන තත්ත්වයකි. මොහොතක් අතීතයට යොමු වෙමු.

එක්සත් ජාතික පක්ෂයේ පාලන බලය උඩු අතට හරවා කැබිනට් රැස්වීම පවා වරායේ නතර කර තිබූ නවසීලන්තයේ නිව්සවුත්ලන්ඩ් නැවෙහි පවත්වන්නට පවා සිදු වූයේ 1953 අගෝස්තු 12 දා ආරම්භ වී රට පුරා ක්‍රියාත්මක වූ අගෝස්තු මහා හර්තාලයේ ගැටුම් උත්සන්න වීම නිසාය. අගෝස්තු හර්තාලය නිසා අගමැති ඩඩ්ලි සේනානායකට හදිසියේ හට ගත් බඩේ අමාරුව හේතුවෙන් අගමැති ධුරයට සර් ජෝන් කොතලාවල පත් කිරීමට සිදු විය. එතැනින් ඇරඹුණු දේශපාලන ක්‍රියාවලිය නතර වූයේ 1956 මහා මැතිවරණයෙන් පක්ෂය අන්ත පරාජයට පත් වීමෙනි.



දිනකට රු.10 ක වැඩි වැටුපක් ඉල්ලා 1980 ජූලි 19 දා ආරම්භ වූ වැඩ වර්ජනයට පක්ෂයේ වෘත්තීය සමිතියෙන් පෙට්‍රල් දැමීම නිසා 40,000 ක් පමණ වූ රජයේ පළාත් පාලන සංස්ථා සේවකයින්ට යන එන මං නැති විය. වැඩ වර්ජනයේ කීපදෙනෙක් සිය දිවි නසා ගත්හ. පාලක පක්ෂය ඉතා දඩබ්බර ලෙස ගත් තීන්දු නිසා මතු වූ අර්බුදය විසඳීම ප්‍රමාද වීම තවත් අතුරු ප්‍රශ්න ගණනාවකට හේතු විය.

1983 ජූලි මාසයේදී පටන් ගත් සිංහල - දෙමළ වාර්ගික ගැටලුවට අදාළ වූ කළු ජූලියේ ගිනි දැල් මුළු රට පුරා පැතිර ගියේ රටම මළ ජූලියක් බවට පත් කරවමිනි.

1977 ජූලි 22 දා පැවැති මහා මැතිවරණයත් සමඟ මතු වූ භීෂණය සති ගණන් දිගට ඇදී ගියේ මනුෂ්‍ය ජීවිත බිලි ගනිමින් රාජ්‍ය දේපොළ හා පෞද්ගලික දේපොළ ද විනාශයට පත් කරමිනි.

1977 න් පටන් ගත් ජනතා විරෝධය පුළුල් වෙමින් මර්දනය වෙමින් යළිත් වර්ධනය වෙමින් වසර 17 ක් පුරා ඇදී ගියේය.

වසර 17 ක් තුළ මෝරා ගිය ගැටුම හමාර වෙමින් යළිත් ජනතා ජයග්‍රහණයක් උදා වූයේ 1994 අගෝස්තු 16 දා පැවැති මහ මැතිවරණයෙන් එ.ජා.පක්ෂය පරාජයට පත් වීමෙනි.

ජූලි - අගෝස්තු මාසයන්හි ස්වභාවිකව පවත්නා දේශගුණික තත්ත්වය නිසාදෝ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට නියෝජිතයකු පත් කරන්නට මාස පහකුත් ගතවීම පිළිබඳව (2020 අගෝස්තු 05 සිට 2021 ජනවාරි 20 දක්වා) සැකයක් මතුවේ. මෙම මන්ත්‍රී ධුරයට පක්ෂ නායක, හිටපු අගමැති රනිල් වික්‍රමසිංහම පත් කළ යුතුයැයි කෘත්‍යාධිකාරී සභාව තදින්ම කියා සිටින්නේ හේතු ගණනාවක් මුල් කර ගනිමිනි.

1977 පටන් අමාත්‍ය ධුර ගණනාවක් දැරූ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක් ඇති බහුශ්‍රැත චරිතයක් පක්ෂය තුළ නොමැති හෙයිනි.

පක්ෂයේ අනාගත නිලධාරී මණ්ඩලයට පක්ෂයේ ඉදිරි කටයුතු ඉතා සාර්ථකව ඉතාම ඉහළ මට්ටමෙන් කළ යුතු බව පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ කෘත්‍යාධිකාරී සභාවේදී දැඩි අවධානයෙන් යුතුව ප්‍රකාශ කළේය. එහෙත් අත්‍යවශ්‍ය කාර්යභාරයට විසඳුමක් නොව ඉඟියක් හෝ පළ නොවීය. ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට රනිල් වික්‍රමසිංහ මහතා අනිවාර්යයෙන්ම පත් කළ යුතුයැයි පවසන කණ්ඩායම නව ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතාගේ නම නියෝජනය වේ. අගෝස්තු 06 වැනිදා සිට මේ දක්වා හිස් වූ මන්ත්‍රී ධුරයට කවදා හිරු පායාවි දැයි නිශ්චයක් නැත.

එක්සත් ජාතික පක්ෂය බිහි වීමට මූලික පදනම වැටෙන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ආරම්භ වූ අමද්‍යප ව්‍යාපාරය හරහාය. 1912 අප්‍රේල් 15 ආරම්භ වූ සුරාබදු ආඥා පනත මඟින් රට පුරා මත්පැන් ශාලා විවෘත කිරීමට ගත් තීන්දුව එදා මේ රටේ සිංහල බෞද්ධ ජනතාවගේ දැඩි අප්‍රසාදයට ලක් වූහ. 1912 මැයි මස 15 වැනිදා කොළඹ ආනන්ද මහ විදුහලේදී පැවැති රැස්වීමට පැමිණි ගිහි පැවිදි නායකයෝ මත්පැන්හල් විවෘත කිරීමට එරෙහිව උද්ඝෝෂණයක නිරත වූහ. රට පුරා අමද්‍යප සමිති පිහිටුවා ආරම්භ කළ අමද්‍යප ව්‍යාපාරය එක්සත් ජාතික පක්ෂය ආරම්භ කිරීමේ මුල් අඩිතාලම විය. දෙවැනි පියවර වශයෙන් 1946 සැප්තැම්බර් 06 දා කොල්ලුපිටියේ පාම්කෝට් මන්දිරයට රැස් වූ දේශපාලනඥයෝ පිරිසක් එ.ජා.පක්ෂය නමින් පක්ෂයක් ආරම්භ කිරීමට තීරණය කළහ.

පක්ෂ නායක ඩී. එස්. සේනානායක අරමුණු සහ ඉලක්ක දක්වමින් සියලු ජාතීන් අතර සුහදත්වයේ වැදගත්කම පැහැදිලි කළේය. එ.ජා.ප. ආරම්භයේ පටන්ම බහු ආගමික බහු වාර්ගික පක්ෂයකි. එමෙන්ම බටහිර සංස්කෘතියට අනුගත වූ පක්ෂයකි. අදාළ කාර්යයන් උදෙසා වර්තමානයේ නායකත්වය දෙන හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මෙම දැවැන්ත පක්ෂය මේ තරම් දුරට දුර්වල කිරීම ගැන අවධානය යොමු කළ යුතු වේ.

1947 පටන් මේ දක්වා වරින් වර වසර කිහිපයක් පුරා පාලන බලය දැරූ 1977 පටන් විවෘත ආර්ථික ක්‍රමයට අනුගත වූ එ.ජා. පක්ෂය මේ තරම් අන්ත පරිහානි තත්ත්වයට ඇද වැටුණේ කෙසේද යන්න ගැන විමර්ශනයක් කිරීම පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ ඇතුළු නව නිලධාරී මණ්ඩලයේ අනිවාර්ය වගකීමක් වේ. පක්ෂයේ දේශපාලන ඉතිහාසය තුළ මේ තරම් අඳුරු යුගයකට පක්ෂය ඇද වැටුණු අවස්ථාවක් කිසිවකු අත්දැක නැත. 1956 දී පක්ෂය අන්ත පරාජයට පත් වූ අවස්ථාවේදීත් පක්ෂ නායක අගමැති සර් ජෝන් කොතලාවල 1931 පටන් නියෝජනය කළ මැතිවරණ බල ප්‍රදේශය අහිමි වූයේ නැත.

මෙබඳු දේශපාලන අර්බුදයන් ගොඩනැගුණු කිහිප අවස්ථාවකම පක්ෂය ප්‍රතිසංවිධානය කිරීම සඳහා පියවර ගැනිණි. පනස් හයේ පරාජය ගැන විමර්ශනය කිරීමෙන් පසු 1961 සිට 1964 දක්වා දීප ව්‍යාප්තව සම්මන්ත්‍රණ මාලාවක් පවත්වනු ලැබීය. පුහුණු භටයින් පුහුණු කිරීම උදෙසා ආරම්භ වූ සම්මන්ත්‍රණ මාලාවෙන් පසු පක්ෂ හතක් ඇතුළත හෝ 1965 දී හවුල් රජයක් ගොඩ නඟන්නට හැකි විය. එහෙත් පුහුණු භටයින්ගේ ආර්ථික ප්‍රශ්න විසඳන්නට පක්ෂය නිවැරැදි ශක්තිමත් පියවරක් ගත්තේ නැත. 1969 දී ගොවි හමුදාවක් ආරම්භ කර විපක්ෂයේ දැඩි සමච්චලයට ලක් වූයේ ස්ථිර නිවැරදි සැලසුමකින් තොරව එය ආරම්භ කළ හෙයිනි. 1970 මහා මැතිවරණයේදී නැවතත් පක්ෂය අන්ත පරාජයට ලක් විය.

1973 දී ජේ. ආර්. ජයවර්ධන නව සභාපති ධුරයට පත් වීමෙන් පසු පක්ෂයේ නව ප්‍රතිසංවිධාන කටයුතු සාර්ථක ලෙස සිදු වූ අතර 1977 මැතිවරණය විජයග්‍රහණය කළේය. පක්ෂ ඉතිහාසය තුළ සිදු වූ නව විපර්යාසයන් විස්තර කළ යුතු නැත. රනිල් වික්‍රමසිංහ පසු කලෙක පක්ෂ නායකත්වයට පත්ව අගමැති ධුරය දක්වා පැමිණියේ එම ප්‍රතිසංවිධානය ඔස්සේය.

එබඳු ප්‍රතිසංවිධානයක් කරන්නට තරම් ශක්තිමත් බුද්ධිමත් විද්වත් කාර්යක්ෂම යාන්ත්‍රණයක් ගොඩනැඟීමට හැකි යෝධ පුරුෂයන් අද පක්ෂය තුළ නැත. එම යාන්ත්‍රණය පණ ගන්වන්නට හැකියාවක් තිබුණු නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස ප්‍රධාන ක්‍රියාකාරීහු සමගි ජන බලවේගය සමඟ අනාගත පාලන බලයක් ලබා ගැනීමේ ව්‍යායාමයට උරදී සිටිති. නමුත් සජිත් ප්‍රේමදාසගේ දේශපාලන සන්ධානයට නිරවුල් පැහැදිලි දේශපාලන දර්ශනයක් හෝ නිවැරැදි මාවතක් නොමැති බව මැදහත් විචාරකයෝ පවසති. පසුගිය කාලසීමාව තුළ සිදු වූ ක්‍රියාකාරකම් තුළින් විපක්ෂ නායකවරයා අසමත්යැයි විචාරකයෝ පවසති.

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ තව දුරටත් දේශපාලන අගාධයට පිවිසෙමින් සිටින අතර ඔහු සජිත් ප්‍රේමදාස කෙනකු නොවන බව බහුතරයගේ මතවාදයයි. එක්සත් ජාතික පක්ෂයට 2021 සැප්තැම්බර් 06 දිනට හරියටම වසර 75 ක් සපිරේ. එම ස්වර්ණමය අවදිය සමරන්නට එක්සත් ජාතික පක්ෂය යළි දෙපයින් නැඟී සිටිය යුතු වෙයි.

1936-12-18 දා ආරම්භ වූ ලංකා සම සමාජ පක්ෂයත්, 1939 දී ගොඩ නැගුණු ලංකා කොමියුනිස්ට් පක්ෂයත් තවමත් දේශපාලන ලෝකය තුළ සප්‍රාණිකව පවතී. පාලන බලයක් ලබා ගත නොහැකි වුවත් කශේරුකාව තිබේ. 1935 ආරම්භ වූ විශාල මහා සභාවක් එජාපය ගොඩ නඟන්නට එක් වූ ලංකා ජාතික සංගමයත් අද නාම මාත්‍ර වශයෙන් ජීවත් වන්නේ දේශපාලන විචාරකයන්ගේ ග්‍රන්ථවල පමණි. කම්කරු පක්ෂය ගුණසිංහත් සමඟම පරලෝ සැපත්ව ඇත. 2022 වසරේදී පැවැත්වෙන පළාත් පාලන මැතිවරණයට එ.ජා. පක්ෂය නාම මාත්‍රිකව හෝ නියෝජනය කරන්නට අවස්ථාවක් උදා කර ගත යුතු වන්නේ නම් පක්ෂයේ නව ප්‍රතිසංවිධානයක් ඉක්මනින් සිදු කළ යුතු වේ. එසේ නොවුනහොත් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය සහිත පුටුවට කාලය විසින් පාංශුකූලය දෙනු නියතය.

**බන්ධුල ආර්. ගුලවත්ත**

# කොවිඩ් එන්නතේ දෙවැනි මාත්‍රාව අප්‍රේල් මාසයේදී



## රාජ්‍ය ඇමැතිනි, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ

ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනකා කොවිෂීල්ඩ් එන්නතේ දෙවැනි මාත්‍රාව අප්‍රේල් මාසයේ දීදීමට සැලසුම් කර ඇති බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමතිනි සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කීවාය.

මෙම එන්නතේ පළමු මාත්‍රාව දී සති 4 කින් දෙවැනි මාත්‍රාව දිය යුතුයි කියා නව විද්‍යාත්මක තොරතුරු, පර්යේෂණවලින් අද වන විට තහවුරු වී ඇති බවත්, දෙවැනි මාත්‍රාව සති 12 කින් දුන් විට ප්‍රතිදේහ නිපදවෙන ප්‍රවණතාව වැඩි බව තහවුරු වී ඇති බවත් රාජ්‍ය ඇමැතිනිය පැවැසුවාය.

එමෙන්ම පළමු මාත්‍රාව දී මාස 3 ක් ගත වූ පසු සියයට 76ක ප්‍රතිදේහ තිබෙන අතර පළමු මාත්‍රාවෙන් ම රෝග ව්‍යාප්ත වීම සියයට 67කින් අඩු වී තිබෙන බව ද ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය අවධාරණය කළාය.

රාජ්‍ය ඇමැතිනිය මේ බැව් පැවැසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ කාර්යාලයේ දී ඊයේ (25) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි.

එහිදී රාජ්‍ය ඇමැතිනිය මෙසේද කීවාය.

"අපේ අරමුණ ජනගහණය සියයට 60කට එන්නත දෙන්නයි. අවුරුදු 18 ට අඩු පිරිසට, ගර්භණී මව්වරුන්ට, කිරි දෙන මවුවරුන්ට මේ එන්නත ගැනීමට හැකියාව නැහැ. ජන ජීවිත සාමාන්‍ය තත්ත්වයට ගෙන්න මේ අවුරුද්දේ මැද වෙනකොට බොහෝ දුරට ඉඩ තියෙන බව අපි මේ අවස්ථාවෙදි මතක් කරන්න ඕන. චීනයේ එන්නතක් සහ රුසියාවේ ස්පුට්නික් 5 එන්නත ලියාපදිංචි කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට ඉල්ලුම් පත්‍ර ලැබිලා තිබෙනවා.

පසුගිය සතිය පුරාම වාර්තා වන කොවිඩ් ආසාදිතයන් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. දවසකට කරන PCR ප්‍රමාණයෙන් පහුගිය කාලයේ සියයට 6ත් 6.5ක් පොසිටිව් වෙලා තිබෙනවා. මේ වෙකොට සියයට 4 දක්වා අඩු වෙලා තිබෙනවා.

අපි ශ්‍රී ලංකාවේ කොවිඩ් එන්නත්කරණය ආරම්භ කරා ජනවාරි 29 වන දා සිට. මේ වෙන කොට ලෝකයේම එන්නත් මිලියන 128 දී තිබෙනවා. මේ මිලියන 128 න් සියයට 75ක් දී තිබෙන්නේ රටවල් 10ටයි. ඒ අතින් බලනකොට ශ්‍රී ලංකාව වාසනාවන්තයි එන්නත්කරණය ආරම්භ කිරීම තුළින්.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ස්තුතිය පුද කරන්න අවශ්‍යයි. ජනාධිපතිතුමාගේ විශේෂ මැදිහත්වීම නිසා තමයි මෙම එන්නත්කරණය ජනවාරි 29 ආරම්භ කිරීමට හැකියාව ලැබුණේ. අපි සැලසුම් කර තිබුණේ මාර්තු පළවන සතියේ ආරම්භ කරන්න. අපිට ඊට කලින් ආරම්භ කරන්න හැකි වුණා.

අන්තර් ජාතික නිර්දේශවල තියෙන්නේ ප්‍රමුඛතාවය වයස 60 අයට කොවිඩ් එන්නත දෙන්න කියලා. ඒ මරණ අනුපාතය අඩු කරන්න. අපේ රටේ මරණ අනුපාතිකය 0.5% ක් වාර්තා වෙන්නේ. අපේ රෝගීන්ගේ දත්ත ගත් විට බහුතරයක් ඉන්නේ 30 - 60 වයස් කාණ්ඩයේ අය. අපේ රටේ තීන්දුවක් ගත්තා අවුරුදු 30 සිට ඉහළට එන්නත දෙන්න ඕන කියලා. එන්නත දීමේ අරමුණ 2ක් තියනවා. එකක් තමයි මරණ අනුපාතය අඩු කර ගැනීම. ඒ නිසා තමයි 60 ඉහළ අයට අවධානය යොමු කරන්නේ. ඒ අතරම රෝග පැතිරීම පාලනය කර ගැනීම. ඒ නිසා තමයි 30 සිට 60 ජනගහනය ඉලක්ක කර ගත්තේ.

කොහොමද එන්නත් කරන්නේ, කොහොමද සන්නිවේදනය කරන්නේ කියලා සෞඛ්‍ය අමාත්‍යංශය ඉතා හොඳ සැලසුම් සකස් කරලා තිබෙනවා. හදිසි යම් යම් අය ගත්ත තීන්දුවක් නිසා 30 සිට 60 ජනතාවට විතරයි එන්නත දුන්නේ. ජනාධිපතිතුමාව දැනුවත් කරලා සහ කාර්ය සාධන බළකාය තීන්දුවක් ගත්තා වයස අවුරුදු 30 සිට ඉහළ සියලු දෙනාටම අනිවාර්යෙන් වයස අවුරුදු 60 ඉහළ අයටත් මේ එන්නත ලබා දෙන්න ඕන කියලා.

පසු විපරම් කරද්දි වයස අවුරුදු 60 පුද්ගලයන්ට එන්නත දෙන්න ඕන කියලා පණිවිඩයක් ගිහින් තිබෙනවා. මම වහාම ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක ලලිත් වීරතුංග මහතාට මේ පිළිබඳව කතා කෙරුවා. එහිදී මා කීවේ අවුරුදු 30ට උඩින් සියලු දෙනාටම ග්‍රාම නිලධාරි වසම් ලියාපදිංචි අයට මේ එන්නත ලබා දීම වැදගත් බවයි. මම දන්නේ නැතිව තාක්ෂණික කමිටුව ගත්ත තීන්දුව පැත්තකට දාලා යම් යම් නිලධාරින් තීන්දු ගත්ත අවස්ථා තිබෙනවා. අපි එය නිවැරදි කරන්න කටයුතු කරනවා.

රජය විශාල මුදලක් වැය කරනවා. නොමිලේ එන්නත් ලක්ෂ 5 ක් ලැබුණා. තව එන්නත් ප්‍රමාණයක් මාර්තු මස 1 වන සතිය තුළ ලැබීමට නියමිතයි. එන්නත් ඇනවුම් කර තිබෙනවා. අඛණ්ඩව එන්නත් කරනවා. සෞඛ්‍ය අමාත්‍යංශය මැතිවරණ කොමිෂමත් එක්ක සම්බන්ධ වෙලා හැම ග්‍රාම නිලධාරි වසමක ලියාපදිංචි ඡන්ද නාම ලේඛන අරගෙන වයස 30 ට වැඩි අය හඳුනා ගෙන ලියාපදිංචි කරනවා.

හොඳට සැලසුම් කරලා, සන්නිවේදන කරලා ප්‍රායෝගිකව සාර්ථකව මේ වැඩසටහන දියත් කරන්න හැකියාව තිබෙනවා. සංවිධාන ගැටලු මුලදී තිබ්බා. ඒවා නිරාකරණය කරමින් මේ රටේ ජනතාව කොරෝනාවෙන් ආරක්ෂා කර ගන්න, ජනාධිපතිතුමාගේ සහයෝගය ඇතිව මෙරට කොරෝනා ව්‍යාප්තිය අඩු කරන්නත් අපි කටයුතු කරනවා. කැබිනෙට්ටුව අනුමත කරලා තිබෙනවා මිලියන 10ට ඩොලර් මිලියන 52.5 ක් එන්නත් මිල දී ගැනීමට. අපිට සල්ලි තිබුණත් එන්නත මිලදී ගැනීමට තරගකාරිත්වයක් තිබෙනවා.

# සහරාන්ගේ බොස් කවුදැයි දැන ගන්න අවශ්‍යයි

## මන්ත්‍රී නිරෝෂන් පෙරේරා

**පහන් විජේසේකර**



පාස්කු දින ප්‍රහාරයට සම්බන්ධ වූවන්ට දඬුවම් දීමට වඩා සහරාන්ගේ බොස් කවුදැයි දැන ගැනීමට බව විපක්ෂ නායක කාර්යාලයේදී ඊයේ (25) පැවැති මාධ්‍ය හමුවට එක් වෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී නිරෝෂන් පෙරේරා මහතා ප්‍රකාශ කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් පල කළ ඒ මහතා මෙසේ ද කීවේය.

පළමුවෙන්ම සුභ පතනවා නීතිඥ සංගමයේ සභාපති ලෙස පත් වූ සාලිය පීරිස් මහතාට. එතුමා රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරමින් අධිකරණයේ ස්වාධීනත්වය රැකීමට කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා .

පාස්කු දින ප්‍රහාරය පිළිබඳව කොමිෂන් වාර්තාව එළි දැක්වුවා. එයට ආණ්ඩුවේ විරෝධය අකමැත්ත විශාල ලෙස තිබුණා. එම වාර්තාව අධීක්ෂණයට ඇමැතිවරු 6 දෙනෙක් පත් කරලා තිබෙනවා. දැන් එම වාර්තාව ජනතාව ට දැක ගන්න ලැබිලා තියෙනවා. මෙම වාර්තාවේ ඇඟිල්ල දික් වුණු පුද්ගලයන් අද නිහඬ වෙලා. මෙම ප්‍රහාරයේ කවුද මොළකරු, කවුද මේ තුළින් දේශපාලන වාසි ගත්තේ යන තොරතුරු විමර්ශන වී නැත්තේ ඇයි කියලා අහනවා. සියලු වැරදි සහරාන් පිට දාන්න බැහැ. මේ ගැන නිසි විමර්ශනයක් කළ යුතුයි. කොහොමද සාරා රටින් පිට වුණේ, අබු කොහේද ඉන්නේ, මේ අයට ඉන්දියාව ඇතුළු විදේශ දේශපාලන නායකයන් ගේ සම්බන්ධතා මොනවාද, ඒ අයට මුදල් ලැබුණු ආකාරය, කවුද බුද්ධි අංශ සමග හිටියේ යන්න හෙළි කර යුතු වෙනවා.

මේ වාර්තාවේ අපිට ලැබී තිබෙනවා. මෙහි යම් කරුණු හෙළි කරලා තියෙනවා. එය යට ගහන්න හදන්න එපා. සාමාන්‍ය පෙළ සමත් නැති, නීතියක් දන්නේ නැති ඇමැතිවරු මෙයට පත් කරලා වැඩක් නැහැ. කාදිනල්උන් වහන්සේ පවා එම කමිටුව ප්‍රතික්ෂේප කළා. මෙහි යම් කරුණු යට ගැහීමක් තිබුණා. දේශපාලන හිතවත්කමට ඇතැම් අය බේරා ගන්න එපා. ප්‍රහාරයෙන් මිය ගිය පවුල්වල අය බලා සිටිනවා සාධාරණයක් ඉටු වෙනකම්. පසුගිය ආණ්ඩුවටට ඇඟිල්ල දිගු නොකර හරියට පරීක්ෂණ කටයුතු කරන ලෙස ද මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය.

නිසි පරීක්ෂණ නොකිරීම ගැන කනගාටු වෙනවා. අපි පාර්ලිමේන්තුවේ සුළු ඉල්ලීමයි කළේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. එහිදී ආණ්ඩුවේ පාර්ශ්වයෙන් විශාල බධා ආවා. අපි කියන්නේ මෙම වාර්තාව පිටපත් කර ආගමික නායකයන් ඇතුළු විශේෂ අයට ඉක්මනින් ලබා දෙන්න කියලා.

කවුරු මෙය යටගහන්න හැදුවත් සත්‍ය ජනතාවට හෙළි වෙනවා. සත්‍ය රටේ නීතියෙන් ඉටු නොවුණොත් ජාත්‍යන්තරයට ගෙන යනව. පාර්ලිමේන්තුවේ දින තුනක් මේ වාර්තාව ගැන විවාද කරන්න බලාපොරොත්තු වෙනවා. ප්‍රහාරය වළක්වා නොගැනීමට දඬුවම් දීම නොවෙයි බලාපොරොත්තු වෙන්නේ. සහරාන් ගේ බොස් කවුද ඔහු පෝෂණය කළේ කවුද දැනගැනීම බව මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය .

# පාස්කු දින ප්‍රහාරයේ මහ මොළකරු කවුද යන්න කොමිසමේදී අනාවරණය නොවීම බරපතළ ගැටලුවක්

## යුක්තිය උදෙසා කාන්තාවෝ

**සුභාෂිණී සේනානායක**

පාස්කු දින ප්‍රහාරයට සැබෑ නායකත්වය දුන්නේ කවුද, ප්‍රහාරයේ මහ මොළකරු කවුද යන්න අනාවරණය කර ගැනීම සඳහා ජනාධිපති කොමිසමක් පත් කළද එම කොමිසම හරහා අදාළ කරුණු අනාවරණය නොවීම බරපතළ ගැටලුවක් යැයි යුක්තිය උදෙසා කාන්තාවෝ සංවිධානය පැවසීය.

බුද්ධි තොරතුරු දුන් පුද්ගලයකු ලෙස සහරාන්ගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් කොමිසමේදී හෙළිදරව් නොවූ බව කියා සිටින යුක්තිය උදෙසා කාන්තාවෝ සංවිධානයේ නිරෝෂා අතුකෝරල මහත්මිය සහරාන් බුද්ධි අංශ සමග සම්බන්ධ වී සිටි බවත්, ඔහුට වැටුප් දී ඇති බවත් තහවුරු වී ඇතැයිද පවසා සිටියාය.

එහෙත් ඔහුගෙන් ලැබුණු බුද්ධි තොරතුරු මොනවාද යන්න පිළිබඳව අනාවරණය කර ගත යුතුව තිබූ බව කියා සිටි ඒ මහත්මිය ඒ සම්බන්ධයෙන් කොමිසම පියවර ගත්තේද යන්න ගැටලුවක් බවද කියා සිටියාය.

එවකට ආරක්ෂක ලේකම්වරයා ලෙස කටයුතු කළ, වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් කොමිසම සාක්ෂි විමසීමට කටයුතු නොකිරීමද බරපතළ ගැටලුවක් යැයිද ඒ මහත්මිය මාධ්‍යට අදහස් දක්වමින් සඳහන් කළාය.

# සමෘද්ධිලාභීන් ලක්ෂ දෙකක් මේ වසරේ සවිබල ගන්වනවා



## රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

**එස්.ජී. උබේපාල කැබිතිගොල්ලෑව සමූහ**

මිලියන 22ක ජනතාවක් ජීවත් වන මෙරට ලක්ෂ 18ක ජනතාවක් සමෘද්ධිය ලබන බවත් ඉන් තෝරාගත් ලක්ෂ දෙකක ප්‍රතිලාභින් ප්‍රමාණයක් මේ වසරේ සවිබල ගැන්වීමට කටයුතු කරන බවත් ඒ සඳහා තෝරාගත් ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි මුද්දරය තෝරා ගත් දිනට පසු දින කපා ඉවත් කිරීමට කිසි සේත් කටයුතු නොකරන බවත් ද සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහතා පැවසීය.

මැදවච්චිය පැවත්වූ දැනුම්වත් කිරීමේ වැඩසටහනකදී පෙරේදා (24) රාජ්‍ය ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේය.

එහිදී අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍යවරයා,

සමෘද්ධි සංශෝධනවලින් අපි මේ රටේ සමෘද්ධි ලැබීමට සුදුසුකම් ලබා සිටින අයගේ සමෘද්ධිය කපා ඉවත් කිරීමට කටයුතු කරන්නෙත් නෑ.

පක්ෂ - පාට, ජාති - භේදවලින් තොරවයි අපි කටයුතු කරන්නේ. මේ රටේ ජීවත් වන ජනතාවගෙන් සියයට 30කට මේ වන විට සමෘද්ධිය දෙනවා. වර්ෂයක් පාසා ඉන් ලක්ෂ දෙකක් සවි බල ගැන්වීමට අපි මේ වන විට ආර්ථික උත්පාදන ගම්මාන බිහි කරමින් සිටිනවා. ඒ තුළ ස්වයං රැකියාලාභින් සඳහා ව්‍යාපාර විවෘත්ත වෙනවා. ඒ වගේම සියයට 1ක සහන පොලියට ණය ලබා දෙනවා ව්‍යාපාර දියුණු කර ගැනීමට. ඒ අනුව මේ වන විට ග්‍රාමීය ප්‍රජා මූල්‍ය සංවිධාන ශක්තිමත් කරන්න කටයුතු කරමින් සිටිනවා. එහි පළමු අදියර ලෙස රුපියල් ලක්ෂ 2,000ක් අනුරාධපුර දිස්ත්‍රික්කයට පමණක් මේ වන විට ග්‍රාමීය ප්‍රජා මූල්‍ය සංවිධාන ශක්තිමත් කරන්න දී තිබෙනවා.

# නව ව්‍යවස්ථාවෙන් පළාත් සභා පදනම් කර ගෙන බලය බෙදිය යුතුයි

## ඊ.පී.ඩී.පී. පක්ෂයේ විද්වත් සභාව

**බුද්ධිකා ඉඹුලාන**

නව ව්‍යවස්ථාව මගින් පළාත් සභාව පදනම් කර ගෙන බලය බෙදීම නිසි ලෙස ඉටු කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව ඊ.පී.ඩී.පී. පක්ෂයේ විද්වත් සභාව පවසයි.

ඉදිරියේදි සැකසීමට යෝජිත ව්‍යවස්ථාවට විශේෂිත වු යෝජනා කිහිපයක් ඊ.පී.ඩී.පී පක්ෂය විසින් සඳහන් කරන අතර එම නිර්දේශ ඊ.පී.ඩී.පි පක්ෂයේ මහලේකම් හා ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් විද්වත් සභාව විසින් නව ව්‍යවස්ථා සම්පාදක කමිටුවේ සභාපති රොමේෂ් ඩී සිල්වා මහතා ප්‍රමුඛ කමිටුවට භාර දීමට කටයුතු කරන ලදී.

මෙම නිර්දේශ වශයෙන්, 13 වන ව්‍යවස්ථා සංශෝධනය පදනම් කරගෙන සකසා ඇති පළාත් සභා ක්‍රමය මුළුමනින්ම ක්‍රියාවට නැන්විය යුතු බවත්, දැනට පවතින පළාත් සභා ශක්තිමත් කිරීමට අවශ්‍ය කරුණු නව ව්‍යවස්ථාවේ අන්තර්ගත විය යුතු බවත් පෙන්වා දී ඇත. ඉන්දු ලංකා ගිවිසුමට අනුව සකසා ඇති පළාත් සභාවලට අයත් බලය හරියාකාරව යොදා ගැනීමට තිබූ අවස්ථාව පසුගිය කාලයේ බලයට පැමිණි ආණ්ඩු විසින් මගහැර ඇති බවටද ඊ.පී.ඩී.පි පක්ෂය චෝදනා කර සිටියි. තමා පළාත් සභා ක්‍රමය සම්පූර්ණයෙන් ක්‍රියාවට නැංවීම හරහා ඉදිරියට යාමෙන් දෙමළ ජනයාගේ ප්‍රශ්නවලට හා ජනවාර්ගික ගැටලුවට විසඳුම් ගත හැකි බව දිගින් දිගටම පෙන්වා දුන් බවත් නව ව්‍යවස්ථාව තුළ මෙම කරුණු අන්තර්ගත විය යුතු බවත් ඊ.පී.ඩී.පි පක්ෂයේ නිර්දේශවල සඳහන් කර ඇත.

# පාස්කු දින ප්‍රහාරය පිළිබඳ කොමිෂන් සභා වාර්තාව හිස්-දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශයක් වගේ

## හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ

**ශිරෝමි අබයසිංහ**

පාස්කු ප්‍රහාරයේ ඇත්ත කරුණු කිසිවක් හෙළි කර නැති ජනාධිපති කොමිෂන් සභා වාර්තාව නිකම්ම නිකම් එක රටක් එක නීතියක් ලෙස සඳහන් දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශයක් වැනි යැයි එක්සත් ජාතික පක්ෂ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඊයේ (25) පැවසීය.

පාස්කු ප්‍රහාරය එල්ල වූ දිනයේ තමා ආරක්ෂක අංශ සියල්ල මෙහෙයවා දෙවැනි සහ ඉදිරි ප්‍රහාර වැළැක්වීමට ගත් පියවර කිසිවක් ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ ඇතුළත් නොවීම අඩුවකැයි ද රනිල් වික්‍රමසිංහ මහතා කීය.

රනිල් වික්‍රමසිංහ මහතා මෙම අදහස් පළ කළේ කොළඹ කොල්ලුපිටිය පස් වන පටුමගේ පිහිටි ඒ මහතාගේ නිවසේ දී ඊයෙ (25) පෙරවරුවේ රැස් වූ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් හමුවේ අදහස් දක්වමිනි.

එක රටක් එක නීතියක් ක්‍රියාත්මක කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුදුදහමට දී තිබෙන ප්‍රමුඛස්ථානය අහෝසි කිරීමට ජනාධිපති කොමිෂන් සභා වාර්තාව නිර්දේශ කරන්නේදැයි ප්‍රශ්න කළ රනිල් වික්‍රමසිංහ මහතා කොමිසම නිර්දේශ කරන ආකාරයට ජාතීන් වශයෙන් ඉඩම් බෙදීමක් ප්‍රයෝගිකව සිදු කරන්නේ කෙසේදැයි ප්‍රශ්න කළේය.

මෙයට අමතරව දහම් පාසල් පාලනය යෝජනා කරන්නේ බෞද්ධ කටයුතු කොමසාරිස් ධුරය අහෝසි කිරීමට-දැයි රනිල් වික්‍රමසිංහ මහතා එහිදී අදහස් දක්වමින් ප්‍රශ්න කර සිටියේය.



තවදුරටත් අදහස් දැක්වූ එක්සත් ජාතික පක්ෂ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා මෙසේද කීය.

"සිංහල හින්දු අලුත් අවුරුද්දට පෙර අප්‍රේල් මස 9 වන දින රැස් වූ ආරක්ෂක මණ්ඩල රැස්වීමේදී ප්‍රහාරයක් එල්ල වීම සම්බන්ධයෙන් ලැබුණු කිසිදු තොරතුරක් පිළිබඳව කතා කළේ නැහැ.

සියලුම හමුදා ප්‍රධානීන්, රහස් පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ඉහළම නිලධාරීන් ඇතුළු රටේ ආරක්ෂාව සම්බන්ධ සියලු දෙනා රැස් වූ එම රැස්වීමේදී හෙළි නොකළ කරුණු ඊට පසුව සාකච්ඡා කළාදැයි සිතිය නොහැකියි.

ජනාධිපති විමර්ශන කොමිසම් වාර්තාවේ අලුතින් කිසිවක් සඳහන් කර නැහැ. එය නිකන්ම නිකන් එක රටක් එක නීතියක් ලෙස සඳහන් දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශයක් වගේ.

උඩරට නීතිය අහෝසි කරන්න ජනාධිපති කොමිසම නිර්දේශ කරනවා. ජාතීන් වශයෙන් සලකා ඉඩම් බෙදීම ප්‍රායෝගිකද? දහම් පාසල් පාලනයක් ගෙන එන්න හදන්නේ බෞද්ධ කටයුතු කොමසාරිස් ධුරය අහෝසි කිරීමටයි. පළමු ප්‍රහාරය එල්ල වී සුළු වේලාවකට පසුව අගමැති ලෙස මම බලෙන්ම ආරක්ෂක අමාත්‍යංශයට ගොස් ආරක්ෂක ප්‍රධානීන් කැඳවා දෙවැනි සහ ඉදිරි ප්‍රහාර එල්ල වීම වැළැක්වූවා.

# විදෙස්ගතව සිටි හිටපු ජනාධිපති පාස්කු දින ප්‍රහාරය සිදු වූ වහාම ශ්‍රී ලංකාවට ආවේ නෑ

## හිටපු මන්ත්‍රී, මහාචාර්ය ආශු මාරසිංහ

**මැදකොළඹ සමූහ**

පාස්කු ඉරිදා ප්‍රහාරය සිදු වන විට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ලංකාවේ නොසිටි නමුත් සිද්ධිය දැනගත් වහාම කඩිනමින් ශ්‍රී ලංකාවට ඒම හිතාමතා පැහැර හැර ඇතැයි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, මහාචාර්ය ආශු මාරසිංහ මහතා පැවැසීය.

සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පසුගියදා පැවැති මාධ්‍ය හමුවකදී අදහස් පළ කරමින් ඒ මහතා මේ බව පැවැසුවේ මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

මාධ්‍යවේදීන් විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මෙසේද කීය.

"පසුගිය පාර්ලිමේන්තුවේදී පාස්කු ඉරිදා සිද්ධිය පිළිබඳ තේරීම් කාරක සභාවක් පත් කරනු ලැබුවා. එහි මාද සාමාජිකයකු ලෙස කටයුතු කළා. පාස්කු ප්‍රහාරයෙන් දින ගණනාවකට පසුවයි වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරණ තරගයට ඉදිරිපත් වීමට තීරණය කළේ.



එවිට ජනාධිපතිවරණයට නාම යෝජනා දීමෙන් පසු පාස්කු ඉරිදා සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වා එහි වැරැදිකරුවන් වන සියලුම දෙනාට දඬුවම් දෙන බව ජනාධිපතිවරණ අපේක්ෂකයා ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශ කර තිබුණු බව රටේ ජනතාව දන්නවා. නමුත් මේ පිළිබඳව කාරක සභා හා වෙනත් කමිටු පත්කරනු ලැබුවත් ඒ කිසිවක් ජනමාධ්‍යයට දැනගැනීමට සැලසුවේ නෑ. දැනට කොරෝනා 19 රෝගයට ගොදුරු වී සිටින පොලිසියේ ශානි අබේසේකර මහතා ඉතා දක්ෂ අන්දමින් කටයුතු කළ බව කිව යුතුයි.

පාස්කු ඉරිදා පිළිබඳව වැරදිකරුවන් වන යහපාලන ආණ්ඩුවේ වැරදිකරුවන්ට දඬුවම් ලෙස දේශපාලන ලෙස ප්‍රජා අයිතිය නැති කිරීමට උරචක්‍රමාලාවක් හදන බවට ආරංචියක් තිබෙන බවද ආශු මාරසිංහ මහතා මාධ්‍යවේදියකු නගන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පැවසීය.

ගෝඨාභය රාජපක්ෂ මහතා පළාත් දිස්ත්‍රික් මට්ටමින් රටේ දුෂ්කර පළාත්වලට ගොස් එම ප්‍රදේශවල ජනතාව හා පාසල් සිසු සිසුවියන් සමග පිළිසඳරේ හා සතුටු සාමීචියේ යෙදෙමින් ගම් පළාත්වල අඩුපාඩු සඳහන් කිරීමට ඉඩදෙනු ලබන්නේ ආණ්ඩුවෙන්ම ඉදිරිපත් කරන පිරිස්වලට පමණක් බව පැහැදිලිව දක්නට ඇතැයි ද හිටපු මන්ත්‍රීවරයා සඳහන් කළේය.

ජනාධිපතිවරයා පුත්තලමට ගිය විට කරුවලගස්වැව ජනතාව වන අලි එළවීම පිළිබඳව ප්‍රශ්න අසන අවස්ථාවේ ඒවාට පිළිතුරු දීමට වනජීවී නිලධාරීන් නොසිටින බවත් ඇතැම් පළාත්වල ගස් කැපීම් කැළෑ එළිපෙහෙළි කිරීම් සිදු වන බවත් ආශු මාරසිංහ මහතා පෙන්වා දුන්නේය. එසේම ඉකුත් දිනක අධිකරණ ඇමැති මොහමඩ් අලි සබ්‍රි මහතා දේවාලගම් පිළිබඳව කළ ප්‍රකාශයක් පිළිබඳ රට තුළ වෙසෙන පූජනීය සංඝරත්නය දැන් විහාරස්ථානවලින් එළියට පැමිණ විරෝධතා දක්වන බවද ඒ මහතා සඳහන් කළේය.

හිස්බුල්ලාගේ බැටිකලෝ කැම්පස් එක වසා තිබෙනවා. මේ පිළිබඳව වත්මන් ආණ්ඩුව වෙත සියලුම කාරණා හෙළිදරව් වී තිබෙන බවට වාර්තා අප වෙත ලැබී තිබෙනවා යැයිද ඒ මහතා කීවේය. යහපාලන ආණ්ඩුව කාලයේ කිසිම රටකට කිසිදු බිම්කඩක් නොවිකුණු බවත් මේ වන විට නැගෙනහිර ජැටිය වෙනුවට බටහිර ජැටිය විකිණීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජය හොරගල් අහුලමින් සිටිනා බවද හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආශු මාරසිංහ මහතා පැවසීය. වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාරිභෝගික ද්‍රව්‍ය 27ක මිල අඩු කිරීමක් සිදු කළත් සතොස ආයතනවල ද්‍රව්‍ය උදෑසනින්ම අවසාන වන බවත් ඒ පිළිබඳව ගනු ලබන පියවර කුමක්දැයි තමා විමසා සිටිනා බවත් ඒ මහතා ප්‍රශ්න කළේය.



# කෝවැක්ස් කොරෝනා එන්නත ආරක්ෂිතයි ඵලදායකයි

## එක්සත් ජනපද නියාමකයෝ සොයාගනිති

ජොන්සන් ඇන්ඩ් ජොන්සන් සමාගමේ කොරෝනා වයිරස් එන්නත පිළිබඳ එක්සත් ජනපද නියාමකයන් විසින් කරන ලද සමාලෝචනයකින් එය ආරක්ෂිත හා ඵලදායී බව සොයාගෙන ඇත. එය එක්සත් ජනපදයේ අනුමැතිය ලත් තෙවන කොවිඩ්-19 එන්නත බවට පත් වී ඇත. මේ එන්නත ෆයිසර් සහ මෝඩර්නා එන්නත් සඳහා ලාභදායී විකල්පයක් වන අතර එය අධි ශීතකරණයක් වෙනුවට සාමාන්‍ය ශීතකරණයක ගබඩා කළ හැකිය. අත්හදා බැලීම්වල ප්‍රතිඵල පසුගිය මාසයේ ජොන්සන් සහ ජොන්සන් විසින් නිකුත් කරන ලදී. ඖෂධ නිෂ්පාදන දැවැන්තයාට අයත් බෙල්ජියම් සමාගමක් වන ජැන්සන් පැවසුවේ එහි දත්ත මගින් පෙන්නුම් කරන්නේ එම නිෂ්පාදිතය දරුණු රෝග තත්ත්වලට එරෙහිව ඉතා ඵලදායී බවයි. කෝවැක්ස් නම් මේ එන්නත බෙදාහැරීමට මුලපිරීමෙන් කොරෝනා වයිරස් එන්නත් ලබාගත් පළමු රට බවට ඝානා රාජ්‍යය පත්විය. එක්සත් ජනපද ආහාර හා ඖෂධ පරිපාලන ආයතනය (FDA) විසින් ප්‍රකාශයට පත් කරන ලද ලේඛනය අනුව, ජැන්සන් විසින් නියාමකයා වෙත ඉදිරිපත් කරන ලද දත්ත පිළිබඳ වැඩි විස්තර සපයයි. රෝග ලක්ෂණ සහ දරුණු රෝගාබාධ අවම කිරීමට ජොන්සන් ඇන්ඩ් ජොන්සන් එන්නතට "ප්‍රතිලාභ" ඇති බව FDA නිගමනය කරයි. එක්සත් ජනපදය, දකුණු අප්‍රිකාව සහ බ්‍රසීලය රටවල සිදු කරන ලද එන්නත් අත්හදා බැලීම්වල ප්‍රතිඵල මගින් වයිරසයේ දරුණුතම ප්‍රතිඵලවලට එරෙහිව එහි කාර්යක්ෂමතාව "ඒ හා සමානව ඉහළ" බව සොයාගත් නමුත් වයිරස් ප්‍රභේද ප්‍රමුඛ වී ඇති දකුණු අප්‍රිකාවේ සහ බ්‍රසීලයේ සමස්ත ආරක්ෂාව අඩු විය.



## ගූගල් සහ ෆේස්බුක්වල පුවත්තිවල අන්තර්ගතයට මුදල් අය කිරීම


# ලොව ප්‍රථම නීතිය ඕස්ට්‍රේලියාව සම්මත කරයි




ගූගල් සහ ෆේස්බුක් ඔවුන්ගේ වේදිකාවල පළ කරන ප්‍රවෘත්ති අන්තර්ගතයන් සඳහා මුදල් අයකිරීම අරමුණු කරගත් ලොව ප්‍රථම නීතිය ඕස්ට්‍රේලියාව සම්මත කර තිබේ.මේ ප්‍රවෘත්ති කේත පනතට එක්සත් ජනපද තාක්ෂණික දැවැන්තයන් දැඩි ලෙස විරුද්ධ වී තිබුණි. පසුගිය සතියේ ෆේස්බුක් විසින් ඕස්ට්‍රේලියානුවන්ට සියලු ප්‍රවෘත්ති අන්තර්ගතය අවහිර කළ නමුත් රජය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මේ සතියේ සිය තීරණය වෙනස් කළේය. එම සාකච්ඡාවලින් පසුව,ෆේස්බුක් සහ ගූගල් කේතයට යටත් නොවීමට ඉඩ සලසන නව සංශෝධන සමඟ නීතිය සම්මත විය. කෙසේ වෙතත්, සමාගම් දෙකම දැන් කේතයෙන් පිටත ඇතැම් විශාල ඕස්ට්‍රේලියානු ප්‍රකාශකයන්ට මුදල් ගෙවීමට කැප වී සිටිති. මේ ගනුදෙනු එම තාක්ෂණික දැවැන්තයන්ගේ සම්මුතියක් ලෙස පුළුල් ලෙස සලකනු ලබයි. ප්‍රවෘත්ති සඳහා ඩිජිටල් වේදිකාවලින් ගෙවීම් ලබා ගැනීමට වෙනත් රටවලට සමාන නියාමනයක් සඳහා ඕස්ට්‍රේලියාවේ නීතිය පරීක්ෂා කළ හැකි අවස්ථාවක් ලෙස මෙය සැලකේ. සංශෝධිත ව්‍යවස්ථාව මීට පෙර සෙනෙට් සභාව හරහා ගොස් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ දී සම්මත විය. ෆේස්බුක් සහ ගූගල් තර්ක කළේ එය "මූලික වශයෙන්" අන්තර්ජාලය ක්‍රියා කරන ආකාරය වරදවා වටහා ගැනීමක් බවයි.




# එක්සත් රාජධානියේ බුද්ධි ඒජන්සිය මිනිස් ජාවාරමේ ගැටලු විසඳීමට කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීමට යයි




එක්සත් රාජධානියේ බුද්ධි ඒජන්සිය GCHQ විසින් ළමා ලිංගික අපයෝජනයේ සිට වැරැදි තොරතුරු සහ මිනිස් ජාවාරම දක්වා වූ ගැටලු විසඳීමට කෘතිම බුද්ධිය භාවිතා කිරීමට අදහස් කරයි. එක්සත් රාජධානියේ සතුරන් ඒ වන විටත් තාක්‍ෂණය භාවිතා කරමින් සිටි බව එම ඒජන්සිය කියයි. ඒජන්සිය විසින් කෘත්‍රිම බුද්ධියට ආචාර ධර්ම පුරෝගාමී නව ජාතික ආරක්ෂාවක් ගැන අදහසක් යන පර්යේෂණ පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කර ඇති අතර එහි ක්‍රියාකාරිත්වය එහි තාක්‍ෂණය හදවතේ තබන බව පවසා තිබේ. විශාල හා වේගයෙන් වර්ධනය වන දත්ත ප්‍රමාණවල සැඟවී ඇති රටා හඳුනා ගැනීමට විශ්ලේෂකයන්ට එය උපකාරී වනු ඇතැයි නිලධාරීහු පවසති. එහෙත් ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීම වැනි මානව හැසිරීම් අනාවැකි කීමට එයට නොහැකිය. GCHQ සිය මැන්චෙස්ටර් කාර්යාලයෙන් තම කටයුතුවලට අදාළ කෘත්‍රිම බුද්ධි විද්‍යාගාරයක් පිහිටුවීම, ව්‍යාපෘති ආකෘතිකරණය කිරීම සහ ආරම්භක ව්‍යාපාර සඳහා මඟ පෙන්වීම ඇතුළුව කෘත්‍රිම බුද්ධි අංශයට සහයෝගය දැක්වීමට අවශ්‍ය වන්නේ කෙසේද යන්න මේ ලිපියෙන් දක්වා ඇත.



## දකුණු කොරියාවේ යුද සිරකරුවන් උතුරු කොරියාවේ ගල් අඟුරු ආකරවල වහල් සේවයේ:

# වහලුන් විලංගු දමා ඇදගෙන යන අයුරු රූපවාහිනියේ මා දුටුවා

## මා චෝයි කි-සන් මාධ්‍යට කියයි





මානව හිමිකම් සංවිධානයක් විසින් නිකුත් කරන ලද වාර්තාවකට අනුව, දකුණු කොරියාවේ යුද සිරකරුවන්ගේ පරම්පරා උතුරු කොරියානු ගල් අඟුරු ආකරවල වහල් ශ්‍රමිකයන් ලෙස පාලන තන්ත්‍රයට සහ එහි ආයුධ වැඩපිළිවෙළට මුදල් උත්පාදනය කිරීමට යොදා ගැනේ."රූපවාහිනියේ වහලුන් විලංගු දමා ඇදගෙන යන අයුරු මා දුටුවා" යැයි මා චෝයි කි-සන් මාධ්‍ය වෙත පැවසීය. ඔහු 1953 කොරියානු යුද්ධය අවසානයේ උතුරු කොරියාව විසින් අල්ලා ගන්නා ලද ඇස්තමේන්තු ගත සිරකරුවන් 50,000 දෙනාගෙන් කෙනෙකි. "අප කම්කරු කඳවුරුවලට ඇදගෙන යන විට, අපි තුවක්කුව අසල සිටිමු. අවට සන්නද්ධ ආරක්ෂකයන් සමඟ පෙළගැසී සිටියෙමු. වහල් ශ්‍රමය නොවන්නේ නම් මෙය කුමක් විය හැකිද?" චෝයි මහතා (ඔහුගේ සැබෑ නම නොවේ) කියා සිටියේ වසර 40 කට පසුව ඔහු පැන යන තෙක් උතුරු හැම්ජියොන්ග් පළාතේ පතලක තවත් යුද සිරකරුවන් 670 ක් පමණ සේවය කළ බවයි. පතල්වලින් කතන්දර ලබා ගැනීම පහසු නැත. චෝයි මහතා මෙන් දිවි ගලවා ගත් අය මාරාන්තික පිපිරීම් සහ සමූහ ඝාතන පිළිබඳ කතා කියති. මේ අයට විවාහවීමට ධෛර්යමත් කරන අතරම, චෝයි මහතා මෙන් - පසුව ඔවුන්ගේ දරුවන් ද පතල්වලට ඔවුන් අනුගමනය කිරීම හැර වෙනත් විකල්පයක් නැති දරුවන් හදාවඩා ගැනීමට ඔවුන්ට අවම සලාක දෙන ආකාරය ඔවුහු හෙළි කරති.

# මියන්මාර ගෘහ සේවිකාවට හිංසා කර ඝාතනය කරලා

## සිංගප්පූරු පොලිස් නිලධාරියාගේ බිරිය වරද පිළිගනී



සිංගප්පූරු පොලිස් නිලධාරියකුගේ බිරියක් තම මියන්මාර ජාතික ගෘහ සේවිකාව කුසගින්නේ තබා, වද හිංසා පමුණුවා අවසානයේ දී ඝාතනය කළ බව පිළිගෙන තිබේ. 2016 දී මේ සිද්ධියෙන් ලැබූ තුවාලවලින් මිය යනවිට සේවිකාවගේ බර කිලෝග්‍රෑම් 24 ක් (රාත්තල් 53ක්) පමණක් වූ බව වාර්තා වේ. ගයත්‍රි මුරුගයාන්ගේ ක්‍රියාව "නපුරු හා මුළුමනින්ම අමානුෂික" යැයි නීතිඥයින් විසින් නම් කර ඇත. එරට සිටින ආසියාවේ අසල්වැසි රටවලින් පැමිණි විදේශීය ගෘහ සේවිකාවන්ට සලකනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ අයිතිවාසිකම් කණ්ඩායම් අවධානය යොමු කර තිබේ. අඟහරුවාදා (23) 40 හැවිරිදි මුරුගයාන් මහත්මිය සිංගප්පූරු අධිකරණයකදී වරද පිළිගත් අතර පියං නගයි ඩොන්ට එරෙහිව සිදු කළ මිනීමැරුම් ඇතුළු චෝදනා 28කට වැරැදිකරු වුවහොත් ඇයට ජීවිතාන්තය දක්වා දඬුවම් නියම කළ හැකිය.





# මුහුදුබත් වූ නැවේ නාවිකයා බෝයා කැබැල්ලක එල්ලී දිවි ගලවා ගත් හැටි

## නාවිකයාගේ පුතා කියන අනුවේදනීය කතාවක්



තමා ගමන්ගත් නැව මුහුදුබත් වූ නාවිකයකු "මුහුදේ පාවෙමින් තිබූ බෝයා කැබැල්ලකට" එල්ලී දිවි ගලවා ගත් බව ඔහුගේ පුතා අනාවරණය කර තිබේ. විදම් පෙරෙවර්ට්ලොව් හිම්දිරි උදෑසන තමන් ගමන් ගත් භාණ්ඩ ප්‍රවාහන නැවෙන් පැසිෆික් සාගරයට වැටීමෙන් පැය 14ක් ජලයේ ගත කළේය. ජීවිතාරක්ෂක කබායක් පැලඳ නොසිටි 52 හැවිරිදි ඔහු සිය ජීවිතය බේරා ගැනීමට කිලෝමීටර් කීපයක් ඈතින් පිහිටි "කළු තිතක්" දෙසට පිහිනීමට තීරණය කළේය. එය මාළු ඇල්ලීමේ බෝයාවකි. තමා බේරා ගන්නා තෙක් ඔහු එය අල්ලාගෙන සිටියේය. පෙරෙවර්ට්ලොව් මහතා සිල්වර් සපෝටර් සමාගමේ ලිතුවේනියානු ප්‍රධාන ඉංජිනේරුවරයා වන අතර ඔහු නවසීලන්තයේ ටෝරන්ගා වරාය සහ හුදකලා බ්‍රිතාන්‍ය භූමි ප්‍රදේශයක් වන පිට්කේන් අතර සැපයුම් ධාවනය කරමින් සිටියේය. එන්ජින් කාමරයේ ඉන්ධන පොම්ප කිරීමෙන් පසුව ඔහුට "උණුසුම් හා කරකැවිල්ල" දැනුණු බව ඔහුගේ පුතා පැවසීය.



ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

# දකුණු පළාත - 2021 මාර්තු මාසය

## අකුරැස්ස විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### අකුරැස්ස පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-01 08:30-13:00
තොග සහ බෙදාහැරීම් : ඌරුවලවතුයාය

2021-03-01 13:00-17:00
බෙදාහැරීම් : බෙලිකැටිය, කම්බිඅඩිය

2021-03-02 08:30-13:00
තොග : නන්දන තේ කර්මාන්තශාලාව
බෙදාහැරීම් : මැලැව්වතව

2021-03-02 13:30-17:00
තොග සහ බෙදාහැරීම් : කිරිමැටිදෙණිය

2021-03-03 08:30-13:00
තොග : කටන්විල තේ කර්මාන්තශාලාව
බෙදාහැරීම් : වැලිගම

2021-03-03 08:30-17:00
බෙදාහැරීම් : බුලුවත, ලබුවැල්හේන, ඔරියන්ට්ගාමන්ට්, පොදුජනගම

2021-03-04 08:30-13:00
තොග : දැදියගල තේ කර්මාන්තශාලාව
බෙදාහැරීම් : දැදියගල

2021-03-04 08:30-17:00
බෙදාහැරීම් : බුලුවත, ඔරියන්ට් ගාමන්ට්, පොදුජනගම

2021-03-04 13:30-17:00
තොග : කෝදගොඩගල්මෝල

2021-03-05 08:30-13:00
තොග : කාර්ගිල්ස්ෆුඩ්සිටි
තොග සහ බෙදාහැරීම් : ගලබොඩහේන තේ කර්මාන්තශාලාව

2021-03-05 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : තිප්පලවත්ත

2021-03-08 08:30-11:30
බෙදාහැරීම් : යහමුල්ල

2021-03-08 11:30-14:30
බෙදාහැරීම් : යහමුල්ල

2021-03-08 11:30-14:30
බෙදාහැරීම් : අතුරලිය නැගෙනහිර

2021-03-08 14:30-17:00
තොග : අතුරලිය තේ කර්මාන්තශාලාව

2021-03-09 08:30-17:00
බෙදාහැරීම් : එරමුදුගොඩ, හුලන්දව, තෙරලුව, වැලිකැටිය

2021-03-10 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : කොරහිලගොඩ

2021-03-17 08:30-17:00
බෙදාහැරීම් : නාපේ

2021-03-18 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : තෙලිජ්ජවිල
බෙදාහැරීම් : 8 කණුව, අධිකාරිවිලගම, අකුරුගොඩ, අලස්වත්ත, දම්පැල්ල, ජොතිඩෙල්වතුයාය, රිච්ලන්ඩ්කෝර්ට්, සමරසිංග්‍රාම, උස්ගොඩ, වල්පිට

2021-03-20 08:30-17:00
බෙදාහැරීම් : තිල්මැණික්ගම, තිල්වලාගම, පුවක්බඩඹිවිට, වැලිහේන

2021-03-30 08:30-17:00
තොග : අතුරලිය තේ කර්මාන්ත ශාලාව, බලකාවල ජලසැපයුම
තොග සහ බෙදාහැරීම් : තලගස්ස ජලසැපයුම
බෙදාහැරීම් : අතුරලිය, අතුරලිය නැගෙනහිර, බලකාවල, බටුගොඩ, දේවේන්ගොඩ, කිතනවල, තිසංසලගම, තලගස්ස, තලගස්සනව, වලගේපියද්ද, විල්පිටනව, යහමුල්ල, යොවුන් සවියගම

### දෙනියාය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-05 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : පැහිරිවත්ත
බෙදාහැරීම් : දිවියගහහේන, කිරිලිපන

2021-03-24 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : සිංහ තේ කර්මාන්තශාලාව
බෙදාහැරීම් : කැටවල, කැටවලනව, පුහුලහේනකන්ද (ඉලුක්තැන්න), තලවත්ත

2021-03-25 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : බෝගොඩ, කැවේෂන්, ලුම්බිණි තේ කර්මාන්තශාලාව, නිව්ගාමිනී, රත්නායක තේ කර්මාන්ත ශාලාව, රිච්ලන්ඩ්, සිරිසිලිය, විලබොඩ, විලීගෂප්
බෙදාහැරීම් : අතුගෙදර, දෙඹගොඩ, ගංගොඩ, කිරිවල්ගම, කේරල්ගොඩ, කිරිවැල්දෙල, මැදේරිපිටිය, තිස්සංකපුර, ඕලගන්දෙණිය, පල්ලෙකන්ද, වතුරාව

2021-03-26 08:30-17:00
තොග : සී.එස්.එන්, දෙරණටී.වී (සියත), ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් (එම්.ටී.වී), හිරුඑෆ්එම්, ස්වර්ණවාහිනී (ඊ.ටී.වී), ටී.එන්.එල්

2021-03-29 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : තම්මැන්නාවත්ත
බෙදාහැරීම් : ගල්දෙලනව, හොරගල, ඉලුක්පිටිය, තුඹේඋල, වේරලුව

### මොරවක පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-15 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : චීනප්‍රෙජෙක්ට්
බෙදාහැරීම් : නවගම්මානය - නාත්තවිල, තැන්නහේන නාත්තවිල

2021-03-16 08:30-17:00
බෙදාහැරීම් : දූරන්ගලහංදිය, දූරන්ගල 11 සේලගිරි විහාරය, දූරන්ගල 48 ප්‍රජෙක්ට්, ගුරුබැවිල, කීර්තිගම දූරන්ගල 1 පියවර, යාපනය පෙදෙස

2021-03-21 08:30-17:00
තොග : ඇල්ලගාවහේන
තොග සහ බෙදාහැරීම් : දන්කොලුව, පිටබැද්දර
බෙදාහැරීම් : දෙහිගස්පෙ, දෙහිගස්පෙ ආඳවිල, දෙහිගස්පෙ ඩයලොග්, මල්පුදනඇල්ල, රජවත්ත, සියඹලාගොඩ බටහිර (කණ්ණාඩිමුල්ල), තුන්බෝධිය දෙහිගස්පෙ

2021-03-22 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : කැටවලවත්ත, තිල්වලාතේ, සදර්න්හිල්
බෙදාහැරීම් : අලපලාදෙණිය (නව), අලපලාදෙණිය (පරණ), බාතගල, දන්ගල, ඊද්ඩුකිත (මාජුවාන), කොඩිකාරගොඩ, මාපානාප, ඕකදූහේන යටිබාතගල

2021-03-25 08:30-17:00
බෙදාහැරීම් : මහවිල

### පස්ගොඩ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 08:30-17:00
තොග : ඌරුබොක්ක තේ කර්මාන්ත ශාලාව
තොග සහ බෙදාහැරීම් : ඌරුබොක්ක ටෙලිකොම්
බෙදාහැරීම් : බත්දත්වල, ඌරුබොක්ක

2021-03-16 08:30-17:00
තොග : ලක්වින්කා තේ කර්මාන්ත ශාලාව
තොග සහ බෙදාහැරීම් : බෙන්ගමුවනව, පස්ගොඩ තේ කර්මාන්ත ශාලාව
බෙදාහැරීම් : බෙන්ගමුව, මොලොග්ගමුව, මොලොග්ගමුව නව, විලයාය

2021-03-19 08:30-17:00
තොග : තිලක්හේන
තොග සහ බෙදාහැරීම් : පස්ගොඩ ඩයලොග්
බෙදාහැරීම් : දෙන්කන්දලිය, කුඩුම්රියන්කන්ද, නව ජනපදය, රොටුඹ

2021-03-22 08:30-17:00
තොග : ග්‍රීන්හවුස්
බෙදාහැරීම් : පනාකඩුව, ඌරව

2021-03-25 08:30-17:00
බෙදාහැරීම් : අඹගස්තැන්න, අම්පනාගල, බටේතැන්න, ඉරිදන්වල, වනසින්කන්ද

### වැලිගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-02 08:30-17:00
තොග : කෘෂිකර්ම, කේප් හෝටලය වැලිගම
බෙදාහැරීම් : සෙන්ට්‍රල් පාර්ක්, ඉබ්බාවල, ඉබ්බාවල ගෝල්ඩන් ගේට්, ඉබ්බාවලනව, ලෝඩ් ස්ටාර් පුහුණු මධ්‍යස්ථානය, මිදිගමතේවතුයාය, තුර්කි ගම්මානය, තුර්කි ගම්මානය, තුර්කි ගම්මානය, වැකඩ - මිදිගම

2021-03-12 08:30-17:00
තොග : නිපොලැක් හේන්වල
බෙදාහැරීම් : බැද්දේකෝන් විලවත්ත, හේන්වල, හේන්වල සුනාමි, කොටවිල, මිරිස්සහිල්ස්, සල්ගහකඩේ

2021-03-17 08:30-17:00
තොග : ආර්පිඩැග්ටයර් (චාර්ලිමවුන්ට්), ආර්පිඩැග් ටයර් කර්මාන්ත ශාලාව, ආයුර්වේද හෝටලය කප්පරතොට, කේප් හෝටලය නව, කේප් හෝටලය වැලිගම, සෙන්ටික් පොජෙක්ට්, දෙඩන්දූව වත්ත, හරිස්චන්ද්‍ර ඇඹරුම්හල, ලෝඩ්ස්ටාර් පුහුණුම ධ්‍යස්ථානය, රබර් කර්මාන්ත ශාලාව, ටෝකියෝ සිමෙන්ති කර්මාන්ත ශාලාව, උඩුකාව වෝග් ටෙක්ස්, විරාජ් ඉලෙක්ට්‍රිකල්ස්
තොග සහ බෙද හැරීම් : බේබීච්, අයිස් ප්ලාන්ට් (පැලෑන), පැලෑන වටරවුම, රිසෝර්ට් හෝටලය කුඹල්ගම, සමරු බීච් හෝටලය, සන්ග්‍රා හෝටල් වෙරළපාර
බෙදාහැරීම් : 4 කණුව උඩුකාව, බටවල පුවක්වත්ත, බිස්දෙළවත්ත, බයිපාස් උපපොල, කාර්ගිල්ස් ෆුඩ්සිටි, සෙන්ට්‍රල් පාර්ක්, චාර්ලිමවුන්ට්, චාර්ලිමවුන්ට් සුනාමි, චාර්ලිමවුන්ට් කර්මාන්තපුර, දෙනිපිටිය, දෙනිපිටිය පියසිරි උපපොල, දෙනුවල, ගල්බොක්ක, ගුරුබැවිලසුනාමි, ගුරුබැවිල කඩබැද්ද උපපොල, කපුවත්තලීමෝල, කච්ඩන්ඇල්ල, කොහොඹගමුව, කොක්මාදූව නව, කොලේදණ්ඩ උපපොල, කුඹල්ගම උපපොල, කුෂ්ඨරාජගල උපපොල, මදුරගොඩ උපපොල, මගනැගුම, මහවීදිය පවර් හවුස්, මැණික්වත්ත ජයවික්‍රමපුර, මීරුප්ප උපපොල, මියාමි එක්ස්පෝර්ට්, මූණමල්පෙ, පලල්ල, පැලෑන සමරවීර උපපොල, පොල්වත්ත දෙනිපිටිය, පොල්වත්තනව, පොල්වතුමෝදර 1(එලුවාවල), පොල්වතු මෝදර 2, සුල්තානගොඩ, සුන්දරවිනයාගරවත්ත, සුපර්මාර්කට් කම්පෙල්ක්ස් වැලිගම, ටෙලිකොම්, තේක්කවත්ත, නගරසභාව, ඌරුවිටිය, වරකපිටිය, වොෂින් ප්ලාන්ට්, ජලපොම්පාගාරය වැලිපිටියනව, ජලපොම්පාගාරය වැලිපිටිය පරණ, වැලිගම බේරිසෝට්, වැලිගම හෝටල් ව්‍යාපෘතිය, වැලිහිද (බෝදගල), වැලිපිටිය

2021-03-17 09:00-17:00
තොග : දෙඩන්දූවවත්ත
බෙදාහැරීම් : කපුවත්ත ලී මෝල, කච්ඩන්ඇල්ල, කොක්මාදූවනව, කොලේදණ්ඩ උපපොල, මියාමි එක්ස්පෝර්ට්, පලල්ල, ජලපොම්පාගාරය, වැලිපිටිය නව ජල පොම්පාගාරය, වැලිපිටිය පරණ, වැලිපිටිය.

2021-03-19 08:30-17:00
තොග : බණ්ඩරමුල්ල, සිලෝන්මූව හෝටලය, වෙරළාරක්ෂක, මිරිස්ස හාබර්, මිරිස්ස රෝහල, පැරඩයිස් හෝටලය, රත්නවිලා හෝටලය මිරිස්ස, සන්බීම් හෝටලය, සන්සෙට් හෝටලය, උඩුපිල මිරිස්ස
තොග සහ බෙදාහැරීම් : මනම්පේරි හෝටලය, මිරිස්ස පැලස්, ජලපොම්පාගාරය උඩුපිල
බෙදාහැරීම් : බණ්ඩරමුල්ල, බණ්ඩරමුල්ල නව, කාර්ගිල්ස් ෆුඩ්සිටි මිරිස්ස, මිරිස්ස දිගන, මිරිස්ස හාබර්, මිරිස්ස නව, මිරිස්ස නව පාසල, මිරිස්ස උඩුපිල, රුහුණු තුෂාරි අයිස්, උඩුපිල ජයලත්ගම

2021-03-29 08:30-17:00
බෙදාහැරීම් : ජඹුරගොඩ නව, ජඹුරගොඩ හියාලගොඩ උපපොල, රණමදුරගම

2021-03-30 08:30-17:00
බෙදාහැරීම් : දෙනිපිටිය, මීරුප්ප උපපොල, පොල්වතුමෝදර 1(එලුවාවල), පොල්වතු මෝදර 2

2021-03-31 08:30-17:00
බෙදාහැරීම් : බටවලපාතෙගම උපපොල, පාතෙගම ලීමෝල, පිටිදූව උපපොල

## අම්බලන්ගොඩ විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### ඇල්පිටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-16 08:30-17:00
බෙදාහැරීම් : අම්බනගිරිබිම, අම්බනසිංහකවය, ඇම්බුත්කන්ද

2021-03-17 08:30-17:00
බෙදාහැරීම් : අක්කර 16 දෙලඉහල, බටුවන්හේන, දෙලඉහල

2021-03-18 08:30-17:00
බෙදාහැරීම් : කොකරකන්ද

2021-03-19 08:30-17:00
බෙදාහැරීම් : ඇල්ලඉහලගොඩ

2021-03-20 08:30-17:00
තොග : ඩයලොග් කුළුණ, ලයිෆ්ස් ටයිල් කර්මාන්තශාලාව, ටෙලිකොම් පතිරාජගම
බෙදාහැරීම් : දිවිතුර (වැවරවුම), ඇත්කඳුර, මයියොක්කාහේන

2021-03-26 08:30-12:30
තොග : ගෝනතිප්පල

2021-03-29 08:30-17:00
තොග : අතුකෝරල තේ කර්මාන්ත ශාලාව, කැල්ලපත තේ කර්මාන්ත ශාලාව, කැටන්දෙල ඇඟළුම් කර්මාන්ත ශාලාව, කැටන්දෙල රබර් කර්මාන්ත ශාලාව
තොග සහ බෙදාහැරීම් : කැටන්දෙල තේ කර්මාන්ත ශාලාව, මියාමි ඇඟළුම් කර්මාන්ත ශාලාව, ඕලුවිලගල්පොත්තාවල
බෙදාහැරීම් : 11වෙනි සැතපුම් කණුව, අමරගම, අමුගොඩ, දික්හේන, ගංඉම පුංචි ඉදිකන්ද, ගරාඩුකන්ද, හත්තක, හිඹුටුගොඩ, කැරැව්ව, කැල්ලපත, කැල්ලපත දෙනියවත්ත, කුරුපැල්පොල, මැටිවිලියකන්දෙගෙදර, මැටිවිලිය සුහගම, නාරංඕවිට, පිටිගල උතුර, පිටිගල තොටුපල පාර, පිටිගල නගරය, තල්ගස්පෙ, උඩෝවිට, උහන්ඕවිට, විතානාච්චිගොඩ, වලහේන, වල්අඹගල

### ඉඳුරුව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-18 08:30-17:00
බෙදාහැරීම් : ඕබඩවත්ත

2021-03-22 08:30-17:00
තොග : සමුද්‍ර, බීච්
තොග සහ බෙදාහැරීම් : යුනෙස්කෝ ගම්මානය
බෙදාහැරීම් : අරෝරා ගම්මානය, බාන්වැල්දූව, සිනමන්පා(ර්)ක් 2කණුව, දෙටු ජනපදය, ගොඩගම සරනංකර, ලංසියාවත්ත, නානතොට පළාත, වතුරවෙල

2021-03-24 08:30-17:00
බෙදාහැරීම් : දෙල්කබලගොඩ, කොටකිරල, කොටුවබැන්දහේන, කුඩාඌරගහ, මීගස්පිටිය

2021-03-25 08:30-17:00
තොග : කැපිටල්ලංකා
බෙදාහැරීම් : බොරළුකැටිය, ගල්තුඩුව, ග්‍රීන්ගාඩින්, හබුරුගල, හබුරුගල පාසල, හොරවල, කනහෙන්තොට, කටුවත්ත, මහකුරුන්ද, මහවිල, මිරිස්වත්ත, පාරප්පුව, පිලේකුඹුර, සිල්ව(ර්) ගාඩින්, තොටකනත්ත, තුඩුව, තුන්දූව

### සීනිගොඩ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 08:30-17:00
බෙදාහැරීම් : කටුකනත්ත, කැකිරිය, කොටවෙල, මඩකුඹුර, මාගලදකුණ, මුත්තෙට්ටුව, සේනාධිගම, උනගස්වෙල

2021-03-13 09:00-11:00
තොග : ටෙලිකොම් බටපොල

2021-03-13 11:00-13:00
බෙදාහැරීම් : නින්දන

2021-03-13 14:00-16:00
බෙදාහැරීම් : බටපොල

2021-03-14 09:00-11:00
බෙදාහැරීම් : අමරකීර්තිගම, එගොඩවෙල, ගංඉම

2021-03-15 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : අක්කර 100 නව
බෙදාහැරීම් : අක්කර 100 , කළුවලගොඩ

2021-03-22 08:30-17:00
තොග : ලෝටස්විලාහෝටලය, තිල්මානෙල් හෝටලය, වන්ව(ර්)ල්ඩ්
තොග සහ බෙදාහැරීම් : මාදූගගපැරඩයිස්, රුහුණුවෙයා
බෙදාහැරීම් : මාදූව, පාතෙගම

2021-03-23 08:30-17:00
බෙදාහැරීම් : කොරකීන, ලේනගලපළාත

2021-03-25 08:30-17:0
බෙදාහැරීම් : අඩගහනතොට, කොබේතුඩුව

2021-03-31 08:30-17:00
බෙදාහැරීම් : පාතුකැටිය, තනිපොල්ගහ

## බද්දේගම විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### බද්දේගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-20 08:30-17:00
තොග : පිලගොඩවැලි
තොග සහ බෙදාහැරීම් : ජෝ ලංකා ගාර්මන්ට්, පිලගොඩවත්ත (කිරින්දලහේන), තිලකැටදගම (පිළගොඩ), උස්ගල්දූව, යහලදූව තේ කර්මාන්ත ශාලාව

### ගෝනපීනුවල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-10 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : අඟුරුමලේබැද්ද වෙන්දේසි ඉඩම, බෙල්ගේට් පාර්ක්, කොම්පෝස්ට් ව්‍යාපෘතිය, ඉඹුලගොඩ, කටුපොල්වත්ත නව ජනපදය, මාවඩවිල, මොන්රෝවියා වත්ත 1, මොන්රෝවියා වත්ත 2, මොන්රෝවියා වත්ත 3, පන්විල

2021-03-29 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : ගුරුසිංහගොඩ, මද්දෙවිල, නාඹරත්ත
බෙදාහැරීම් : මිරිස්වත්ත

### තල්ගස්විල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-04 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : බන්ඩිහේන, දවුල්හේන, මහලියද්ද තේකර්මාන්තශාලාව

2021-03-05 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : අන්නාසිගලකන්ද, උඩලමත්ත

2021-03-17 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : ගල්ලන්දල, කන්නෙලිය තේ කර්මාන්ත ශාලාව, කැටගොඩ, පනන්ගල, රන්වල

2021-03-19 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : කැප්පෙටියගොඩ, කැප්පෙටියගොඩ නව, නාගොඩවලව්ව හන්දිය, සිරිසඳගල්මෝල

2021-03-26 08:30-12:30
බෙදාහැරීම් :

2021-03-27 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : බනන්ගල, කිඹුලාවල රේචන බනන්ගල තේ කර්මාන්ත ශාලාව

2021-03-29 08:30-17:00
බෙදාහැරීම් :

2021-03-31 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : කිරිවැල්තුඩුව, කොවුලාන තේ කර්මාන්ත ශාලාව, කුඩමලාන තේ කර්මාන්ත ශාලාව, කුඹුරුහේන, කුඹුරුහේනනව, ලක්මාලි තේ කර්මාන්ත ශාලාව, මලාමුරේ, මලාමුරේ මාරකන්ද, මාපලගම මධ්‍යම, තල්ගස්වලවත්ත

### වඳුරඹ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-02 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : හිල්සයිඩ් තේ කර්මාන්ත ශාලාව, ජම්බුගහවිල, ලෙහුවල, සූදල

2021-03-04 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : උඩුගම ටෙලිකොම්

021-03-08 08:30-17:00
තොගසහබෙදාහැරීම් : මාමනදෙළ, මිදෙල්ල (තේකර්මාන්තශාලාවසහරබර්වත්ත), සීතලදෙළ

2021-03-09 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : කැකිරිහේන්දෙල, වරකපලහේන, වත්තහේන ජී.එල්.

2021-03-17 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : අක්කරඅසූව (බන්ගමපාර), ගුණානන්ද මාවත උඩුගම, හෝමදෙළ රබර් කර්මාන්ත ශාලාව, හෝමදෙළ දෙක කොටස, හෝමදෙළ තේ කර්මාන්ත ශාලාව, තුන්මෝදර (හෝමදෙළ ගම්මානය), උඩුගම නැගෙනහිර, උඩුගම ටෙලිකොම්
බෙදාහැරීම් : හෝමදෙළ නිවාසසංකීර්ණය

2021-03-22 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : නාකියාදෙණිය තෙල් ගොවිපල

2021-03-23 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : බැදිමඩ, ඉද්දමල්දෙණිය තේ කර්මාන්ත ශාලාව, ජනහිත තේ කර්මාන්ත ශාලාව, මාබොටුවන (ලාහමුල්ල), මාබොටුවන පන්සල, මහේෂ්ලන්ඩ්, නාවල, රත්නතේකර්මාන්තශාලාව

2021-03-24 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : හේනකන්ද තේ කර්මාන්ත ශාලාව, පන්විලහේන, පිටිහරාව

2021-03-26 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : සිට්රස් තේ කර්මාන්ත ශාලාව, සිට්රස් ටෙලිකොම්, කාසිදෙණිය
බෙදාහැරීම් : කාසිදෙණිය ගල්මෝල

## ගාල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### බටදූව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-18 08:30-17:00
තොග : ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඇතුල්වීම, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පොම්පාගාරය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය රෝස්වුඩ්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වක්වැල්ල, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මවුන්ට් ප්ලසන්ට්, රුහුණු විශ්වවිද්‍යාලය 01, රුහුණු විශ්වවිද්‍යාලය 02, රුහුණු විශ්වවිද්‍යා නේවාසිකාගාරය
තොග සහ බෙදාහැරීම් : ෆෙයාෆීල්ඩ් තේ කර්මාන්ත ශාලාව, ග්‍රෑන්ඩ් ඇඟළුම් කර්මාන්ත ශාලාව, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
බෙදාහැරීම් : ආනන්ද මාවත, ආරච්චිකන්ද, බටුවන්තුඩාව, බෙරලියදෙලවත්ත, ග්‍රෑන්ඩ් 'පැනරෝමා, හපුගල, ඊරියගහනව, මීපාවල, මොල්ලිගොඩ, මවුන්ට් ප්ලසන්ට් වත්ත, ඕපාත, සරසවි අසපුව, උළුවිටිකේ පන්සල, යුනිවර් සල්සිටි, වක්වැල්ල, වටරැක

2021-03-19 08:30-17:00
බෙදාහැරීම් :

2021-03-24 08:30-17:00
තොග : ඩී.එස්.අයි.සැම්සන්රබර්
තොග සහ බෙදාහැරීම් : කළුපහන, එස්.ඕ.එස්. ගම්මානය
බෙදාහැරීම් : ඩී.එස්.අයි. හිල්සයිඩ්වත්ත, වටරැකපාසල

2021-03-27 08:30-17:00
තොග සහ බෙදාහැරීම් : කොට්ටවවැලි තේ කර්මාන්ත ශාලාව, ලියොන්ටා තේ කර්මාන්ත ශාලාව, ටී.ආර්.අයි. තල්ගම්පල
බෙදාහැරීම් : වත්තෙහේන

2021-03-30 08:30-17:00
තොග : ජේ.එම්.සී. ගල්මෝල
තොග සහ බෙදාහැරීම් : හියාරේ ජලාශය, මැණික්කන්ද තේ කර්මාන්ත ශාලාව
බෙදාහැරීම් : බතලවත්ත, බැද්දෙගෙදර, ඩයලොග් කැබින්, ගරාවිල, හියාරේ, කඳුරුගස්හේන, කැකිල්ලහේන, කැටන්දෙල

### ගාල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-05 08:30-17:00
බෙදාහැරීම් : ඩම්සබ්

021-03-17 08:30-17:00
බෙදාහැරීම් : දිවුලාන, ඩම්සබ්, හප්පාවන, හප්පාවනනව, පහලවත්ත, පිලාන, පිලානනව, රේන්බෝසිටි, රෝයල්කිංඩම්

2021-03-19 08:30-17:00
බෙදාහැරීම් : ජී.ජේ.එම්. ඇඟළුම්කර්මාන්තශාලාව, මහරඹ

2021-03-24 08:30-17:00
තොග : නාවිකකඳවුර, නූරස්සෙරන්ඩිබ්
තො ගසහ බෙදාහැරීම් : ප්ලයිවුඩ්, දූවසංස්ථාව
බෙදාහැරීම් : බූස්ස යුධහමුද කඳවුර, දෙලහේන, ඇලබඩ, ජම්බුකැටිය, මහහපුගල, පියදිගම, උක්වත්ත, වැලිපිටිමෝදර

### හබරාදූව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-16 08:30-17:00
බෙදාහැරීම් : දීගොඩ, ගනේගොඩ

2021-03-19 07:30-17:00
තොග : කාබුල්රාසා, ක්රවුස(ර්) මෝල්ඩින්, කේකේබීච්, කොග්ගල ගුවන්හමුද කඳවුර 2, සෝමාවතී ළමා නිවාසය
තොග සහ බෙදාහැරීම් : පැරගන්, පොල්කන්ද
බෙදාහැරීම් : දූව, ගුඩුමුල්ල, හබරාදූව, හැඩිවත්ත, කහවැන්නගම, කටුකුරුන්ද, කොග්ගල ගුවන්හමුද කඳවුර, කොකාවත්ත, මාගල්තොට, තිලසෙවන 2, තිලසෙවන 1, පළුටුගහ, පිටිදූව, තල්පෙ

2021-03-19 08:30-17:00
තොග : ආසිරි
තොග සහ බෙදාහැරීම් : අද්දරදූව වත්ත
බෙදාහැරීම් : ගල්කඩුව, ඉමදූකන්ද, ඉමදූවනව, ටෙලිකොම් ඉමදූව, කෝම්ඹල, වලපල

### හබරාදුව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-21 08:30-17:00
තොග : ඒ.සී.ඊ ඇපරල් ඇඟළුම් කර්මාන්ත ශාලාව, ඒ.සී.ඊ. ඩිස්ට්‍රිපාක්ස්, ඇල්ෆා ටෙක්ස්ටයිල්ස් පුද්ගලික සමාගම, ආශාලංකා, ඒෂියාටෙක්ස්, ඒ.ටී.ජී. හැන්ඩ්කෙයා(ර්), ඒ.ටී.ජී. II, ඔස්ට්‍රලංකා, ආයෝජන මණ්ඩල පරිපාලන සංකීර්ණය, බ්‍රැන්ඩෙක්ස්, ලංකා ගගනගාමී සේවය, ඩී.එම්. ආර්. ඇපරල්, ෆැෂන ට්‍රෙන්ඩ්ස්, කොග්ගලබීච්, කොග්ගල ඇඟළුම් කර්මාන්ත ශාලාව, කොග්ගල ඇඟළුම් කර්මාන්ත ශාලාව නව, කොග්ගල නිෂ්පාදනාගාරය, කොග්ගලවිලා, මිල(ර්) ලංකා, නොබෙල්වෙයා(ර්), ඔරියන්ට් ඇඟළුම් කර්මාන්ත ශාලාව, ඔක්සිජන් ඩිස්කනෙක්ටඩ්, ආවරණ පිරිපහදු කර්මාන්ත ශාලාව, ප්ලාස්ටික්ෂෙල්ස්, එස්.ටී.වයි. ඇඟළුම් කර්මාන්ත ශාලාව, ස්ට්‍රේන්ටෙක්, තාරකී ඇඟළුම් කර්මාන්ත ශාලාව, යුනිප්ලාස්ටික්, යුනිප්ලාස්ටික් 2, යුනිවෙලා, වෘත්තීය පුහුණු අධිකාරිය, යන්ඇන්ඩ් ලංකා
තොග සහ බෙදහැරීම් : ෆෝට්රස් හෝටලය, හෝටල් පාසල, ලොන්ග් බීච් හෝටලය, පොලිටෙක්ස්
බෙදහැරීම් : කොග්ගල බලාගාරය, සිංහධීවරගම, තිසාරා හෝටලය

2021-03-25 08:30-17:00
තොග : තස්මා ජාත්‍යන්තර
තොග සහ බෙදහැරීම් : ඉබ්බාවල ළමා ගම්මානය, කාන්තිසිරිවත්ත
බෙදහැරීම් : අඳුගොඩ, දික්කුඹුර, පැලවත්ත, විතානගේ ගල්මෝල

2021-03-29 08:30-17:00
තොග සහ බෙදහැරීම් : මුස්සැන්නවත්ත
බෙදහැරීම් : කතතේරියාන, මායකඩුව, පිටුවලහේන

### තවලම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 09:00-17:00
තොග සහ බෙදහැරීම් : හේකොක්වැලි, හිත්ගල්ගොඩ, යුනිටි
බෙදහැරීම් : හිනිදුමපල්ලිය, හිනිදුමපොලීසිය, ලකී, මහබෝධිවත්ත, මල්හතාව, නැවැතිමුල්ල, නුගගලමාවත

2021-03-15 08:30-17:00
බෙදහැරීම් : ආයුධගල, දූන්හේන, ඉබ්බාවල

2021-03-20 08:30-17:00
තොග : කළුබෝවිටියන II
තොග සහ බෙදහැරීම් : කළුබෝවිටියන 1 හා 2
බෙදහැරීම් : දම්මල, හල්විටිගල පියවර II, තිබ්බොටුකන්ද

2021-03-26 08:30-17:00
බෙදහැරීම් : ඇලඉහල, කුඹුරෙගොඩ, රත්මීර්

2021-03-30 08:30-17:00
බෙදහැරීම් : වීරපාන නැගෙනහිර

2021-03-31 08:30-17:00
බෙදහැරීම් : හබරකඩ වතුයාය, හල්ලකන්ද, කුඩුගල්පොල

## හම්බන්තොට විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### හම්බන්තොට පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-16 08:30-17:00
බෙදහැරීම් : ලුනම

2021-03-23 08:30-17:00
බෙදහැරීම් : කරගස්ආර, මෝදරපිලිවෙල

2021-03-24 08:30-17:00
තොග : ෂැංග්‍රිලා හෝටලය
බෙදහැරීම් : සඳපහනගම

2021-03-25 08:30-17:00
බෙදහැරීම් : කඩවරඋතුර, කඩවරදකුණ, කොග්ගල්ල, මදයමලලන්ද

2021-03-01 08:30-12:30
තොග : රෝහල, රෝහල් නව වාට්ටුව

2021-03-01 13:30-17:00
බෙදහැරීම් : ඉදිවින්නපිට්ටනිය, ලියන්කණුව

2021-03-02 08:30-12:30
බෙදහැරීම් : ගෙවල් 18, ගෙවල් 50

2021-03-02 12:30-17:00
බෙදහැරීම් : කැලියවැලැන, යහන්ගල

2021-03-04 08:30-17:00
තොග : ගුවන්තොටුපල කාණ්ඩ අංගනය

2021-03-07 08:30-17:00
තොග : රෝහල, රෝහල් නව වාට්ටුව, ඉසුරු මෙඩිහවුස්, තාවල්වරාය, තෙල් ගොවිපොල බී, ටෙලිකොම් කාර්යාලය
තොග සහ බෙදහැරීම් : ලංකාබැංකුව, කාගිල්ස්, හම්බන්තොට නගරය, පීකොක් බීච් හෝටලය, ටෙලිකොම් හුවමාරු මධ්‍යස්ථානය
බෙදහැරීම් : බෝබුවැටිය, ලංකා විදුලි බලමණ්ඩලය, ඉදිවින්නපිට්ටනිය, ලියන්කණුව

2021-03-17 08:30-17:00
තොග : මහානාම ගල්මෝල, එස්.එම්.එස්. හෝල්ඩින්ස් ගොන්නෝරුව
බෙදහැරීම් : ගොන්නෝරුව 6 කණුව, ගොන්නෝරුව පාසල, කැටන්වැව, කැලිගම, කැලියපුර, මහහැඩිල්ල, පතියලාගේගම (රුහුණුගොවිපල), විශේෂ කාර්යය බලකාකඳවුර පත්වැව

2021-03-26 08:30-17:00
බෙදහැරීම් : සැනසිලිගම, වෙහෙරගොඩ

### කතරගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-08 08:30-17:00
බෙදහැරීම් : ඩී 03 ඇල්ලගල

2021-03-15 08:30-17:00
දෙහැරීම් : ඩී 03 ඇල්ලගල

2021-03-27 08:30-17:00
බෙදහැරීම් : බිබිල ඇඟළුම් කර්මාන්ත ශාලාව, කඳසුරිදුගම ගල්මෝල, විහාරමහා දේවි ගම

2021-03-27 08:30-17:00
තොග : බෙරලිහෙල ජලසම්පාදන මණ්ඩලය, මුණසිංහ ගල්මෝල, ටෙලි සිනමා ගම්මානය
බෙදහැරීම් : 18වෙනි බලකා කඳවුර, අමරදේවගම, බෙරලිහෙල 03 වෙනි කොලනිය, බෙරලිහෙල 04 , 05 කොලනිය, ජූල්පල්ලම, කාවන්තිස්සපුර 10වෙනි සැතපුම, කොඩිගහ වැව 02, කොඩිගහ වැව 01, කොහොඹගහ පැලැස්ස 7වෙනි සැතපුම් කණුව, මහවැලි, ජූල්පල්ල මමොබිටෙල් කුළුණ, මෝදිගම්මානය, රත්මිණිතැන්න නව, රත්මිණිතැන්න පැරණි, සදිසිගම, සාලියපුර, සාමගුලිය, තඹරාව, වනඋද්‍යානය (ගමුදාව), වීරහෙල

2021-03-29 08:30-17:00
තොග : අප ජලපිරිපහදු අංගනය
බෙදහැරීම් : අක්කර 20, අක්කර 20 යුධ හමුදාකඳවුර, ගාමිණිපුර, ගෝතමීගම, නාගහවීදිය

### සූරියවැව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-03 08:30-17:00
බෙදහැරීම් : දෙවුරම්වෙහෙර, පළුගල්වැව

2021-03-06 08:30-17:00
තොග : චීනවරාය තාර අංගනය, චීනවරාය ඉංජිනේරු සමාගම, චීනවරාය අධිවේගීමාර්ග 1, චීනවරාය අධිවේගීමාර්ග 2

2021-03-07 08:30-17:00
තොග : මත්තල ගුවන්තොටුපල අන්තර්හුවමාරු සංඥා පුවරුව, මත්තල ගුවන්තොටුපල නිල නිවාස, මත්තල ගුවන්තොටුපල, මත්තල ගුවන්තොටුපල අන්තර්හුවමාරු ඒ මාර්ගය, ටර්මිනල් ගොඩනැගිලි
බෙදහැරීම් : සියත්ලංකාගම

2021-03-10 08:30-17:00
තොග : අන්දරවැව ජල ව්‍යාපෘතිය
බෙදහැරීම් : රුහුණුපුර, සංදීපගල, වල්සපුගල, වල්සපුගල අධිවේගී මාර්ග සංඥාපුවරුව

2021-03-13 08:30-17:00
බෙදහැරීම් : හත්පෝරුවඩී - 1 (ඇල), කුරුගම්වැටිය, වෙනිවැල්ආර පන්සල, වෙනිවැල්ආර ජලපොම්පාගාරය, වෙනිවැල්ආර 2

2021-03-18 08:30-17:00
බෙදහැරීම් : දිමුතුගම, මව්සිරිගම

2021-03-19 08:30-17:00
බෙදහැරීම් : සමන්මල්ගම, සුරුවිරුගම, වීරියගම

### තිස්සමහාරාමය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-08 08:30-17:00
බෙදහැරීම් : අංජලීගල, ඇල්ලගල ජලසම්පාදන මණ්ඩලය, කුරුළුගම

2021-03-15 08:30-17:00
තොග : සමූපකාර සහල් මෝල, ආණ්ඩුකාර කඳවුර, ගුරුගොඩ, හිල්ටන් හෝටලය, බුටික් හෝටලය, යාල ජංගල් බීච් රිසෝට්, ලුණුගම්වෙහෙර යොවුන් සේනාංකය, පලටුපානලුණු - 2, රේන්ට්‍රි, සෝමස මිඳුගම, විලාසෆාරි, වී.එච්.ජී. සහල්මෝල, වී.එච්.ජී. සහල්මෝල, වයිල් කෝස්ට්ලොජ්
තොග සහ බෙදහැරීම් : ගඟසිරිපුර, ගඟසිරිපුර නව, තාවුල්ල රිසෝට්
බෙදහැරීම් : කාසිංගම පැරණි, 17 කණුව, 19 වෙනි පාලම, අක්කර 80, අංජලීගල, අට්ටික්කාව (හල්මිල්ලෑව), කාගිල්ස්ෆුඩ්සිටි, සෙලින්කෝ, සමූපකාරගම්මානය, දඹේවැලැන, දෙබරවැව රෝහල, දෙබරවැව හංදිය, දෙබරවැව ටෙලිකොම්, දෙබරවැව ජලසම්පාදන මණ්ඩලය 01, දෙබරවැව ජලසම්පාදන මණ්ඩලය 02, දියැස්සාය, දියවර ගම්මානය, ඩබල්බෝක්කුව, එකමුතුගම, ඇල්ලගලවම, ඇල්ලගල, ගැමුණුපුර, හැලබාන, හැළඹගස්වල, ඉක්කපල්ලම, ජෙට්වින් හෝටලය, ජූල්මුල්ල, කච්චේරියගම, කැරැන්ගොඩ, කාසිංගම නගරය, කැන්දගස්මංකඩ, කිරින්ද, කිරින්දවරාය, කොරගහ උල්පත, කොත්තමල්ලියාය, කුරුළුගම, මගුල්මහවිහාරය, මැදවැලැන, මුතියම්මාගම, නැදිගම්විල නවෝද ජලසම්පාදන මණ්ඩලය, නෙළුම්පොකුණ ගම්මානය, නිදන්ගලවැල්ල, පලටුපානලුණු, පන්නෙගමුව හංදිය, පන්නෙගමුව ප්‍රදේශය, පන්විලහංදිය, පෙහෙකම්හල, පොල්ගහවැලැන, රබර්වත්ත නව, රබර්වත්ත පැරණි, සඳනිලගම, සම්පත්ගම, සඳුන්ගම, සෙනෙවිරාජගම, සිඳුජයපුර , සිඳුජයපුර හංදිය, ටිකිරිඋදනපුර, තිස්ස බස්නැවතුම්පල, තිස්ස ලංකා විදුලිබල මණ්ඩලය, තිස්ස විවේකාගාරය, තිස්ස පන්සල, උඩගන්දර, උනාව, විජිතපුර, විලම්ල්ල, වල්ගම්පත්තුව, වනමල්, වැලිපොතේවෙල, වැලිපොතේවෙලනව, වැවේයාය, යාලයුධහමුදාකඳවුර, යාල ජාතික වනෝද්‍යානය, යාලසෆාරි, යාල ගම්මානය, යටල, යායගොඩ, යෝධකන්ඩිය

2021-03-16 08:30-12:30
බෙදහැරීම් : මෝලහංදිය, වීරවිලකොලනි 8

2021-03-16 13:30-17:00
බෙදහැරීම් : කොලනි 19, කොලනි 18

2021-03-30 08:30-17:00
බෙදහැරීම් : එළිෆන්ට්බීච්, නිමලව, පුස්තොලමුල්ල, යාලහංදිය

2021-03-31 08:30-17:00
බෙදහැරීම් : ජෙට්වින් හෝටලය, යාල සෆාරි

## මාතර විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### දික්වැල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-19 08:30-17:00
තොග : බඹරන්ද දුම්රිය ස්ථානය, මීගස්දෙණිය ගල්මෝල, මියාමිගාමන්ට්, පිටදෙණිය ගල්මෝල, තිළිණ ගල්මෝල
තොග සහ බෙදහැරීම් : කිරිහැන්දගම
බෙදහැරීම් : අකුරුබැබිල, ඩයලොග් ටවර් දණ්දෙණිය, කිරිනැලිය, ලෝලන්ආර, පුබුදුගම, රත්මලේ

### හක්මන පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-01 11:30-13:30
බෙදහැරීම් : වල්ජම්බුගහහේන

2021-03-21 08:30-17:00
බෙදහැරීම් :

2021-03-25 14:30-17:00
බෙදහැරීම් : ආගරවල

2021-03-26 08:30-17:00
තොග : ගලබඩ චීන ව්‍යාපෘතිය
බෙදහැරීම් : උඩුව

2021-03-29 08:30-17:00
තොග : අධිවේගී මාර්ග කඩවැද්දුව පාර
බෙදහැරීම් : තඹගල්ලැල්ල

2021-03-30 08:30-17:00
තොග : අධිවේගී මාර්ග ආරණ්‍ය පාර
බෙදහැරීම් : තඹගල්ලැල්ල කැකුලන්ගහ, උඩ අපරැක්ක, උඩ අපරැක්ක අසපුව

### හිත්තැටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-06 08:30-17:00
බෙදහැරීම් : ඇලවේල්ලපාර, කුමාරදස මාවත, මුදලින්ද පිරිවෙන

2021-03-07 08:30-17:00
බෙදහැරීම් : ඕඩිරිස්සිල්වා

2021-03-12 11:30-13:30
බෙදහැරීම් : පුවක්වත්ත

2021-03-16 09:00-11:00
බෙදහැරීම් : ඇදුව

2021-03-16 11:30-13:30
බෙදහැරීම් : සුල්තානාගොඩ

2021-03-16 11:30-13:30
බෙදහැරීම් : නැටව්ව

2021-03-19 08:30-17:00
බෙදහැරීම් : එපිටවත්ත තල්අරඹ, ඉස්සන් වගාකිරීමේ ගොවිපොල

2021-03-20 09:00-11:00
බෙදහැරීම් : ගල්පමුණ

2021-03-20 11:30-13:30
බෙදහැරීම් : ගල්පමුණ 2

2021-03-20 14:30-17:00
බෙදහැරීම් : ඕගස්පේ

### කඹුරුපිටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-05 08:30-17:00
බෙදහැරීම් : බන්ඩරවත්ත, පහලවිටියල, විටියල කාවෝදයගම, වෙරකාවිල

2021-03-09 08:30-17:00
තොග : අභිමන්සලගඨාර
බෙදහැරීම් : ගඨාර, ගඨාරවැව

2021-03-10 08:30-17:00
බෙදහැරීම් : පොල්ගහමුල්ල

2021-03-17 08:30-17:00
තොග : මාපලානවිශ්වවිද්‍යාලය 2
තොග සහ බෙදහැරීම් : මාපලාන විශ්වවිද්‍යාලය
බෙදහැරීම් : මාපලාන පාසල, ඔටෝ ලංකා ටයර් කර්මාන්ත ශාලාව, බටුවිට, බටුවිට ජනාවාස, බටුවිටඋඩුදමන, ජනශක්තිගම, කහගල, මාපලානනව, මාස්මුල්ල, පැතුම්ගම, රටලංකාවත්ත, උල්ලල මහහේන, ඌරපොල, ඌරපොල අකුරුගොඩ

### මාතර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-07 08:30-17:00
තොග සහ බෙදහැරීම් : සෙන්ට්‍රල් බැංකුව
බෙදහැරීම් : කිංග්ස්වත්ත

2021-03-15 08:30-17:00
තොග : පුරාණවැල්ල
බෙදහැරීම් : දෙවිනුවරදේවාලය, දෙවිනුවර පැරණි, දෙවිනුවර නගරය (නව), ෆෝස්ටාර් ගාමන්ට් (දෙවිනුවර), ගලගනේ, ලයිට්හවුස්

### මුලටියන පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-18 08:30-17:00
තොග : කුඩාපානතේ
බෙදහැරීම් : ගොම්බද්දල, කිල්ලදෙණිය, කුඩාපාන

2021-03-22 08:30-17:00
තොග : රත්නායක තේ
බෙදහැරීම් : තෙරලම්පිටිය

2021-03-23 08:30-17:00
තොග සහ බෙදහැරීම් : මාවරල ටෙලිකොම්

2021-03-24 09:00-11:00
බෙදහැරීම් : රෝයිපුරය

2021-03-24 11:30-13:30
බෙදහැරීම් : සීතිපැල්ල

2021-03-24 14:30-17:30
තොග සහ බෙදහැරීම් : මුලටියන ටෙලිකොම්

## තංගල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### අඟුණකොලපැලැස්ස පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-12 08:30-17:00
බෙදහැරීම් : දහඅමුණ, හකුරුවෙල, කොටවාය

2021-03-21 08:30-17:00
තොග : අළුත්වැව අධිවේගී මාර්ගය
බෙදහැරීම් : අළුත්වැව පන්සල, හෙලේකඩ ධීවර ගම්මානය, කංකානම්ගම, පළුගහවෙල

2021-03-23 08:30-17:00
බෙදහැරීම් : කදිරගොඩ, විගමුවනව

2021-03-25 08:30-17:00
බෙදහැරීම් : හීන්ආර

### බෙලිඅත්ත පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-22 08:30-17:00
බෙදහැරීම් : හාල්පන්දෙනිය, පාලන්කඩ

2021-03-29 08:30-17:00
බෙදහැරීම් : අරංවෙලඉඩම්, මයික්රො ඇග්රෝ, සියඹලාගොඩ

### තංගල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-10 08:30-17:00
බෙදහැරීම් : මාදුගොඩ

2021-03-18 08:30-17:00
තොග : අළුත්ගොඩ ජලපොම්පා ගරය, විතාරන්දෙනිය පොම්පාගාරය
තොග සහ බෙදහැරීම් : නලගම
බෙදහැරීම් : දෙමටවලවත්ත, දූඹුල්ලකඩ, නලගමපැල තවාන, විතාරන්දෙනිය, වල්ගම්එළිය

2021-03-25 08:30-17:00
බෙදහැරීම් : තිරවල

2021-03-30 08:30-17:00
තොග : බැදිගම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
බෙදහැරීම් : බැදිගම, බැදිගම පාසල, ගලවලගාඩ, නාමල්වත්ත, රණසිංහගොඩ, සුදර්ශනගම

### වලස්මුල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-02 08:30-11:30
බෙදහැරීම් : සිත්තම්ගල්ලෙන

2021-03-02 11:30-14:00
බෙදහැරීම් : හඳුගල

2021-03-02 14:00-17:00
බෙදහැරීම් : හඳුගලපහල (කැකුණගොඩ)

2021-03-04 08:30-11:30
බෙදහැරීම් : වීදිකන්ද

2021-03-04 11:30-14:00
බෙදහැරීම් : හඳුගල තේ කර්මාන්ත ශාලාව

2021-03-04 14:00-17:00
බෙදහැරීම් : දෙහිගහහේන

2021-03-08 08:30-17:00
බෙදහැරීම් : මුරුතවෙල නව, රළුව නව

2021-03-13 08:30-17:00
තොග : රෙඩ්හා(ර්)ට් ඇඟළුම්කර්මාන්ත ශාලාව
තොග සහ බෙදහැරීම් : ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වීරකැටිය
බෙදහැරීම් : අග්‍රාහැර, ගුරුගොඩැල්ල, පීල්ලවල, සිරිකඳවුර වත්ත, වකමුල්ල ජලසම්පාදනය

2021-03-14 08:30-17:00
බෙදහැරීම් : ඉත්තදෙමලිය, ඉත්තදෙමලිය නව, කොහොලාන, පඹුරන, සුනීතගම, උඩුකිරිවිල

2021-03-15 08:30-17:00
බෙදහැරීම් : අඹගහහේන, බින්තැන්න, බින්තැන්නහංදිය, කරමැටිය, කෝන්ගස්තැන්න, කෝන්කරහේන, ඕබඩගහදෙනිය ඩයලොග් කුළුණ, ඕබඩගහදෙනිය හංදිය, පිඟලැල්ල, වල්ගම්මුල්ල, වතුකන්ද

2021-03-21 08:30-17:00
තොග සහ බෙදහැරීම් : වලස්මුල්ල රෝහල
බෙදහැරීම් : කණුමුල්දෙනිය, මුදුන, නාතවල, රාජපුරගොඩ

2021-03-22 08:30-17:00
බෙදහැරීම් : කොන්ඩගල

2021-03-24 08:30-17:00
බෙදහැරීම් : එගොඩබැද්ද, පහලවත්ත, පිස්සුබැද්ද 1

2021-03-25 08:30-17:00
බෙදහැරීම් : ගුරුගොඩැල්ල


2021-03-26 08:30-17:00
බෙදහැරීම් : රාජපුරගොඩ

2021-03-31 08:30-17:00
බෙදහැරීම් : ගලහිටිය, ඕමාර පැරණි, ඕමාර පන්සල

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත),**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ද.ප.) කාර්යාලය,**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය,**
**නො. 167, මාතර පාර, ගාල්ල.**
**දු. ක : 091 2232095, 091 2232058**
**ෆැක්ස් අංක : 091 2232058, 091 2232095**

*විදුලි බලයෙන් සසිරිමත් දිවියක්*

**ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක**

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina · Daily News · Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!

AVAILABLE AT
LAKE HOUSE

# නාඋල ප්‍රාදේශීය සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

### පුරනැගුම ගොඩනැගිල්ලේ බිම් මහල සාප්පු සංකීර්ණයක් බවට පරිවර්තනය කිරීම - I අදියර

**කර්මාන්ත අංකය - CPC/NPS/3/4/කඩ කාමර / පොදු අ/01**

01. නාඋල ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු පත් 2021.03.19 දින පස්වරු 2.00 දක්වා භාරගනු ලබන අතර, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම ලංසු විවෘත කරනු ලැබේ. අදාළ පෝරම ගාස්තු නාඋල ප්‍රාදේශීය සභාවේ සරප් වෙත මුදල් ගෙවීමෙන් ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු කැඳවීමේ ලේඛන නාඋල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන අංශයෙන් 2021.03.01 දින සිට 2021.03.18 දින පස්වරු 03.00 දක්වා ලබාගත හැක.

02. ලංසු ඇපකරු ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත වාණිජ බැංකුවකින් හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අනුමැතිය ලබා ඇති ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) මගින් හෝ සභාවේ සරප් වෙත මුදල් ගෙවීමෙන් ලබා ගන්නා කුවිතාන්සිය මගින් හෝ ලංසු පතෙහි මුල් පිටපත සමග ඉදිරිපත් කළ යුතුය.

03. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) ගොඩනැගිලි, ඉදිකිරීම් පිළිබඳව පහත සඳහන් ශ්‍රේණි වල ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් වෙත තම ලියාපදිංචිය තහවුරු කිරීමෙන් පසුව පමණක් ලංසු පත් නිකුත් කරනු ලැබේ.

04. මුද්‍රා තබන ලද ලංසු පිටපත් 2කින් යුතුව නාඋල ප්‍රාදේශීය සභාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ ප්‍රසම්පාදන කමිටු සභාපති, නාඋල ප්‍රාදේශීය සභාව, නාඋල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම කළ හැකිය.

05. කිසිදු හේතුවක් නොදන්වා ඕනෑම හෝ සියලුම ලංසු පිළිගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුවන අතර, ලංසු භාර ගැනීමේ වේලාව අවසන් වූ වහාම සභාවේ රැස්වීම් ශාලාවේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නිලධාරියකුට සහභාගි විය හැකිය.

06. ලංසු සඳහා පූර්ව ප්‍රසම්පාදන රැස්වීමක් 2021.03.12 දින පෙරවරු 10.00 ට නාඋල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන අතර, එදිනට ලංසුකරුවන්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

07. අදාළ මූල්‍ය හා තාක්ෂණික සුදුසුකම් නොමැති ලංසුකරුවන්ගේ ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මේ සඳහා වැඩි විස්තර නාඋල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන අංශයෙන් ලබාගත හැකිය. (066-2246275)

| වැඩ විස්තරය | ලියාපදිංචිය (විශේෂතාවය ගොඩනැගිලි ඉදිකිරීම්) | ආපසු නොගෙවන පෝරම ගාස්තුව | ආපසු ගෙවන ලංසු ඇපකරය හෝ මුදල | | ලංසු ඇපකරය වලංගු කාලය | කොන්ත්‍රාත් කාලය |
|---|---|---|---|---|---|---|
| | | | ඇපකරයේ වටිනාකම | මුදල් තැන්පතු | | |
| නාඋල ප්‍රාදේශීය සභාවේ පුරනැගුම ගොඩනැගිල්ලේ බිම් මහල සාප්පු සංකීර්ණයක් බවට පරිවර්තනය කිරීම හා පැරණි කඩ කාමර කඩා ඉවත් කිරීම (I - අදියර) | CIDA - C - 07 හෝ ඉහළ | 5,000/- | 126,000/- | 126,000/- | 105 (දින) 2021.06.11 දින දක්වා | 100 (දින) |

**සභාපති,**
**ප්‍රාදේශීය සභාව,**
**නාඋල.**

# කොළඹ මහා නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීම

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් පහත සඳහන් සේවාවන් හා අයිතම ප්‍රසම්පාදනය පිණිස සුදුසුකම් ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| | යොමු අංකය | විස්තරය |
|---|---|---|
| 01 | CPD 01/3315/2020 | එක් වසරක නියම කළ කාලය අතර තුර අවශ්‍ය වන පරිදි අවශ්‍ය වන විට මිලදී ගැනීමේ පදනම මත DI මැන් හෝල් කවර ප්‍රසම්පාදනය. |

ලංසුකරණ ලිපිලේඛන (මුල්පිටපත හා අනුපිටපත) ක්‍රම දෙකකට ලබා ගත හැකිය.

**01. කො. න. ස. වෙබ් අඩවිය www.colombo.mc.gov.lk වෙතින් බාගත කර ගැනීමෙන්**

i. රු. 5400/- ක ආපසු නොගෙවන ලංසුකරණ ලිපිලේඛන ගාස්තුව පහත දැක්වෙන පරිදි ගෙවිය හැකිය.

අ) ඕනෑම මහජන බැංකු ශාඛාවකින්, මහජන බැංකුව නගරශාලා ශාඛාවේ අංක 167-1-001-6-3169425 දරන ගිණුමට තැන්පත් කිරීම.

ආ) පහත දැක්වෙන කොළඹ නගර සීමාව තුළ නාගරික පරිශ්‍රයන්හි ගෙවීම් කවුන්ටර වෙත ගෙවීම් කිරීම.

- ❖ දිස්ත්‍රික් කාර්යාල - 04,
  නො. 147, හයිලෙවල් පාර, කිරුළපොන, කොළඹ - 06.
- ❖ ජලාපවහන හා ජලසම්පාදන අංශය,
  මාළිගාකන්ද, කොළඹ - 10.

ii. ගෙවීම් සඳහා ලබාගත් ලදුපත / තුණ්ඩුව ලංසුකරණ ලිපිලේඛන සමග අමුණා එවීම අනිවාර්ය වේ.

**02. නගර ශාලා පරිශ්‍රයෙන් ලබා ගැනීම**

i. 2021 මාර්තු 18 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා එක් කට්ටලයකට රු. 5400/- බැගින් වන ආපසු නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුවක් නගරශාලා පරිශ්‍රයේ සරප් කවුන්ටර් වෙත ගෙවීමෙන් අනතුරුව, කොළඹ 07, නගර ශාලාව, කොළඹ මහා නගර සභාවේ මධ්‍යම මිලදී ගැනීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයෙන් ලංසුකරණ ලිපිලේඛන ලබාගත හැකිය.

ලංසුකරණ ලිපිලේඛන 2021 මාර්තු 18 දින ප.ව. 3.00 න් පසු වෙබ් අඩවියෙන් ලබා දෙන්නේ හෝ නිකුත් කරන්නේ නැත.

යථාපරිදි සම්පූර්ණ කළ මුද්‍රා තැබූ ලංසුකරණ ලිපිලේඛන මුල්පිටපත හා අනුපිටපත, 2021 මාර්තු 19 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර, කොළඹ - 07, නගර ශාලාව, නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ (ලංසු පෙට්ටියේ) තැන්පත් කළ යුතුය.

2021 මාර්තු 19 දින පෙ.ව. 10.00 ට ලංසු භාරගැනීම අවසාන වන අතර, ඒ වහාම විවෘත කෙරේ. ලංසුකරුවන්ගේ බලය ලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි වීමට අවසර ලැබේ.

යම් පැහැදිලිකිරීම් (අවශ්‍ය වේ නම්) ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් දුරකථනය 011 2686389 / 011 2673173 මගින් ලබාගත හැකිය.

**රොෂානී දිසානායක - නීතිඥ**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව.**

ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 47/1, දේවාල පාර, පෙතියාගොඩ ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 196370600821 හිමි **හෑගොඩ ගමගේ විමලාවතී** නමින් හැඳින්වූ මා මෙතැන් පටන් **විමලා තිරාණගම** නමින් හඳුන්වනු ලබන බව උතුම් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට - විමලා තිරාණගම**

## නම වෙනස් කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ මාලබේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නො.448/87, 2 වන පටුමග විහාර මාවත, කොතලාවල ලිපිනයේ පදිංචි **සුදුවාදේවගේ අජිත් බන්දුප්‍රිය කුමාර සහ සුදුවාදේවගේ රදනිකා ලයන්ති කුමාරි** මෙතැන් පටන් **සූරිආරච්චි ඩයස් අජිත් කුමාර සහ සූරිආරච්චි ඩයස් රදනිකා ලයන්ති කුමාරි** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

**මෙයට,**
**සූරිආරච්චි ඩයස් අජිත් කුමාර,**
**සූරිආරච්චි ඩයස් රදනිකා ලසන්ති කුමාරි.**

## වරද නිවැරදි කිරීමටයි

**1986 අංක 32 දරණ පනතින් සංශෝධිත 1961 අංක 29 දරණ පනතේ 29 ඩී ( 29 D ) වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය.**

PEOPLE'S BANK

මහජන බැංකුව (තෙල්දෙණිය ශාඛාව)

**2021.02.23 අඟහරුවාදා දිනැති මහජන බැංකුව තෙල්දෙණිය ශාඛාවට අදාල බෝගහලන්දේ හේන නැමැති දේපල වෙන්දේසියට අදාල විකුණුම් නිවේදනයේ නිලධාරියාගේ තනතුර ප්‍රාදේශිය කළමනාකාර පුත්තලම ලෙස සඳහන්ව ඇත. එය ප්‍රාදේශිය කළමනාකාර මහතා මහනුවර ලෙස නිවැරදි විය යුතුය.**

DK's AUCTIONS
To Professionally Serve the Nation

**ඩැලස් කෙලාට්**
බලයලත් වෙන්දේසිකරුවන්
අංක:146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය, කොහුවල.
දුරකථන: 011- 4367467,0 11- 4367111
විද්‍යුත් : aucslk@gmail.com

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

### නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

## හෝමාගම කාර්මික විද්‍යාලය, සැලසුම් කොට, විකරණය කොට, ප්‍රතිනව්‍යකරණය කිරීම

**කොන්ත්‍රාත් අංකය : SDVT/PRO/01/01-2021(I)**

1. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින්, පහතින් විස්තර කොට ඇති පරිදි, හෝමාගම කාර්මික විද්‍යාලය සැලසුම් කොට, විකරණය කොට, ප්‍රතිනව්‍යකරණය කිරීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 350 කි.

| | කාර්ය විස්තරය | කොන්ත්‍රාත් කාලය |
|---|---|---|
| පැකේජය 1 | ප්‍රවේශයේ පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ල (පරිපාලන ගොඩනැගිලි) පෙනුම වැඩිදියුනු කිරීම, අනෙකුත් ගොඩනැගිලි නවීකරණය කිරීම, ආපනික ගොඩනැගිලි කඩා ඉවත් කිරීම, උද්‍යාන අලංකරණය, ආපනශාලාවද ඇතුළත් පහසුකම් ගොඩනැගිල්ල සැලසුම් කොට ඉදිකිරීම හා ප්‍රධාන ප්‍රවේශ විකරණය (Modify) කිරීම | මාස 6 ක් වන අතර, දෝෂ වගකීම් කාලය දින 365 ක් වේ. |
| පැකේජය 2 | සිව් මහල් ගොඩනැගිල්ලක් සැලසුම් කොට ඉදිකිරීම | මාස 15 ක් වන අතර, දෝෂ වගකීම් කාලය දින 365 ක් වේ. |

ලංසුකරුවන් සියලුම පැකේජ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. එසේ නොවේනම්, එවන් ලංසු "ප්‍රතිචාර නොදැක්වූ" ඒවා ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක් එක් පැකේජයක් වෙන් වශයෙන් අගැයුම් කරනු ඇත. සියලුම පැකේජ හෝ පැකේජයන් තුළ අයිතම වශයෙන් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත බලය පවතී.

2. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. (ලංසුකරු විසින්, මූලික තොරතුරු, සැලසුම් / තාක්ෂණ යෝජනා පිටපත් දෙකක් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. අදාළ යෝජනා, වෙන් වශයෙන් මුද්‍රා තැබූ කවර දෙකකින් යුක්ත විය යුතු අතර, ඉන් පළමු කවරය තුළ මූලික තොරතුරුද, සැලසුම් / තාක්ෂණ යෝජනා හා දෙවන කවරය තුළ මූල්‍ය යෝජනාද ඇතුළත් විය යුතුය.) තාක්ෂණිකව සුදුසුකම්ලත් ලංසුකරුවන්ගේ ලංසු මුදල, මූල්‍ය ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේදී ප්‍රසිද්ධියේ කියවනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛනගතවූ අයකු නොවිය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඩා) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C 2 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය සපුරාලිය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කොට තිබිය යුතුය.
   - පසුගිය වසර තුන තුළ පවත්වාගත් සමාගමේ වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් රුපියල් මිලියන 420 ක් විය යුතුය.
   - පසුගිය වසර පහ තුළ, වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 300 කට නොඅඩු, සමාන ස්වභාවයේ (ගොඩනැගිලි සැලසුම් කොට ඉදිකිරීම් හෝ ඉදිකිරීම්, විකරණය හා ප්‍රතිනව්‍යකරණය) අවම වශයෙන් එක් ව්‍යාපෘතියක් සාර්ථකව සම්පූර්ණ කිරීමේ පළපුරුද්ද.
   - තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය (කොන්ත්‍රාත්තුමය වගකීම් සඳහා වෙන්කිරීම් හැර) හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර, ශ්‍රී ලංකා රුපියල් මිලියන 25 කට නොඅඩු විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 354/2, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර, එම ලිපිනයේදීම, 2021-03-01 දින සිට 2021-03-19 දින දක්වා, 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ රාජකාරි දිනවල ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

6. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් පනස් දහසක් (ශ්‍රී ලං. රුපියල් 50,000.00) ගෙවීමෙන් හා කොළඹ 5, ඇල්විටිගල මාවතේ, අංක 354/2, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2021-03-01 දින සිට 2021-03-19 දින දක්වා, රාජකාරි දිනවල, 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදීගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ.

7. ලංසු, සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC), නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය, අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට ගෙනැවිත් භාරදීමෙන් හෝ කොළඹ 5. ඇල්විටිගල මාවතේ, අංක 354/2, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍යාංශයේ, බිම් මහලේ, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන්, 2021-03-25 දින 1400 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ, නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

8. සියලුම ලංසු සමග. ශ්‍රී ලංකා රුපියල් මිලියන හතරක (ශ්‍රී.ලං.රුපියල් 4,000,000.00) වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වානිජ බැංකුවකින් නිකුත් කළ, නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමට ගත්, 2021-07-22 දින (ලංසු විවෘත කළ දිනයේ සිට දින 119) දක්වා වලංගු, කොන්දේසි විරහිත හා ඒක්ෂණ ආකෘතියෙන් යුත් ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

9. මේ සම්බන්ධ පෙර ලංසු හමුවක් 02 වන මහලේ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී, 2021-03-08 දින 1000 පැයට පැවැත්වීමට නියමිතය. මෙම පෙර ලංසු හමුවෙන් පසුව, හෝමාගම කාර්මික විද්‍යාලය වෙත වැඩබිම් චාරිකාවක් සිදුකරනු ඇත.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC),**
**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය,**
**අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 5.**

# ලුහුඬු දැන්වීම්



රැකී රක්ෂා




323

ඇබෑර්තු

කම්කරු

වයස අවුරුදු 45 ට අඩු සුරාපානයෙන් තොර පළපුරුදු පිරිමි අයෙකු දෛනික වැටුපට, ගල්කිස්සේ අපාර්ට්මන්ට් අනු නිවාස සඳහා උදේ 8.00 සිට සවස 5.00 දක්වා සේවයට අවශ්‍යයි. වැඩ කටයුතු වලට අපාර්ට්මන්ට් අනු නිවාස කාමර පවිත්‍ර කිරීම, රෙදිපිළි සෝදා පිරිසිදු කිරීම, අයන් කිරීම් ආදි දිනපතා වැඩ අන්තර්ගතය. මත්පැනින් තොර සෞඛ්‍ය සම්පන්න නිරෝගී අයෙකු විය යුතුය. අවශ්‍ය වැටුප සඳහන් කර විමසන්න. දුරකථන : 0715-350621, 0765-842222 014586



301

රැකීරක්ෂා

සේවා

බාත්රූම් වල පයිප්ප සහ ටයිල් පිටිස් ඇල්ලීම සහ සියළුම වැඩ භාරගනු ලැබේ. 0774362367 014791

සත මෙත සිරිසෙත සලසන සත්පත

දෝ සතර වෙද සතර දත් නොදත් කාටත් මහගු මිණකි

සුබසෙත

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491

LAKE HOUSE

අනුරාධපුර මධ්‍යම විශේෂ-බී.එම්.විජේසූරිය

# අනුරාධපුර ශික්ෂණ රෝහලේ නාගරික හදිසි මරණ පරීක්ෂකවරයාගේ නිල කාමරයට අගුළු දමලා

අනුරාධපුර ශික්ෂණ රෝහලේ නාගරික හදිසි මරණ පරීක්ෂකවරයාගේ නිල කාමරය අගුළුදමා වසා දැමීමට කටයුතු කිරීම නිසා සිය රාජකාරි නිසි අයුරින් සිදුකිරීමට නොහැකිවී ඇති බව කියමින් අනුරාධපුර නාගරික හදිසි මරණ පරීක්ෂක ජේ.එම්.ජයතිලක මහතා අධිකරණ අමාත්‍යංශයේ ලේකම්වරයාට (24දා) දිනයේ ෆැක්ස් මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

ඊට අමතරව අනුරාධපුර ප්‍රධාන මහේස්ත්‍රාත් ජනක ප්‍රසන්න සමරසිංහ මහතාට උද්ගතව තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා මගින් දන්වා ඇති අතර සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම්වරයාට රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය දුලාන් සමරසිංහ මහතාට හා විශේෂඥ අධිකරණ වෛද්‍ය ඩී.එල් වෛද්‍යරත්න මහතාටත් ඒ පිළිබඳව දන්වා තිබේ.

අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන් දෙදෙනකු ඇතුළු පස්දෙනකු සේවයේ නිරතවන අතර ඒ අතර සිටින එක් අධිකරණ වෛද්‍යවරයකු විසින් ගැටුම්කාරි තත්වය නිර්මාණය කර සුළු සේවකයන් හරහා සිය කටයුතු වලට බාධා කරවමින් මහජනතාව අපහසුතාවයට පත්කරනා බව අදාළ අංශ වලට දැනුම්දී තිබේ.

දින කිහිපයක නිවාඩු ලබාගෙන (24දා) දිනයේ සිය කාර්යාලයට පැමිණි අවස්ථාවේ කාර්යාලය දොරගුළු දමා වසා දමා තිබෙන බවත් එහි මිනිස් අස්ථි කොටස් විශාල ප්‍රමාණයක් ගොඩගසා තිබෙන බවක් දැනගන්නට ලැබුණු බව නාගරික හදිසි මරණ පරීක්ෂක ජේ.එම් ජයතිලක මහතා පැවසුවේය.

තම රාජකාරි සිදුකිරීම සඳහා ලබාදී තිබුණු නිල කාමරයේ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා දුරකථන අංක සහිතව සවිකර තිබූ නාගරික මරණ පරීක්ෂක පුවරුව ගලවා ඉවත්කර තිබෙනා බවත් කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍රයේ ගෑස් නළයක් තියුණු ආයුදයකින් කපා විනාශ කිරීම හා ඕනෑ ස්ථානයක සිට මරණ පරීක්ෂණ සිදුකර ගන්නා ලෙස අධිකරණ වෛද්‍යවරුන් ප්‍රකාශ කිරීම නිසා මහජනතාවට සේවය සැපයීම ප්‍රමාද වන බව ඒ මහතා පැවසුවේය.

මේ හේතුවෙන් වැඩ බලන මරණ පරීක්ෂකවරුන් පසු ගිය දින කිහිපයේ මරණ පරීක්ෂණ පැවත්වීම සිදුකරනු ලැබුවේ මෘත ශරීරාගාරයේ පාංශුකූලය සඳහා වෙන්කර ඇති ස්ථානයේ බවත් (24දා) පරසන්ගස්වැව රිය අනතුරකින් මියගිය දෙදෙනෙකු ගෝමරන්කඩලදී හා තවත් ප්‍රදේශයකදී මියගිය පුද්ගලයෙකුගේ මරණ පරීක්ෂණ කටයුතු සිදුකරනු ලැබුවේ අනුරාධපුර උදය මාවතේ පිහිටි පෞද්ගලික නිවෙසක බව ඒ මහතා පැවසුවේය.

එක්තරා වෛද්‍යවරයෙකු ඇති කර තිබෙනා මෙම තත්වය සමග මහජනතාව පොලිසිය හා මරණ පරීක්ෂකවරුන් අපහසුතාවට පත්වී සිටිනා බවත් මියගිය පුද්ගලයන්ට නිදහසේ අවසන් ගමන යාමටවත් මෙම තත්වය මත හැකියාවක් නැති බව ඒ මහතා පැවසුවේය.

මේ සම්බන්ධයෙන් අනුරාධපුර ශික්ෂණ රෝහලේ වැඩ බලන අධ්‍යක්ෂ වෛද්‍ය දුලාන් වීරවර්ධන මහතාගෙන් දුරකථනයෙන් කළ විමසීමකදි ඔහු කියා සිටියේ තමන්ට නාගරික හදිසි මරණ පරීක්ෂක ජේ.එම් ජයතිලක මහතා කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත්කර නැති බවත් මරණ පරීක්ෂණ කටයුතු අඩාළවීමක් හෝ දෙපාර්ශ්වය අතර කිසිදු මත ගැටුමක් තමන්ට වාර්ථාවී නැති බව ඒ මහතා පැවසුවේය.

එස්.පී.උඩබේපාල - කැබිතිගොල්ලෑව සමූහ

## බඩ ඉරිඟු වගාවක් තුළ ගංජා වගාවක්



ගොවියකු විසින් ඉතා සූක්ෂම ලෙස බඩ ඉරිඟු වගාවක් තුළ වගා කරන ලද ගංජා වගාවක් කහටගස්දිගිලිය, රම්පත්විල, නිවාස 30 ප්‍රදේශයේ හේන් යායකදී සොයා ගැනීමට හැකි වූ බව කහටගස්දිගිලිට පොලීසිය කියයි.

මෙසේ නීති විරෝධී ලෙස සූක්ෂමව ගංජා වගා කළ රම්පත්විල, නිවාස 30 පදිංචි 57 හැවිරිදි සැකකරුද, කහටගස්දිගිලිය පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන ඇත.

මෙම සැකකරු මෙසේ වගා කරන ගංජා හොඳින් වැඩුණු පසු එම ප්‍රදේශයේම පුද්ගලයන් සඳහා අලෙවි කර ඇත. කාලයක් පුරා සිදු කළ මෙම ජාවාරම ලද තොරතුරකට අනුව නීතියේ රැහැනට හසු කර ගැනීමට හැකි වූ බව මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරමින් කහටගස්දිගිලිය පොලීසිය පැවසීය.

වයඹ පළාත් සංචාරක සහ ගිරිඋල්ල සමූහ

## පල්ලේගම ඌරු ගොවිපොළෙන් පළාතම දූෂණය වෙලා

### ගැබිනි මවුවරු, රෝගීන්, කුඩා දරුවන්ටත් දැඩි දුෂ්කරතා



පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පල්ලේගම ප්‍රදේශයේ මහයායවත්ත නැමැති ඉඩමේ පවත්වාගෙන යනු ලබන මහා පරිමාන ඌරු ගොවිපළක් හේතුවෙන් මේ වන විට දැඩි පාරිසරික ගැටලුවක් මතුවී ඇත. එලිබිච්චිය, පල්ලේගම, මැල්ලවලාන ආදී ප්‍රදේශ කීපයකට මෙම ඌරු ගොවිපළෙන් නිකුත් වන දුර්ගන්ධය නිසා මෙම ප්‍රදේශවල ජීවත්වන ජනතාව දැඩි දුෂ්කරතාවන් රැසකට මුහුණ පා සිටිති.

දවසේ පැය 24 පුරාම අවුරුද්දේ දින 365ම ඌරු කොටුවේ අපද්‍රව්‍ය වලින් නිකුත් වන දැඩි දුර්ගන්ධය ඉවසමින් මේ ගම්වල මිනිසුන්ට ජීවත්වීමට සිදුව ඇත. ඌරන්ගෙන් පිටවන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර නොකිරීම නිසා ඉන් පිට වන දුගඳ පණ ඇති මිනිසුන්ට නම් ඉවසිය නොහැකි බව ප්‍රදේශවාසීහු සඳහන් කරති. විශේෂයෙන්ම කුඩා දරුවන්, රෝගීන්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාවගේද සෞඛ්‍යයට මින් එල්ලවන තර්ජනය අති විශාලය. වර්ෂාව පවතින කාලවලට මින් නිකුත් වන දුගඳ කිසිසේත්ම ඉවසාගත නොහැකිය. එසේම මිය යන ඌරන්ගේ අපද්‍රව්‍යද කපුටන් හා සුනඛයන් විසින් අවට ඉඩම්වලට ගෙනගොස් දමනු ලබයි. ඇතැම් අපද්‍රව්‍ය කපුටන් විසින් ළිං වලට දැමීම හේතුවෙන් පානීය ජලයද අපවිත්‍ර වන බව අවට ගම්වාසීහු සඳහන් කරති. ජනතාවගේ ශරීර සෞඛ්‍යයට තර්ජනයක් වන ආකාරයට ඉතා අවධිමත් ලෙස පවත්වාගෙන යන මෙම ඌරු ගොවිපළ වහා නවතාදමන ලෙස එහි අයිතිකරුවන්ගෙන් ප්‍රදේශවාසීහු ඉල්ලා සිටියද ඒ විරෝධයටද කන්නොදී මෙම ගොවිපළ පවත්වාගෙන යනු ලබයි. අවසානයේ ප්‍රදේශවාසීන්ට සිදුවූයේ නීතියේ පිළිසරණ පැතීමටය. මේ වන විට කුලියාපිටිය අධිකරණයේ මෙම ඌරු ගොවිපළට විරුද්ධව නඩුවක් පවරා ඇත. ඒත් එම නීතියද නොතකා ගොවිපළ පෙර පරිදිම පවත්වාගෙන යනු ලබයි. දුගඳත් එසේමය. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු මෙන්ම මහජන නියෝජිතයෝද නිහඬය. මේ සියලු දෙනාටම සන්තෝෂම් ලබාදෙමින් ඌරු කොටු ව්‍යාපාරිකයා සිය ධන බලයට සියල්ල නිහඬකර නීති විරෝධී ලෙස මෙම සත්ත්ව ගොවිපළ පවත්වාගෙන යන බව ප්‍රදේශවාසීන්ගේ මතය වී ඇත. ගඳ සුවඳ දන්නා වගකිවයුත්තනි මේ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ නිදහසේ හුස්ම ගැනීමේ අයිතිය තහවුරු කර දෙන ලෙස ඔවුහු බලධාරීන්ගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිති.

දිනමිණ දසත දස අත ම එක තැන

මාතලේ දිස්ත්‍රික් සමූහ

## සත්ව පාලනය නැංවීමට පියවර රැසක්

මාතලේ දිස්ත්‍රික්කයට අයත් පල්ලේපොළ ප්‍රාදේශීය ලේකම් බලපෙදෙසෙහි සත්ව පාලන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා පළාත් සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මේවනවිට පියවර රැසක් ගෙන ඇත.

මෙම සැලැස්ම යටතේ පෙදෙසේ ආදර්ශ ගොවිපළක් ආම්භකරන අතර කිරිපට්ටි පාලනය වැඩිදියුණුකිරීම සඳහා තෘණවගා ව්‍යාපෘති ග්‍රාමීය පෙදෙස් ආශ්‍රිතව සකස්කිරීමටද තීරණයකර තිබේ. මෙයට සමගාමිව අභිජනන ගොවිපළවල් හතරක් සහ උපගැබ් පරීක්ෂණ මධ්‍යස්ථානයක්ද ඇරඹීමට නියමිතය.

එමෙන්ම මෙම පෙදෙසේ මේවනවිට පවුල් හාරදහසක පමණ ප්‍රමාණයක් මෙම සත්ව පාලන කටයුතුවල නියැළී සිටින අතර මොවුන්ගෙන් බහුතරය අඩුආදායම්ලාභින් බව නිලධාරින් පවසයි.

එමෙන්ම දැනටමත් මෙම පෙදෙසේ කිරිගොවීන් විසින් මසකට දියරකිරි ලීටර් 61000 කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන අතර කුකුළුමස් කිලෝග්‍රෑම් 82000 ක් සහ බිත්තර 83000 ක ප්‍රමාණයක් වෙළෙඳපලට නිකුත්කරන බවද මොවුන් පෙන්නාදෙයි.

තවද පෙදෙසේ පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීම සඳහා ඉදිරියේදී ළමුන් පන්සියදෙනකු (500) වෙනුවෙන් නොමිලයේ දියරකිරි ලබාදීමටද පියවර ගන්නා බව මෙම නිලධාරිහු සඳහන් කරති.

මේ අතර මෙම සත්ව පාලන කටයුතුවල නියැළෙන පිරිස පවසන්නේ අවම වශයෙන් අවශ්‍ය මූලික පහසුකම්වත් තමන්ට ලබාදෙන්නේ නම් මෙම කර්මාන්තය ඉතා කෙටිකලකදී වඩාත් දියුණු තත්වයකට පත්කළහැකි බවය.

නාගොඩ විශේෂ එන්.විජේරත්න

## 'කොවිඩ් 19 කතා එකතුව' එළිදකී



සර්වෝදය ශාන්තිසේනා සංසදය මගින් කොවිඩ් 19 වසංගතය හමුවේ ප්‍රජාව මුහුණ දුන් අත්දැකීම් පාදක කර ගනිමින් 'කොවිඩ් 19 කතා එකතුව' නම් වූ කෘතිය එළිදැක්වීම කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නව ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මහා සංඝරත්නය, අන්‍ය ආගමික පූජකතුමන්, ආරාධිතයන් පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව මෙම සමාරම්භක අවස්ථාව පැවැති අතර සර්වෝදය ශාන්ති සේනා සංසදයේ විධායක අධ්‍යක්ෂක රවීන්ද්‍ර කන්දගේ මහතා ඇතුළු කීප දෙනෙක් අදහස් දැක්වූහ.

දික්වැල්ලේ තිලකරත්න ගාල්ල උතුර සමූහ

## මුහුදු ජල පිරිපහදු යන්ත්‍රය විවෘත කරයි



නාවික සමාජයීය මෙහෙවර ව්‍යාපෘතිය මගින් ප්‍රථම වරට නෞකා වෙනුවෙන් නිෂ්පාදනය කර ශ්‍රීලංනානෞ ජයසාගර නෞකාව තුළ ස්ථාපිත කරන ලද මුහුදු ජල පිරිපහදු යන්ත්‍රය (Sea water Reverse Osmosis Plant) (24) උතුරු නාවික විධානයේ ආඥාපති රියර් අද්මිරාල් සෙනරත් විජේසූරිය මහතා විසින් විවෘත කෙරිණි.

මෙරට සාගර කලාපය තුළ නිරන්තර මුර සංචාර සහ මෙහෙයුම් සිදු කරනු ලබන මුහුදු ජල පිරිපහදු යන්ත්‍ර පහසුකම් නොමැති නෞකාවන් සඳහා අවශ්‍ය පිරිසිදු ජල අවශ්‍යතාවය සපුරා ගනිමින් නෞකාවන්ගේ මෙහෙයුම් කාර්යක්‍ෂමතාව වර්ධනය කිරීම සඳහා නාවික හමුදා සමාජීය මෙහෙවර ව්‍යාපෘතිය මගින් නාවික හමුදා ශිල්පීය හා තාක්‍ෂණික දැනුම උපයෝගී කර ගනිමින් ප්‍රථම වරට මෙම මුහුදු ජල පිරිපහදු යන්ත්‍රය නිෂ්පාදනය කරන ලද අතර, එමගින් දිනකට මුහුදු ජලය ලීටර් 10000 ක් පිරිපහදු කිරීමේ හැකියාව පවතී. ඒ අනුව, මෙම මුහුදු ජල පිරිපහදු යන්ත්‍රය උතුරු නාවික විධානයේ ආඥාපති රියර් අද්මිරාල් සෙනරත් විජේසූරිය මහතා විසින් ශ්‍රීලංනානෞ ජයසාගර නෞකාවේදී මෙලෙස විවෘත කිරීමට කටයුතු කෙරිණි.

මෙම අවස්ථාව සඳහා උතුරු නාවික විධානයේ නියෝජ්‍ය ආඥාපති, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරී ඇතුළු නාවික පිරිසක් සහභාගී වී සිටියහ.

සීගිරිය විශේෂ

## ලග්ගල කොවිඩ් ප්‍රතිකාර රෝහලට රුපියල් ලක්ෂයකට අධික අත්‍යවශ්‍ය භාණ්ඩ



නව ලග්ගල පිහිටි කොවිඩ් ප්‍රතිකාර රෝහලට රුපියල් ලක්ෂයකට අධික අත්‍යවශ්‍ය භාණ්ඩ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳ සංගමය මගින් පරිත්‍යාග කිරීම 24 දින පස්වරුවේ සිදු කෙරිණි.

ලග්ගල ප්‍රාදේශීය රෝහල කොවිඩ් ප්‍රතිකාර රෝහලක් බවට පත් කොට එහි සියයකට වඩා අධික රෝගීන් පිරිසක් නේවාසිකව ප්‍රතිකාර ලබයි.

එහි ප්‍රතිකාර ලබන බොහෝදෙනාට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ පිරිසුදු කිරීමේ උපකරණ විසබීජහරණය කිරීම දියර සනීපාරක්ෂක දේ ඇතුළු බොහෝ දේ ගෙන්වා ගැනීමට නොහැකි බව වාර්තා වීමත් සමග දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳ සංගමය ඒකාබද්ධ වී එහි අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගෙන රෝහලටම ගොස් ඒවා පරිත්‍යාග කිරීම සිදු කරනු ලැබූහ.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන වෙළෙඳ සංගමයේ සභාපති වන්න ඇරැවුල මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට ක්ව සිටි අතර රෝහලේ භාර වෛද්‍යවරයාට මෙම භාණ්ඩ සියල්ල ලබා දීම සිදු කළහ.

ඡායාරූපයෙන් දැක්වෙන්නේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන වෙළෙඳ සංගමයේ සභාපති වන්න ඇරැවුල මහතා ඇතුළු පිරිස රෝහලේ භාර වෛද්‍යවරයාට එම භාණ්ඩ භාරදෙන අවස්තාවයි .

මරදන්කඩවල සමූහ කේ.එස්.කරුණාරත්න

## රිවෝල්වරයක් සමඟ ජීව උණ්ඩ 2ක් අත්අඩංගුවට



තිරප්පනේ පොලිස් බලප්‍රදේශයට අයත් සෙලෙස්තිමඩුව ග්‍රාමයේ නිවෙසක් පිටුපස ගෙවත්තේ වළදමා තිබූ ස්වයංක්‍රීය රිවෝල්වරයක් සමග මිලිමීටර් 9 ජීව උණ්ඩ දෙකක් 23 සවස සොයාගත් බව තිරප්පනේ පොලිසිය කියයි.

සෙලෙස්තිමඩුව ,නාච්චාදූව ලිපිනයෙහි පදිංචි පුංචිබණ්ඩාගේ සමන්ත උපාලි දසනායක නොහොත් මරංචි සමන්ත යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන සැකකරුගේ නිවෙස පිටුපස ජම්බු ගසක් මුල මෙම ගිනිඅවිය සඟවා තිබිය දී හමු වූ බව ද පොලිසිය කීය.

පොලිසිය වෙත ලැබුණු තොරතුරක් මත මෙම වැටලීම සිදු කර ඇත. ගිනිඅවිය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී එය සන්තකයේ තබාගත් බවට සැකකෙරෙන මෙම සැකකරු නිවසින් පලාගොස් තිබූ බව පොලිසිය කීය.

මෙම රිවෝල්වරය භාවිතා කරන ලද සැකකරු මුදල් වංචා කිරීම්, නීතිවිරෝධී මත්පැන් විකිණීම හා මත්පැන් ජාවාරමේ නිරතවීම සහ පොලිසියට බැණවැදීම් ඇතුළු චෝදනා රැසකට සම්බන්ධ අයකු බව මූලික විමර්ශනවල දී අනාවරණය වූ බව පොලිසිය කීය. එමෙන් ම තිරප්පනේ පොලිසියේ පමණක් ඔහුට එරෙහිව නඩු හතක් පමණ ගොණුවී ඇතැයි ද පොලිසිය පැවසීය.

සිද්ධිය සම්බන්ධයෙන්(24) අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කරුණු දැක්වීමට නියමිතව තිබිණ.

උතුරු මැද පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ , නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් , ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගීගනගේ ,සහකාර පොලිස් අධිකාරි රුවන් නාරාවිටගේ යන පොලිස් නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තිරප්පනේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්. එම්. අයි. බණ්ඩාර රත්නායක මහතාගේ මූලිකත්වයෙන් තිරප්පනේ පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරයි.

ඩී. මිහිඳු කුල කොච්චිකඩේ

## නොමිලේ ලබාදෙන අභ්‍යාස පොත් වෙළෙඳසලකට විකුණලා

මීගමු මහ නගර සභාවේ ප්‍රතිපාදන මගින් වාර්ෂිකව අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් ළමුන් සඳහා නොමිලේ බෙදා දෙනු ලබන අභ්‍යාස පොත් තොගයක් පොත් වෙළෙඳසලකට අලෙවි කර ඇතැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ අයකු රුපියල් 5000 ක මුදල් අප හා ඇප හා රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදා හැරීමට මිගමුව වැඩබලන මහේස්ත්‍රාත් චරිත ජයනාථ මහතා නියෝග කළේය.

මෙසේ මුදාහරිනු ලැබූවේ ඇලස් පාර මීගමුව 6/8,පදිංචි බව කියන මීගමුව මහනගර සභාවේ හිටපු නාගරික මන්ත්‍රීවරයකුගේ පුත්‍රයකු වන මිහිඳුකුලසූරිය ශේන් රුචිත ප්‍රනාන්දු නැමැත්තෙකි

තමන් මීගමුව මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන් සමඟ සම්බන්ධකම් පවත්වන බවත් එබැවින් තමන් වෙත සජිත් මෝහන් සහ ,ජූඩ් යන නාගරික මන්ත්‍රීවරුන් පොත් කට්ටල නමයක් ලබාදුන් බව සැකකරු පොලිසියට ප්‍රකාශ කර තිබේ.

සිද්ධිය සම්බන්ධව මීගමුව මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරු පිරිසක් පොලිසියට පැමිණිලි කොට ඇතැයි කියයි මීගමු පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ නඩු කටයුතු මෙහෙවන පොලිස් කොස්තාපල් (53883) නවරත්න බණ්ඩාර මහතා විසින් දණ්ඩනීති සංග්‍රහයේ 386 වැනි වගන්තිය යටතේ සාපරාධී සාවද්‍ය පරිහරණය යන චෝදනා මත සැකකරු අධිකරණයට ඉදිරිපත් කර පැමිණිල්ල මෙහෙයවීය.

විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

## කොටපොල ජාතික පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට නිළ ලාංඡන



කොටපොල ජාතික පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට නිළ ලාංඡන පැළඳවීමේ උත්සවය 24 වෙනි දින එම විද්‍යාලයේදී පැවැත්විනි. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී හා මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති නිපුණ රණවක මහතා සහභාගීවූ අතර ඒ මහතා විසින් නිළ ලාංඡන පැළඳවීම සිදු කරනු ලැබීය.

විදුහල්පති ගොඩ්ප්‍රි අසංක මහතා ප්‍රමුඛ විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය , දෙමාපියන් සහ සුබපතන්නන් පිරිසක් මෙම අවස්ථාවට එක්වී සිටියහ.



# රාජිනි තිරාණගම ඝාතනය ගැන දිනමුරසු හෙළිදරව්ව

**1989 අගභාගයේ සිදු වූ ඝාතනයක් අදටත් අභිරහසක්ව පවතී. යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ කථිකාචාරිනී රාජිනි තිරාණගම ඝාතනයයි ඒ,**

යාපනය විශ්වවිද්‍යාලයේ කථිකාචාරිනී මෙන්ම කොටි සංවිධානයේ සිට පසුව ඉවත් වූ නිර්මලාගේ සහෝදරියයි රාජිනි තිරාණගම. ඇය මානව හිමිකම්, කාන්තා විමුක්තිය වෙනුවෙන් අවංකවම පෙනී සිටි අයෙකි. සිය ජීවිතයට අනතුරක් සිදුවිය හැකියි කියන තරම් අවදානමක් මධ්‍යයේ වුවද යාපනය විශ්වවිද්‍යාලය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එන්නට ඉදිරියෙන්ම කටයුතු කළ අයෙකි.

## බිඳුණු තල් ගස

ඉන්දීය හමුදාව පැමිණීමෙන් ඇති වූ මානව හිමිකම් උල්ලංඝනයවීම්, සාපරාධී ක්‍රියා සම්බන්ධයෙන් රාජිනි තිරාණගම පසු වූයේ මහත් කෝපයෙනි.

'අප වටා සිදු වන්නේ කුමක් ද යන්න අපක්ෂපාතීව ගෙනහැර දැක්විය යුතුයි. මේ දුකින් මිදුණු ජීවිතයක් ගැන සිතන්න ජනතාවට අවබෝධ කර දිය යුතුයි යන්න රාජිනිගේ කැමැත්ත විය.

යාපනය විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් සඳහා වූ ආචාර්ය මණ්ඩලය යන නමින් සංවිධානයක් ගොඩනගා තම ජීවිත කාලයේ සිදු වූ විනාශයන් හෙළිකරන්නට ඉදිරිපත් වූ අයගෙන් කෙනෙකි රාජිනි.

මානව හිමිකම් සඳහා වූ ආචාර්ය මණ්ඩලය (යාපනය) නමින් මාධ්‍ය නිවේදන නිකුත් විය. ඉන් අනතුරුව රාජිනි තිරාණගම අභීතව අති විශාල ප්‍රයත්නයක යෙදුනාය.

එනම් 'බිඳුණු තල් ගස' නමැති ග්‍රන්ථය බිහිකිරීමේ ප්‍රයත්නයයි. ඇයත් සමග අවනීතියට එරෙහි අභීත විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් වන රාජන්හූල්, දයා සෝමසුන්දරම්, කේ. ශ්‍රීදරන් යන අය ද එක්ව එම ග්‍රන්ථය ගොඩනැගීමේ උත්සහයේ නිරත වූහ. මානව හිමිකම්, මානවයාගේ ගෞරවය වෙනුවෙන් හඬ නැඟීම යන නමින් ඔබේ නමත්, මුහුණත් පෙන්වන රැස්වීම් කවදත් පැවැත්විණි. දැනටත් එවැනි දේ ක්‍රියාත්මකය.

මේ අය මානව හිමිකම් වෙනුවෙන් සටන් කළහොත් කරදරයක් වන්නේ පුවත්පත්වලටයි. තමන්ගේ නම්, මුහුණු ප්‍රවෘත්ති ඡායාරූපවල පළවූයේ නැතිනම් විලාප නඟන්න පටන් ගනියි.

මෙවැනි පුද්ගලයන් මානව හිමිකම් ගැන කතාකර තම ජීවිතයට අනතුරක් කියමින් රටින් පලා යනු ඇත. පසුව සුර සැප විඳිමින් සුඛවිහරණව මානව හිමිකම් ගැන කතා කරන්නට සුදුසු වාතාවරණයක් ගොඩනැගුණහොත් ආපසු පැමිණ තමන් ගැන පුරසාරම් දොඩනු ඇත.

එහෙත් රාජිනි තිරාණගම එවන් අයෙකු නොවේ. ඇය සටන්කාමී කාන්තාවකි, සාමාන්‍ය දෙයක් මෙන් මිනිස් ඝාතන සිදුවෙමින් පවතින විටත් කිසිවකට නොසැළී තම ජීවිතය පරදුවට තබා මානවයාට එරෙහි හිංසාවන් එළියට ගෙනඒමට කටයුතු කළ සටන්කාමිනියකි. කතාවටත් වඩා ක්‍රියාවෙන් වැඩ කරන්නට ලැදි අයෙකි.

## ඉන්දියානු හමුදාවේ කෝපය

'බිඳුණු තල් ගස' ග්‍රන්ථය නිර්මාණය කිරීම සඳහා රාජනිටත්, ඇය හා එක්වූ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ටත් විපතට පත් අයව හමුවීමට අවශ්‍යව තිබිණි. ඉන්දීය හමුදාව මිනිස් දඩයම සිදුකළ ඒ ප්‍රදේශවලටම ගොස් තොරතුරු රැස්කිරීමේ අවශ්‍යතාව තිබිණි. මේ තොරතුර ඉන්දීය හමුදාව අතට පත් විය. තමන් සිදුකළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ලෝකය හමුවට යාවි යැයි ඔවුන් කලබලයට පත් වූහ.

තෙවතාවක් රාජිනි තිරාණගමගේ නිවසට ගිය ඉන්දීය හමුදාව අස්සක් මුල්ලක් නැර මේ පිළිබඳ තොරතුරු සෙව්වත් කිසිවක් හමු වූයේ නැත.

වක්‍රව තර්ජනය කරන්නට වූහ. තමන් පසුපස කවුරු හෝ හඹා එන බව ඇය දැන සිටියාය.

කොටි සංවිධානය පිළිබඳවත්, ඔවුන්ගේ කටයුතු පිළිබඳවත් රාජිනි හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විවේචනය කර තිබුණි. කොටින්ගේ වැරදි ක්‍රියා හෙළිකර තිබිණි. එහෙත් ඔවුන්ගේ කටයුතු එදා කොටින්ටත් වඩා ඉන්දීය හමුදාවට හා ඉන්දීය හමුදාවට සබැඳි සංවිධානවලට විශාල අභියෝගයක් විය.

ලෝකයේ විශාලතම හමුදාවන්ගෙන් එකක් වූ ඉන්දියන් හමුදාව ශ්‍රී ලංකාවේ ලේ පිපාසයෙන් කටයුතු කළහ. අපචාර ක්‍රියාවන් හි නිරත වූහ. යාපනය රෝහල තුළට රිංගා මිනීමැරුම් සිදුකිරීම් වැනි තොරතුරු ප්‍රචාරය වීම ඉන්දියන් හමුදාවට කිසිදිනෙක ගැලවිය නොහැකි ලේබලයක් විය.

එයත් සමාජයේ එකගත්වය ඇති විශ්වවිද්‍යාල ආචාර්යවරුන් එවැනි ග්‍රන්ථයක් නිකුත් කළහොත් එය කාගෙත් විශ්වාසය දිනාගන්නා පිළිගත් ග්‍රන්ථයක් වනු ඇතැයි බිය වූහ. රාජිනි තිරාණගම ඝාතනය සිදු වූයේ මෙවන් පසුබිමකය. මින් මතුවට සඳහන් කරනු ලබන තොරතුරු රාජිනි තිරාණගම ඝාතනය පිළිබඳ මෙතෙක් ප්‍රකාශ වූ තොරතුරුවලට හාත්පසින්ම වෙනස්විය හැකිය. එබැවින් ලද තොරතුරු එලෙසින්ම සඳහන් කරමි.

## රහසිගත සැලැස්ම

රාජිනි තිරාණගමව කොටින්ගේ නමින් ඝාතනය කරන්නට ඉන්දීය හමුදාවේ එක් බලඇණියක් තීරණය කර තිබිණි. මෙම ඝාතන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම කර්නල් සසිකුමාර්ට භාර කෙරිණි. කර්නල් සසිකුමාර් වහාම ඊ. පී. ආර්. එල්. එෆ්. යාපනය දිස්ත්‍රික් ප්‍රධානි රාෆීක් හා සම්බන්ධ විය. රාෆීක්ගේ නිවැරදි නම රවීන්දිරන්. ඔහු පදිංචිව සිටියේ යාපනය කොවිලඩි ප්‍රදේශයේය.

ඉන්දීය හමුදාව පිටව යාමට නියමිත බවත් තමන්ට වැඩි කාලයක් මෙසේ වැජඹීමට නොහැකි බවත් රාෆීක් දැන සිටියේය. එපමණක් නොව තමන් විසින්ම කොල්ලකෑම් ගණනාවක් සිදුකර මුදල් හා සම්පත් රැස්කිරීමට පියවර ගෙන සිටියේය.

නායකත්වයේ සිටි උදවිය ඉන්දියාවෙන් ලැබෙන මුදල් යටිමඩි ගසාගනියි. මම කුමක් කරන්න ද? හෙට දවසේ මහ පාරට ඇද වැටෙන්න ද? ඒ රාෆීක් තම ක්‍රියාව ගැන කී කතාවයි.

පද්මනාභාගේ විශ්වාසවන්තම පුද්ගලයා වූ රාෆීක් පද්මනාභටම හොරෙන් කොල්ලකන්න පටන් ගත්තේය. ඒ සමඟ ඉන්දීය හමුදාව හා ඉන්දීය හමුදාවේ රහස් ඔත්තු සේවා සමඟ ද සබඳතා පැවැත්වූ අතර එම සබඳතාවය පුද්ගලික සබඳතා බවට පසුව පරිවර්තනය විය.

## රාජිනී මරන්න ඔත්තු බැලීම

කර්නල් සසිකුමාර් රාෆීක් හමුවී රාජිනි මරාදැමීම ගැන කී මොහොතේම රාෆීක් එක්වරම ඊට එකඟ විය. ඒ කාලයේ මිනී මැරීම සාමාන්‍ය දෙයකි. මීට පෙර ආර්ථික විද්‍යා ආචාර්ය ක්‍රිෂ්ණානන්දන් ඇතුළු ගුරුවරුන් රැසක් ඊ. පී. ආර්. එල්. එෆ්. සංවිධානයේ අය විසින් ඝාතනය කර තිබිණි. රාෆීක්ගේ අනුදැනුම ඇතිවම ඒ සියලු ඝාතනයන් සිදු විය. එනිසා රාජිනි තිරාණගමව ඝාතනය කිරීම ද සාමාන්‍ය දෙයක් ලෙස රාෆීක් බාරගනු ලැබීය.

මේ පිළිබඳව පද්මනාභ දැනුවත් කළේද, නැද්ද යන්න දැනගත නොහැකිය. රාජිනිව ඝාතනය කිරීමේ වගකීම රාෆීක් විසින් කාර්තික්, තෝමස් යන දෙදෙනාට පවරනු ලැබීය. මොවුන් ටික දවසක් රාජිනිගේ ගමන් මාර්ගය හා ක්‍රියාමාර්ග අධීක්ෂණය කළහ. ඇය පසුපස ගමන් කළහ.

1989-09-21 දින යාපනය විශ්වවිද්‍යාලය ආසන්නයේ පිහිටි තිරුනෙල්වේලි හන්දියේ දී රාජිනි වෙඩි තබා ඝාතනය කළහ.

රාජිනිට වෙඩි තැබුවේ තෝමස් නමැත්තාය. ඇයට වෙඩි පාරවල් කිහිපයක් තබා පලා ගියේය.

මානව හිමිකම් පිළිබඳ අභීත ක්‍රියාකාරිනී රාජිනි ලේ ගංගාවක වැතිර සිටියාය. මෙම සිදුවීම කිසිවෙකුටත් නොකියා රහසිගතව තබාගත යුතු බව ඉහළින් ලද නියෝගයක් බවත් රාෆීක් වෙඩි තැබූවන්ට නියම කළේය.

## ඝාතකයාගේ ශෝකය

ඝාතනය පිළිබඳ පුවත හෙළිවීමටත් පෙර මෙම ඝාතනය කොටි විසින් සිදු කළ බවට ඊ. පී. ආර්. එල්. එෆ්. සංවිධානය නිවේදනයක් නිකුත් කළේය. ඒ නිවේදනයෙන් ඔවුන්ගේ ශෝකය ද පළ කර තිබිණි.

රාජිනි තිරාණගම තිරුනල්වේලි හන්දියේ දී වෙඩි තබා ඝාතනය කරන අවස්ථාවේ ඒ වෙඩි හඬ ඇසුණු මොහොතේ කොටි සංවිධානයේ ප්‍රබලයෙක් එම මාර්ගයේ ගමන් කරමින් සිට ඇත. තමන්ව දැක වෙඩි තබනවා යැයි සිතූ කොටි ප්‍රබලයා ඉතා වේගයෙන් එම ස්ථානයෙන් පිටව ගොස් ඇත. ඔහු එසේ වේගයෙන් ගමන් කරනු සමහරක් දැක ඇත. මේ ඝාතනය කොටි පිට පැටවීමට හේතු වී ඇත්තේ එම කාරණයමයි.

මේ තොරතුරු සියල්ල මෙම ඝාතනයට සෘජුව සම්බන්ධ වූ කාර්තික් මඟින් හෙළිවී ඇත. කාර්තික්, තෝමස් යන අය ඊ. පී. ආර්. එල්. එෆ්. සංවිධානයේ 'මන්ඩයන්' කණ්ඩායමේ සිටි අයයි. ඊ. පී. ආර්. එල්. එෆ්. යැයි එළියට නොපෙනෙන්නට තම විරුද්ධවාදීන්ව මරා දැමීම මෙම කණ්ඩායමේ රාජකාරිය විය.

ඉන්දීය හමුදාව පිටව යාමෙන් පසු කාර්තික් ඊ. පී. ආර්. එල්. එෆ්. සංවිධානයෙන් ඉවත් වී ඊ. පී. ඩී. පී. සංවිධානයට එක්විය. තෝමස් ඊ. පී. ආර්. එල්. එෆ්. මහ ලේකම් සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්ගේ ආරක්ෂකයා ලෙස කොළඹ ටික කලක් සිටියේය. දැනට විදෙස්ගතව සිටියි.

කාර්තික් පසුව ඊ. පී. ඩී. පී.යෙන් ඉවත් විය. ත්‍රිකුණාමලයේ දී පුද්ගලික අරවුලකින් කපා කොටා මරා දමා ඇත. රාජිනී තිරාණගම ඝාතනයට තමන් සම්බන්ධ නැති බව කොටි කල්තියාම කියා තිබුණි. එහෙත් මේ දක්වාම කියවෙන්නේ කොටි සිදුකළ බවය.

මේ අතරතුර රාජිනි ඝාතනයේ ප්‍රධාන මොළකරු කර්නල් සසිකුමාර් යාපනය අරියාලයි මනියම් වතු ප්‍රදේශයේ ඇතිවූ ගැටුමකින් කොටි විසින් මරා දමන ලදි.

තමන් මිය යාමට දින 14 කට කලින් රාජිනි සිය හිතවතෙකුට ලියූ ලියුමක මෙසේ සඳහන් කර සිටියාය.

'කවදා හෝ දවසක තුවක්කුවක් මා නිහඬ කරනු ඇත. එය සාමාන්‍ය මිනිසෙක් විසින් සිදුකරන්නක් විය නොහැක. මාගේ ඉතිහාසය බෙදාගන්නා මේ සමාජයේ ජීවත්වන එක් කාන්තාවකගේ කුසෙන් ඉපදුනු පුතෙකු විසින් එල්ල කරන ලද තුවක්කුවක්ම විය හැකිය.

**ටී. චන්ද්‍රසේකර**
**(දිනමුරසු ඇසුරෙන්)**

---

# පළමු ජනහමුවේදීම ප්‍රභාකරන්ට ජනතා විරෝධය එල්ල වුණු හැටි

**මෙරට මෑත කාලීන ඉතිහාසයේ එක පිට එක දරුණු මෙන්ම අහිතකර සිදුවීම් වාර්තා වූ වර්ෂයක් ලෙස 1987 සැලකිය හැකිය. රටේ උතුර මෙන්ම දකුණද ගිනිගෙන දැවෙමින් තිබුණු අතර අන්තර්ජාතිකව ද රටට හිතකර තත්ත්වයක් නිර්මාණය වී තිබුණේ නැත. මේ සියලු අහිතකර බලපෑම් හමුවේ එල්.ටී.ටී.ඊ නායකයා ප්‍රථම වරට ප්‍රසිද්ධ රැස්වීමක් ඇමතීම සිදුවිය.**

ඉන්දු - ලංකා සාම ගිවිසුම අස්සන් කිරීමට නියම වී තිබුණේ 1987 ජූලි 29 වැනිදා ය. අස්සන් කිරීමට නියමිත ගිවිසුමේ කරුණු නිසා රට ගිනි ගනිමින් තිබිණි. මෙහි එක් වගන්තියකට අනුව සටන්කරුවන් ආයුධ භාර දීමටත්, රජය ඔවුන්ට සමාව දීමටත් නියමිත විය. මේ සම්බන්ධයෙන් දෙමළ සටන්කාමීන් තුළ එකගතාවක් තිබුණේ නැත. විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊයේ ප්‍රතිචාරය පැහැදිලිව පෙනෙන්නට තිබුණේ නැත. ජූලි මස 24 දින ඉන්දියානු ගුවන් හමුදාවට අයත් හෙලිකොප්ටරයකින් ප්‍රභාකරන් නවදිල්ලිය බලා රැගෙන ගියේ මේ අතර ය. මේ ගමනේදී ප්‍රභාකරන් අගමැති රජීව් ගාන්ධි ඇතුළු ඉන්දීය නිලධාරීන් කිහිපදෙනෙක් හමුවීමටද නියමිතව තිබිණි. ජූලි 28 ලංකාවේ දෙමළ සටන්කාමීන් සහ ඉන්දීය අගමැතිවරයා අතර හමුව සිදුවිය.

පසු දින ලංකාවට පැමිණි ඉන්දීය අගමැතිවරයා, ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සමඟ ගිවිසුම අස්සන් කරන ලදී. ගිවිසුමට අනුව ජූලි 30 දින ඉන්දීය සාම සාධක හමුදාව පලාලි ගුවන්තොටුපොළින් ලංකාවට ගොඩ බැස්සේය. ඒ සමඟම දෙමළ සටන්කාමීන්ට පැය 72ක් ඇතුළත ආයුධ භාරදීමට නියම වී තිබිණි. බොහෝ දෙමළ සංවිධාන ආයුධ භාරදීමට කටයුතු කළත් එල්.ටී.ටී.ඊය තම ආයුධ භාර දීම මගහැර සිටියේය. ඉන්දියාවට ගිය ප්‍රභාකරන් ගැන තොරතුරක් එල්.ටී.ටී.ඊයට ලැබී නොතිබීම මෙයට හේතු ලෙස දක්වා තිබිණි. මේ බව එල්.ටී.ටී.ඊ සංවිධානයේ යාපනය ආඥාපති කුමාරප්පා විසින් ප්‍රකාශ කරන ලද අතර, එහිදී ඔහු කියා සිටියේ තම නායකයා නොමැතිව තීරණයක් ගත නොහැකි බවය.

මේ අතර දින අටකට පසු අගෝස්තු 2 දින ඉන්දියාව විසින් ප්‍රභාකරන් යාපනයේ සුදුමලේ ප්‍රදේශයට ආපසු රැගෙන ආවේය. අවි ආයුධ භාරදීම සම්බන්ධයෙන් ජනතාවට කරුණු පැහැදිලි කිරීමේ රැස්වීමක් සුදුමලේ අම්මාන් කෝවිල අසලදී පැවැත්වීමට කටයුතු කෙරිණි. අගෝස්තු 4 වැනිදා පැවැති මෙම රැස්වීමට දස දහසක් පමණ ජනතාවක් පැමිණ සිටි බව කියැවේ. ඉන්දීය හමුදා නිලධාරීන්, දෙස් විදෙස් මාධ්‍යවේදීන් රැසක් ද මෙයට සහභාගි වී සිටියහ. මෙහිදී ප්‍රභාකරන් විසින් කරන ලද කතාව බොහෝ දෙනකුගේ අවධානය දිනා ගත්තේය.

"හදිසියේම, කාලයක්, අවකාශයක් නොලබා, අපගේ සටන්කාමීන්ගේ කැමැත්තෙන් තොරව, අපගේ ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ සහතිකයක් නැතිව මෙම ගිවිසුම අපිව නිරායුධ කර දමයි. මේ නිසා අපි ආයුධ භාරදීම ප්‍රතික්ෂේප කළෙමු. මේ තත්ත්වය යටතේ ඉන්දියා අගමැති රජීව් ගාන්ධි මහතා මා කැඳවා සාකච්ඡා කළේය. ඔහු සමඟ අපගේ ප්‍රශ්න පිළිබඳව විවෘතව කතා කළෙමි. සිංහල ජාතිවාදී රජය කෙරේ අපට බිඳුවක් හෝ විශ්වාසයක් නැති බවත්, ඔවුන් මෙම ගිවිසුම ක්‍රියාත්මක කරන්නේ නැති බවත් ඉන්දීය අගමැතිවරයා හට මම ගෙනහැර දැක්වීමි. අපගේ ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයත් ඒ සඳහා අවශ්‍ය වන සහතිකය පිළිබඳත් ඔහුට කීවෙමි. ඔහු අපගේ ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ සහතික විය."

"... අප සතුරන් වෙතින් ආරක්ෂා කිරීමේ වගකීම ඉන්දීය හමුදා හටයෝ භාර ගනිති. අප ඔවුන් වෙත ආයුධ භාරදීමෙන් ඊළාම්වාසී සෑම ද්‍රවිඩයකුගේම ජීවිතයටත්, ආරක්ෂාවටත් ඉන්දියානු රජය යැයි වගකිව යුත්තේ යන්න මෙහිදී මම අවධාරණය කරන්නට කැමැතියි."



"මගේ ආදරණීය ජනතාවනි, ඉන්දියාවේ මෙම උත්සාහයට සහයෝගය දීම හැර අන් මගක් නැත. මෙම අවස්ථාව අපි ඔවුනට ලබාදෙන්නෙමු."

ප්‍රභාකරන්ගේ මේ කතාවත් සමගම රැස්ව සිටි ජනතාව අත්පොළසන් දී ප්‍රීති ඝෝෂා නගන්නට වූහ. ප්‍රභාකරන්ගේ මුහුණේ ඇඳී තිබුණේ දැඩි කෝපයකි. රූපවාහිනී තිර ආධාරයෙන් රැස්වීම නැරඹූවන්ට ප්‍රභාකරන්ගේ මුහුණෙහි වූ කෝපය දැක ගන්නට ලැබිණි. ජනතාවගේ හැසිරීම නිසා එම අවස්ථාවට සහභාගි වී සිටි එල්.ටී.ටී.ඊ යේ නියෝජ්‍ය නායක මහත්තයා ද බලවත් සේ කෝප වී සිටියේය.

"බලන්නකෝ, මේ මිනිස්සු දිහා! මේ යක්කු අප්පුඩි ගහනවා නිකමට හිතන්න අපි සටන් කරලා තියෙන්නේ මේ ජාතියෙ මිනිස්සු වෙනුවෙන් දැයි"ප්‍රකාශ කර තිබේ.

මෙහිදී වැදගත් දෙයක් අප අවබෝධ කරගත යුතුය. රැස්ව සිටි ජනතාවගේ හැඟීම්, ප්‍රභාකරන්ගේ හැඟීම්වලට සමාන වී නම් ජනතාව මෙහිදී මහත් කනගාටුවට පත්විය යුතුව තිබිණි. එහෙත් එවැන්නක් සිදු නොවිණි. එසේ වූයේ ජනතාව තවදුරටත් යුද්ධය පිළිකුල් කළ නිසාය. ජනතාවට අවශ්‍ය වූයේ එල්.ටී.ටී.ඊය විසින් හෝ වෙනත් පාර්ශ්වයක් බලහත්කාරයෙන් පටවන ලද නිදහසක් නොව සැබෑ නිදහසක්ය යන්න මින් පැහැදිලි වේ.

අගෝස්තු 05 දින එල්.ටී.ටී.ඊය ආයුධ භාරදීම ආරම්භ කළේය. එසේ අවිආයුධ භාරදීමට කලින් තමන් ප්‍රහාරවලදී භාවිතයට ගත් අවි ආයුධ ප්‍රදර්ශනය කරමින් එල්.ටී.ටී.ඊය සහ ඊරෝස් සංවිධානය මඩකලපුව, තිරිකුණාමලය ඇතුළු ප්‍රදේශ කිහිපයක පෙළපාලි පැවැත්වීය.

පසුව දිලිප් යෝගී විසින් එල්.ටී.ටී.ඊයේ ප්‍රථම අවි තොගය ආරක්ෂක ලේකම් සේපාල ආටිගල මහතාට භාරදුනි. එහිදී ජනාධිපතිවරයාගේ සමා නියෝගය ද ආටිගල මහතා විසින් කියවන ලදි. එම අවස්ථාවේ අදහස් දැක්වූ ආරක්ෂක ලේකම්වරයා, කල් ඇතිව තම කොටස ඉටුකරන ලෙස ඉන්දියාව තමන් කැමැති කරවා ගත් බවද, අවි සොයා එළියට දැමීමට ඉන්දියාව භාරගත් බවද කීවේය. "එය සාමය සඳහා මිස යුද්ධය සඳහා වූ ගිවිසුමක් නොවන බව"ද ඔහු අවධාරණය කළේය. මෙවැනි අවි ආයුධ භාරදීම් ගණනාවක් උතුරු නැගෙනහිර දක්නට ලැබිණි. මේ අවස්ථා රූපවාහිනී නාලිකාවල පෙන්වීමට කටයුතු කර තිබිණි.

ගිවිසුම් අස්සන් කිරීමෙන් පසු උතුරු නැගෙනහිර ස්ථිරසාර සාමයක් ඇති වී යයි බොහෝ දෙනා විශ්වාස කළහ. සියල්ලෝම සතුටට සැනසීමට පත්වූහ. ගිවිසුමට අනුව සියලු සටන්කාමී කණ්ඩායම් ලංකාවට පැමිණීම, ආයුධ භාරදීම, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට ප්‍රවිශ්ට වීම සිදුවිය යුතුව තිබිණි.

එකල "ඊලමුරසු" පුවත්පතේ වාර්තාවලට අනුව ගිවිසුම අස්සන් කිරීමෙන් පසුව එල්.ටී.ටී.ඊය දේශපාලන ප්‍රවාහයට එක්වීමට නියමිත විය. මෙලෙස ආයුධ භාරදීම සහ සටන්කරුවන්ට සමාව දීම සම්බන්ධයෙන් විදෙස් මාධ්‍ය රැසක් විවිධ අදහස් දක්වා තිබිණි.

මෙහිදී "පොරොන්දු වූ පරිදි දෙමළ ගරිල්ලන් ඔවුන් සතු ආයුධ ඉන්දියා සාම සාධක හමුදාවට භාර දෙන්නේද සහ මෙම ගිවිසුම රටේ අයිතිය පාවා දෙන්නක් යැයි කියමින් ගිවිසුමට එරෙහිව කරන විවේචන නවතා දැමීමට තරම් සිංහලයන් සාධාරණ වේද යන කරුණු දෙක මත මෙම ගිවිසුමේ සාර්ථකත්වය මැන ගත හැකියි" යනුවෙන් සඳහන් කරන නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත ගිවිසුමේ බොරු වළවල් දැකිය හැකි බවත්, ඒවා පැහැදිලිව පෙනෙන්නට තිබෙන හෙයින් ප්‍රඥාවන්ත ලෙස කටයුතු කළ යුතුව බව ද පෙන්වා දී තිබිණි.

කෙසේ වුවද අවි භාරදීම නිසි පරිදි සිදු නොවූ බව ඇතැම් විචාරකයන්ගේ මතයයි. එහිදී එල්.ටී.ටී.ඊය පරණ අවි ආයුධ භාරදුන් බව බොහෝ දෙනාගේ විශ්වාසයයි. එමෙන්ම ගිවිසුම් අස්සන් කිරීමෙන් පසුව දෙමළ සන්නද්ධ කණ්ඩායම් එකිනෙකා ගහමරා ගැනීම් අවම වෙතැයි සිතුවත් එවැන්නක් වූයේ නැත. මෙලෙස එකිනෙකා මරාගැනීමේ පළමු සිදුවීම මන්නාරමෙන් වාර්තා වූ අතර එහිදී එල්.ටී.ටී.ඊ සාමාජිකයන් තිදෙනකු මරා දමා තිබිණි. මෙතැන් පටන් යාපනයේ එකෙන් එක සිදුවීම් දක්නට ලැබිණි. මෙහි දරුණුම ප්‍රහාරය වූයේ සැප්තැම්බර් 13 වැනිදාය. එදින එල්.ටී.ටී.ඊය විසින් අනපේක්ෂිත මොහොතක කරන ලද ප්‍රහාරයකින් 70 දෙනකු මරා දමන ලදහ. මෙසේ මිය ගිය පිරිස සෙසු දෙමළ සටන්කාමී පිරිසක් වූ අතර සාම ගිවිසුම නිසා ආයුධ අතහැර දමා සිටි පිරිසක් ද විය.

මෙහිදී බොහෝ පිරිසකට පැන නැගී ප්‍රශ්නයක් තිබිණි. ඒ ඉන්දියාව එල්.ටී.ටී.ඊයට පමණක් ආමන්ත්‍රණය කිරීම, අවධානය යොමු කිරීම මගින් ඔවුන් විශේෂ සැලකිල්ලක් එල්.ටී.ටී.ඊයට ලබාදී තිබීමයි. මේ අනුව එල්.ටී.ටී.ඊය මැඩ පැවැත්වීමට ඉන්දියාවට ඇත්ත වශයෙන්ම වුවමනාවක් තිබුණිදැයි ජනතාවට සැකයක් ඉපදී තිබිණි.

රජීව් ගාන්ධිගේ ශ්‍රීලංකා භූමිකාව මානව දයාව හෝ මානව හිමිකම් රැකීම වැනි උත්තරීතර අරමුණකින් යුතුව ගොඩ නැගුනක් නොවේ. බොහෝ විචාරකයන් පෙන්වා දෙන පරිදි එය ආත්මාර්ථකාමී දේශපාලන අරමුණක් ජයග්‍රහණය කිරීම වෙනුවෙන් සකස් වූවක් බව පෙනේ.

එකල රජීව් ගාන්ධිගේ ජනප්‍රියත්වය ශීඝ්‍රයෙන් බිඳ වැටෙමින් තිබිණි. ස්වීඩනයෙන් අවි ආයුධ මිලදී ගැනීමේදී වූ මහා පරිමාණ ජාවාරම අනාවරණය වීම නිසා මෙන්ම නොයෙක් අභ්‍යන්තර වියවුල් ද මේ කෙරේ බලපා තිබිණි. මැතිවරණයක් ආසන්නයේ මෙසේ කඩා වැටී සිටි ගාන්ධිට ඉන් ගොඩ ඒමට තිබූ හොඳම ක්‍රමය වූයේ තමිල්නාඩු ප්‍රාන්තයේ දැවෙමින් තිබුණු ජාතිවාදයට පක්ෂපාතී වීමය.

ප්‍රභාකරන් නවදිල්ලියේ රඳවා සිටි කාලයේදී රජීව් ගාන්ධි සහභාගි වන ජන රැලියක් තමිල්නාඩුවේ පැවැත්වීමට කටයුතු කෙරිණි. ලංකාවේද දේශපාලනය උණුසුම්ව පැවැති මේ අවස්ථාවේ ප්‍රභාකරන් ද අදාළ රැලියට සහභාගි වීමේ ඉඩක් තිබෙන බවද ප්‍රචාරය වී තිබිණි. එදිනම ලංකාවේ පැවැති මාධ්‍ය හමුවකදී ඉන්දීය මහකොමසාරිස්වරයා වූ ජේ.එන්. ඩික්සිත්ගෙන් මේ සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් ප්‍රශ්න කරනු ලැබිණි.

"ඒක මම දන්නේ නැහැ. එම්.ජී. රාමචන්ද්‍රන් සහභාගි වෙනවා." ඩික්සිත්ගේ පිළිතුර එලෙස කෙටිවී තිබිණි.

තමිල්නාඩුවේ පැවැති අදාළ රැස්වීමට ප්‍රභාකරන් සහභාගී වූ බවට වාර්තා හමුවන්නේ නැත. එහෙත් රජීව් ගාන්ධි සමඟ එම්.ජී.ආර් එම රැස්වීමට සහභාගි වූහ. මෙහිදී ගාන්ධිව වීරයකු ලෙස පිළිගැනුණු බව එකල පුවත්පත් වාර්තා කර තිබිණි. ගාන්ධි සහ එම්.ජී.ආර්. දෙදෙනා දෙමළ ජනතාවගේ සහ සටන්කාමීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත බව ජනතාවට තහවුරු කළහ. තවද සමකාලීනව අගෝස්තු 03දා රුසියාවේ ප්‍රවුදා පුවත්පත ඉන්දු - ලංකා ගිවිසුම ගැන මෙසේ අදහස් දක්වා තිබිණි.

"ත්‍රිකුණාමල වරාය තුන්වන රටකට නොදීමටද, 'අමෙරිකානු හඬ' ගුවන්විදුලි මධ්‍යස්ථානයේ කටයුතු සීමා කිරීමට හා පාලනය කිරීමටත් පාකිස්තාන් හා ඊශ්‍රායල් යුද උපදේශකයන් මුදා හැරීමටත් නවදිල්ලි රජය හා ශ්‍රීලංකා රජය එකඟ වීමෙන් ශ්‍රී ලංකාවේ අර්බුදය තමන්ගේ වාසියට හරවා ගැනීමට ප්‍රයත්න දරන අධිරාජ්‍යවාදී කණ්ඩායම්වල අපේක්ෂාවන් නිරර්ථක කිරීමට හේතුවනු ඇත."

ඉන්දු ලංකා ගිවිසුමෙන් පොරොන්දු වී ඇති පරිදි ඉන්දීය හමුදා පෝක් සමුද්‍ර සන්ධිය අසල මුහුදේ මුරසේවා සඳහා යොදවා තැබීමට කටයුතු කෙරිණි. එම සිදුවීම ප්‍රවුදා පුවත්පත වාර්තා කර තිබුණේ ආයුධ හොරෙන් ගෙන ඒම වැළැක්වීම සඳහා ඉන්දියානු යුද්ධ නැව් වෙරළාසන්න මුහුදු ප්‍රදේශයේ මුර සංචාරයට යොදවා ඇති බවය.

**මලික් චමින්ද ධර්මවර්ධන**

පාර්ලිමේන්තු මන්ත්‍රී රාජ නීතිඥ එච්.ශ්‍රී නිශ්ශංක මහතා දිවංගත වී පෙබරවාරි 26 වෙනි දිනට එතුමාගේ ගුණ සමරුව නිමිත්තෙනි.

# ශ්‍රීලනිප ගොඩනැගූ

## රාජ නීතිඥ එච්.ශ්‍රී නිශ්ශංක

මුහුදුබඩ පළාත් පාලනය කළ පෘතුගීසි බලය බිඳ හෙළමින් ලන්දේසි පාලනය ආරම්භ විය. ලන්දේසි පාලනය අවසන් වෙමින් තිබූ දහ අටවන සියවසේ මැද භාගයේ පුරාණ වැල්තොට හෙවත් වත්මන් බළපිටිය ප්‍රදේශයේ කොස්ගොඩට අයත්ව තිබූ අහුන්ගල්ල ඇතුළු ගම් රැසක ග්‍රාම ප්‍රධානියා හෙවත් මහා රාළ පදවිය දැරුවේ කළුහත් දිනෙස් ද ආබ්‍රෙව් මහ රාළය. ඔහුගේ පුතණුවෙකු වූ කළුහත් හෙන්ද්‍රික් ද ආබ්‍රෙව් ලන්දේසින් පළවා හැර මුහුදුබඩ අල්වාගත් ඉංග්‍රීසි පාලන යුගයේ මුල් අවදියේදී මුහන්දිරම් තනතුරකට පත් කළේ එවකට මුහුදුබඩ පාලනය කළ ප්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ අනුදැනුමෙනි. ඔහුගේ දියණියකගේ පුතණුවෙකු වූයේ ගුණවර්ධන ආදිම්ස් ද සොයිසා වික්‍රමරත්නය. වර්තමානයේ සම්බුදු සසුනේ මුදුන්මල්කඩක් බඳු වූ බෞද්ධ සිද්ධස්ථානයක් වන රත්ගම මැතිවරණ කොට්ඨාසයේ අකුරළ ගල්දූව ආරණ්‍ය සේනාසනයට අයත් භූමි භාගය සසුනට පූජා කළ දානපති ඉඩම් හිමි වැවිලිකරුවා ඔහුය.

ඔහුගේ දියණිය විවාහ වූයේ බළපිටිය ගරුමුණි වලවුවේ විසූ ගරුමුණි ආමිස ද සොයිසා වික්‍රමරත්න විදානේ ආරච්චි සමඟය. තම දියණිය ඔහු සමඟ විවාහ වන විට ඇයට දායාද වශයෙන් සිය පියා වූ ඉහත සඳහන් ආදිරිස් ද සොයිසා වික්‍රමරත්න මහතා පිරිනැමූ ඉඩම් ප්‍රමාණය අක්කර තුන් දහසකි.

මෙම නව විවාහයෙන් එම දෙපළට ලැබුන දූ දරුවන් අතර පුතුන් දෙදෙනෙකු විය. ඔවුන් නම් ගරුමුණි රොබට් ද සොයිසා මහතා සහ ගරුමුණි ආතර් ද සොයිසා යන දෙපළය. මොවුන් දෙදෙනාම මෙරට රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කළ මන්ත්‍රීවරු දෙදෙනෙකු විය. මේ දෙදෙනාගේම සොහොයුරියක වූ ගරුමුණි අනෝනා ද සොයිසා වික්‍රමරත්න මෙනවිය විවාහ වූයේ දිවේරිස් මෙන්ඩිස් මහතා සමඟය. මේ දෙපළට 1898 දී උපත ලද දරුවා එච්.ශ්‍රී නිශ්ශංක විය.

බළපිටිය ගරුමුණි වලව්වේදී උපන් නිශ්ශංක මහතා තම මෑණියන්ගේ පියාණන් විසින් අරඹන ලද ගරුමුණි වලවුව අසල පිහිටි බොදු මුසු පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා වැඩිදුර අධ්‍යාපනය උදෙසා ඇතුළත් වූයේ කොළඹ ආනන්ද විද්‍යාලයටය. එයින් පසු කොළඹ රාජකීය විද්‍යාලයෙන් ද අධ්‍යාපනය ලැබූ නිශ්ශංක මහතා සරසවි අධ්‍යාපනය සඳහා එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත් විය. මෙම විශ්වවිද්‍යාලයේදී ඔහුට සුවිශේෂී මිතුරෙක් වීමට සුදුසු ලාංකික සිසුවෙකු හමුවිය. ඔහු නම් දිවංගත අගමැතිවරයෙකු වන එස්. ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාය. සැදැහැවත් බෞද්ධ සිසුවෙකු වූ නිශ්ශංක මහතාට ක්‍රිස්තියානි බැතිමතෙකු වූ බණ්ඩාරනායක මහතා ඇසුරු කිරීමට කිසිම අපහසුවක් නොවීය. නිශ්ශංකයන්ගේ අදහස වූයේ කෙසේ හෝ ලංකාව අධිරාජ්‍යවාදින්ගෙන් නිදහස් කර සිංහල කමට බොදු කමට මුල්තැන දෙන රජයක් පිහිටුවීමය. ඔහු එංගලන්තයේ ඉගෙන ගන්නා අතර කල්පනා කළේ මෙම දේවල් පිළිබඳවය. එංගලන්තයේ සිට අධ්‍යාපනය නිමා කළේ නීතිවේදියෙකු වශයෙන් දිවුරුම් දීමෙනි. එසේ දිවුරුම් දුන් නිශ්ශංක මහතා 1922 වසරේදී එනම් මීට වසර එකුන් සියයකට පෙර ලංකාවට පැමිණ නීති වෘත්තියේ වැඩ කටයුතු ආරම්භ කළහ.

මගේ අශ්වයාට වඩා ඔබේ අශ්වයා ඉතා හොඳයි. උසස් වර්ගයේ එකෙක්. ඌ විකුණනවා නම් මට දෙන්න. මම ඔබට ඕනෑම මුදලක් දෙන්නම්. මට සල්ලි මිල මුදල් එපා. ඔබතුමා ඒ අශ්වයා මගෙන් ලැබුණ තෑග්ගක් විදියට ගන්න. එපා එපා මගේ අශ්වයා සමඟ ඔබ වටිනා මුදලක් ගන්න.

මෙම ජීවිතයට පෙර නිශ්ශංක මහතාට තවත් සුවිශේෂී ජීවිතයක් තිබුණි. ඒ ජීවිතය නම් කාලයක් ගත කළ පැවිදි ජීවිතයයි. ලක්දිව බුදු සසුන පොදු මහත් ජනතාවටම විවෘත කරමින් 1802 දී මෙරට අමරපුර භික්ෂු වංශය බළපිටිය මාදු නදියේ සිදුකළ මහා උපසම්පදාවත් සමඟ පිහිටු වූ පසු එම ප්‍රදේශයේ සෑම පවුලකින්ම දරුවෙකු සසුන්ගත කිරීම සුවිශේෂී කාරණයක් විය. ඒ අනුව දුගී පැල්පතේ සිට වලවු මන්දිර දක්වා පවුල්වල දරුවන් කිසිම භේදයකින් තොරව සසුනට ඇතුළත් විය. ගරුමුණි වලවුවට නෑ සබඳතා ඇති අය අතරින් ප්‍රථමයෙන් පැවිදි වූයේ මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද මා හිමියන්ය. එයින් දශක ගණනකට පසු නිශ්ශංක දරුවා පැවිදි විය. අතිපූජනීය අරංගල සිරි ධම්ම හිමියන් සෙවණේ පැවිදි වූ මෙම සාමණේරයන් වහන්සේ තමාගේ මවු පාර්ශ්වයේ ඥාති හිමි නමක් වූ රාජගුරු වැලිතර සිරි සුදස්සන උප සංඝරාජයාණන් වහන්සේගේ අවසරය මත එකල උන්වහන්සේගේ භාරයෙ තිබූ ගල්දූව තපෝවනයේ දුෂ්කර ජීවිතයක් ගෙවමින් භාවනා යෝගිව වැඩ සිටියහ. තම මවගේ මුත්තණුවන් විසින් සසුනට පිදූ මෙම පින්බිම තුළ වෙසෙන යුගයේ මෙම හිමියන්ට වැටහී ගියේ මෙම පැවිදි දිවියෙන් තමා සසරෙන් ගැලවී ගියත් තවත් විශාල ප්‍රමාණයක් සසර සයුරට වැදී දුක් විඳින බවය. තවත් අතකින් ඉංග්‍රීසින්ට යටත්ව තිබෙන මෙම යුගයේ පැවදිව සිටිමින් ඇති වී ඇති දුර්භාග්‍ය සමයෙන් ශාසනය රැක ගැනීමට භාවනා යෝගිව සිටින පැවිදි අයෙකුට කළ හැකි කාර්ය අල්ප බවයි. මේ සඳහා ගිහි සමාජයට ඇතුළත්ව සමාජයේ උසස් තැනකට පැමිණ අරගලයක යෙදිය යුතු බව සිතට දැනුනි. තම මවට අයත් අක්කර සිය ගණනක දේපළ පසෙකට දමා පැවිදි වූ මේ හිමියෝ යළි උපැවිදි වී එංගලන්තයට ගොස් නීතිය හදාරා පැමිණ කොළඹ නගරයෙ ගොඩනැගූ යමුනා නිවසේ පදිංචි වූයේ බෞද්ධ නායකයෙකු වශයෙන් හා සුවිශේෂී දක්ෂතා ඇති නීතිවේදියෙකු ලෙස නමක් දිනා ගනිමිනි.

දිනක් අශ්වයෙකු පිට නැගී ගාලු මුවදොර පිටියේ ගමන් කරන විට ඒ අසලට තවත් අයකු සිට නැගී පැමිණි පුද්ගලයා නිශ්ශංක මහතාගේ අශ්වයා නිරීක්ෂණය කර මේ අශ්වයා කාගෙදැයි විමසීය. මේ සතා අද්වකාත් නිශ්ශංකගේ යැයි ඔහු කීය. ඔහු හමුවෙන්නට හැකි දැයි අසරුවා ඇසීය. පුළුවන් සවසට ගෙදරට එන්න යැයි නිශ්ශංක මහතා කීය. ප්‍රශ්න කළ තැනැත්තා නිශ්ශංක මහතා ගැන අසා තිබුණත් දැන හඳුනාගෙන සිටියේ නැත. සවස නිශ්ශංක මහතා සොයාගෙන ඔහුගේ නිවසට අර අමුත්තා පැමිණියේය. ඒ වන විට නිශ්ශංක මහතා සිටියේ තම ගෙවත්තේ වෙනත් වැඩක යෙදීය.

“ළමයෝ අද්වකාත් මහතා සිටිනවා ද?“ ඔහු ඇසීය.

‘ඔව් ඉන්නවා. එනකං ගිහින් වාඩිවෙන්න“ නිශ්ශංක මහතා කීවේය.

ඇඟපත සෝදාගෙන නිශ්ශංක මහතා පැමිණියේය. අමුත්තා පුදුම විය. උදේ හමු වූ පුද්ගලයාත් වත්තෙ වැඩ කළ පුද්ගලයාත් දැන් තමා ඉදිරියේ සිටින පුද්ගලයාත් තිදෙනෙකු නොව එක් අයෙකු බවත් ඔහු තමා නොදැක සිටි නමින් හඳුනන නිශ්ශංක අද්වකාත් මහතා බව ඔහු වටහාගත්තේය.

මම මහමුදලි සොලමන්ස් ඩයස් බණ්ඩාරනායක ඔහු කීය. ඔව් මම දන්නවා. ඔබගේ පුතත් මමත් එකට ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙ ඉගෙන ගත්තෙ. මම ඒකත් දන්නවා. නමුත් මම මීට පෙර ඔබ දැකල තිබුණෙ නැහැ. මහ මුදලි තුමා කීහ. මා ආවෙ ඔබෙන් ලොකු උදවුවක් ඉල්ලගෙන. මගේ අශ්වයාට වඩා ඔබේ අශ්වයා ඉතා හොඳයි. උසස් වර්ගයේ එකෙක්. ඌ විකුණනවා නම් මට දෙන්න. මම ඔබට ඕනෑම මුදලක් දෙන්නම්. මට සල්ලි මිල මුදල් එපා. ඔබතුමා ඒ අශ්වයා මගෙන් ලැබුණ තෑග්ගක් විදියට ගන්න. එපා එපා මගේ අශ්වයා සමඟ ඔබ වටිනා මුදලක් ගන්න. නැහැ නැහැ මට එපා. මට ඔය වර්ගයේ අශ්වයො කිහිපදෙනෙක් ඉන්නවා. අපේ බළපිටියෙ ගරුමුණි වලවුවෙත් ඉන්නවා, නිශ්ශංක මහතා කීවේය. තමාගේ අසරුවකු සමඟ මහමුදලිවරයාගේ නිවසට අශ්වයා යැවීමට නිශ්ශංක මහතා පියවර ගත්තේය.

මෙවැනි රසවත් කතා රාශියක් නිශ්ශංක මහතා වටා ගෙතී ඇත. තම මවගේ සහෝදරයා වූ ගරුමුණි රොබට් ද සොයිසා 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට තරග කරන විට ඔහු බළපිටියට පැමිණ උදවු කළේය. නමුත් එම මැතිවරණයේදීම ගාල්ලට තරග කළ ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා සමග තරග වැදී සිටි තම ඥාතියෙකු වූ රාජ නීතිඥ ප්‍රැන්සිස් ද සොයිසාට උදවු නොකර ඔහු උදවු කළේ කන්නන්ගර මහතා දිනවීමටය.

1946 සැප්තැම්බර් 06 වෙනි දින ඩී.ඇස්.සේනානායක මහතා එක්සත් ජාතික පක්ෂය පිහිටුවන විට තම මාමා වූ ගරුමුණි ආතර් ද සොයිසා මහතා තම බෑනා වූ එච්.ශ්‍රී නිශ්ශංක මහතාට ද එයට එක් වන ලෙස ඇරයුම් කළහ. තමාගේ මිතුරා වූ බණ්ඩාරනායක මහතා ද නිශ්ශංක මහතාට ආරාධනා කළත් ඔහුවත් ඔහුගේ එවකට තිබූ දේශපාලන සංවිධානය වූ උඩරට සමාජවාදි පෙරමුණවත් එක්සත් ජාතික පක්ෂයට එකතු වූයේ නැත. ආරම්භක එක්සත් ජාතික පක්ෂයේ 125 වෙනි සාමාජිකයා වූයේ තමාගේ මවගේ සොහොයුරා වූ බළපිටිය හිටපු රාජ්‍ය මන්ත්‍රී ආතර් ද සොයිසා මහතාය. නමුත් නිශ්ශංක මහතා ආරම්භයේ සිටම අංක එකේ එ.ජා.ප විරෝධියෙකු විය.

1947 මහ මැතිවරණයේදී බළපිටිය අම්බලන්ගොඩ බහු මන්ත්‍රී ආසනය සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් තරග වැදුනේ ගරුමුණි ආතර් ද සොයිසා මහතාය. එච්. ශ්‍රී නිශ්ශංක මහතා එම මැතිවරණයට ඉදිරිපත් වූයේ කුරුණෑගල මැතිවරණ කොට්ඨාසයට එ.ජා.ප. විරෝධි නිදහස් අපේක්ෂකයෙකු ලෙසය. මෙම මැතිවරණයෙන් කුරුණෑගල ආසනය දිනාගෙන මැති සබයට පැමිණීමට එච්. ශ්‍රී නිශ්ශංක මහතාට හැකි විය. බළපිටිය අම්බලන්ගොඩ බහු මැතිවරණ කොට්ඨාසයේ දෙවෙනි මන්ත්‍රීවරයා වශයෙන් නිශ්ශංක මහතාගේ මාමා වූ ගරුමුණි ආතර් ද සොයිසා මහතා මැති සබයට පැමිණියේ ගාලු දිස්ත්‍රික්කයෙන් මැති සබයට පැමිණි එක්සත් ජාතික පක්ෂයේ එකම මන්ත්‍රීවරයාත් ප්‍රථම මන්ත්‍රීවරයාත් වශයෙන් වාර්තාවක් තබමිනි. ඊට අමතරව නිශ්ශංක මහතාත් ආතර් ද සොයිසා මහතාත් එම මැති සබයේ තවත් වාර්තාවක් තැබුවේය. එම වාර්තාව නම් මැති සබය නියෝජනය කළ මාමාත් බෑනාත් වශයෙනි.

1947 මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට රජයක් පිහිටුවීමට ඉඩකඩ නොතබා සමාජවාදි රජයක් පිහිටුවීම සැලසුම් කිරීම එච්. ශ්‍රී නිශ්ශංක මහතා අතින් සිදු විය. ඒ අනුව නිශ්ශංක මහතාගේ කොළඹ පිහිටි “යමුනා” නිවසට කැඳ වූ වාමාංශික පිරිස් ඇතුළු ස්වාධීන මන්ත්‍රීවරු බණ්ඩාරනායක මහතා අගමැති කිරීමට පිඹුරුපත් සැකසුව ද මේ වන විට එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත්ව අත්තනගල්ල මැතිවරණ කොට්ඨාසය දිනා මැති සබයට පැමිණ සිටි බණ්ඩාරනායක මහතා ඒ ඉල්ලීම කාරුණිකව ප්‍රතික්ෂේප කළේ අගමැතිවරයා වශයෙන් ඩී.ඇස්.සේනානායක මහතාගේ නායකත්වය පිළිගනිමිනි.

1951 වසර වන විට රජය සමඟ මතභේද ඇතිකරගත් බණ්ඩාරනායක මහතා රජයෙනුත් එක්සත් ජාතික පක්ෂයෙනුත් ඉල්ලා අස්වී විපක්ෂයේ අසුන්ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ සිටි ඩී.ඒ.රාජපක්ෂ මන්ත්‍රීවරයා සමඟිනි. බණ්ඩාරනායක මහතාගේ නව පෙරළියත් සමඟ ඒ ගැන වඩාත් සතුටු වූයේ එච්.ශ්‍රී නිශ්ශංක මහතාය.

ඔහු නව පක්ෂයක් පිහිටුවීම සඳහා දමා තිබුණු අඩිතාලම බණ්ඩාරනායක මහතාට පැහැදිලි කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1951 වසරේ සැප්තැම්බර් 04 වෙනි දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දොරට වැඩියේ සඟ,වෙද,ගුරු,ගොවි කම්කරු යන පංච මහා බලවේගයේ පෙර ගමන්කරුවා ලෙසය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ එච්.ශ්‍රී නිශ්ශංක මහතාටය. පක්ෂයේ නමත්, වර්ණයත්, සළකුණත් එච්. ශ්‍රී නිශ්ශංක මහතාගේය. බෞද්ධ නායකයෙකු වූ නිශ්ශංක මහතා පක්ෂයට වර්ණය යොදා ගැනීමේ දී නිල්පාට තෝරා ගත්තේ එය බෞද්ධ ධජයේ තිබෙන ප්‍රථම වර්ණයත් ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ වර්ණයත් නිල්පාට නිසාය. පක්ෂයේ ලකුණට ‘අත’ යොදා ගත්තේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී හස්තය සිහිපත් කරගෙනය. තමාගේ නමට තිබෙන ශ්‍රී අකුර පක්ෂයේ මුල් අක්ෂරය ලෙස යොදා ගනිමින් ඔහු සිය පක්ෂය නිර්මාණය කර ගත්හ. බණ්ඩාරනායක මහතාට තිබුණේ මෙම නිර්මිත පක්ෂයේ නායකත්වය භාර ගැනීම පමණි. එච්.ශ්‍රී නිශ්ශංකගේ නව දේශපාලන පක්ෂයට තමාගේ උපන් නිවස වූ බළපිටිය ගරුමුණි වලවුවේ ඥාතීන් කිසිවෙක් සම්බන්ධ වූයේ නැත. බළපිටියේ එ.ජා.ප මූලස්ථානය වූයේ ශ්‍රී.ල.නි.ප ය නිර්මාණය කළ එච්. ශ්‍රී නිශ්ශංක මහතාගේ මහා ගෙදරය.

1952 වසරේ පැවැති මහ මැතිවරණයට නිශ්ශංක මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් කුරුණෑගලට ඡන්දය ඉල්ලූ අතර නිශ්ශංක මහතාගේ මෑණියන්ගේ සහෝදරියගේ පුතා වූ අධිනීතිඥ ඉයන් ද සොයිසා මහතා බළපිටියට එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් විය. මෙම මැතිවරණයෙන් නිශ්ශංක මහතා පරාජය වුව ද ඥාති සහෝදරයා වූ ඉයන් ද සොයිසා මහතා බළපිටිය මන්ත්‍රීවරයා වශයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මැති සබයට ආහ.

කොළඹ මහ නගර සභාවේ වැල්ලවත්ත ප්‍රදේශයේ නාගරික මන්ත්‍රීවරයා වශයෙන් නිතරඟයෙන් පත්ව කොළඹ නගර සභාව නියෝජනය කළ නිශ්ශංක මහතා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ධුරය ද දැරුවේය. තම මෑණියන්ගේ මුත්තණුවන් වූ ආදිරිස් ද සොයිසා ගුණවර්ධන බොදු උවසුවා මෙන් නිශ්ශංක මහතා ද මෙරට ශාසනික ඉතිහාසයේ වටිනාම සේවයක් සැලසූ බෞද්ධ නායකයෙයකු ලෙස සල්ගල ආරණ්‍ය සේනාසනය නඟා සිටුවා වැඩි දියුණු කළේ බෝසත් උතුමෙකු ලෙසය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දොරට වැඩියේ සඟ,වෙද,ගුරු,ගොවි කම්කරු යන පංච මහා බලවේගයේ පෙර ගමන්කරුවා ලෙසය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ එච්.ශ්‍රී නිශ්ශංක මහතාටය. පක්ෂයේ නමත්, වර්ණයත්, සළකුණත් එච්. ශ්‍රී නිශ්ශංක මහතාගේය.

1947 දී පාර්ලිමේන්තුවේ කථානායක පදවියට ද තරග වැදුන මෙතුමා පරාජයට පත්වූවත් නිශ්ශංක මහතාගේ කීර්තිය යශෝරාවය මේ වනතුරු පරාජයට පත් වී නැත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඇම්.පී. ද සොයිසා, සී.පී.ද සිල්වා වැනි නායකයන් හඳුන්වා දී ඔවුන්ට පක්ෂයේ මුදුනටම පැමිණීමට අඩිතාලම දැමුවේ නිශ්ශංක මහතා විසිනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක නියෝජ්‍ය නායකයාවූ එච්. ශ්‍රී නිශ්ශංක මහතා අගමැති ඩඩ්ලි සේනානායක මහතාගේ ළඟම හිතවතෙකු විය. සල්ගල ආරණ්‍යයේ සියලු කටයුතුවලට ඩඩ්ලිගේ සහය ලබා ගත්තේ සහෝදර ප්‍රේමයෙනි.

නිශ්ශංක මහතා ආරම්භ කළ උඩරට සමාජවාදී පෙරමුණට එක් වූ තරුණයෙකු වූ දි.මු.ජයරත්න මහතාට මෙරට අගමැති වීමට තරම් වාසනාව හිමි විය. එම සංවිධානයේ සාමාජිකයෙකු වූ ටී.බී.ඉලංගරත්න මහතා කීර්තිමත් දේශපාලකයෙකු විය. තමාගේ ගම් පළාතේ උපන් සී.පී.ද සිල්වා මහතා බණ්ඩාරනායක මහතාගෙන් පසු පක්ෂයේ නායකයා විය. (ශ්‍රී.ල.නි. පය අද එය අකාමකා දමා ඇත.) එම්.පී.ද සොයිසා මහතා පක්ෂ ලේකම් වශයෙන් ද ක්‍රියා කළේය. පහතරට ධනපති වලවු පරපුරක උපත ලබා සමාජවාදය වෙනුවෙන් කැපවුන මේ ශ්‍රේෂ්ඨ දේශපාලකයා 1954 පෙබරවාරි මස 26 වෙනි දින දැයෙන් සමුගත්තේ සිරිලක ශ්‍රී සම්බුද්ධ ශාසනයත් දේශපාලනයත් පවතින තුරු අමතක නොවන ශ්‍රී නාමයක් ඉතිරි කරමිනි.



අහුන්ගල්ලේ දේ. සූ. ද සොයිසා

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ නැනිම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

# බස්නාහිර පළාත දකුණ 02 - 2021 මාර්තු මාසය

## අවිස්සාවේල්ල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### අවිස්සාවේල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 08.00 - 17.00
තොග : රෝයල් ෆාර්ම් වුඩ්
බෙදාහැරීම් : බොල්ලතාව, කහව හංදිය, කනම්පැල්ල වත්ත, ලැවෙන්ඩා පාර්ක්, මීගහවත්ත, වැරැල්ලමන්ඩිය

2021-03-19 08.00 - 17.00
තොග : ටෙක්ස්ටර්ඩ් ජර්සි නේවාසිකාගාරය
බෙදාහැරීම් : වෙරලුපිටිය

2021-03-20 08.00 - 17.00
තොග : පුස්සැල්ල ෆාර්ම්, පුස්සැල්ල ෆාර්ම් - නව, සීලන්ඩ් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම
බෙදාහැරීම් : බාලිකාව පාර, හැඩවත්ත - කොස්ගම, කොස්ගම ලංවිම

2021-03-24 08.00 - 17.00
තොග : අවිස්සාවේල්ල ටෙලිකොම්, පෙත්රිත්, පෙත්රිත් ජල පොම්පය
බෙදාහැරීම් : හොනිටන්, උක්වත්ත

2021-03-26 08.00 - 17.00
තොග : හමුදා කඳවුර - කොස්ගම, අතුල පරණයාපා, ඇතුල් පරණයාපා, ශාලාව හමුදා කඳවුර, ශාලාව හමුදා කඳවුර II, වෝටර් ඉන්ටේක් - කහටපිටිය, ජල පිරිපහදුව - කොස්ගම
තොග සහ බෙදාහැරීම් : ටෙලිකොම් - කොස්ගම
බෙදාහැරීම් : අකරවිට, ආනන්දගම, බෙනවල, බොරලුගහලන්ද, මීවිත උයන, ශාලාව සාප්පු සංකීර්ණය - හමුදා කඳවුර

### හංවැල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-12 08.00 - 17.00
තොග : ඇග්‍රි ලෙශර්
බෙදාහැරීම් : බ්‍රැන්ඩිගම්පොල, එළමලවල, කහහේන - රිද්මා, කහහේන නව, කටුකලවිල, කිරිවන, පැල්පොල, වැලිකන්න - ළහිරුගම, වැලිකන්න - පැරණි, වැලිකන්න නගරය - නව

2021-03-14 08.00 - 17.00
තොග : ඒ.වී.එස්.ඉම්පෝර්ට්ස් - ආටිගල, ඒ සී එම් අයි ලංකා, ඇමරිකන් ප්‍රිමියම්, කාගිල්ස් - හංවැල්ල, දිනූෂා ලී මෝල, ග්‍රේට් සිලෙක්ෂන්, එම්.එස්.පී.පෙරේරා, නවගමුව ස්ටෙස්පෝ නව (2), ඕලේ ස්ප්‍රින් - නව (පෙප්සි), ඕලේ ස්ප්‍රින්ග් (පෙප්සි), පෙරේරා, රන්සර ගල් මෝල, එස්.ඩී.වී.එස් ජයසුන්දර, ටෙක්ස්ප්‍රෝ, වරුණ බේවරේජස්
බෙදාහැරීම් : ආටිගල නව, බයිපාස් රෝඩ්, ඇඹුල්ගම ආර්.ඊ, හංවැල්ල පිරවුම් හල, හංවැල්ල නගරය, හංවැල්ල නගරය - පිරවුම් හල අසල, හංවැල්ල නගරය නව, හංවැල්ල නගරය අංක 02 - පහත්ගම පාර, ජයවීරගොඩ, එන් ඩී බී හංවැල්ල, නිපෝන් ලංකා, පහල හංවැල්ල, පහත්ගම, ප්‍රයිම් ලෑන්ඩ් (ජයවීරගොඩ)

2021-03-15 08.00 - 17.00
තොගබෙදාහැරීම් : බොරලුවතැන්න, ඉරිදපොල, කෙළිමඩල හංදිය, මාවරගොඩැල්ල (හීනැලිබොඩ), මොරකැලේ නව, ප්‍රීමා - වග

2021-03-17 08.00 - 17.00
තොග : අම්බලම ලෙශර් ලොන්ජ්, හමුදා කඳවුර - ලව්කෙවෙල, බඹර සන්සොනි එක්ස්පෝර්ට්, දිද්දෙනිය ලී මෝල, හංවැල්ල රබර් නිෂ්පාදන, ලෙශර් වර්ල්ඩ්, එම්.එච්.එම්.මුනවර (ලාෆ් සුපර්), පුෂ්පික ගල් මෝල, කොලිටි ලේටෙක්ස් - හංවැල්ල වත්ත, රෙබ් මෙක්, එස් එම් එස්, ශාන්ත මරියාමාවත - රබර් කර්මාන්තශාලාව, වේවැල්පතාව ෆාර්ම්
තොග සහ බෙදාහැරීම් : ෆේවරිට් ගාර්මන්ට්, හල්ගස් හේන පැරණි - යහපත් එඬේරා
බෙදාහැරීම් : බෝයිස් ටවුන් - තිරිපොල, දිද්දෙනිය - බදුවත්ත, දිද්දෙනිය නව, දිද්දෙනිය පංසල, කහටපිටිය පැරණි, කහටපිටිය නව, කහටපිටිය පාසල (ප්ලයිවුඩ්), කලුඅග්ගල - නව, කලුඅග්ගල - පැරණි, කේ.වී.සී - සුදුවැල්ල, මාවල්ගම - බොරලුගොඩ, තිරිපොල -සමූපකාරය, පහත්ගම නගරය, රත්නවර්ධන, ශාලාව වත්ත, සුදුවැල්ල, වනහගොඩ

2021-03-18 08.00 - 17.00
තොග : ආටිගල ප්ලාස්ටික්, ලංකා ඩෙකල්ස්, මැක්ස් බේවරේජ් (පුද්) සමාගම, සචිකෝ ඉන්ටර්නැෂනල්, සිතුමිණ - ජයසුන්දර
බෙදාහැරීම් : ආටිගල - විල උඩ, බටවල, සිටි ඔෆ් වෙස්ට් - ජල්තර, හිඹුටුමුල්ල (පාතලුව), ලව්පිටිය, නිව් ලීෆ්, ප්‍රයිම් හෝම්ස්

2021-03-21 08.00 - 17.00
තොග : ඇක්සස් ඉංජිනියරින්, සී බී එල් ෆුඩ්ස්, සෙරම්කෝ මිනරල්ස්, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් (ලුම්බිණි වත්ත), ඩෙව් ලංකා - ටෙක් ස්ට්‍රීම්, එලිෆන්ට් හවුස්, එලිෆන්ට් හවුස් - අයිස් ක්‍රීම්, ගාමිණී ෆැෂන්, ගාමිණී ලී බඩු, ජිනදස ගාර්මන්ට්, කොඩිකාර ගල් මෝල, ලොකුපිටිය ගල් මෝල, ඔස්ප්‍රේ III, ඔස්ප්‍රේ ක්ලෝතින්, පීසා ක්‍රාෆ්ට් ලංකා (පුද්) සමාගම, කොලිටි පැක් ලංකා - නවගමුව, එස් එම් එස්, ස්ටාර් පැකේජින්ග්, සුපර් ඇපරල්ස් - රනාල, වෙන්චර්ස් එන්ටප්‍රයිසස්, වයි.ජී.ඒ.පෙරේරා
තොග සහ බෙදාහැරීම් : සිං ලංකා
බෙදාහැරීම් : බටේවෙල - එලිෆන්ට් හවුස් අසල, දැඩිගමුව, එලිෆන්ට් හවුස්, ඇඹිල්ලදෙනිය, ජල්තර හංදිය, කුරුඳුවත්ත, ලක්සිරි ගාර්ඩන්, නවගමුව සුපර් සිටි, එලිෆන්ට් හවුස් අසල, සරසවි නවගමුව, සියඹලගහ හංදිය - රනාල, තලපිටිය - උඳුගොඩ, ටොරින්ටන් සිටි, උඳුගොඩ ලෑන්ඩ් සේල්, යශෝදරා මාවත

2021-03-23 08.00 - 17.00
තොග : අක්ෆා සෝල් ඉන්ඩස්ට්‍රීස් - ජල්තර, සෙන්ට්‍රි මැකැනිකල් සිස්ටම්, ජල්තර නිවාස - සවරේජ්, ජල්තර, ලංකා ටයිල්, ලංකා ටයිල් නව, මල් ලංකා, නුවුරෝ මීට් ප්‍රඩක්ට්ස්
බෙදාහැරීම් : දීගල්ල වත්ත, එච්.ටී.පී - ජල්තර, ජල්තර නිවාස සංකීර්ණය 1, ජල්තර නිවාස සංකීර්ණය 2, ජල්තර නිවාස සංකීර්ණය 3, තෙම්කො - ජල්තර - සමූපකාරය

2021-03-25 08.00 - 17.00
තොගබෙදාහැරීම් : කුඩලුවිල

2021-03-27 08.00 - 17.00
තොග : ක්‍රෙව් මික්ස්, අල්ට්‍රා ටෙක්ස්ටයිල් ප්‍රින්ටින්ග්
බෙදාහැරීම් : වල්පිට සමූපකාරය

### පාදුක්ක පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 08.00 - 17.00
තොග : මිද්‍යා පැකේජින්ග්, උපාලි ජයසූරිය
බෙදාහැරීම් : ආයුර්වේද රෝහල

2021-03-16 08.00 - 17.00
තොග : ඇක්සස් නැචුරල් වෝටර්, චතුරංග රබර් මෝල, පුස්සැල්ල ෆාර්ම් - බෝපේ
බෙදාහැරීම් : අයර් වත්ත, ගුරුලන්ද, මඩකඩ, මෙනේරිගම, රූපවාහිණී - හිඟුරල කන්ද, උඩගම ආර්.ඊ., උඩගම නව, වෝටර් මාර්ට්, වේවැල්කැටිය නව

2021-03-20 08.00 - 17.00
තොග : වීෆ්වේ ගාර්මන්ට්, ලක්ෂ්මන් ගල් මෝල, ව්.ම්.ආර්.සී.ප්‍රියන්ත, තිලාරෝ හොටෙල්
බෙදාහැරීම් : දම්පෙ නව (දෙහිගහවිට), දම්පෙ ආර්.ඊ, ඩයමන්ඩ් සිටි, ගල්කන්ද - මීගොඩ, බටහිර හොරගල, මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය, ට්‍රස්ට් ලංකා ලෑන්ඩ්, උඩගෙවත්ත, වෙරලුපාගොඩ

2021-03-22 08.00 - 17.00
තොග : සැටර්ලයිට්
බෙදාහැරීම් : වර්ක්ෂොප්

2021-03-23 08.00 - 17.00
තොග : ජිනේෂා ගාර්මන්ට්, ස්පෙන්සා ඩෙනිම්
බෙදාහැරීම් : පහල පාදුක්ක

2021-03-25 08.00 - 17.00
තොග : ඊස්තටික් ඉන්ස්ටිටියුට්, සෙරමික් කෝපරේෂන්, එල්.එච්.පියසේන කම්පැනි, ලංකා වෝල් ටයිල්, අම්.ආර්.සී.ගාර්මන්ට්, මෙට්ල් මික්ස් මීපේ, ප්‍රේමා ගල් මෝල, සුකී ඩයරි ෆුඩ්, සර්ටෙක්ස් ඉන්ඩස්ට්‍රීස්
තොග සහ බෙදාහැරීම් : සිලෝන් රබර් ප්‍රඩක්ට්ස්
බෙදාහැරීම් : මාවතගම, මාවතගම නව, මීපේ වී.සී, තුන්නාන ආර්.ඊ, තුන්නාන පංසල

2021-03-26 08.00 - 17.00
තොග : මිද්‍යා පැකේජින්ග්, උපාලි ජයසූරිය
බෙදාහැරීම් : ආයුර්වේද රෝහල

2021-03-27 08.00 - 17.00
තොග : බී.ඩී.එන්.රබර් ෆැක්ටරි
බෙදාහැරීම් : අංගමුව ප්‍රයිම් ලෑන්ඩ්, මීරියගල්ල, පාදුක්ක වත්ත, වේරගල වත්ත

## බණ්ඩාරගම විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### බණ්ඩාරගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-12 08.00 - 17.00
තොග : පොලිමර් ප්‍රඩක්ට්
බෙදාහැරීම් : ලෙස්ලි ගුණවර්ධන මාවත, තිව්ඩාව, ඔන්චියාවත්ත, පුලුන්ගල හංදිය

2021-03-15 08.00 - 17.00
තොග : ප්‍රශාන්ති හෝල්
තොග සහ බෙදාහැරීම් : වික්‍රම රබර් මෝල - කුඹුක, විජය ලංකා ස්පෝර්ට්ස් වෙයර් ගාර්මන්ට් ෆැක්ටරි
බෙදාහැරීම් : ජෙෆ් කම්පැනි, කුඹුක I, කුඹුක II, සෝමාලියාවත්ත, වනමීකන්ද - කුඹුකවත්ත

2021-03-16 08.00 - 17.00
තොග : බණ්ඩාරගම රෝහල, කාගිල්ස්, කාගිල්ස් නව, දර්ශන, දන්සින් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම, ෆ්ලෙක්සි කෙයාර්, ගන්ධාරි ගාර්මන්ට්, එච්.එන්.බී. - බණ්ඩාරගම, අයි සී සී (පුද්) සමාගම, ඉන්දු ලංකා, කීල්ස් - බණ්ඩාරගම, නිරෝමි ෆැෂන්, පින්නගොඩ විතාන, රැජ්කෝ උයන්වත්ත (ජේ එල්), දක්ෂිණ අධිවේගී මාර්ගය - වම් පස , දක්ෂිණ අධිවේගී මාර්ගය - දකුණු පස, ටෙලිකොම් - බණ්ඩාරගම
තොග සහ බෙදාහැරීම් : මොගාමො ලංකා
බෙදාහැරීම් : බණ්ඩාරගම රෝහල් උපපොල, බණ්ඩාරගම නගරය, දෙල්ගස් වත්ත, කැලේකඩේ හංදිය, කොට්ටේගොඩ, ලේක් සිටි, මස්විල I, එන්.එස්.බී. බණ්ඩාරගම, රයිගම නව, රඹුක්කන II, රඹුක්කන උපපොල, සුපර් මාර්කට් බණ්ඩාරගම, උයන්වත්ත, උයන්වත්ත ලෑන්ඩ්

2021-03-17 08.00 - 17.00
තොග : රතුවිතාන, සචිත්‍ර මෙඩි කෙයර්
බෙදාහැරීම් : අරලියගස් හංදිය, ඇටඹගහහේන නව, ඇටඹහේන, ගැලනිගම, අයි.වී.ට්‍රාස්, නාගස් හංදිය - කුඹුක, නිව් සිටි, නිව් සිටි II - බොරලුකැටිය පාර, පිටවිල කාරියවසම්, රේරුකාන , රේරුකාන නව

2021-03-19 08.00 - 17.00
තොග : තිස්ස ජයසිංහ ඇසෝසියේට්ස්
බෙදාහැරීම් : බෙල්ලන්තුඩාව ගැමුණු මාවත, කුරුඳුවත්ත ගැමුණු මාවත, කුරුඳුවත්ත නව, පතහවත්ත පංසල, රයිගම

2021-03-24 08.00 - 17.00
තොග : චයිනා හාබර් - වල්ගම, ඩේවිඩ් පීරිස් - වල්ගම, ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම, ප්‍රශාන්ති හෝල්, වෙල්ත් ෆැෂන්
තොග සහ බෙදාහැරීම් : වික්‍රම රබර් මෝල - කුඹුක, විජය ලංකා ස්පෝර්ට්ස් වෙයර් ගාර්මන්ට් ෆැක්ටරි
බෙදාහැරීම් : බද්දේගොඩ, බටපොත, බෙත්මගොඩ, හේන්ගොඩ, ජෙෆ් කම්පැනි, කනත්තගොඩ ජයදදගම, කනත්තගොඩ නව, කුඹුක II, සෝමාලියාවත්ත, වල්ගම කනත්ත, වනමීකන්ද - කුඹුකවත්ත, වීදගම ලෝකපිල, වීදියගොඩ, වැව පාර

2021-03-29 08.00 - 17.00
තොග :පානදුරුඋපපොල

### මිල්ලනිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-18 08.00 - 17.00
තොග : රන් මාර්ට්, ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම
තොග සහ බෙදාහැරීම් : මැලෑගම (මැස්ටිය)
බෙදාහැරීම් : හබරගහලන්ද, කන්ද උඩ - මැලෑගම, මහරුක්ම සුසාන භූමිය, මැස්ටිය පංසල

## හෝමාගම විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### හෝමාගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 08.00 - 17.00
තොග : කාගිල්ස් - මනතුංග මාවත, ගීකියාන, හෙන්රි සහ සමාගම (රොබින් මෙට්ල්), මහින්ද රාජපක්ෂ විද්‍යාලය, මොරිසන්ස්, නැනෝ පාර්ක් - හමුදා කඳවුර, නැනෝ පුද්ගලික සමාගම (ලාෆ්ස්), ජාතික මිනුම් විද්‍යාගාරය, එන් එස් බී එම් මාහේනවත්ත, එස් එල් ටී කැම්පස්, තාක්ෂණ පූර්ව ලියාපදිංචි තක්සේරු කිරීම, යු ඕ එස් ජේ නේවාසිකාගාරය, යු ඕ එස් ජේ තොරතුරු තාක්ෂණ පීඨය
තොග සහ බෙදාහැරීම් : තමෝ ප්ලාස්ටික්, උණපඳුර හන්දිය
බෙදාහැරීම් : ගැමුණු මාවත - පන්කොටුවා, මාහේනවත්ත - ගොඩහේන පාර, මනතුංග මාවත, මිලේනියම්, මොබිටෙල් - වැකන්ද පාර, වලව්ව හන්දිය, වැකන්ද පාර (විමාන)

2021-03-15 08.00 - 17.00
තොග : ලක්ෂපාණ බැටරි, සෙලාන් බැංකුව
තොග සහ බෙදාහැරීම් : කාර්මික විද්‍යාලය
බෙදාහැරීම් : ගොඩගම ටෙක්ස්ටයිල්

2021-03-16 08.00 - 17.00
තොග : ඩීප්ඩ් ප්‍රොඩක්ට්, හයිකෙම්, හිරිපිටිය, මොනා ප්ලාස්ටික්, නියෝප්‍රෙක්ස්, රයිගම් සෝයා, රෙබ් මෙක්, සෙනෙවි රබර් මෝල
බෙදාහැරීම් : බැන්කන් වත්ත, බ්‍රාහ්මනගම, දීපන්ගොඩ, දෙලේකඩේ හන්දිය, දෙලේකඩේ නව, ගංගානි ලෑන්ඩ්, හිරිපිටිය, ජම්බෝලගස්වත්ත, ජයගත් මාවත - බ්‍රාහ්මනගම, කැන්දකැටිය, කිරිවත්තුඩුව, කිතුලවිල පාර, කොස්වත්ත, මුණමලේවත්ත, ස්කයි පාර්ක් 2, තෝරමුල්ල, යකහලුව

2021-03-27 08.00 - 17.00
තොග : ජනතා ෆිනෑන්ස්
බෙදාහැරීම් : සුමනසේකර පුර, තුරුලිය උයන, වැලිපිල්ලෑව 11

2021-03-30 08.00 - 17.00
තොග : ඩීප්ඩ් ප්‍රොඩක්ට්, හයිකෙම්, හිරිපිටිය, නියෝප්‍රෙක්ස්
බෙදාහැරීම් : බ්‍රාහ්මනගම, දීපන්ගොඩ, දෙලේකඩේ හන්දිය, දෙලේකඩේ නව, හිරිපිටිය, ජම්බෝලගස්වත්ත, ජයගත් මාවත - බ්‍රාහ්මනගම

### පන්නිපිටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-12 08.00 - 17.00
තොග : කාර්ගිල්ස් - පාසල් හංදිය හෝකන්දර, කැටකැඩැල්ලගහ වත්ත, රණසිරි ප්ලාස්ටික්, එස්.පී.අයි.මල්වත්ත, සතොස ගොඩනැගිල්ල
බෙදාහැරීම් : අමුඇටමුල්ල පාර, බිග් සිටි (බාලිකා නිවාස), දක්ෂිණ මාවත (මල්වත්ත පාර), දැඩිගම ජුවලර්ස්, ගල උඩ පන්සල, හතරමන් හංදිය, හෝම් මේකර්ස්, කේ.එස්.ආර්.ස්ටුඩියෝ, කැන්වින් සිටි, කටුකුරුන්ද, කුලසෙවන පාර, මල්වත්ත - කුඩාදෙනිය, මල්වත්ත පාර, නිව් සිටි, නුගේමුල්ල, පනුගල්හේන, පස්මංහංදිය, පොම්පාගාරය, සමගි මාවත- කටුකුරුන්ද, තුෂාර මාවත, වැඩිහිටි නිවාස

2021-03-13 08.00 - 17.00
තොගබෙදාහැරීම් : මැදගොඩලන්ද

2021-03-16 08.00 - 17.00
තොග : ආර්පිකෝ සුපර් ස්ටෝර්ස්,මාකුඹුර, සියෙම් කමඩිටීස්, දිලීප වික්‍රමසිංහ, ග්ලෝමාර්ක් සොෆ්ට්ලොජික්, ජේ.එස්.පී.ස්ටීල්.පුද්ගලික සමාගම, කොට්ටාව කේ.එෆ්.සී., ලංකා සෙරමික්, ලක්ස් නිවාස ව්‍යාපෘතිය, මල්ටි මොඩ්ල් සෙන්ටර් - මාකුඹුර, නීරෝ ලංකා, වික්‍රම හාර්ඩ්වෙයාර්
තොග සහ බෙදාහැරීම් : කොට්ටාව පොම්පාගාරය, ලංකා ස්පයිස් කො.
බෙදාහැරීම් : හිරිපිටිය, කුලතුංග මාවත, ලංකා ස්පයිස් අසල, ලංකා ස්පයිසි කම්පැනි අසල, නිදහස් මාවත, රණසිරි මෙටල් කො.

2021-03-20 08.00 - 17.00
තොගබෙදාහැරීම් : බොරළුගොඩ (නව), හොරහේන, හොරහේන (නව), නඩුදෙනිය, පාසල් මාවත - රුක්මලේ

2021-03-24 08.00 - 17.00
තොග : බෙය්ජින් ලංකා, සී.අයි.සී නව, එල්.ඒ.ඩබ්.ලංකානාත්, පැලැන්වත්ත - දිගන පොම්පාගාරය, සමර් ෆීල්ඩ්, සන්ටෙල් ටවර්, විශ්ව ග්‍රැෆික්ස්
තොග සහ බෙදාහැරීම් : සී.අයි.සී.ප්ලාස්ටික්, ඩයනමයිට් සමාගම, සිද්දමුල්ල ලී මෝල
බෙදාහැරීම් : මද්දුමබණ්ඩාර විදුහල, භූමි ප්‍රොපෙර්ටි, දිගන (නව), දිගන පන්සල, දූදරුවෝ (නව), දූව පන්සල, එදිරිසිංහ, ගොරකපිටිය, ඉඳිගහකැටිය, මහල්වරාව (නව), මහයායවත්ත, නාම්පමුණුව, නාම්පමුණුව කෙල්සි හෝම්, පොල්කොටුව, ප්‍රයිම් එල්සිම්, සචිත්‍ර සමරනායක, සල්ගස් හංදිය, සම්බෝධිය වත්ත, සංඝාරාම - කුඩමාදුව, සිද්දමුල්ල, සිද්දමුල්ල (මිහිඳුපුර), සිකුරාදපොල හංදිය, තානායම් ගොඩැල්ල, විද්‍යාදීප - හොරණ පාර, යෝධ මාවත, යෝධ මාවත (නව)

2021-03-26 08.00 - 17.00
තොග : ආර්පිටැග්, මත්තෙගොඩ හමුදා කඳවුර, රක්ෂා ගාර්මන්ට්, රිචර්ඩ් පීරිස් කො. , රිචර්ඩ් පීරිස් කො., රිචර්ඩ් පීරිස් කො. (ප්ලාස්ටිෂෙල්)
බෙදාහැරීම් :දික්හේනවත්ත , ජයමුතුගම, ජයපුර, ප්‍රයිම්එක්ස්ප්‍රස්, ප්‍රයිම්ලෑන්ඩ් - මත්තෙගොඩ, පුබුදුමාවත, රදකන්තනිවාස, සිසිල්සෙවනගාර්ඩන්, සියඹලාගොඩ, සියඹලාගොඩ (නව), දව්ලේජ්

2021-03-30 08.00 - 17.00
තොගබෙදාහැරීම් : හිරිපිටිය

## හොරණ විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### බුලත්සිංහල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-12 08.00 - 17.00
තොගබෙදාහැරීම් : නාගහදෙල

2021-03-16 08.00 - 17.00
තොග : මොබිටෙල් කුළුණ - මාරහේන

2021-03-30 08.00 - 17.00
තොගබෙදාහැරීම් : කඳන්වාඩිය, කඳන්වාඩිය

### හොරණ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-13 08.00 - 17.00
තොගබෙදාහැරීම් : බටගොඩ

2021-03-17 08.00 - 17.00
තොග : ඇල්මාටෝයි, ෆැල් ෆැශන්, මහවැලි ෆ්ලාර් මිල්ක්, නොබ්ල්ස් වෙයාර්, පොකුණුවිට කාර්ගිල්ස්
තොග සහ බෙදාහැරීම් : දික්බැද්දහේන
බෙදාහැරීම් : බණ්ඩාරවත්ත, මිල්ලගස් හංදිය, පොකුණුවිට, වැලිගම්පිටිය, වැලිගම්පිටිය II

2021-03-18 08.00 - 17.00
තොග : කොකෝවා ෆැක්ටරි, ග්ලෝබල් ෆුඩ් ප්‍රඩක්තොරණ බෝ ගස, ඉන්ටබැජ් ෆැක්ටරි (රෝයල් සෙරමික්), කරුණාරත්න සහ පුත්‍රයෝ, පොලිතින් - මිදෙල්ලමුල්ල
බෙදාහැරීම් : ඉසුරුවිමන, කිරිගලහේන, මාරගහහේන, සව්ගස් හංදිය, තක්ෂිලා උයන

2021-03-19 08.00 - 17.00
තොග : දේවප්‍රිය වික්‍රමසිංහ
තොග සහ බෙදාහැරීම් : සිරිපති
බෙදාහැරීම් : සුමංගල මාවත

2021-03-20 08.00 - 17.00
තොග : ඩී.පී.ජේ.බාර් කෝඩ් & ලේබල්
බෙදාහැරීම් : ගොරක්ගොඩ, ඉසිපතන

2021-03-22 08.00 - 17.00
තොග සහ බෙදාහැරීම් : පින්නකොලවත්ත (තලගල රබර්)
බෙදාහැරීම් : කුරේවත්ත, ඔලබොඩුකන්ද, තිලිණපුර

2021-03-23 08.00 - 17.00
තොග : ඒ සී ඒ හෙල්ත් කෙයාර්, එස් & සී රබර් - බැල්ලපිටිය, සෙවන් සුපර්, ශ්‍රී ලංකා ටෙලිකොම් - ගෝවින්න, ශ්‍රී පාලි විශ්වවිද්‍යාලය, ටියුලිප් ඇපරල්ස්, උකුවෙල කන්ද නව, වතුර පොම්පය - කඳන - ගඟ අසල
තොග සහ බෙදාහැරීම් : පාලිත ලී මෝල බැල්ලපිටිය, විජය රබර් මෝල (ලේටෙක්ස්)
බෙදාහැරීම් : ගෝවින්න අක්කර 10 පාසල අසල, ගෝවින්න රතුගෙවත්ත, ඉහල නාරගල, කඳන I - මංගලසිරිපුර, කඳන II - ඉලිඹ පාර, කඳන III (පහල නාරගල), කොට රෝඩ් - ගෝවින්න, කොටා රෝඩ් II (කොක්හේන), ඕපල්ල පාර, පිච්චමල් ගාර්ඩින්, රැටියලවත්ත, සඳගිරි උයන, සත්සර උයන, ජල සම්පාදන නව, විල්මට් පෙරේරා

2021-03-25 08.00 - 17.00
තොග : ෆ්‍රොසෙස්ටර් රබර් කර්මාන්තශාලාව, වාසනා බේකර්ස්
බෙදාහැරීම් : ඉමලකන්ද, රැටියල විදුහල, රැටියල - ආර්.ඊ.එස්

2021-03-26 08.00 - 17.00
තොග : කාර්ගිල්ස් රවින්ද්‍ර කිරිවත්තුඩුව, කෝපරේටිව් හොරණ, දිමුතු ප්‍රඩක්ට්ස්, ජයවර්ධන -රොසෙල්, විජය රේඩියෝ
බෙදාහැරීම් : හොරණ නව බස් නැවතුම්පල, මෙඩිහෙල්ත්, සෝමානන්ද මාවත, උඩවත්ත - ධම්මරතන, උඩවත්තපාර, මාන්න

2021-03-27 08.00 - 17.00
තොග : ගැසික් පොලිමර්ස්, කලුබෝවිල ඉම්පෙක්ස් - වවුලුගල, මැදතැන්න මිනරල්ස්, රොඩ්සන්ස් & සන්ස්, යුනික් හෝල්ඩින්ග්
තොග සහ බෙදාහැරීම් : අම්රිතා ඇපරල්
බෙදාහැරීම් : බටගොඩ, හේමචන්ද්‍ර ටයර් වර්ක් (අයි ඩී බී II), වවුලුගල අයි ඩී බී I

2021-03-29 08.00 - 17.00
තොග : හොරණ රබර් මෝල, කනන්විල පලතුරු
තොග සහ බෙදාහැරීම් : මීසන් වීවින් මිල්ස්
බෙදාහැරීම් : දෑකඩුවල, කබල්ලාගොඩ කනන්විල, කබල්ලාගොඩ II, කහටපිටිය II - පන්තිලකන්ද

2021-03-30 08.00 - 17.00
තොග : සී ඩබ්ලිව් මැකී - නාර්තුපාන, හේලීස් ඒ ඩී සී ටෙක්ස්ටයිල් ලිමිටඩ්, හේලීස් ඒ ඩී සී ටෙක්ස්ටයිල් ලිමිටඩ්, හේලීස් III, හේලීස් එම් ජී ටී ක්නිටින් ලිමිටඩ්, හේලීස් එම් ජී ටී - මුද්‍රණ අංශය, හේලීස් එම් ජී ටී
තොග සහ බෙදාහැරීම් : හමුදා කඳවුර - දෙඹගොඩ, නිව් චැට්ල් රබර් කර්මාන්තශාලාව
බෙදාහැරීම් : අඟුරුවාතොට පන්සල හංදිය, දෙඹගොඩ රණවිරු ගම්මානය, දෙඹගොඩ රණවිරු ගම්මානය, හේන්ගොඩ, මදුරාවල, නිව් චැට්ල් නේ කර්මාන්තශාලාව, උඩුගම්මන පාර, උඩුවර දෙල්ගොඩ

### ඉංගිරිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021-03-14 08.00 - 17.00
තොග : ඇග්‍රොමෙට් ඒෂියා, බෙයිරා එන්විරෝ සොලියුෂන්ස්, කාර්ල්ස් එම්බ්ලිශර්ස්, කැවින්කරේ ලංකා, සිලෝන් බේවරේජස් කෑන් (පුද්) සමාගම, සිලෝන් බෙවරේජ් ඉන්ටනැෂනල් - II, සීමෙට් (පුද්) සමාගම, ඩියුරෝ මෙඩිකල්, එච්.ඩී.ඩී.එස් එක්ස්ට්‍රැක්ට්, හෙස්පරිස් නැචුරල් (පුද්) සමාගම, ඉනොක් පොල්මර් ලංකා, ලයිසන් ලංකා, මර්බොක් එන්ටර්ප්‍රයිසස්, මර්බොක් එම් ඩී එෆ් ලංකා, නේචරබ් එක්ස්පෝර්ට්ස්, නව ජල පිරිපහදුව, නිත්‍යා පේපර්ස්, පැකේජ් වෝටර්, ෆෝනික්ස් ඉන්ඩස්ට්‍රීස්, ප්‍රිමියර් ෆුඩ්, ආර්.පී.සී.පොලිමර්ස්, සන්රිච්, ටයිටන් ලංකා II, තායියාන් ලංකා, යූ සී ඒ ලංකා (පුද්) සමාගම - 13බී කොටස, යුනි ලීවර්, ජල පිරිපහදුව
බෙදාහැරීම් : බී.ඕ.අයි.

2021-03-15 08.00 - 17.00
තොග : එස්. ඒ.සමරක්කොඩි
බෙදාහැරීම් : බට්ටගල, සී එස් ආර් පැකේජින්ග්, දඹර නව, හාඳුපැල්පොල, හොරකැටිය, මීවනපලාන

2021-03-16 08.00 - 17.00
තොග : කොස්ගහගොඩැල්ල වතුර පොම්පය
බෙදාහැරීම් : මගුරුවෙල

2021-03-18 08.00 - 17.00
තොගබෙදාහැරීම් : දෙඹගස්කන්ද, දෙඹගස්කන්ද නව, ඇදුරගලවත්ත, ගර්ටින් වත්ත

2021-03-19 08.00 - 17.00
තොගබෙදාහැරීම් : කුරන, කුරාන නව

2021-03-21 08.00 - 17.00
තොග : තිලෝනා ප්‍රොපර්ටි, රිගිට් ටයර් II
බෙදාහැරීම් : අරුණගම, පහන් පියස, පර්ත් නව

2021-03-23 08.00 - 17.00
තොගබෙදාහැරීම් : ගිරන්චිකන්ද, සිරිනිමල් වත්ත

2021-03-25 08.00 - 17.00
තොග : පුස්සැල්ල ෆාර්ම්
තොග සහ බෙදාහැරීම් : තෙනුකි ලී මෝල
බෙදාහැරීම් : අරකවිල/කොස් හේන

2021-03-26 08.00 - 17.00
තොග : ඊ.ඒ.එම් මැලිබන් ටෙක්ස්ටයිල් (පුද්) සමාගම
බෙදාහැරීම් :බටුගම්පොල - ජන උදානගම, බටුගම්පොල - කිරිගල, සිටි ඔෆ් ලයිෆ්, ගොනාබැඳිවලකඩ, මාලිගාකන්ද, නිමලගම - බටුගම්පොල II, ශාන්ත පීටර්ස් වත්ත

# අධිකරණ අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## අධිකරණ ගොඩනැගිලි වල ක්‍රියාත්මක කිරීමට ඇති අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු

**අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත සඳහන් අධිකරණ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.**

| No. | Court Zone | Project Name | IFB No. | Estimated Total Cost (Excluding VAT & Contingencies (Rs - Mn) | ICTAD No. | Bid Security Amount (Rs.) | Non- Refundable Fee (Rs) |
|---|---|---|---|---|---|---|---|
| 1 | Ampara | "Repairing works at High Court Complex- Ampara" | MOJ/ACT/NCB/26/01/AMP/P-001 | 8.5 | C6 & C7 | 86,000.00 | 2,000.00 |
| 2 | Anuradhapura | "Repairing of Old Court Building for Court Complex–Anuradhapura" | MOJ/ACT/NCB/26/02/ANU/P-001 | 32.18 | C4 & C5 | 322,000.00 | 5,000.00 |
| 3 | Avissawella | "Repairs to Court Buildings at Avissawella Court Complex" | MOJ/ACT/NCB/26/03/AVI/P-001 | 7.96 | C6 & C7 | 80,000.00 | 2,000.00 |
| 4 | Badulla | " Renovation of Eave Ceiling, Colour Washing, Floor Tiling (03 Floors), Aluminium Partitions, Electricity Repair at Civil Appealate Court – Badulla" | MOJ/ACT/NCB/26/04/BAD/P-001 | 5.58 | C6 & C7 | 56,000.00 | 2,000.00 |
| | | "Roof Repairs High Court & District Court Office Building & Colour Wash High Court -Badulla" | MOJ/ACT/NCB/26/05/BAD/P-002 | 4.05 | C7 & C8 | 41,000.00 | 1,500.00 |
| | | " Roof Repairs to Open Court, Record Room Office Bbuilding & Colour Wash and Proposed Security Hut District Court-Bandarawela" | MOJ/ACT/NCB/26/06/BAD/P-003 | 3.96 | C7 & C8 | 40,000.00 | 1,500.00 |
| 5 | Batticaloa | " Necessary Electrical repairing work at Court Building- District Magistrates' Court -Valaichenai" | MOJ/ACT/NCB/26/07/BAT/P-001 | 1.85 | C8 & C9 | 18,000.00 | 1,000.00 |
| | | " Necessary repairing and improvement works at High Court-Batticaloa" | MOJ/ACT/NCB/26/08/BAT/P-002 | 4.2 | C7 & C8 | 43,000.00 | 1,500.00 |
| 6 | Chilaw | "Repairs to Court Complex at Marawila" | MOJ/ACT/NCB/26/09/CHI/P-001 | 11.78 | C 5 & C6 | 118,000.00 | 5,000.00 |
| | | "Repairs Court Hall & Construction of the Watcher Hut for High Court in Chilaw" | MOJ/ACT/NCB/26/10/CHI/P-002 | 4.47 | C7 & C8 | 45,000.00 | 1,500.00 |
| 7 | Gampaha | " Improvements and repairs to Civil Appealate High Court Building at Gampaha" | MOJ/ACT/NCB/26/11/GAM/P-001 | 7.15 | C6 & C7 | 72,000.00 | 2,000.00 |
| 8 | Kalmunai | "Necessary repairing and improvement works at District/Magistrates' Court- Akkaraipattu" | MOJ/ACT/NCB/26/12/KAM/P-001 | 6.77 | C6 & C7 | 68,000.00 | 2,000.00 |
| | | " Construction of Boundary wall and supply and fixing of production racks –Magistrates' Court - Sammanthurai" | MOJ/ACT/NCB/26/13/KAM/P-002 | 5.73 | C6 & C7 | 58,000.00 | 2,000.00 |
| | | "Necessary repairing and improvement works at High Court Complex -Kalmunai" | MOJ/ACT/NCB/26/14/KAM/P-003 | 9.32 | C6 & C7 | 94,000.00 | 2,000.00 |
| 9 | Kalutara | " Repairing Building at Kalutara Civil Appealate High Court" | MOJ/ACT/NCB/26/15/KAL/P-001 | 4.42 | C7 & C8 | 45,000.00 | 1,500.00 |
| 10 | Kandy | "Repairs and colour wash of the Court Complex- Kandy " | MOJ/ACT/NCB/26/16/KAN/P-001 | 32.35 | C4 & C5 | 324,000.00 | 5,000.00 |
| | | "Balance work estimate for repairs to Office Building at District/ Magistrates' Court - Dambulla" | MOJ/ACT/NCB/26/17/KAN/P-002 | 16.18 | C5 & C6 | 162,000.00 | 5,000.00 |
| 11 | Kegalle | "Renovation of District/ Magistrates' Court – Mawanella " | MOJ/ACT/NCB/26/18/KAD/P-001 | 8.0 | C6 & C7 | 80,000.00 | 2,000.00 |
| | | "Renovation of Court Complex at Kegalle" | MOJ/ACT/NCB/26/19/KEG/P-002 | 27.49 | C4 & C5 | 275,000.00 | 5,000.00 |
| | | "Renovation of District/ Magistrates' Court- Warakapola" | MOJ/ACT/NCB/26/20/KEG/P-003 | 21.7 | C5 & C6 | 218,000.00 | 5,000.00 |
| 12 | Kurunegala | "Repairs to Court Buildings and Construction of Boundary Wall and Security hut- Magistrates' Court - Hettipola" | MOJ/ACT/NCB/26/21/KUR/P-001 | 10.97 | C5 & C6 | 110,000.00 | 2,000.00 |
| | | "Repairs to Office Buildings, Public Toilets, Painting Boundary Wall at Magistrate Court –Rambadagalla" | MOJ/ACT/NCB/26/22/KUR/P-002 | 1.68 | C8 & C9 | 17,000.00 | 1,000.00 |
| 13 | Matara | " Repairing Building, Concrete Road & New Public Toilet and Septic Tank at Magistrates' Court - Deiyyandara" | MOJ/ACT/NCB/26/23/MAT/P-001 | 6.8 | C6 & C7 | 68,000.00 | 2,000.00 |
| 14 | Negombo | " Repairs and improvements to Court Buildings for District/ Magistrates' Court at - Minuwangoda" | MOJ/ACT/NCB/26/24/NEG/P-001 | 18.8 | C5 & C6 | 189,000.00 | 5,000.00 |
| 15 | Nuwara Eliya | "Colour wash, Water Proofing & Miners Repair at Court Complex- Nuwara Eliya" | MOJ/ACT/NCB/26/25/NUW/P-001 | 6.73 | C6 & C7 | 68,000.00 | 2,000.00 |
| 16 | Polonnaruwa | "Renovation of Court Building and Chummery House for District/ Magistrates' Court –Hingurakgoda" | MOJ/ACT/NCB/26/26/POL/P-001 | 11.5 | C5 & C6 | 116,000.00 | 5,000.00 |
| 17 | Puttalam | "Construction of Boundary Wall- Magistrates' Court, Anamaduwa" | MOJ/ACT/NCB/26/27/PUT/P-001 | 3.86 | C7 & C8 | 39,000.00 | 1,000.00 |
| | | "Repair, Painting work, Electrical work at Circuit Magistrate's Court in Kalpitiya" | MOJ/ACT/NCB/26/28/PUT/P-002 | 2.68 | C7 & C8 | 27,000.00 | 1,000.00 |
| | | "Repairs of Roof Work, Painting Work, Tile work of Open Court and Toilet at Court Complex in Puttalam" | MOJ/ACT/NCB/26/29/PUT//P-003 | 11.3 | C5 & C6 | 114,000.00 | 5,000.00 |
| 18 | Rathnapura | " Repairs to Court buildings at Kalawana Magistrate Court " | MOJ/ACT/NCB/26/30/RAT/P-001 | 6.39 | C6 & C7 | 64,000.00 | 2,000.00 |
| | | "Repairs to Court buildings and construction work at Embilipitiya Court Complex" | MOJ/ACT/NCB/26/31/RAT/P-002 | 17.9 | C5 & C6 | 180,000.00 | 5,000.00 |
| | | "Repairs to Court buildings at Balangoda Magistrate court " | MOJ/ACT/NCB/26/32/RAT/P-003 | 13.0 | C5 & C6 | 131,000.00 | 5,000.00 |
| 19 | Tangalle | "Repairing Building at District Magistrate Court - Walasmulla" | MOJ/ACT/NCB/26/33/TAN/P-001 | 6.45 | C6 & C7 | 65,000.00 | 2,000.00 |
| 20 | Jaffna | "Expenses necessary to be incurred for the renovation work of Jaffna Court Complex -stage 01" | MOJ/ACT/NCB/26/34/JAF/P-001 | 25.6 | C4 & C5 | 257,000.00 | 5,000.00 |

01. ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා වන අවශ්‍යතාවයන් සහ ක්‍රියාත්මක කිරීමේ පිරිවිතර පිළිබඳව පැහැදිලි කරන ලද විස්තර ලංසු ලිපිලේඛන සමග මිලදී ගත හැක.

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතුය. ඉහත වගුගත කර ඇති ශ්‍රේණි සඳහා CIDA / ICTAD ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ අධිකරණ අමාත්‍යාංශයෙහි 03 වන මහලෙහි ප්‍රසම්පාදන අංශයේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර, ඉහත කී ප්‍රසම්පාදන අංශයේ දී 2021/03/01 දින සිට (ප්‍රසිද්ධ නිවාඩු දින හැර) සතියේ දිනවලදී කාර්යාල වේලාව තුළදී, (පෙ.ව. 9.00 – ප.ව. 4.00) ලංසු ලිපි ලේඛන පරීක්ෂාකර බැලිය හැකිය. දූරකථනය / ෆැක්ස් අංකය : 011–2438178

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් එක් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා ආපසු ගෙවනු නොලබන උක්ත වගුවේ සඳහන් ගාස්තුව කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ අධිකරණ අමාත්‍යාංශයේ තුනවන මහලේ ප්‍රසම්පාදන අංශය වෙත ගෙවීමෙන් අනතුරුව ලිඛිත ඉල්ලීමක් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් කාර්යාල වේලාව තුළදී (පෙ.ව. 9.00 – ප.ව. 3.00) 2021/03/01 දින සිට 2021/03/21 දින දක්වා ඉංග්‍රීසි බසින් සකස් කරනලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

06. ලංසු පිටපත් දෙකකින් යුතුව (එනම්, මුල් පිටපත හා අනු පිටපත ලෙස සටහන් කර මුද්‍රා තබන ලද)

I. 2021/03/22 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර අමාත්‍යාංශය වෙත ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කිරීමට

හෝ

II. 2021/03/22 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි කාර්යාල වේලාව තුළදී කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ අධිකරණ අමාත්‍යාංශයේ 03 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය.

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෙනත් ආකාරයකින් හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කෙරෙන ලංසු භාරගනු නොලැබේ.

07. සියලුම ලංසු, ලංසු ලිපි ලේඛනය සමග අමුණා ඇති ආකෘතිය ප්‍රකාර වූ බැංකු ඇපකරය ආකාරයෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් වටිනාකම යුතු ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරයේ වටිනාකම එක් එක් ලංසු ලේඛනවල මිල ගණන් කැඳවීමේ ආරාධනා පත්‍රයෙහි (IFB) සඳහන් වටිනාකමින් යුක්ත විය යුතුය. වලංගු ලංසු ඇපකරයක් අමුණා නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු ඉදිරිපත් කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු ලංසු ලිපි ලේඛනයේ සඳහන් කොට ඇත.

08. ලංසු වලංගු කාලය ලංසු ලේඛන වල සඳහන් දිනය පරිදිම විය යුතුය.

09. ලංසු භාර ගැනීම සඳහා වන අවසාන වේලාව ඉක්මවූ වහාම 05 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් සහ / හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසුව විවෘත කරනු ලැබේ.

10. ලංසු පිළියෙල කිරීම, ගෙනැවිත් භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන් හට දරන්නට සිදුවන යම් පිරිවැයක් සඳහා අධිකරණ අමාත්‍යාංශය වගකීම නොදරයි.

11. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2021/03/02 දින පෙ.ව. 11.00 ට පැවැත්වේ.

12. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධ අවසන් තීරණය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වෙයි.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය,**
**කොළඹ 12.**

2021 පෙබරවාරි 26 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.